229 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 229 - இல. 7
**Volume 229 - No. 7**

2014 ඔක්තෝබර් 09 වන බ්‍රහස්පතින්දා
2014 ஒக்ரோபர் 09, வியாழக்கிழமை
**Thursday, 09th October, 2014**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය

**නිවේදන:**
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත :
ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත :**
නියෝග

**මහනගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත :**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදි.

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත :**
ඉල්ලා අස් කර ගන්නා ලදි.

**පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදි.

---

# பிரதான உள்ளடக்கம்

**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்

**அறிவிப்புகள்:**
குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டமூலம்: உயர்நீதிமன்றத் தீர்ப்பு

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டம் :**
ஒழுங்குவிதிகள்

**மாநகர சபைகள் (திருத்தம்) சட்டமூலம் :**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**நகர சபைகள் (திருத்தம்) சட்டமூலம் :**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலம் :**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம் :**
அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது

**உள்ளூர் அதிகாரசபைகள் வெற்றிடங்களை நிரப்புதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

---

# PRINCIPAL CONTENTS

MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation

ANNOUNCEMENTS:
Assistance to and Protection of Victims of Crime and Witnesses Bill: Determination of the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

CONVENTION AGAINST DOPING IN SPORTS ACT:
Regulations

MUNICIPAL COUNCILS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

URBAN COUNCILS (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

PRADESHIYA SABHA (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

LOCAL AUTHORITIES ELECTIONS (AMENDMENT) BILL:
Withdrawn

LOCAL AUTHORITIES FILLING OF VACANCIES (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2014 ඔක්තෝබර් 09 වන බ්‍රහස්පතින්දා*
*2014 ஒக்ரோபர் 09, வியாழக்கிழமை*
*Thursday, 09th October, 2014*

**අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு#சந்திம#வீரக்கொடி] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.

MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පහත දැක්වෙන සන්දේශය අතිගරු ජනාධිපතිතුමාගෙන් ගරු කථානායකතුමා වෙත ලැබී තිබෙනවා.

"

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

අංකය : පීජේඑල්/308
2014 සැප්තැම්බර් මස 03 වන දින
කොළඹ දී ය.

ගරු කථානායකතුමනි,

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 12 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයෙන් මවිසින් ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල සියලුම සාමාජිකයින් දිවයිනේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ සක්‍රීය සේවය සඳහා කැඳවන ලදී.

ඉහත කී ප්‍රකාශනය නිකුත් කිරීමට හේතුව ත්‍රස්තවාදය සහ යම් මහජන කැළඹීමක් වැළැක්වීම සහ මැඩ පැවැත්වීම පිණිස බව පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති"



# නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

## I

### අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்புச் சட்டமூலம் : உயர் நீதிமன்றத் தீர்ப்பு
### ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES BILL : DETERMINATION OF THE SUPREME COURT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව සභාවට දැන්වීමට කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යෝජනා කර ඇති සංශෝධන, පනත් කෙටුම්පතට එකතු කිරීමට යටත්ව එම පනත් කෙටුම්පතේ විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට 123 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යයි මම නියෝග කරමි.

***ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය:***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:#*
*Determination of the Supreme Court:*

S.C.(SD) No. 01/2014 to S.C. (SD) No. 06/2014

**"ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES"**

**BEFORE :**

| | | |
|---|---|---|
| K.Sripavan | - | Judge of the Supreme Court |
| S.E.Wanasundera, P.C. | - | Judge of the Supreme Court |
| Sarath De Abrew | - | Judge of the Supreme Court |

**S.C. (SD) No. 01/2014**

Petitioner : Hikkadukoralage Don Chandrasoma

Counsel : Gomin Dayasiri with Jayantha Gunasekera, Manoli Jinadasa and Sulakshana Senanayake for the Petitioner

Yasantha Kodagoda Deputy Solicitor General with Dr. Avanti Perera, Senior State Counsel for the Attorney-General

**S.C. (SD) No. 02/2014**

Petitioner : Shamali Dayasri

Counsel : Gomin Dayasiri with Jayantha Gunasekera, Manoli Jinadasa and Sulakshana Senanayake for the Petitioner

Yasantha Kodagoda Deputy Solicitor General with Dr. Avanti Perera, Senior State Counsel for the Attorney-General

**S.C. (SD) No. 03/2014**

Petitioner : Gallage Punnawardana

Counsel : Canishka Witharana with Tushara Palliyage for the Petitioner

Yasantha Kodagoda Deputy Solicitor General with Dr. Avanti Perera, Senior State Counsel for the Attorney-General

**S.C. (SD) No. 04/2014**

| | | |
|---|---|---|
| Petitioner | : | Kapila Gamage |
| Counsel | : | J.P. Gamage with Canishka Witharana and Sumudhu Liyanarachchi for the Petitioner |
| Respondent | : | Hon. Attorney-General |
| Counsel | : | Yasantha Kodagoda Deputy Solicitor General with Dr. Avanti Perera Senior Stae Counsel for the Attorney-General |

**S.C. (SD) No. 05/2014**

| | | |
|---|---|---|
| Petitioner | : | Nanayakkaravasam Carijjawatthage Vijitha |
| Counsel | : | Gomin Dayasiri with Jayantha Gunasekera, Manoli Jinadasa and Sulakshana Senanayake for the Petitioner |
| | | Yasantha Kodagoda Deputy Solicitor General with Dr. Avanti Perera Senior Stae Counsel for the Attorney-General |

**S.C. (SD) No. 06/2014**

| | | |
|---|---|---|
| Petitioner | : | Herath Disanayakege Jayantha Kulathunga |
| Counsel | : | Manohara de Silva, P.C. With Irosha Munasinghe and Palitha Gamage |
| Respondent | : | Hon. Attorney-General |
| Counsel | : | Yasantha Kodagoda Deputy Solicitor General with Dr. Avanti Perera Senior State Counsel for the Attorney-General |

A Bill bearing the title "Assistance to and Protection of Victims of Crime and Witnesses" was published on the Gazette of the Republic of Sri Lanka on 8th August 2014 and placed on the Order Paper of Parliament on 10th September 2014. Six Petitions were filed challenging the constitutionality of this Bill by invoking the jurisdiction of this Court in terms of Article 121 (1) of the Constitution.

Due notices were given to the Hon. Attorney General in respect of all six Petitions and was heard in terms of Article 134(1) of the Constitution on 17th September 2014. The long title to the said Bill provides for the setting out of Rights and Entitlements of Victims of Crime and witnesses and the Protection and Promotion of such Rights and Entitlements to give effect to appropriate International Norms, Standards and best practices relating to the Protection of Victims of Crime and Witnesses; the

Establishment of the National Authority for the Protection of Victims of Crime and Witnesses; Constitution of a Board of Management, the Victims of Crime and Witnesses Assistance and Protection Division of the Sri Lanka Police Department; Payment of Compensation to Victims of Crime and for the establishment of a Fund known as "Victims of Crime and Witnesses Assistance and Protection Fund".

Learned Counsel for the Petitioner contended that the provision contained in Clause 3(a) which provides that a victim be treated with equality and fairness with regard to "his dignity and privacy" is inconsistent with Article 12(1) of the Constitution. Article 12(1) portulates that there shall be equal treatment in equal circumstances and there shall not be any discrimination among victims based on their dignity and privacy. Learned Deputy Solicitor General agreed to omit the word "his" in the said Clause and reword the said Clause to avoid any discrimination amongst victims. In a similar manner, learned Deputy Solicitor General agreed to omit the word "his" appearing in Clause 5.

Clause 3(c) of the Bill is silent as to the person who would prescribe the procedure referred to therein. One does not know whether the procedure will be prescribed by the Authority or by the Minister. This uncertainity leads to the violation of Article 12(1) of the Constitution. When considering the exercise of statutory power certain fundamental principles can never be overlooked. The first is that our Constitution and System of Courts are founded on the rule of law; secondly statutory power conferred for public purposes is conferred as if it were upon trust and not absolutely.

It is noted that the words "relevant authorities" referred to in Clause 3(f) has to be defined in order to avoid any vagueness. Failure to do so will permit various authorities to act in an arbitrary and discriminatory manner. It is a fundamental principle of law that persons or authorities whose functions are statutorily demarcated must be clearly identified. No absolute and unfettered discretions be placed on public functionaries and any such discretions is to be judged by reference to the purposes for which they were so entrusted. The inconsistancy with Article 12(1) could be avoided if a clear and unambiguous definition is given to the words "relevant authorities".

It has been pointed out that the word "legal Counsel " in Clause 3(h) may lead to an interpretation to mean a "foreign counsel" representing a victim in any on-going investigation. Learned Deputy Solicitor General undertook to substitute the word "Attorney-at-Law" in place of the word "legal counsel". Further, it was also agreed to reformulate the definitions of "victims of crime" found in Clause 46.

One of the duties and functions of the National Authority of the Protection of Victims of Crime and Witnesses as spelt out in Clause 13(1)(k) is to take measures to sensitize Public Officers involved in enforcement of law including Officers of the Sri Lanka Police and Public Officers associated with the Probation and Social Services on the needs of Victims of Crime and Witnesses. Clause 13(1)(l) empowers the National Authority of the Protection of Victims of Crime and Witnesses to promote and ensure the observance and application of codes of conduct, recognized norms and best practices relating to the protection of the right and entitlement of victims of crime and witnesses by Officers of the Sri Lanka Police and Officers of Government Social Services Institutions. (emphasis added)

Learned Counsel for the Petitioners brought to the notice of Court that Item 7 in List 1 of the 9th Schedule to the Constitution provides the following matter as a asubject coming under the Provincial Coucils List :

Social Services and Rehabilitation

7.1 Probation and Child Care Services;

The Court has to consider whether "Probation and Social Services" in its entirety has been devolved on the Provincial Councils. What has been devolved with regard to "Social Services" is Probation and Child Care and not Probation on the needs of victims of crime and witnesses. Thus, we are unable to hold that probation on the special needs of victims of crime and witnesses, is a devolved subject.

Item 1 in the 9th Schedule to the Constitution, provides for Police and Public Order and the exercise of Police Powers to the extent set out in Appendix I within the Province.

In terms of Clause 2:2 of Appendix 1, a Provincial Division shall consist of the Deputy Inspector General of Police, Senior Superintendents of Police, Assistant Superintendents of Police, seconded from the National Division and Provincial Assistant Superintendents of Police , Chief Inspectors, Inspectors, Sub Inspectors, Sergents and Constables recruited in the Province. It would thus be seen, in terms of Clause 13(1)(k) and 13(1)(l), the National Authority for the Protection of Crime and Witnesses may exercise certain amount of control over these Officers of the Sri Lanka Police in the Province. It was argued that "Police and Public Order" being a devolved subject within a province to the extent set out in Appendix I, the consultation process referred to in Article 154(G)3 needs to be complied with. Sensitizing the Police Officers involved in the enforcement of law with regard to the needs of victims of crime and witnesses is not a devloved subject. As such, we are of the view that Article 154(G)(3) need not be complied with.

Clause 28(1) (a)(ii) permits every High Court and every Magistrate Court to impose a fine on a convicted person subject to a limitation referred to therein. Item 36:8 in List 1 of the Ninth Schedule provides that "fine imposed by Courts" to be a subject of the Provincial Councils. By virtue of such devolution, every Provincial Council may make statutes applicable to the Province for which it is established in respect of "fines imposed by Courts". Thus, this Bill cannot in terms of Clause 29(3)(c) create a fund to collect such fines unless the Bill is referred by the President, after its publication in the Gazette and before it is placed on the Order Paper of Parliament, to every Provincial Council for its views thereon as provided in Article 154(G)(3) of the Constitution. Thus, Clause 29(3)(c) should be deleted in order to ensure that the "Protection Fund" does not get any monies from "Court fines".

In the course of the argument, learned Deputy Solicitor General submitted that an earlier version of the Bill (S.C. Determination No. 1/2008) sought to be enacted in 2008 not only received the scrutiny of this Court but was determined to be not inconsistent with the Constitution. It is observed that Court having considered the provisions contained in S.C. Determination No. 1/2008 which was referred to the Supreme Court by His Excellency the President in terms of Article 122(1)(b) suggested certain amendments, inclusions, modifications and alterations. However, we do not know whether the suggestions were incorporated in the Bill and the Court had no opportunity of considering the same. The constitutional provisions are to be understood and interpreted with an object-oriented approach considering the democratic spirit underlying it. Hence, we do not express any opinion on those matters.

The provisions in the Bill along with the suggested amendments, if incorporated into the Bill, would be in consonance with the Constitution and would not be offensive of any provisions in the Constitution or the 13th Amendment thereto.

Subject to the abovementioned observations, we make a determination that in terms of Article 123(1) of the Constitution, neither the Bill nor any provision thereof is inconsistent with the Constitution.

We place on record our deep appreciation of the assistance given by all learned Counsel for the Petitioners and the learned Deputy Solicitor General who appeared on behalf of the Hon. Attorney-General.

**K. SRIPAVAN, J.**

JUDGE OF THE SUPREME COURT

**S.E. WANASUNDERA, P.C. J**

JUDGE OF THE SUPREME COURT.

**SARATH DE ABREW, J.**

JUDGE OF THE SUPREME COURT.

## II

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2014 ඔක්තෝබර් මස 09 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 2.30ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, එයට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014 ජූලි 15 දිනැති අංක 1871/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014 මාර්තු 14 දිනැති අංක 1853/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014 ජූලි 17 දිනැති අංක 1871/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014 මැයි 21 දිනැති අංක 1863/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014 ජූලි 25 දිනැති අංක 1872/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014 ජූලි 09 දිනැති අංක 1870/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2013 වර්ෂය සඳහා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව; සහ

(viii) 2013 අංක 36 දරන විසර්ජන පනතේ 6(1) වැනි වගන්තිය යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ අයවැය සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම - 2014.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසර හා පුනර්ජනනීය බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12 (1) (V) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 29 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2014 ජූලි 11 දිනැති අංක 1870/71 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග.- [කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු# ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2013 වර්ෂය සඳහා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
மனுக்கள்
PETITIONS

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පානදුර, වෑකඩ, රීජන්ට් ග්‍රොව්, අංක 01 දරන ස්ථානයෙහි පදිංචි ඩී.සී.පී.ජේ. කුලසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බදුල්ල, ඉහළ අලුත් ඇළ පාර, අංක 55/1 දරන ස්ථානයෙහි පදිංචි බී.එස්. ද සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු දුමින්ද දිසානායක මහතා (අධ්‍යාපන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க - கல்விச் சேவைகள் அமைச்சர்)
(The Hon.Duminda Dissanayake - Minister of Education Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අනුරාධපුර, ගුවන් තොටුපළ හන්දිය, අංක 246/24 දරන ස්ථානයෙහි පදිංචි එච්.එම්. එංගොනෝනා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත්# හා# ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
*மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon.H. R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දෙහිඕවිට, අල්ගොඩ, දෙහිඕවිට දන්ගම්පල පාර, දැහැමි සෙවන, ඒ 58/2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ජයන්ත වීරසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා - පැමිණ නැත.

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

Hon. Deputy Speaker, I present a petition received from Mr. A.L. Peer Mohamed of the Batticaloa Kachcheri.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### කරදිය ධීවර කර්මාන්තය : ජාතික වැඩ පිළිවෙළ
### உவர் நீர் மீன்பிடித்துறை : தேசிய வேலைத்திட்டம்
### SEAWATER FISHING INDUSTRY: NATIONAL PROGRAMME

2670/'12

1. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තය නංවාලීම උදෙසා ක්‍රියාත්මක කර ඇති ජාතික වැඩ පිළිවෙළ කවරේද;

(ii) කරදිය ධීවර ප්‍රජාවට ධීවර කාර්මික උපකරණ ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(iii) එසේ නම්, එම වැඩසටහන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(v) එම මුදල ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට වෙන් කළ මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(vi) වෙන් කරන ලද එම මුදල ප්‍රමාණවත් වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் உவர் நீர் மீன்பிடித்துறையை முன்னேற்றுவதற்காக நடைமுறைப்படுத்தப் பட்டுள்ள தேசிய வேலைத்திட்டம் யாதென்பதையும்;

(ii) உவர் நீர் மீனவ சமுதாயத்திற்கு மீன்பிடி உபகரணங்களை வழங்குவதற்கான நிகழ்ச்சித் திட்டங்கள் நடைமுறைப்படுத்தப்படுகின்றனவா என்பதையும்;

(iii) ஆமெனில், அந்த நிகழ்ச்சித்திட்டங்கள் வெவ் வேறாக யாவையென்பதையும்;

(iv) மேற்படி நிகழ்ச்சித்திட்டங்களுக்காக ஒதுக்கப் பட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வள வென்பதையும்;

(v) மேற்படி பணத்தொகையானது கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சுக்கு ஒதுக்கப்பட்டுள்ள மொத்தப் பணத்தொகையின் சதவீதமாக எவ்வளவென்பதையும்;

(vi) ஒதுக்கப்பட்டுள்ள மேற்படி பணத்தொகை போதுமானதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Will he state -

(i) the name of the national programme implemented for the upliftment of seawater fishing industry in Sri Lanka;

(ii) whether programmes for providing fishing gear for seawater fishing community are being implemented;

(iii) if so, separately the names of those programmes;

(iv) the total amount of money allocated for those programmes;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(v) the aforesaid amount as a percentage of the total amount of money allocated for the Ministry of Fisheries and Aquatic Resources Development; and

(vi) whether the allocated amount will be sufficient?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධන උපාය මාර්ග 2010 - 2013 සැලැස්මෙහි අරමුණු හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මැදිහත් වීම. විස්තර පහත වගුවේ දැක්වේ.

<table>
<tr><th>අරමුණු</th><th>යෝජිත මැදිහත්වීම</th></tr>
<tr><td>1. වෛද්‍ය පර්යේෂණ ආයාතනය නිර්දේශ කරන ආකාරයට පුද්ගලයෙකුට අවශ්‍ය දෛනික ප්‍රෝටීන් පරිභෝජනය සඳහා මසුන් ග්‍රෑම් 60 ක ප්‍රමාණයක් සැපයීම.</td><td>1. ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම; 2009 වර්ෂයේදී මෙ. ටො. 339,730 ක් වූ ධීවර නිෂ්පාදනය 2013 වර්ෂයේදී මෙ. ටො. 512,840 (අදාළ කාලය තුළ වැඩිවීම 51%කි) දක්වා වැඩි කරගෙන ඇත. මෙය අවම අවශ්‍යතාව වන මෙ.ටො. 685,690 දක්වා වැඩි කිරීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරයි.<br><br>2. 2009 වර්ෂයේ දී ග්‍රෑම් 28 ක් වූ දෛනික මත්ස්‍ය පරිභෝජනය 2013 වර්ෂයේ දී ග්‍රෑම් 41.3 ක් දක්වා වැඩි කරගෙන ඇත.<br><br>3. සමස්ත ජනතාවටම මිලදී ගත හැකි අකාරයේ නිෂ්පාදන විවිධාංගීකරණයකට යොමු කිරීම හා බෙදා හැරීම් ජාලය කාර්යක්ෂම කිරීම.</td></tr>
<tr><td>2. වසර 2013 වන විට දේශීය මත්ස්‍ය නිෂ්පාදන මෙට්‍රික් ටොන් 685,690 දක්වා වැඩි කිරීම.</td><td>1. ධීවර යාත්‍රා පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් වෙරළාසන්න සහ ගැඹුරු දිය කලාපයේ මසුන් නෙළීමේ ආයාසයන් වැඩි කිරීම.<br>
<table>
<tr><th>යෙදවුම</th><th>2009</th><th>2013</th></tr>
<tr><td>IMUL යාත්‍රා</td><td>2,934</td><td>4,182</td></tr>
<tr><td>IDAY යාත්‍රා</td><td>958</td><td>884</td></tr>
<tr><td>OFRP යාත්‍රා</td><td>17,183</td><td>23,210</td></tr>
<tr><td>MTRB යාත්‍රා</td><td>2,126</td><td>2,480</td></tr>
<tr><td>NTRB යාත්‍රා</td><td>18,243</td><td>22,900</td></tr>
<tr><td>සම්පූර්ණ යාත්‍රා ගණන</td><td>40,014</td><td>62,786</td></tr>
<tr><td>නිකුත් කරන ලද මෙහෙයුම් බලපත්‍ර ගණන</td><td>35,140</td><td>53,945</td></tr>
<tr><td>ඉහත යාත්‍රා අතරින් මරුවැල්පන්න කර්මාන්තයේ යෙදෙන ධීවර යාත්‍රා ප්‍රමාණය</td><td>1,127</td><td>4,833</td></tr>
</table>
<br>2. උතුරු පළාතේ ධීවර ක්‍රියාකාරකම් පුනරුත්ථාපනය කිරීම. යුද්ධයට පෙර (1983) ලංකාවේ කරදිය ධීවර ක්ෂේත්‍රය සඳහා උතුරු පළාතේ දායකත්වය 44.4 ක් වූ අතර එය 2007 වර්ෂයේ දී 9.3 දක්වා පහත වැටුණි. 2013 වර්ෂයේ දී මෙය නැවතත් 23.8 ක් වී ඇත.</td></tr>
<tr><td></td><td>3. භාවිතයේ නොමැතිව තිබූ මාදැල් පාඩු 2013 වර්ෂය වන විට නැවතත් සම්පූර්ණයෙන්ම ක්‍රියාකාරීත්වයට ගෙන ඒම. 2009 වර්ෂයේ 359 ක්ව පැවැති මාදැල් පාඩු සංඛ්‍යාව 2013 වර්ෂය වන විට 1109 ක් දක්වා වර්ධනය වී ඇත.<br><br>4. ධීවර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ආයෝජන හැකියාව ඉහළ නැංවීම පිණිස සියලුම ධීවරයින් වසර 05ක් සඳහා ආදායම් බද්දෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කිරීම.<br><br>5. දැල් ආම්පන්න සහ එංජින් සම්පූර්ණ බද්දෙන් නිදහස් කර ඇත.<br><br>6. ධීවර යෙදවුම් ආම්පන්නවලට යොදා ගන්නා රැහැන් 15% ක බද්දෙන් නිදහස් කර ඇත.</td></tr>
</table>

7. ධීවර මත්ස්‍ය ඇම සඳහා 15% ක බද්දෙන් නිදහස් කර ඇත.

8. නිෂ්පාදනය ඉහළ නැංවීම ඉලක්කකර ගෙන සෑම වර්ෂයකදීම ධීවර කර්මාන්තය වෙනුවෙන් අය වැයෙන් විශේෂ ප්‍රතිපාදන වෙන් කෙරෙන අතර ධීවර බලපත්‍ර ගාස්තු අහෝසි කිරීම, ධීවර ණය සහන ලබාදීම වැනි ප්‍රතිපත්තිමය පහසුකම්ද සලසා දෙනු ලැබේ.

| අදියර | | අදියර 1 | අදියර 2 |
|---|---|---|---|
| ක්‍රියාත්මක වූකාල සීමාව | | සිට 2010 2013 දක්වා | 2013 සිට ඉදිරියට |
| පොලී අනුපාත | රු 02 .මි.ට ඉහළ ණය සඳහා | 12% | 12% |
| | රු 02 .මි.ට පහල ණය සඳහා | 9.5% | 10% |
| රජය විසින් ගෙවනු ලබන පොලී සහනය | | 4% | 4% |
| ධීවර කාර්මිකයා විසින් ගෙවිය යුතු පොලිය | රු 02 .මි.ට ඉහළ ණය සඳහා | **8%** | **8%** |
| | රු 02 .මි.ට පහල ණය සඳහා | **5.5%** | **6%** |
| ණය ආපසු අයකර ගැනිමේ උපරිම කාල සීමාව | | අවුරුදු 08 | අවුරුදු 08 |
| ලබාදුන් ණය ප්‍රමාණය | | 687 | 70 |
| වටිනාකම රු.මි. | | 1000.0 | 155.87 |

3. තරඟකාරී මත්ස්‍ය වෙළඳාමක් ක්‍රියාත්මක කිරීම තුළින් මසුන් නිෂ්පාදනය සඳහා තරඟකාරී මිලක් ස්ථාපිත කිරීම.

1. ලංකා ධීවර සංස්ථාවෙහි මත්ස්‍ය අලෙවිසැල් ජාලය වැඩි කිරීම තුළින් සංස්ථාවේ වෙළඳපොළ දායකත්වය ලබා ගැනීම.දිවයිනේ මත්ස්‍ය අස්වැන්නෙන් වැඩිපුර ප්‍රමාණයක් මිලදී ගෙන පාරිභෝගික ජනතාව වෙත සහන මිලට අලෙවි කිරීම සහ ඒ තුළින් වෙළඳපොල මසුන් මිල පාලනය කිරීම අරමුණු කොට ගෙන ලංකා ධීවර සංස්ථා අලෙවිසැල් ජාලය 250 දක්වා පුලුල් කිරිමේ වැඩ පිළිවෙළ යටතේ මේ වන විට අලෙවිසැල් සංඛ්‍යාව (ආර්ථික මධ්‍යස්ථානද ඇතුළුව) 137 දක්වා වැඩිකර ඇත.

2. මීට අමතරව ලක් ස.තො.ස ශාඛා 225 ක් හා කෝප්සිටි 61ක් මඟින් ලංකා ධීවර සංස්ථාවේ මසුන් බෙදා හැරීම් හා අලෙවි කටයුතු සිදු කරයි.

3. සියලුම ධීවර වරායන් ආවරණය වන පරිදි මසුන් මිලදී ගැනිමේ මධ්‍යස්ථාන ස්ථාපිත කොට සාධාරණ මිලකට ධීවරයාගේ නිෂ්පාදන මිලදී ගැනීමේ වැඩපිළිවෙළ තවදුරටත් ව්‍යාප්ත කිරීම.

4. වසර 2013 වන විට මත්ස්‍ය අපනයනය මෙට්‍රික් ටොන් 36,000 දක්වා වැඩි කිරීම තුළින් විදේශ විනිමය ඉපයීම ඉහල නැංවීම.

1. ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය වැඩි දියුණු කිරීම තුළින් වූනා වර්ගයේ මසුන් අපනයනය ඉහළ නැංවීම.

2. අපනයන වෙළඳපොළ සඳහා ඉස්සන් වගාව පුනරුජ්තාපනය හා ව්‍යාප්ත කිරිම.

කිවුල්දිය ඉස්සන් වගාව සඳහා ණය සහන ලබාදීමට මහ බැංකුවේ අධිපතිතුමා සග පැවැත්වූ සාකච්ඡාවේ තීරණ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

<table>
<tr>
<td></td>
<td>
i. මුළු ණය මුදල රු. බි. 330<br>
ii. ණය කරුවන් ගනන 23<br>
iii. එයින් ඉස්සන් වගාව නැවත ආරම්භ කරන ණයකරුවන් සඳහා පමණක්<br>
<br>
i. සම්පූර්ණ පොළිය කපා හැරීම (රු.මි. 1,778)<br>
ii. 2013 මැයි මස සිට නැවතත් ණය ලබා ගැනීමට පහසුකම් සලසා දීම.<br>
iii. ඉහත ණය මුදල ගෙවීමට අවුරුදු 10ක කාලයක් ලබාදීම.<br>
iv. පරණ ණය ගෙවීම සඳහා අදාළි බැංකු සමග සාකච්ඡා කර නැවතත් ණය ගෙවීම සඳහා ක්‍රමයක් සකස් කර ගැනීම හා නොකඩවා මාස 06ක් අලෙවි වීමෙන් පසු නැවතත් ණය ලබාදීම.<br>
<br>
ඉදිරියටත් ඉස්සන් කර්මාන්තයේ නියැලෙන ණයකරුවන්ගෙන් මාස 06 ක් ඇතුළත ණය ගෙවන්නේ නම් සම්පූර්ණ පොළිය කපා හැරීම.<br>
3. අපනයන විභවයක් ඇති පරම්පාරික නොවන ජලජීවි වගාවන් වැඩි දියුණු කිරීම. (මුහුදු පැළෑටි, මුහුදු කුඩැල්ලන්,බෙල්ලන්, මෝදා වර්ගයේ මසුන්)<br>
4. රට තුළින් ගලායන විදේශ විනිමය ඉතිරි කිරීම සහ විශාල පිරිසකට රැකියා අවස්ථා උදාකර දීම අරමුණු කොට ගෙන CEYFISH වෙළඳනාමය යටතේ මසුන් ටින්කිරීමේ කර්මාන්ත ශාලාවක් ගාල්ල නගරයේ ආරම්භ කිරීම.<br>
5. TESS, SEAQUEEN, CHAMMAI, MEKERAL යන වෙළඳ නාම යටතේ මේ වන විට මෙරට ටින් මාළු කර්මාන්තශාලා 04 ක් ක්‍රියාත්මක වේ.<br>
6. මත්ස්‍ය අපනයන සංවර්ධනය කිරීමේ අරමුණින් අපනයනය සඳහා හොඳ විභවයක් ඇති මත්ස්‍ය විශේෂ හා සම්පත් සුලභත්වය හඳුනාගැනීමට අදාළ පර්යේෂණ සිදු කිරීම. උදා:- Sea Cucumber (මුහුදු කැකිරි), Sea Urchin (මුහුදු ඉකිරි)
</td>
</tr>
<tr>
<td>5. ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය හා ජීවන මට්ටම ඉහල නැංවීම සඳහා ධීවර සමාජ සංවර්ධනය ඇති කිරීම, රැකියා විවිධාංගිකරණය කිරීම සහ යටිතල පහසුකම් සහ ධීවර ප්‍රජාවගේ අවශ්‍යතා සැපයීම.</td>
<td>
1. ධීවර ප්‍රජාව සඳහා නිවාස හා පොදු පහසුකම් ලබා දීම.<br>
2. ජාතික ධීවර සම්මේලනය යටතේ ධීවර කාර්මිකයින් පෙළගැස්වීම. මේ වන විට මෙහි සාමාජිකත්වය 102,000.00 ක් දක්වා වර්ධනය වී ඇත. මෙම සම්මේලන නියෝජිතයින් මාසිකව හමුවී සාකච්ඡා කර ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය අදාල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ කාර්යයන් සිදු කරයි.<br>
3. විකල්ප රැකියා ලබා දීම.<br>
4. මාසිකව රු. 10,000.00 ක් මුදලක් ලැබෙන පරිදි ඵලදායි ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම.<br>
5. සම්පූර්ණ හානි මෙන්ම අර්ධ හානිද ආවරණය වන පරිදි ධීවර රක්ෂණ ක්‍රමය පුළුල් කිරීම.<br>
<br>
රක්ෂණය කරන ලද ධීවර යාත්‍රා ගණන
<table>
<tr><td>2009</td><td>2011</td></tr>
<tr><td>2091</td><td>11,833</td></tr>
</table>
2011 වසරේ ආරම්භ කරන ලද ධීවර කාර්මික රක්ෂණය සඳහා රක්ෂණය වූ ධීවර කාර්මිකයින් ගණන 20,132කි.<br>
<br>
6. 6% පොළි සහිත පහසු ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙමින් මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශයක් ලබාදීම. මේ සඳහා මේ වන විට රු.මි 3000ක් වෙන් කර ඇත.
</td>
</tr>
</table>

| | |
|---|---|
| | 7. වෙනත් රටවල මුහුදු සීමා උල්ලංඝනය කරන ලද හෝ අනතුරටපත් වීම නිසාවෙනත් මුහුදු සීමා හරහා පාවීයෑම නිසා එම රටවල අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මෙරටට ගෙන්වා ගැනීම සඳහා වාර්ෂිකව රු.මි. 05ක් පමණ වැය කරණු ලබයි.<br>8. ධීවර කාර්මිකයින්ගේ ආරක්ෂාව සඳහා ජීවිත ආරක්ෂක කබා නොමිලේ ලබාදීම වාර්ෂකව සිදුවේ. 2010 සිට2013 වසර දක්වා බෙදාදුන් ජීවිතාරක්ෂක කුබා සංඛ්‍යාව 7,495 කි. 2014 වසරේ ජීවිතාරක්ෂක කබා 37,000 ක් ලබාදේ.<br>9. ධිවර ආපදා සඳහා සහන සලසා දීම.<br>• 2010, 2011 නොවැම්බර් මස ආපදා තත්ත්වයේ දී මරණයට පත් ධීවරයින් සඳහා රුපියල් ලක්ෂය බැගින් ලබා දී ඇත.<br>• 2013 ජුනි මස දකුණු පළාතේ කප්පරතොට ආපදා තත්ත්වයෙදී මරණයට පත් ධීවරයින් සඳහා රුපියල් ලක්ෂය බැගින් ලබා දී ඇත. 2013 ජුනි මස දකුණු පළාතේ සිදුවූ ධීවර අනතුරු වලින් විනාශයට පත් යාත්‍රා සහ ආම්පන්න වෙනුවෙන් වන්දි ලෙස රු 73.3 .මි.ක මුදලක් ලබාදී ඇත.<br>• මීට අමතරව විවිධ අවස්ථාවලදී අනතුරට ලක්වන ධීවරයින් හා ධීවර යාත්‍රා සඳහා වන්දි ලබා දීම කර ඇත. |
| 6. පසු අස්වනු නාස්තිය අවම කිරීම. | 1. මත්ස්‍ය ප්‍රමිතිය සහ තත්ත්ව පාලනය සඳහා අවශ්‍ය පහසුකම් දියුණු කිරීම. පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොලේ තබා ඇති මත්ස්‍ය සාම්පලවල ගුණාත්මක බව පරීක්ෂා කිරීමේ නියමු ව්‍යාපෘතියක් මේ වන විට අරඹා ඇත. මේ සඳහා තත්ත්ව පාලන පර්යේෂණාගාරයක් එම සංකීර්ණයේ පිහිටුවා ඇත.<br>2. මීට සමගාමීව එම සංකීර්ණයේ ලංකා ධීවර සංස්ථාවේ අලෙවියට තබා ඇති මත්ස්‍යයින්ගේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමේ වැඩසටහනක් අරඹා ඇති අතර ඉදිරියේ දී එය සියලු අලෙවිසැල් ආවරණය වන පරිදි ව්‍යාප්ත කරයි. |

| | |
|---|---|
| | 3. බහුදින යාත්‍රාවල ශීත කළ මුහුදු ජලය භාවිතය සඳහා පෙළඹවීම. (CSW & RSW)<br>4. දිවි නැඟුම ධීවර අංශයේ වැඩ සටහන යටතේ ප්‍රජා දායකත්වය සහිතව ධීවර නිෂ්පාදන පසු-අස්වනු තාක්ෂණ ව්‍යාපෘති මඟින් කරවල, උම්බලකඩ හා ජාඩි වැනි නිෂ්පාදන සුලභ කිරීම තුළින් එම නිෂ්පාදන පරිභෝජනය කරන ප්‍රජාව වෙත මත්ස්‍ය නිෂ්පාදන ලබා දීම. 2009 - 2013 අතර කාලය තුළ උම්බලකඩ ආනයනය 55.5% (මෙ.ටො. 3,250 සිට මෙ.ටො. 1,447 දක්වා) කින් පහළ බැසි ඇති අතර එම කාලය තුළ කරවල ආනයනය 18%කින් (මෙ.ටො. 45,605 සිට මෙ.ටො. 37,509 දක්වා) කින් පහළ බැස ඇත.<br>5. ලංකා ධීවර සංස්ථාව විසින් කරවල නිෂ්පාදන ව්‍යාපෘතියක් සහ උම්බලකඩ නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම. |
| 7. ධීවර කර්මාන්තය තිරසාර ලෙස කළමනාකරණය කිරීම. මේ යටතේ ධීවර කර්මාන්තය, එක්සත් ජාතින්ගේ සාගර ප්‍රඥප්තිය සහ ධීවර, ජෛව විවිධත්ව හා සාගර පරිසරය නියමයන්ට අනුකූල වන සේ තිරසාර ලෙස කළමනාකරණය කිරීම. | 1. ධීවර කළමනාකරණ ප්‍රදේශ හඳුනාගැනීම සහ කළමනාකරණ ක්‍රමය හඳුන්වාදීම . ධීවර පනතේ 31 හා 32 වගන්ති ප්‍රකාරව ප්‍රාද්ශීය මට්ටමින් ධීවර සම්පත් කළමනාකරණය කිරීම "සහ-කළමනාකරණ" ප්‍රවේශයක් මඟින් සිදු කිරීමේ අරමුණෙන් ධීවර කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කර ඇත. මෙවැනි කළමනාකරණ ප්‍රදේශ 23ක් මේ වන විට ප්‍රකාශයට පත් කර, කමිටු පිහිටුවා ඇත.<br>2. හානිකර පන්න ක්‍රමවල යෙදීමට විරුද්ධව කටයුතු කිරීම. ලංකාව තුළ නීති හා රෙගුලාසි මඟින් තහනම් කරන ලද ප්‍රධාන ධීවර මෙහෙයුම් පහත පරිදි වේ.<br>a. විෂ සහිත හෝ පුපුරණ ද්‍රව්‍ය මඟින් මසුන් මැරීම<br>b. තල්ලු දැල් හෝ පතුලේ ඇදගෙන යනු ලබන දැල්<br>c. ඇවුලුම් බිලී භාවිතයෙන් ක්ෂීරපායි ගනයේ ජලජ ජීවීන් ඇල්ලීම.<br>d. ඉතා කුඩා ඇස් ඇති මොක්සි දැල්<br>e. කොරල්පර මත කරමල්/ත්‍රිත්ව දැල් එලීම |

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

| | |
|---|---|
| | f. තංගුස් (ඒක සූත්‍රික දැල්) භාවිතය<br>g. තහනම් කරන ලද සජීවී ජීවීන් ඇල්ලීම (උදා: ඩොල්පින්, කැස්බෑවුන්, මුහුදු ඌරන්, ඇතැම් කොරල්පර මසුන්)<br>h. විධිමත් මෙහෙයුම් බලපත්‍රයක් නොමැතිව තහනම් නොවන ආම්පන්න වලින් වුවද ධීවර කටයුතුවල යෙදීම.<br><br>මෙම සියලූ පන්න ක්‍රම භාවිතය සම්පූර්ණයෙන්ම නැවැත්වීම සඳහා කටයුතු කිරීම. මේ සඳහා 2013 වසරේ නඩු පැවරීම් 449 ක් සිදු කර ඇත .<br><br>3. තහනම් පන්න ක්‍රම වෙනුවට නව කාර්යක්ෂම හා අනුමත පන්න ක්‍රම හඳුන්වා දීම, ප්‍රවර්ධනය සඳහා අමාත්‍යාංශය මඟින් තාක්ෂණ සහායන් සහ විකල්ප ආම්පන්න ලබා දීම.<br><br>4. ඒක සූත්‍රික දැල් (Mono-Filament Nets) ආනයනය, සන්තකයේ තබා ගැනීම මෙන්ම විකිණීමද තහනම් කර ඇත. අනවසර ගබඩා කිරීම් හා සන්තකයේ තබා ගැනීම් පාලනයට වැටලීම් සිදුකරයි.<br><br>5. යාත්‍රා සුපරීක්ෂණ පද්ධතියක් දියත් කිරීම සහ ඒ තුළින් නීත්‍යානුකූල නොවන වාර්තා නොවන හා පාලනය නොකරන ලද ධීවර කටයුතු නතර කිරීම. මෙය 2014 වර්ෂයේ ඔක්තෝබර් මස සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. |
| | 6. ධීවර කළමනාකරණයේදී කලාපීය සහයෝගය වර්ධනය කිරීම.<br>a. 2010 කිවුල්දිය ඉස්සන් අභිජනනාගාර (පසු කීටයන් නිකුත් කිරීම) නියෝග 1677/7, 2011 නොවැම්බර් 23<br>b. 2011 නොවැම්බර් 30 දිනැති අංක 1734/12 දරන අති විශේෂ ගැසට්පත්‍රය් පලකරන ලද නියෝග සඳහා කරන ලද සංශෝධන 1786/26, 2012 නොවැම්බර් 30<br>c. 2011 කෘත්‍රිම උපස්තරමත වගා කරන මුහුදු ජලජ ජීවීන් අපනයනය කිරීමේ නියෝග (96 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත) 1730/14, 2011 නොවැම්බර් 02<br><br>**අන්තර්ජාතික නියමනයන්ට අනුව කටයුතු කිරීම.**<br><br>7. ඉන්දියානු සාගර ටූනා කොමිසමේ සහ එක්සත් ජාතීන්ගේ අහාර හා කෘෂිකර්ම සංවිධානයේ වගකීමෙන් යුතු ධීවර කර්මාන්තයක් සඳහා වූ පැවතුම් සංග්‍රහයේ නීති රීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම. |
| 8. ධීවර කර්මාන්තය තිරසාර ලෙස සංවර්ධනය හා කළමනාකරණය කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම. | 1. මිලෙන් අඩු හා ගුණාත්මක භාවයෙන් වැඩි මත්ස්‍ය ආහාර නිපදවීම හා හඳුන්වාදීම. මෙම ව්‍යාපෘතිය ලෝක ආහාර සංවිධාන සහාය යටතේ ක්‍රියාත්මක වේ. ප්‍රජා සහායක ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරෙන මේ සඳහා පුහුණුව හා උපකරණ ලබා දී ඇත.<br><br>2. දුර්ලභවූ ඒක දේශීය සහ විදේශීය මත්ස්‍යයන් ප්‍රේරණ හා ස්වාභාවික අභිජනන ක්‍රම මඟින් බෝ කිරීම හා වැඩි දියුණු තාක්ෂණය ලබාදීම.<br><br>3. දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල තත්වය බාලවීම වැළැක්වීම සඳහා පවතින නිවැරදි පරිහරණ ක්‍රමවලට අදාළ රෙගුලාසි වැඩි දියුණු කිරීම සඳහා වන විද්‍යාත්මක දත්ත රැස් කිරීම සහ අදාළ වාර්තා සකසා ධීවර අමාත්‍යාංශය-වෙත ලබාදීමට කටයුතු කරමින් සිටී.<br><br>4. පාරම්පරික මත්ස්‍ය නිෂ්පාදන ඉහළ තුළනාත්මක තත්වයෙන් නිපදවීම සඳහා අවශ්‍ය නිවැරදි තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම බෙදා දීම. මේ යටතේ ජපානයේ භාවිත සෙට් නෙට් තාක්ෂණය හඳුන්වා දීමට අවශ්‍ය පියවර ගැනීම.<br><br>5. මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා වන අන්තර්ජාතික මට්ටමේ පිළිගත හැකි තත්ත්ව වාර්තා (මත්ස්‍ය නිෂ්පාදන සඳහා) නිකුත් කිරීම. |

| | |
|---|---|
| | 6. මත්ස්‍යයන් ව්‍යාප්තිය, සුලභත්වය හා සුලභ වකවානු හඳුනාගැනීම හා ඒ තුළින් මත්ස්‍ය සම්පත් පිළිබඳ තොරතුරු ලබාදීමට කටයුතු කිරීම.<br><br>7. වෙරළාශ්‍රිත ධීවර කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදුකර දත්ත හා නිර්දේශ ලබා දීමට කටයුතු කිරීම.<br><br>8. විශාල අපනයන විභවයක් ඇති ආහාරමය වටිනාකමක් ඇති ජෙලියන් විශේෂ දෙකක් හඳුනා ගැනීම.<br><br>9. හම්බන්තොට සිට මුලතිව් දක්වා ගැඹුරු මුහුදේ නිතල මත්ස්‍ය බිම් හඳුනා ගැනීම සහ එය තුළින් ධීවර ප්‍රජාව දැනුවත් කිරීම. තවද, අල්ලා ගැනීමට වඩා සුදුසු මසුන් හඳුන්වා දීම. |
| | 10. පොකිරිස්සන් හා මුහුදු කුඩැල්ලන් නම් කිරීමේ ව්‍යාපෘති ආරම්භ කිරීම ඒ හා බැඳුණු තාක්ෂණික දැනුම ධීවරයින්ට ලබාදීමට කටයුතු කිරීම.<br><br>11. රූප විද්‍යාත්මකව විශේෂ හඳුනාගත නොහැකි අවස්ථාවලදී එම විශේෂ හඳුනා ගැනීම් සඳහා DNA දත්ත අනුක්‍රමනයන් භාවිතා කර දත්ත ගබඩාවක් පිළියෙල කර තිබීම.<br><br>12. පුපුරණ ද්‍රව්‍ය යොදා අල්ලන ලද මසුන් උසාවියට ඉදිරිපත් කළ අවස්ථාවේදී එම මසුන් අල්වාගනු ලැබ ඇත්තේ පුපුරණ ද්‍රව්‍ය යොදා ගෙන දැයි පර්යේෂණ මඟින් තහවුරු කර, ධිවර කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා දායක වීම.<br><br>13. ධීවර කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා නව මැදැල් තොටුපළවල් ලබාදිය යුතු දැයි යන්න තීරණය කිරීම සඳහා පර්යේෂණ සිදුකර අවශ්‍ය තොරතුරු ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට ලබාදීම. |
| 9. ධීවර වරාය, නැංගුරම්පොල හා තොටුපොල ඇතුළු යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. | 1. ධීවර වරාය හා නැංගුරම්පොළ සංවර්ධනය සඳහා දේශීය අරමුදල් මඟින් 2013 වර්ෂයේ රු.මි. 2000ක මුදලක් වෙන් කළ අතර 2014 වර්ෂයේ රු.මි. 1000ක් මුදලක් වෙන් කරන ලදී. මෙ යටතේ මූලික පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි.<br>1.1.ධීවර වරායන් 01 (කලමැටිය)<br>1.2.නැංගුරම්පොළ 03 (කප්රතොට, කයිකාවල, මරදාන)<br>1.3.නවීකරණ කටයුතු 03 (හම්බන්තොට, ගාල්ල, දොඩන්දූව)<br>1.4.තොටුපොළ සංවර්ධනය (පලහතුරේ හා පෝරුතොට)<br>1.5.තවද, ඉදි කිරීමට යෝජිත වරාය හා නැංගුරම්පොල සඳහා මූලික අධ්‍යයන කටයුතු ද සිදු කරයි.<br>2. ශ්‍රී ලංකාවේ ධීවර වරාය සංවර්ධනය උදෙසා දැනට දික්ඕවිට, නිල්වැල්ල, සුදුවැල්ල, නව ධීවර වරාය 03 ක් ඉදිකර ක්‍රියාත්මක කිරීම.<br>3. ගුරුනගර්, සිලාවතුර, ගන්දර යන ස්ථානවල වරායන් ඉදිකිරීම් ව්‍යාපෘතිය.<br><br>4. වරාය/ නැංගුරම්පොල/ තොටුපොල 23 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.<br><br>5. පේසාලේ (කොන්තප්පිඩි), මුලතිවු, වලෙයි, පුඩුවේකට්ටු, ලංකා පටුන (ඉලංගන්තුරෙයි), පලංවෙන්නායි වරාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය.<br><br>6. ජපන් යෙන් මිලියන 760 ක වටිනාකම ඇති කැණීම් යන්ත්‍රයක් ජයිකා ආධාර යටතේ ලබා ගෙන ඇත.<br><br>7. කොඩ්බේ ධීවර වරාය සංවර්ධනයට මිලියන 78 ක බර එසවීම් යන්ත්‍රයක් මිලදී ගෙන ඇත. දියත් මග වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.<br><br>8. චීන ණය ව්‍යාපෘතිය මඟින් වැලි ඉවත් කිරීමේ යන්ත්‍ර 05 ක් හා ජංගම එසවුම් යන්ත්‍ර මිලදී ගැනීමට මූලික කටයුතු ඉටු කර ඇත<br><br>9. නෙදර්ලන්තයෙන් කැණීම් යන්ත්‍ර 3 ක් ලබාගෙන වරාය මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට යෝජිතය. |

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

(ii) ඔව්.

(iii) විකල්ප ඉන්ධන සහනාධාර වැඩ පිළිවෙළ යටතේ ධීවර කාර්මිකයින්ට ධීවර ආම්පන්න ධීවරයාගේ කැමැත්ත පරිදි ඔවුන්ට ලබා දේ.

කරමල්, දැල් වර්ග 500කට අධික ප්‍රමාණයකින් දැල් ඒකක 2,250,000කට අධික ප්‍රමාණයක්; මරුවැල් ආම්පන්න කට්ටල 455ක්;

පිටත සවිකරන ධීවර යාත්‍රා එන්ජින් 38ක්;

GPS උපකරණ 151ක්;

ජීවිතාරක්ෂක කබා - 37,000ක්;

(iv)

| වැඩ සටහන | වෙන් කරන ලද මුදල |
|---|---|
| විකල්ප ඉන්ධන සහනාධාර වැඩ පිළිවෙළ යටතේ ධීවර කාර්මිකයින්ට ධීවර ආම්පන්න ලබා දීමේ වැඩසටහන | මිලියන 4200 වෙන් කර ඇත. (දැනට මිලියන 1500ක් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කර අදාළ ආම්පන්න මිල දී ගැනීම සිදු කර ඇත. එම ආම්පන්න බෙදා දීම දැන් සිදු කෙරේ. |

(v) සියයට 39.04

(vi) ඔව්.

(ආ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව ඔබතුමා ප්‍රකාශ කළා, ඉන්ධන සහනාධාරයට විකල්පයක් හැටියට ධීවර උපකරණ ලබා දෙනවාය කියලා. නමුත් 2005 අවුරුද්දේ සහ 2010 අවුරුද්දේ ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවල සඳහන් වෙලා තිබෙනවා, උපකරණත් ලබා දෙනවා; ඉන්ධන සහනාධාරත් ලබා දෙනවා කියලා. ඒ දෙකම ලබා දෙනවා කියලා සඳහන් වෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් මා අහන්න කැමැතියි, ඔබතුමන්ලා ධීවර ප්‍රජාවට ඉන්ධන සහනාධාරය ලබා දෙනවාය කියලා පොරොන්දු වෙලා, අද ඔබතුමන්ලාගේ රජය ඒ පොරොන්දුවෙන් බැහැර වෙලා ධීවර ප්‍රජාව අනාථභාවයට ලක් කරලා තිබෙන්නේ ඇයි කියලා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අනාථභාවයක් නැහැ නේ. ධීවර සමිති ඔක්කොම එක්ක සාකච්ඡා කරලා තමයි මේ ක්‍රමය ආරම්භ කර තිබෙන්නේ. ඒගොල්ලන් කිව්වා, ඒ මුදල හා සමානව ආම්පන්න ලබා දෙන්නය කියලා. දැන් ඔබතුමා කියනවා, මේ දෙකම ලබා දෙන්නය කියලා. ඇත්තෙන්ම මේ වසරේ සැප්තැම්බර් මාසයේ 20වැනි දා ඉඳලා මේ දෙකම ලබා දෙනවා. මොකද, අද ඉන්ධන මිල පහත හෙළා තිබෙනවා. මේ ඉන්ධන සහනාධාරය ලබා දෙනකොට සමහරුන් විරෝධතා පැවැත්වුවේ, "අපි ඉල්ලුවේ නැහැ, සහනාධාර. අපට සහනාධාර එපා, ඉන්ධන මිල පහත දමන්න" කියලායි. ඊට පසුව සහනාධාරය ඉවත් කළාම ඒගොල්ලන්ගේ සටන් පාඨය වුණේ, "සහනාධාරය වහාම දියවු" කියන එකයි. ඒගොල්ලන් මාත් එක්ක සාකච්ඡාවට ආපු වෙලාවේ මම ඇහුවා, "දැන් ඔබතුමන්ලා මෙච්චර කාලයක් සහනාධාර එපා කිව්වා නේ. දැන් කොහොමද ඕනෑ කියලා කියන්නේ?" කියලා. ඒ මොකද, ඒවා දේශපාලන සටන් පාඨ.

දැන් ඉන්ධන මිල අඩු කර තිබෙනවා. භූමි තෙල් මිල රුපියල් 20කින් අඩු කළා. මුලින් තිබුණු තත්ත්වයට ආවා. දැන් එතකොට මේ දෙකම ලැබෙනවා. ඒකත් හම්බවෙනවා; මේකත් හම්බවෙනවා. මේ අවුරුද්දේ තෙල් මිල අඩු කිරීමකුත් සිදු වුණා, සහනාධාරයත් ලැබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

දැන් ඔබතුමා ප්‍රකාශ කළා, ඒකත් හම්බවෙනවා; මේකත් හම්බවෙනවා; දෙකම හම්බවෙනවා කියලා. නමුත් ඔබතුමා දැන ගන්නට ඕනෑ, මාස ගණනාවක් දෙනවාය කියපු දේ දුන්නේ නැති බව. ඉන්ධන සහනාධාරය ලබා දෙනවාය කිව්වේ අද ඊයේ නොවෙයි, 2006 ජනවාරි මාසයේ යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මට පෙනෙනවා මේ රජය ඔබතුමාට වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැති බව. [බාධා කිරීමක්] ඔව්, මට පෙනෙනවා. මොකද, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට වාර්ෂිකව ඔබතුමාගේ අමාත්‍යාංශයට වෙන් කරන මුදල් ප්‍රමාණය අඩු වෙනවා.

ඔබතුමාගේ අමාත්‍යාංශයට වෙන් කළ මුදල් ප්‍රමාණය වාර්ෂිකව අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි මෙන්න මේ කාරණය. ඔබතුමා හොඳ සටන්කාමී දේශපාලනඥයෙක්. ඇයි, ධීවර ප්‍රජාවගේ ශුභ සිද්ධිය උදෙසා මහා භාණ්ඩාගාරයෙන් වැඩි පංගුවක් ලබා ගන්නට ඔබතුමාගේ ඒ සුපුරුදු සටන්කාමී චරිතය ක්‍රියාත්මක නොවන්නේ?

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඇත්තටම සටන්කාමීත්වය තිබෙන්න ඕනෑ, මෙතැන වැඩ පෙන්වලා නේ. මේ වනකොට ආචාර්ය පී.බී. ජයසුන්දර මහත්මයා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විශාල පිළිගැනීමකට ලක් කර තිබෙනවා. ඒ නිසා මෙවර අය වැයෙන් වෙන දාට වඩා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. දැන් ඔබතුමාගේ වාගේම මගෙත් කාලය හොඳ වේගෙන එනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඇත්ත වශයෙන්ම ඔබතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරන මුදල් ප්‍රමාණය වාර්ෂිකව කපා තිබෙන බව. එතුමා ධීවර ප්‍රජාවගේ ඝාතකයකු හැටියට කටයුතු කර තිබෙනවා. ඒකයි ඇත්ත කථාව. මම ඔබතුමාගෙන් අහනවා, මහා භාණ්ඩාගාරය ඔබතුමාට ඔච්චර සලකනවා නම් අර පොරොන්දු වුණු නිවාස 30,000 හදන්න වෙන් කළ රුපියල් කෝටි 150න් ශත පහක්වත් මේ වන තෙක් තමුන්නාන්සේට ලබා දීලා නැත්තේ ඇයි කියා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ධීවර නිවාස වැඩ පිළිවෙළ ලබා දීලා තිබෙන්නේ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතට. ඒ විෂය එතැනට තමයි ගිහින් තිබෙන්නේ. අපේ අමාත්‍යාංශයට නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 3 - 3713/'13- (3), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4 -3961/'13- (2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 5-4419/'13-(1), ගරු රෝසි සේනානායක මහත්මිය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 6 -4636/'13- (1), ගරු පී. හැරිසන් මහතා.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10 - 4847/'14 - (3), ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11 -4944/'14- (1), ගරු තිස්ස අත්තනායක මහතා.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13-5031/'14-(1), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 2-3246/'12-(2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාසල් නිල ඇඳුම් රෙදි : විස්තර
பாடசாலைச் சீருடைத் துணிகள் : விபரம்
SCHOOL UNIFORM MATERIAL : DETAILS

4733/'14

7. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අනෝමා ගමගේ මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு (திருமதி) அனோமா கமகே சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. (Mrs.) Anoma Gamage)
අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2014 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් සඳහා රෙදි ලබා දිය යුතුව තිබූ ගැහැනු සහ පිරිමි ළමුන් සංඛ්‍යාව කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එක් එක් දිස්ත්‍රික්කයේ පාසල් නිල ඇඳුම් එනම්, සුදු ගවුම්, සුදු කමිස හා කලිසම්, කුඩා පිරිමි සිසුන් සඳහා නිල් කලිසම් සඳහා අවශ්‍ය රෙදි ප්‍රමාණය කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි මිලදීගත් ආකාරය කවරේද;

(ii) ඊට අදාළව ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) එසේ නම්, එක් එක් ටෙන්ඩර් අයදුම්කරුගේ නම, ඉදිරිපත් කළ මිල ගණන් සහ රෙදි වර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිරිපත් කළ රෙදි වර්ග නියමිත පිරිවිතරයන්ට අනුකූලදැයි තාක්ෂණික ඇගයුම් කමිටුවක් මගින් පරීක්ෂා කරනු ලැබුවේද;

(v) එසේ නම්, එම කමිටුවේ නිර්දේශ අනුව සැපයුම්කරුවන් තෝරා ගනු ලැබුවේද;

(vi) දිවයින පුරා රජයේ පාසල්වල සෑම දරුවෙකුටම එක හා සමානව නිල ඇඳුම් රෙදි ලැබෙන්නේද යන්න පිළිබඳව පසු විපරම් කිරීමක් හෝ අවසන් වාර්තා සකස් කිරීමක් සිදු වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்விச் சேவை அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2014ஆம் ஆண்டுக்கான பாடசாலைச் சீருடைகளுக்கு துணிகள் வழங்க வேண்டியதாக இருந்த பெண் மற்றும் ஆண் பிள்ளைகளின் எண்ணிக்கை தனித்தனி யாக எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) ஒவ்வொரு மாவட்டத்தினதும் பாடசாலைச் சீரு டைகள் அதாவது, வெள்ளை கவுண், வெள்ளை சேர்ட் மற்றும் காற்சட்டை, சிறு மாணவர்களுக்கான நீல நிறக் காற் சட்டை ஆகியவற்றுக்குத் தேவையான துணிகளின் அளவு தனித்தனியாக எவ்வளவென்பதை அவர் சபையில் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி சீருடைகளுக்குத் தேவையான துணிகள் கொள்வனவு செய்யப்பட்ட முறை யாதென்பதையும்;

(ii) இது சம்பந்தமாக கேள்விப்பத்திரம் கோரப் பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், ஒவ்வொரு கேள்விப்பத்திர விண்ணப்பதாரரின் பெயர், முன்வைத்துள்ள விலைகள் மற்றும் துணி வகைகள் தனித் தனியாக யாதென்பதையும்;

(iv) தொழில்நுட்ப மதிப்பீட்டுக் குழுவொன்றினால் முன்வைக்கப்பட்ட துணி வகைகள் உரிய விவரக்கூற்றுகளுக்கு அமைவானவையா என பரிசீலனை செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், மேற்படி குழுவின் பரிந்துரைக்கேற்ப வழங்குநர்கள் தேர்ந்தெடுக்கப்பட்டுள்ளனரா என்பதையும்;

(vi) நாடு பூராவுமுள்ள அரச பாடசாலைகளின் அனைத்துப் பிள்ளைகளுக்கும் சமமான முறை

யில் சீருடைத் துணிகள் கிடைக்கின்றனவா என்பதை பின்னாய்வு செய்தலோ அல்லது இறுதி அறிக்கை தயாரித்தலோ நடைபெறு கின்றதா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education Services:

(a) Will he state separately, the number of girls and boys who should have been given free school uniform material for the year 2014?

(b) Will he table separately, the quantity of material required for school uniforms, i.e. for girls' dresses, for white shirts and trousers and for blue shorts given to younger boys in each district?

(c) Will he inform this House -

(i) the manner adopted to purchase material required for the aforesaid uniforms;

(ii) whether tenders were called for this purpose;

(iii) if so, the names of the tenderers, bids submitted and types of material offered by each tenderer;

(iv) whether the submitted materials were checked by a technical evaluation committee to ensure that they are in accordance with the specifications;

(v) if so, whether the suppliers were selected according to the recommendation of the aforesaid committee; and

(vi) whether a follow-up programme or a final report is compiled to check whether all students studying in Government schools islandwide are provided with uniform material equally?

(d) If not, why?

**ගරු දුමින්ද දිසානායක මහතා**
(மாண்புமிகு துமிந்த திசாநாயக்க )
(The Hon. Duminda Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) පිරිමි 2,209,472

ගැහැනු 2,213,730

(ආ) ඔව්, ඇමුණුම සභාගත* කරමි.

(ඇ) (i) 2014 වර්ෂයේ පාසල් නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට පුවත් පත් දැන්වීමක් මඟින් ලංසු කැඳවීමේ කාර්යය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කර ඇත. එම ලංසු ඇගයීමෙන් පසු ප්‍රසම්පාදන මණ්ඩලය / දේශීය රෙදිපිළි පංගුකරුවන්ගේ කමිටුව විසින් මිල ගණන් තීරණය කිරීමෙන් පසු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම මිල ගණන් යටතේ පාසල් නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමෙන් පසු, ඒ වන විට මෙම විෂයය අධ්‍යාපන සේවා අමාත්‍යාංශය වෙත පැවරී තිබූ නිසා 2013 ජූලි මස 13 වන දින අමප/13/0961/563/003 අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් ඉදිරිපත් කර තිබූ මිල නැවත කේවල් කිරීමට තීරණය කර නැවත කේවල් කිරීමේ කමිටුවක් මඟින් එම මිල ගණන් කේවල් කිරීමට කටයුතු කර කේවල් කිරීමේ කමිටුව විසින් එළඹි අවසන් මිල ගණන් යටතේ පාසල් නිල ඇඳුම් රෙදි මිලදී ගැනීමට අධ්‍යාපන සේවා අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාළ ලංසුකරුවන්ට ලංසු ප්‍රදානය කර මිලදී ගැනීම සිදු කර ඇත.

(ii) ඔව්.

(iii) පහත සඳහන් ප්‍රමාණ හා මිල ගණන් ඉදිරිපත්ව තිබූ බව සඳහන් වේ.

| Name of Bidders | White Shirt/Frock ME-01 | | White Trouser . ME-02 | | Blue Trouser ME-03 | | Robe ME-04 | | Yellow Shirt ME-05 | | Brown Trouser ME-06 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Qty (000m) | Price (L.K.R) | Qty (000m) | Price (L.K.R) | Qty (000m) | Price (L.K.R) | Qty (000m) | Price (L.K.R) | Qty | Price (L.K.R) | Qty | Price (L.K.R) |
| Praba Tex | 2,800 | 175 | 200 | 235 | - | - | - | - | - | - | - | - |
| Vanguard | 3,500 | 175 | 750 | 235 | 300 | 250 | - | - | - | - | - | - |
| Cliftex | 1,800 | 175 | 750 | 235 | 750 | 250 | - | - | - | - | - | - |
| Creative | 6,350 | 175 | 1,400 | 235 | 1,100 | 250 | 300 | 190 | 5,550 | 175 | 5,450 | 250 |
| Total Qty quoted | 14,450 | - | 3,100 | - | 2,150 | - | 300 | - | 5,550 | - | 5,450 | - |
| Total Qty required | 8,200 | | 1,400 | | 1,100 | | 300 | | 5,550 | | 5,450 | |

[ගරු දුමින්ද දිසානායක මහතා]

(iv) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය විසින් පිරිවිතරයන්ට අනුකූලදැයි අවස්ථා දෙකකදී පරීක්ෂා කර ඇත.

(v) තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත සැපයුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(vi) ඔව්.

(ඇ) අදාළ නොවේ.

* ඇමුණුම:
* இணைப்பு:
* Annex:

| අනු අංකය | දිස්ත්‍රික්කය | 1-5 සිසුන්ගේ නිල ඇඳුම් (මීටර්) | | | | | 6-9 සිසුන්ගේ නිල ඇඳුම් (මීටර්) | | | | | 10-13 සිසුන්ගේ නිල ඇඳුම් (මීටර්) | | | | | එකතුව (මීටර්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිසු කමිස | සිසු ගවුම | වර්ද | සිසු කලිසම | නිල් කලිසම | සිසු කමිස | සිසු ගවුම | වර්ද | සිසු කලිසම | නිල් කලිසම | සිසු කමිස | සිසු ගවුම | වර්ද | සිසු කලිසම | ළමා සාරි | |
| 1 | කොළඹ | 102014.04 | 146546.4 | 5970 | 5578.04 | 55272.44 | 97169.99 | 143733.48 | 5212.5 | 19395.74 | 45147.83 | 103808 | 176538.2 | 5197.5 | 118081.6 | 0 | 1029665.76 |
| 2 | ගම්පහ | 95281.2 | 148910.58 | 3303 | 20044.36 | 36790.04 | 84372.82 | 140197.2 | 3436.25 | 29362.06 | 26681.2 | 76572.8 | 151968.62 | 3255 | 87101.56 | 0 | 907276.69 |
| 3 | කළුතර | 58240.32 | 91145.6 | 5674 | 10688.24 | 24051.6 | 49922.8 | 84127.44 | 4832.5 | 16473.73 | 16686.67 | 49244.8 | 95960.28 | 5316 | 56015.96 | 0 | 568379.94 |
| | | | | | | | | | | | | | | | | | |
| 4 | නුවර | 68023.8 | 106870.4 | 9067 | 10155.12 | 30420.48 | 62541.87 | 102841.68 | 9082.5 | 13267.8 | 28274.61 | 63044.8 | 123626.06 | 9802.5 | 71713.46 | 0 | 708732.08 |
| 5 | මාතලේ | 25595.28 | . 40449.5 | 2249 | 5529.08 | 9738.28 | 22047.41 | 37834.32 | 2430 | 5788.51 | 8856.12 | 25460.8 | 48089.74 | 3138 | 28961.66 | 0 | 266167.7 |
| 6 | නුවර එළිය | 44603.64 | 68362.84 | 142 | 2344.64 | 24261.04 | 39577.93 | 63881.04 | 697.5 | 2315.95 | 23973.04 | 34008 | 64551.66 | 591 | 38684.1 | 0 | 407994.38 |
| | | | | | | | | | | | | | | | | | 0 |
| 7 | මඩකලපුව | 36164.22 | 55280.68 | 9206 | 27.2 | 21544.44 | 32974.53 | 53381.64 | 8131.25 | 172.9 | 21729.89 | 26768 | 52347.7 | 6457.5 | 30448.6 | 0 | 354634.55 |
| 8 | අම්පාර | 35683.14 | 53171.3 | 13539 | 153.68 | 21131 | 29500.21 | 46774.2 | 11596.25 | 11097.45 | 8498.49 | 30347.2 | 53651.94 | 11867 | 30448.6 | 0 | 357458.96 |
| 9 | ත්‍රිකුණාමලය | 26650.92 | 41710.76 | 10788 | 286.28 | 15610.76 | 22661.17 | 36981.6 | 9547.5 | 4784.78 | 10267.53 | 25281.6 | 44023.58 | 11046 | 28757.82 | 0 | 288398.3 |
| | | | | | | | | | | | | | | | | | |
| 10 | යාපනය | 31242.84 | 47602.1 | 250 | 0 | 18636.08 | 33174.55 | 51799.32 | 287.5 | 0 | 22035.65 | 35142.4 | 66891.62 | 285 | 39974.48 | 0 | 347321.54 |
| 11 | මන්නාරම | 8593.32 | 13719.16 | 2339 | 820.76 | 4687.24 | 7854.21 | 11737.44 | 2051.25 | 1094.73 | 3921.19 | 7171.2 | 18475.82 | 1720.5 | 8157.24 | 0 | 92343.06 |
| 12 | වව්නියා | 12962.94 | 19787.04 | 874 | 0 | 3593.12 | 10992.88 | 15643.08 | 2537.5 | 142.87 | 7158.97 | 12107.2 | 23016 | 846 | 13771.94 | 0 | 123433.54 |
| 13 | මුලතිව් | 5403.6 | 8291.92 | 70 | 79.56 | 3143.64 | 4399.07 | 6983.64 | 110 | 93.73 | 2828.28 | 4192 | 8041.9 | 96 | 4768.4 | 0 | 48501.74 |
| 14 | කිලිනොච්චි | 8856.66 | 13892.06 | 200 | 0 | 5282.92 | 7773.38 | 12469.32 | 250 | 0 | 5163.34 | 5513.6 | 10823 | 300 | 6271.72 | 0 | 76796 |
| | | | | | | | | | | | | | | | | | |
| 15 | කුරුණෑගල | 85191.06 | 133884.66 | 6610 | 14770.96 | 36044.76 | 72536.02 | 119016 | 6268.75 | 17445.61 | 30735.25 | 77371.2 | 142474.52 | 8050.5 | 88009.74 | 0 | 838409.03 |
| 16 | පුත්තලම | 42868.56 | 67835.04 | 8577 | 4719.2 | 20851.52 | 39135.42 | 63940.32 | 8101.25 | 8427.51 | 17567.55 | 32872 | 62085.66 | 7795.5 | 37391.9 | 0 | 422168.43 |
| | | | | | | | | | | | | | | | | | |
| 17 | අනුරාධපුරය | 50033.46 | 78212.68 | 4542 | 24470.48 | 5374.04 | 42359.03 | 69006.48 | 4032.5 | 26853.19 | 1283.1 | 41675.2 | 74462.24 | 3918 | 47405.54 | 4657.5 | 478285.44 |
| 18 | පොළොන්නරුව | 22959.6 | 35440.86 | 2003 | 13695.2 | 0 | 19138.9 | 30802.8 | 1783.75 | 12712.7 | 0 | 18179.2 | 33978.74 | 1458 | 20678.84 | 0 | 212831.59 |
| | | | | | | | | | | | | | | | | | |
| 19 | බදුල්ල | 47185.74 | 75033.14 | 2279 | 694.28 | 27451.6 | 42680.98 | 69786.24 | 2248.75 | 1072.89 | 27277.25 | 43040 | 84438.58 | 2257.5 | 48958 | 0 | 474403.95 |
| 20 | මොණරාගල | 26784.3 | 41286.7 | 568 | 1759.84 | 14216.76 | 21302.13 | 36149.4 | 537.5 | 1706.25 | 12443.34 | 20740.8 | 40713.66 | 615 | 23592.66 | 0 | 242416.34 |
| | | | | | | | | | | | | | | | | | |
| 21 | ගාල්ල | 56893.98 | 81872.7 | 1652 | 1910.8 | 32025.96 | 49811.83 | 75411 | 10972.5 | 2275 | 30811.69 | 54955.2 | 99330.48 | 1401 | 62511.54 | 0 | 561835.68 |
| 22 | මාතර | 42048.9 | 65232.44 | 1342 | 1729.24 | 23352.56 | 37620.2 | 60887.4 | 1231.25 | 4474.47 | 20514.13 | 39507.2 | 76824.12 | 1297.5 | 44939.44 | 0 | 421000.85 |
| 23 | හම්බන්තොට | 32480.88 | 51678.9 | 708 | 4983.72 | 18030.88 | 28982.35 | 46963.44 | 617.5 | 5601.05 | 13650 | 29457.6 | 57731.8 | 364.5 | 33508.02 | 0 | 324758.64 |
| | | | | | | | | | | | | | | | | | |
| 24 | රත්නපුරය | 70356.24 | 109476.64 | 1908 | 9838.24 | 32128.64 | 59796.39 | 95917.32 | 1745 | 18604.04 | 21114.73 | 57134.4 | 110274.04 | 1972.5 | 64990.38 | 0 | 655256.56 |
| 25 | කෑගල්ල | 28318.74 | 44322.46 | 2823 | 843.2 | 16048.68 | 24424.36 | 41138.04 | 2533.75 | 5268.9 | 10954.58 | 26590.4 | 49881.7 | 2794.5 | 30246.58 | 0 | 286188.89 |
| | එකතුව | **1064437.38** | **1640016.56** | **96683** | **135122.12** | **499688.48** | **942750.43** | **1517403.84** | **100275** | **208431.86** | **417574.43** | **940185.6** | **1770201.66** | **91842** | **1065389.78** | **4657.5** | **10494659.64** |

## කිරි ගම්මාන වැඩසටහන : කුරුණෑගල දිස්ත්‍රික්කය
பால் கிராமம் வேலைத் திட்டம் :குருநாகல் மாவட்டம்
DAIRY VILLAGE PROGRAMME : KURUNEGALA DISTRICT

4762/'14

8. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු අශෝක් අබේසිංහ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு அசோக் அபேசிங்க சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Ashok Abeysinghe)
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කිරි ගම්මාන වැඩසටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ආරම්භ කර ඇති කිරි අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) දියර කිරි ප්‍රචලිත කිරීම සඳහා ආරම්භ කරන ලද ඉහත අලෙවිසැල් ක්‍රියාත්මක වීම පිළිබඳව පසු විපරම් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கால்நடை வளர்ப்பு, கிராமிய சன சமூக அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பால் கிராமம் வேலைத்திட்டத்தின்கீழ் குருநாகல் மாவட்டத்தில் தாபிக்கப்பட்டுள்ள கிராமங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) குருநாகல் மாவட்டத்தில் ஆரம்பிக்கப்பட்டுள்ள பால் விற்பனை நிலையங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) திரவப் பாலை பிரபல்யப்படுத்துவதற்காக ஆரம் பிக்கப்பட்ட மேற்குறிப்பிட்ட விற்பனை நிலையங்களின் செயற்பாடு தொடர்பான பின்னாய்வு செயற்றிட்டமொன்று நடை முறையில் உள்ளதா என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Livestock and Rural Community Development:

(a) Will he inform this House -

(i) the number of villages established in the Kurunegala District under the Dairy Village Programme;

(ii) the number of milk sales outlets that have been established in the Kurunegala District;

(ii) whether a follow-up review programme is implemented in regard to the operation of the aforesaid sales outlets which have been commenced to popularize liquid milk?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 139

(ii) 36

(iii) ඔව්.

(ආ) පැන නොනඟී.

## ආරක්ෂක අංශයේ නිලධාරින්: යෝග්‍යතා පරීක්ෂණ
பாதுகாப்புப் பிரிவு அலுவலர்கள் : தகைமைப் பரீட்சை
OFFICERS IN SECURITY DIVISIONS : FITNESS TESTS

4816/'14

9. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Nalin Bandara Jayamaha)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ජනාධිපති ආරක්ෂක අංශය, අගමැති ආරක්ෂක අංශය සහ ප්‍රභූ ආරක්ෂක අංශය තුළ සේවය කරන නිලධාරින් සඳහා යෝග්‍යතා පරීක්ෂණ පවත්වනු ලබන වයස් සීමාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වයස් සීමා කවරේද;

(iii) ඉහත යෝග්‍යතා පරීක්ෂණ කාලය අතරතුර මරණයට පත් වූ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iv) යෝග්‍යතා පරීක්ෂණ කාලය තුළදී, රෝගාතුර වූ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஜனாதிபதியின் பாதுகாப்புப் பிரிவு, பிரதம அமைச்சரின் பாதுகாப்புப் பிரிவு மற்றும் பிரபுக் களின் பாதுகாப்புப் பிரிவில் சேவையாற்று கின்ற அலுவலர்களுக்கான தகைமைப் பரீட் சைகள் நடத்தப்படுகின்ற வயதெல்லைகள் யாதென்பதையும்;

(ii) மேற்படி வயதெல்லைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி தகைமைப் பரீட்சைக் காலப்பகுதிக்குள் உயிரிழந்துள்ள அலுவலர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) தகைமைப் பரீட்சைக் காலப்பகுதிக்குள் நோய் வாய்ப்பட்டுள்ள அலுவலர்களின் எண்ணிக்கை யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු ජෝන් අමරතුංග මහතා]

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) the number of age limits at which the fitness tests are conducted for officers serving in the Presidential Security Division, the Prime Minister's Security Division and the VIP Security Division;

(ii) what those age limits are;

(iii) the number of officers who have died during the fitness test referred to above; and

(iv) the number of officers who have fallen sick during the fitness test?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 02යි.

(ii) අවුරුදු 40ට වැඩි හා අවුරුදු 40ට අඩු වශයෙනි.

(iii) නිලධාරින් 05දෙනෙකු මිය ගොස් ඇත.

(iv) නිලධාරින් 04දෙනෙකු රෝගාතුර වී පසුව සුවය ලබා ඇත.

(ආ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12-4959/'14-(1), ගරු නිරෝෂන් පෙරේරා මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14-5171/'14- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15- 3317/'12- (1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන දෙපාර්ශ්වයේම ගරු මැතිඇමතිතුමන්ලා ගැළපෙන ආකාරයට පැමිණ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රශ්න වටය විනාඩි 20න් අවසන්. ලෝක වාර්තාවක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා එයින් විනාඩි 15ක් ගත්තා. ඒකත් වාර්තාවක්.

ප්‍රධාන කටයුතු ආරම්භයේ යෝජනා පිළිබඳ දැනුම් දීම. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම- ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා - පැමිණ නැත.

පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම - ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා - පැමිණ නැත.

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු. අංක 1 යෝජනාව, ක්‍රීඩා අමාත්‍යතුමා.

## ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත : නියෝග
## விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டம்: ஒழுங்குவிதிகள்
## CONVENTION AGAINST DOPING IN SPORTS ACT : REGULATIONS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, 34 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 සැප්තැම්බර් 05 දිනැති අංක 1878/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.09.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියන්න කැමැතියි, අංක 1 යෝජනාව විවාදයකින් තොරව සම්මත කිරීමට එකඟතාවක් තිබෙන බව. - [බාධා කිරීමක්] We agreed to give another date for Item 1.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes, that is right.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
We agreed to that at the Meeting of the Committee on Parliamentary Business.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය විවාදයට ගැනීමට වෙන දිනයක් දීමට එකඟ වෙලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අද දින න්‍යාය පත්‍රයේ අංක 2 සිට 6 දක්වා පනත් කෙටුම්පත් දෙවන වර කියවීම - [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මම ඔබතුමා වෙත ප්‍රශ්නයක් යොමු කර තිබුණා. ඒ පිළිබඳව ගරු ලේකම්තුමා මා සමඟ දුරකථනයෙන් පවසා සිටියා. ලිඛිතව නම් තවමත් යමක් ලැබී නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාර්යාලයට ලිඛිතව දන්වා යවා තිබෙනවා. ඒක ලැබුණු බව ඔබතුමාගේ කාර්යාලයෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට දන්වා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනදාට ලේකම්තුමා මට මෙහෙදී ලබා දෙන නිසා මම හිතුවේ මෙහේදීම ලබා දෙයි කියලායි. කමක් නැහැ, කාර්යාලයට යවලා තිබෙනවා නම් හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ක්‍රිස් නෝනිස් මහත්මයාට පහර දීමක් සිදු වී තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, මූලාසනයේ තීන්දුව ඔබතුමා වෙත ලිඛිතව දැනුම් දී තිබෙනවා. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ප්‍රකාරව මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාට විමසිය හැකි ක්‍රමයක් තිබෙනවා. ඒ ආකාරයට Substantive Motion එකක් මඟින් එම යෝජනාව ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජෝන් අමරතුංග මහතා. [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ යෝජනාවේ තිබෙන දේවල් මොකුත් කියන්නේ නැතුව මම කථා කරන්නම් කෝ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එවූ යෝජනාවේ "මන්ත්‍රීවරයා" ලෙස සඳහන් වූ තැන් කිහිපයක් තිබෙනවා. ඒක මත මම එකඟ වෙනවා. නමුත් ගැහුවේ කව්ද කියලා මගේ යෝජනාවේ තිබෙනවා. එතකොට ඔහු මන්ත්‍රීවරයෙක් නම් විදේශ කටයුතු ඇමතිතුමාට කියන්න පුළුවන්, ඔහු මන්ත්‍රීවරයෙක්, ඒ නිසා නම කියන්න බැහැ කියලා. ක්‍රිස් නෝනිස් කියලා තානාපතිවරයෙකුට පහර දුන්නාට පස්සේ එසේ පහර දුන්නේ කව්ද කියලා මේ පාර්ලිමේන්තුවේදී අහන්න බැරි නම් මොකක්ද මේකේ තේරුම? මම අහලා තිබෙන්නේ ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරයෙක් එම තානාපතිතුමාට පහර දීලා තිබෙනවා, එසේ පහර දුන්නේ ඇයි, පහර දුන්නේ කවදාද, ඒ සඳහා ගත් ක්‍රියා මාර්ගය මොනවාද කියන එකයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ඔබතුමාට එය ඇසීමට ක්‍රමවේදයක් තිබෙනවා. එසේ ඇසිය හැකි

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

ක්‍රමවේදය භාවිත කරමින් ප්‍රශ්නය අසන ලෙස ඉතාම කාරුණිකව දන්වා සිටිනවා. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විජයදාස රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ සිටියා. නමුත් එතුමා සභාවට පැමිණීමට විනාඩියක් ප්‍රමාද වුණා. එම නිසා එතුමාට අද දින න්‍යාය පත්‍රයේ "ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා පිළිබඳ දැනුම්දීම" යටතේ ඇති අංක 01 දරන යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැන් ඒ අවස්ථාව පසු කරලා, වෙනත් යෝජනා ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාවත් පසු කරලායි තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, වෙනත් දිනයක යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Very sorry, we will take it up at the Party Leaders' Meeting. - [*Interruption*,] We cannot reverse.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

No, not merely reverse -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

No, we cannot. We have passed -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

You can take it up on a subsequent day. That is not a problem. We cannot allow him to raise it now. As per the usually adopted procedure, it is not possible to raise it now.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 2 සිට 6 දක්වා වූ පනත් කෙටුම්පත් දෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇමතිතුමා නැහැ. [බාධා කිරීම්] ඒකට මොකද කියන්නේ? [බාධා කිරීම්]

## මහනගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත

## மாநகர சபைகள் (திருத்தம்) சட்டமூலம்
MUNICIPAL COUNCILS (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[අ.භා. 1.25]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියැවිය යුතුය" යි යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද දින න්‍යාය පත්‍රයේ "යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු" යටතේ ඇති අංක 3 සිට 6 දක්වා වූ පනත් කෙටුම්පත් ද දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා. අදාළ පනත් කෙටුම්පත් පිළිබඳව ගරු ඉන්දික බණ්ඩාරනායක නියෝජ්‍ය අමාත්‍යවරයා කරුණු පැහැදිලි කරනවා ඇති.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[අ.භා. 1.26]

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත සහ නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා -[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන -[බාධා කිරීම්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is your point of Order, Hon. Anura Dissanayake?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළාට පස්සේ මේ පනත් කෙටුම්පතේ අරමුණු මොනවාද, මේ

පනත් කෙටුම්පතින් මොකක්ද කරන්නේ, අපේක්ෂාව මොකක්ද කියලා එතුමා අපට පැහැදිලි කරන්න ඕනෑ. එතුමා පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා කියලා වාඩි වෙනවා. මොකක්ද මේ කරන්නේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන ක්ෂේත්‍රයේ යම් යම් ප්‍රශ්න, ගැටලු ගණනාවක් නිර්මාණය වුණු ඉතිහාසයක් පසු ගිය කාලයේ තිබුණා. විශේෂයෙන්ම අපේ රජය පසු ගිය කාලයේ විපක්ෂය සහ අනිකුත් දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කරලා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ ගරු සභාවේ එකඟතාව මත මේ පනත් කෙටුම්පත සංශෝධනය කරන්නට මේ වන කොට අප කටයුතු කරමින් යනවා.

විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවල අපේ සභාපතිතුමන්ලාගේ කාර්ය භාරයන් ක්‍රියාත්මක කිරීමේදී පසු ගිය කාලය පුරාම යම් යම් ප්‍රශ්න -ගැටලු- ගණනාවක් නිර්මාණය වුණා. ඒ නිසාම ඒ ප්‍රාදේශීය සභා පවත්වාගෙන යාමේදී ප්‍රශ්න -ගැටලු- රාශියකට අපට මුහුණ දෙන්න සිදු වුණා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කියන්නේ අය වැය පරාජය වුණාම -[බාධා කිරීම්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
වාඩි වෙන්න, වාඩි වෙන්න.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පිළිබඳව අපේ අමාත්‍යාංශය දිගින් දිගටම සාකච්ඡා කරලා මේ සංශෝධන පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේකෙන් අපේක්ෂා කරන්නේ මොකක්ද? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කථා කරන්න.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ පළාත් පාලන ආයතනවල අය වැය පරාජයට පත් වුණාම ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් ඉවත් කරන්න කටයුතු කර ගෙන ආවා. අපි අද ඒ පිළිබඳව සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව - [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න කෝ. [බාධා කිරීම්]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ඔබතුමන්ලා පොඩ්ඩක් ඉන්න. තවම කථාව ඉවර නැහැ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කරුණාකර, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාල පරිච්ඡේදය පුරාම ප්‍රශ්න -ගැටලු- රාශියක් නිර්මාණය වීම හේතුවෙන් අපි අද මේ පනත් කෙටුම්පත හරහා සංශෝධන රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. පළාත් පාලන ආයතනවල අය වැය පරාජයට පත් වුණත් එහි සභාපතිවරයාට එම ප්‍රාදේශීය සභාවේ කටයුතු දිගටම පවත්වා ගෙන යන්න පුළුවන් ආකාරයට ඒ සංශෝධන අපි ඉදිරිපත් කර තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අයියෝ! එච්චරද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එච්චරද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට, ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා.

[අ.භා. 1.29]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව අතරමං වෙලා තිබෙන හැටි අපට පෙනෙනවා, අද මේ සංශෝධන ඉදිරිපත් කරන්න ඇමතිතුමාත් මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ නොමැති වීම තුළින්. මේක තමයි පාර්ලිමේන්තුවට වෙලා තිබෙන්නේත්; ආණ්ඩුවට වෙලා තිබෙන්නේත්. නියෝජ්‍ය ඇමතිතුමා මේ සංශෝධන සම්බන්ධයෙන් විස්තර කළ විධිය බැලුවාම එතුමා මේ පිළිබඳව මොකුත් දන්නේ නැහැ කියා අපට පෙනෙනවා. [බාධා කිරීමක්]

අපි පළමුවෙන්ම කථා කළ යුතු කරුණක් තිබෙනවා. පළාත් පාලන ආයතනවල අය වැය පැරදුණොත් ස්ථිර වශයෙන්ම

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

තිබුණේ දෙවරක් ඉදිරිපත් කිරීමෙන් පසුව එය සම්මත වූ හැටියට සලකනවා කියලායි. ඊට පස්සේ මේ පළාත් පාලන ආයතනවල කොට්ඨාස බෙදීමත්, ඡන්ද විමසීමත් කියන ඒ සංශෝධන ගෙනාවාට පස්සේ අද මේ සංශෝධනයට විශේෂයෙන් බලපාන පළාත් පාලන ආයතනයක අය වැය දෙපාරක් පරාද වුණොත් ඒ සභාපතිවරයා එයින් ඉවත් විය යුතුයි කියන දෙවැනි සංශෝධනය ඉදිරිපත් කළා.

අද ගෙනෙන සංශෝධනයෙන් කියන්නේ, -පනතේ ඒ වගන්තිය නැවත වරක් සංශෝධනය කරලා- දෙවන වරට ඉදිරිපත් කළ අය වැයක් පරාද වුණත්, ඒ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා ඉල්ලා අස් විය යුතු නැති බවත්, එම අය වැය සම්මත වූ හැටියට සලකන බවත්.

තමුන්නාන්සේලා එදා දෙවන සංශෝධනයෙන් ඉල්ලා සිටියේ, පළාත් පාලන ආයතනයක අය වැය දෙපාරක් පරාද වුණොත් එහි සභාපතිවරයා එම තනතුරෙන් ඉල්ලා අස් විය යුතු බවත්, වෙන කෙනෙක් පත් කළ යුතු බවත්. අද ඒකට තවත් අතිරේක සංශෝධනයක් ගෙනැත් තිබෙනවා. ඒ, 2002 අලුත් සංශෝධනය ගෙනැල්ලා, එය ගැසට් කරන්න ඉස්සෙල්ලා තිබුණු පරිදි, පළාත් පාලන ආයතනවල අය වැයක් දෙවන වරටත් පැරදුණත් ඒ අය වැය සම්මත වූවා සේ සලකනවා කියලායි. දැන් මෙතැන අවුල් ගොඩක්. පනත් කෙටුම්පතක් ගෙනෙන්න දන්නේත් නැහැ, පනතක් සංශෝධනය කරන්න දන්නේත් නැහැ, ඇති වුණු එකඟතාවලට ගරු කරන්න දන්නේත් නැහැ.

දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ නායකත්වයෙන් යුත් විශේෂ කාරක සභාවකට ගිහිල්ලා, අපි එකඟ වුණේ මොනවාටද? අපි එකඟ වුණේ අලුත් මැතිවරණ ක්‍රමයකට. පාර්ලිමේන්තුවට, පළාත් සභාවට, පළාත් පාලන ආයතනවලට අදාළ අලුත් මැතිවරණ ක්‍රමයකට. ඒක තමයි අපේ එකඟතාව. එහිදී අපි කොට්ඨාස බෙදීම පිළිබඳ ප්‍රධාන කාරණයකට එකඟ වුණා. පාර්ලිමේන්තු මැතිවරණයට යන්නේ කොට්ඨාස ක්‍රමයට කියලා. ඒක සියලු දෙනාම පිළිගත්තා.

දෙවන කරුණ හැටියට පළාත් සභා මැතිවරණයේදීත් කොට්ඨාස ක්‍රමයට යා යුතුයි කියලා එකඟ වුණා. ඒකත් පිළිගත්තා. පළාත් පාලන ආයතනවල මැතිවරණයේදීත් කොට්ඨාස ක්‍රමයට යා යුතුයි කියලා එකඟ වුණා. ඒකත් පිළිගත්තා.

ආණ්ඩුවට හදිසි නම් ඒක කරන ක්‍රමයකුත් තිබෙනවා. මේ සංශෝධනයේදී ආණ්ඩුව බලාපොරොත්තු වුණ ප්‍රධාන කරුණු දෙකක් මම කියන්න කැමැතියි. එක කාරණයක් තමයි, කොට්ඨාස ක්‍රමය. දෙවන කාරණය තමයි, අය වැය දෙවරක් පැරදුණොත් එම පළාත් පාලන ආයතනයේ සභාපති ඉවත් වෙනවාය කියන කාරණය. මේ කාරණා දෙක දිහා බලද්දී අපට පෙනෙනවා, එකිනෙකට ඇති නොගැළපීම් කීපයක්. මට පෙනෙන හැටියට අද ඉදිරිපත් කළ සංශෝධනයත් වැඩකට ඇති සංශෝධනයක් නොවෙයි.

මෙතැනදී පැහැදිලි කර ගන්න ඕනෑ කරුණු කීපයක් තිබෙනවා. සම්පූර්ණ මැතිවරණ ක්‍රමයට අත්හදා බැලීමක් ලෙස තමයි, පළාත් පාලන මැතිවරණ සංශෝධන පනත ගෙනැල්ලා කොට්ඨාස ක්‍රමය ක්‍රියාත්මක කරන්න සම්මත කර ගත්තේ. ඒ කොට්ඨාස ක්‍රමය එනකොට තමයි ඇත්තටම මේ පනතේ නියම අර්ථය ආවේ, සභාපතිවරයා අයින් විය යුතුයි කියලා දෙවරක් අය වැය පරාද වුණොත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ මේ ස්ථාවරය මොකක්ද කියලායි මා තමුන්නාන්සේගෙන් අහන්නේ. පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් මඟින් එකඟතාවකට ඇවිල්ලා, පාර්ලිමේන්තුවේ හැම දෙනාගේම එකඟත්වයෙන් සම්මත කරපු වැදගත් පනතක්, නැත්නම් සංශෝධනයක් කාටවත් නොකියා හදිසියේම වෙනස් කරන්නට තිබෙන වුවමනාව මොකක් ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධනය දෙස බැලුවොත් මෙහි කොට්ඨාස කැඩීම පිළිබඳව තිබෙනවා. දැන් ඒ කොට්ඨාස කඩලාය කියනවා. ඒ පිළිබඳ පරීක්ෂණ තිබ්බාය කියනවා. ඒ කරුණු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළාය කියනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? පළාත් පාලන මැතිවරණ තියන්නට ගැසට් නිවේදනය නිකුත් කරන්නට මේ රටේ බලය තිබෙන පුද්ගලයා හැටියට ජනාධිපතිවරයාට බැරි නම්, එයට ජනාධිපතිවරයා අපොහොසත් නම්, ඊළඟට තමයි අනෙක් කරුණු බලපාන්නේ. දැන් මූලික වශයෙන් කරන්න තියෙන්නේ මොකක් ද? මූලික වශයෙන් කරන්න තිබෙන්නේ, පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම සඳහා කොට්ඨාස ක්‍රමය ඇති කිරීමයි. මෙතැන කිසි ප්‍රශ්නයක් නැහැ. බොහොම ලෙහෙසියෙන් මේ ප්‍රශ්නය විසඳාගන්න තිබුණා, පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම කල් නොදැම්මා නම්. කල් නොදා, ඡන්ද විමසීම තිබ්බා නම් අලුත් ඡන්ද ක්‍රමයක් එන්නේ. -කොට්ඨාස ක්‍රමය - එතකොට අලුත් පළාත් පාලන ආයතනයක් බලයට එන්නේ. ඊළඟට තමයි අය වැය සම්මත වීම එන්නේ. ඉස්සර වෙලා කෙරෙන්නේ මේ දෙකෙන් මොකක්ද? එහෙම නම් අපට රජයෙන් අහන්නට තිබෙන්නේ තමුන්නාන්සේලා කොට්ඨාස ක්‍රමය ඇති කරන්න මේ සංශෝධන ගෙනාවේ ඇයි කියන එකයි. ඒ කොට්ඨාස ක්‍රමයේ සාර්ථකත්වය අනුව, ඊට පස්සේ තමයි අය වැය පිළිබඳ කාරණය එන්නේ. කොට්ඨාස ක්‍රමයට මැතිවරණය තියනවා නම්, ඒක තියන්න තිබුණේ පළාත් පාලන මැතිවරණය කල් දමලා නොවෙයි. දැන් පළාත් පාලන මැතිවරණය අවුරුද්දකින් කල් දාලා තිබෙන්නේ. ඇයි ඒ? මොකටද එහෙම කල් දැම්මේ? මේ ප්‍රශ්නය තමයි වැදගත්ම ප්‍රශ්නය හැටියට අපට මතු වන්නේ. මේ නිසාම තමයි තමුන්නාන්සේලා අද අතර මං වෙලා ඉන්නේ. තමුන්නාන්සේලා අද දේශපාලන වශයෙන් අතර මං වෙලා. හැම පළාත් පාලන ආයතනයකම වාගේ අය වැයෙන් ආණ්ඩු පක්ෂය පරාජයට පත් වුණා. ඒ පළාත් පාලන ආයතන ඇතුළේම සට්ටන ඇති වුණා. තමුන්නාන්සේලාට ඒවා බේරා ගන්න බැරිව ගියා. ඒකට විසඳුමක් වශයෙන් කරන්න තිබුණු හොඳම දේ තමයි, මේ සංශෝධන මොකුත් නැතිව පළාත් පාලන මැතිවරණය පවත්වන එක. නමුත්, තමුන්නාන්සේලා ඒ මැතිවරණ පැවැත්වූයේ නැහැ. මැතිවරණ පැවැත්වූයේ නැති නිසා ඇති වූ අවුල හැටියට ආණ්ඩුව දෙදරීමේ, කඩා වැටීමේ මූලික අවස්ථාව ලෙස ඒ පළාත් පාලන ආයතනවල අය වැය පරාජයට පත් වුණා. ඒ පළාත් පාලන ආයතනවල සභාපති එළවන්න, අය වැය පරාද කරන්න, එය අකර්මණ්‍ය කරන්න ඒ පළාත් පාලන ආයතනවලම සිටින ප්‍රගතිශීලී අදහස් දරන මන්ත්‍රීවරු එකතු වුණා. ඔවුන් එකතු වෙලා ඒ ආයතනවල අය වැය පරාද කළා. රටේ ප්‍රධාන පාලකයන්ට අකමැති නම්, ඒකට විසඳුම් වශයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රම දෙකක් තිබෙනවා. එකක්, මැතිවරණයකට යන එක. නැත්නම් දෝෂාභියෝගයක් ගෙනෙන එක.

මේ සංශෝධන ඒ දෝෂාභියෝගය ගෙනෙන එක නතර කරන්න තමුන්නාන්සේලා දරන වෑයමක්ද? මේ සංශෝධන ගෙන ඒම, ඒ සම්බන්ධයෙන් අපට කරන බරපතළ ඉඟියක් බවට පත් වනවා. පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් තමුන්නාන්සේලාගේම වුවමනාවට ගෙනාපු මේ සංශෝධනවලින් අද කියැවෙන්නේ අය වැය දෙකක් පරාද වුණත්, සභාපති ඉවත් වන්න ඕනෑ නැහැ කියන එක. මෙතැනදී අපට ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තුවත්, පළාත් පාලන ආයතනත් ගැන කථා කරන කොට විශේෂ කාරක සභාවේදී අපි ගත්ත ස්ථාවරය මොකක් වුණත්, තමුන්නාන්සේලා මේ තැන්වලින් ඉවත් වන්න කොහොමත් කල්පනා කරන්නේ නැහැ. ඒ නිසා අපට කරන්න තිබෙන්නේ මොකක්ද? බලහත්කාරයෙන් එළවන එක. වෙන

එකක් නැහැ. මේ පළාත් පාලන ආයතන ඇතුළේ වෙන්නේ මොකක්ද කියලා හදිසියේම හොයන්න තමුන්නාන්සේලාට ඇති වෙලා තිබෙන තත්ත්වය මොකක්ද? තමුන්නාන්සේලාගේ පළාත් පාලන ආයතන තමුන්නාන්සේලාටම පාලනය කර ගන්න බැහැ. ඒවායේ අය වැය ගෙනාවාම පරාද වනවා. එතකොට සභාපති තනතුරේ ඉන්න පුද්ගලයා ඒ තනතුරෙන් ඉවත් වෙලා මන්ත්‍රීවරයකු හැටියට ඉන්න ඕනෑ. නමුත් අය වැය පරාද වුණත්, ඒ තනතුරේ ඉන්න පුළුවන් විධියටනේ දැන් මේ සංශෝධනය ගෙනෙන්නේ.

2015 වසරේ අය වැය මේ මස 24 වැනි දා සිට සාකච්ඡා කරන්න කටයුතු යොදලා තිබෙනවා. ඒ අය වැය පරාද වුණත්, තමුන්නාන්සේලා ඉන්න ඕනෑය කියන එක නේද මේ සංශෝධනයෙන් කියන්නේ?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒකටත් පනතක් ගෙනෙයි. පරාද වුණාට කමක් නැහැ, බලයේ ඉන්න ඕනෑ කියලා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඒකටත් පනතක් ගෙනෙයි. පාර්ලිමේන්තුවේදී අය වැය පරාද වුණත්, ඒකටත් පනත් කෙටුම්පතක් ගෙනෙයි. යන්නේ නැහැ. මේක තමයි අද තිබෙන තත්ත්වය. එහෙම නම් කරන්න තිබුණේ වෙන ක්‍රමයක්. ඒ පළාත් පාලන ආයතනයේ වෙනම මැතිවරණයක් තියන්න පුළුවන්කම තිබුණා. ඒකට ඉඩ තිබුණා. අලුත් සංශෝධනය අනුව ඒකට ඉඩ තිබුණා. ඒක තමයි තමුන්නාන්සේලා කල් දැම්මේ. මේක පළාත් පාලන ආයතනවල තිබෙන එක කරුණක් විධියට විතරක් සලකන්න බැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ නායකත්වය යටතේ මෙහෙය වුණු ඒ කමිටුවේදී අප යෝජනා කළේ, කථා කළේ පාර්ලිමේන්තුව, පළාත් සභාව සහ පළාත් පාලන ආයතන කියන තුනේම මැතිවරණ ක්‍රමවල වෙනසක් ඇති කළ යුතු බවයි. උදාහරණයක් හැටියට, pilot project එකක් හැටියට තමයි අප පළාත් පාලන ආයතන ගත්තේ. දැන් තමුන්නාන්සේලා මොකක්ද කියන්නේ? ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙහෙය වුණු ඒ කමිටුවේදී ගත්ත ඒ තීරණයට තමුන්නාන්සේලා එකඟ වෙනවාද, නැද්ද? අපට අහන්න තිබෙන්නේ ඒකයි. මේක ක්‍රියාදාමයක එක අවස්ථාවක්. [බාධා කිරීමක්] මම අහන්නේ ඒකයි. මේ ක්‍රියාදාමයක එක අවස්ථාවක්.

ඊළඟට මේ සංශෝධනයෙන් තව කොටසක් ගේනවා. ඒකේ කියන්නේ, 2002 දී ගැසට් කරන්න පෙර තිබුණු ඒවා එහෙමම තිබෙනවා කියලායි. අර නීතියමයි කියන්නේ. දෙවරක් පරාජය වුණත්, ඒකේ සභාපති ඉන්නවා. ඒකයි දැන් තිබෙන්නේ. පළාත් පාලනය භාරව පළාත් සභාවේ සිටි කෙනෙක් හැටියට තමුන්නාන්සේටත් තේරෙනවා ඇති, මේ ආණ්ඩුවේ තිබෙන පරස්පර විරෝධය ගැන. අපට තේරෙන්නේ නැත්තේ ඒකයි. ඒකයි අද ඇමතිවරයා මෙතැනින් මඟ හැරියේ. වෙන කතන්දරයක් නිසා නොවෙයි. තමුන්නාන්සේලාට පළාත් පාලන ආයතනවලට යන්න බැහැ. ගියාම කෑ ගහලා කියනවා, ජනාධිපති මැතිවරණයට එන්න එපා, අපි විරුද්ධව වැඩ කරනවාය කියලා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன )
(The Hon. Lasantha Alagiyawanna )

ඔබතුමන්ලා ගමට ගිහින් අහන්න එපා යැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ඇයි, එහෙම නම් මේක වෙනස් කරන්නේ? පරාජය වුණොත් සභාපතිව අයින් කරන්න තිබුණු බලය තමුන්නාන්සේලා නැවත වරක් සංශෝධනය කරන්නේ ඇයි? ඒ කාරණය තමයි වැදගත් වන්නේ. අපට උත්තරය ඕනෑ ඒකටයි. එහෙම නම් අපට බලාපොරොත්තු වෙන්න සිද්ධ වෙනවා මේ ආණ්ඩුවේ කොයි වැඩ පිළිවෙළත් මේ වාගෙයි කියලා.

අනික් කාරණය මෙයයි. ගරු ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, මම දන්නේ නැහැ, එතුමා නොපැමිණියේ ඇයි කියලා. එතුමා නේ, උත්තර දෙන්න ඕනෑ. තමුන්නාන්සේ නොවෙයි නේ. [බාධා කිරීමක්] එතුමා එන කොට අප මේ කතන්දර අහලා ඉවරයි නේ. එතුමාගේ පුරුදු තැටිය ගහනවා, "බැහැ, බැහැ, බැහැ" කියලා. එච්චරයි නේ. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, එතුමාට පුළුවන් "බැහැ" කියන්න විතරයි. කවුරු කිව්වත්, "බැහැ" කියනවා. [බාධා කිරීමක්] හරි, මගේ කථාව අවසන් වුණාට පසුව උත්තර දෙන්න කියන්න කෝ. මේ ගැන පක්ෂ නායකයින්ගේ සාකච්ඡාවක් තිබුණා.

මේ කොට්ඨාස කැඩීම පිළිබඳව නීත්‍යානුකූල තත්ත්වයක් තිබුණත් ඒක වැරදියි කියලයි හැම පක්ෂයක්ම පිළිගෙන තිබෙනවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාත්, අප සියලු දෙනාත් එකඟ වුණා, ඒක අපටත් -දේශපාලන පක්ෂවලටත්- බලන්න දෙන්න කියලා. මේ කොට්ඨාස කැඩීම පිළිබඳව බලන්න දෙන්න, නීතිය අනුව දැන් ඒක සංශෝධනය කරන්න බැරි වුණත් ඒක හරිද වැරදිද කියලා අපට බලන්න දෙන්න කියා අපි ඉල්ලා සිටියා. ඒකටත් බැහැයි කියනවා. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා කියන කීමටත් තමුන්නාන්සේලා එකඟ වන්නේ නැත්නම් මේ ක්‍රියාත්මක වන්නේ කොහේ නියෝගයක්ද? මම හිතන විධියට මේක ඉතාමත්ම භයානක තත්ත්වයක්. ඒකත් යන්නේ අනෙක් පැත්තට. ආණ්ඩුව ගන්න තීරණ මොනවාද කියලා ඇමතිවරු දන්නේ නැහැ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා, බැසිල් රාජපක්ෂ ඇමතිතුමා, පළාත් පාලන ඇමතිතුමා ඔක්කොම අය ඉන්නේ එකම කැබිනට් එකේ නේ. එයින් එක්කෙනෙක් යෝජනා කරනවා "මේ කොට්ඨාස කඩපු එක, සීමා නිර්ණ කොමිසමේ ක්‍රියා පටිපාටිය අපට පිළිගන්න බැරි වෙන්න පුළුවන්, ඒක නිසා කරලා තිබෙන හැටි දේශපාලන පක්ෂවලට බලන්න ඉඩ දෙන්න" කියලා. ඒ ඉල්ලීමට ඔක්කොම එකඟ වෙන කොට ඇමතිතුමා බැහැයි කියනවා. ඉතින් ආණ්ඩුවක් ගෙන යන්නේ කොහොමද? මෙන්න මේ කාරණා ටික තමයි අපට මෙතැනදී විශේෂයෙන්ම මතක් කරන්න තිබෙන්නේ.

මෙයට සම්බන්ධ වන තවත් කාරණාවක් තිබෙනවා. ඒ පාර්ලිමේන්තුවේ අයිතිය පිළිබඳව. අය වැය ලේඛනයක් ඉදිරිපත් කළාම ඒක පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරන්න කාල සීමාවක් අපට තිබෙනවා. දැන් තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ මොකක්ද? ඒ කාල සීමාවත් අඩු කරලා. ඔක්තෝබර් මාසයේ 24වැනි දා අය වැය යෝජනා ඉදිරිපත් කරලා නොවැම්බර් මාසයේ 18වැනිදා වන විට ඡන්දයත් ගන්නවා. විවාද කරන කාලය - දින ගණන- අඩු කරලා ගරු හිටපු අගමැතිතුමනි. ඒ ක්‍රමය මොකක්ද? අය වැය ලේඛනය පිළිබඳව මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුවේදී ජනතාව වෙනුවෙන් තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න තිබෙන අයිතිය ආණ්ඩුවෙන් කප්පාදු කරලා. මේක කරන්න පුළුවන්ද? මේක කරන්න බැරි වැඩක්. අදත් අපේ Committee on Parliamentary Business රැස් වෙනවා. මම කියන්නේ ඒක නැවත සලකා බලන්න කියායි. මේ ගැන අපි ඇහුවාම කියා තිබෙන්නේ දින ගණන අඩු කළාට වෙලාව වැඩි කරලා තිබෙනවා කියලායි. එහෙම නම් වෙලාව වැඩි කරලා දවස් දෙකක් තුනක් එකට ඉඳ ගෙන ඔක්කොම ඉවර කරන්න පුළුවන්

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

නේ. එතකොට වැඩේ ඉවර නේ. එළිවෙන තෙක් කථා කරන්න. අපට මතකයි ආචාර්ය ඩබ්ලිව්. දහනායක මැතිතුමා එහෙම කළා. එළිවෙන තෙක් කථා කළා. වෙලාව නියමයකුත් නැහැ. ඉතින් ඒ වාගේ තත්ත්වයකටද මේ සූදානම් වන්නේ? අපි මේ ක්‍රමයට එකඟ වෙලා නැහැ. මම හිතන විධියට අපේ විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මේ ක්‍රමයට එකඟ වුණේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, අපි එකඟ වුණේ නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
විපක්ෂය එකඟ වන්නේ නැතිව, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද අනුව අය වැය විවාදයකදී කථා කරන්නට තිබෙන කාලය කෙටි කරන්නට තමුන්නාන්සේලා ක්‍රියා කරනවා නම්, ඒක බරපතළ වරදක්. මා පළාත් පාලන ආයතන පිළිබඳව කථා කරන අවස්ථාවේ මේ ගැන මතු කළේ ඒකයි. එතැනින් අයිතිය කපනකොට, ඒ අයිතිය මෙතැනිනුත් කපනවා. මේක තමයි දැන් තිබෙන තත්ත්වය, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක සෙල්ලමක්. ඕනෑ එකක් ඇහුවොත්, ඕනෑ ඕනෑ වෙලාවට, ඕනෑ ඕනෑ විධියට කථා කරන්න පුළුවන්.

අපි මේ සංශෝධන බලමු. තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙන අලුත් සංශෝධනය බැලුවොත්, එහි කියන්නේ මොකක්ද? "අන්තර්කාලීන විධිවිධාන - 178ආ. 212 අංක 21 දරන පළාත් පාලන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත පරිදි වූ නගර සභා ආඥා පනතේ 178අ වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන, පිළිවෙළින් 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත සහ 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව පැවැත් වූ ඡන්ද විමසීම්වල ප්‍රතිඵල ප්‍රකාර ස්ථාපිත කරනු ලැබූ නගර සභාවකට ඉදිරිපත් කරනු ලබන අයවැයකට හෝ පරිපූරක අයවැයකට අදාළ නොවිය යුතුය." ඒ කියන්නේ තමුන්නාන්සේලා වෙනස් කළ ඒ තමුන්නාන්සේලාගේ පනතට දැන් අලුත් සංශෝධනයක් ගෙනෙනවා, මේ පනත සම්මත වුණු දිනයට ඉස්සර තිබුණු පළාත් පාලන ආයතනවලට මේක බලපාන්නේ නැහැ යි කියලා.

මේක මොන විහිළුවක්ද? කල් දමන්නේ නැතිව දැන් මේ ඡන්දය පැවැත්වුවා නම් ඉවර නේ. ඇමතිතුමාගෙන් මට අහන්නට තිබෙන්නේ ඒකයි. [බාධා කිරීමක්] ඡන්දය කල් දමන්නේ නැතිව තිබුණා නම් මේ ප්‍රශ්නය ඉවරයි නේ. 2012 සංශෝධනයට අනුව තමයි මේ ඔක්කොම තිබෙන්නේ. ඡන්දය කල් දැමුව නිසා නේ මේ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙන්නේ. දැන් ඡන්දය කල් දැමුව නිසා පරණ කට්ටියත් ඉන්නවා; අලුත් කට්ටියත් ඉන්නවා. මේකයි වෙලා තිබෙන්නේ. හෙට ඡන්දය තියන්න කෝ. [බාධා කිරීමක්] ජනාධිපතිවරණ නොවෙයි. මේ පළාත් පාලන ආයතනවල කල් දැමුව ඡන්දය තියන්න. [බාධා කිරීමක්] ඔව්, ඡන්දය තිබුණා නම් මේ ප්‍රශ්නය ඉවරයි. ඇයි මේ හදිසිය? මේ හදිසිය තමයි, ජනාධිපති මැතිවරණයකට පළාත් පාලන ආයතනවල සහයෝගය තමුන්නාන්සේලාට ගන්න බැහැ. ඒ ගොල්ලන්ට පොරොන්දුවක් දුන්නා, "භය වෙන්න එපා" කියලා. මම දන්නවා කියපු හැටි. "අපිව නේ පරාද කරන්න හදන්නේ. දෙන්නම් වැඩේ" කියලා ඒ ගොල්ලන්ට එහෙම පොරොන්දුවක් දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාරණය තමයි අපට කියන්න තිබෙන්නේ. අපට ඒකට එකඟ වෙන්න බැහැ; එක්සත් ජාතික පක්ෂය හැටියට අපට ඒ කාරණයට එකඟ වෙන්න බැහැ. ඒක තමයි ඉදිරිපත් කරන්නේ තව සංශෝධන ගෙනැල්ලා.

Budget එක කියන දේ ලේසි පහසු කාරණයක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදී රාමුව පැවතී තිබෙන්නේ ඒක උඩයි. ඒ පැවතී තිබෙන ක්‍රමයත්, මන්ත්‍රීවරුන්ට තිබෙන අයිතියත් තමුන්නාන්සේලා කෙටි කරනවා නම්, අඩු කරනවා නම්, ඒක හොඳ දෙයක් නොවෙයි. කවුද මන්ත්‍රීවරුන්ව පත් කරන්නේ? මේ රටේ ජනතාව. මේ රටේ ජනතාවට කියන්න තිබෙන දේ තමයි දෙපැත්තේම මන්ත්‍රීවරු මෙතැනට ඇවිල්ලා කියන්නේ. අපව පත් කරපු මහ ජනතාවට තිබෙන අයිතිය, වෘත්තීය සමිතිවලට තිබෙන අයිතිය, ගොවි ජනතාවට තිබෙන අයිතිය තමයි මේ අඩු කරන්නේ. මෙවර අය වැය තුළ ඇති හොඳ හෝ නරක ගැන කථා කරන කොට, මීට පෙර ඉදිරිපත් කළ අය වැය කීපයක් අරගෙන ඒ කාරණාත් අපි සලකා බලලා, මෙම අය වැයෙන් ඒක ඉෂ්ට වෙලා තිබෙනවාද, නැද්ද කියලා බලලා, අලුතෙන් මොනවාද තිබෙන්නේ කියලා බලලා, මේ රටේ කම්කරු ජනතාව ඉල්ලන පඩි වැඩි වීම, රජයේ සේවකයන්ගේ ඒකාබද්ධ වැටුපට එල්ලා තිබෙන ඔක්කෝම එකතු කිරීම, ඒ ඔක්කෝම ගැන කථා කරනවා. ඒ අයිතිය තමයි තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේදී පාලනය කරන්නේ. ඒක තමයි මේකෙන් පැහැදිලි වෙන්නේ. ඒ කාරණා දෙකක්. එතකොට මොකද වෙන්නේ? තමුන්නාන්සේලාට හැම ප්‍රශ්නයක්ම විසඳන්න වෙලා තිබෙන්නේ, මේ රටේ ජනතාව පෙළපාළි ගිහින්, වැඩ වර්ජනය කරලා අසරණ වුණාට පස්සේ. අසරණ වුණාට පස්සේ.

අපි දැක්කා, ආරෝග්‍යශාලාවල තිබුණු ප්‍රශ්නය නොවිසඳපු නිසා, තමුන්නාන්සේලා කල් දාලා, කල් දාලා ඉදිරියට ගෙන ගිය නිසා ලෙඩ්ඩු කී දෙනෙකු මැරුණා ද කියලා. මේක තමයි තමුන්නාන්සේලාගේ දර්ශනය. මේවා වෙනස් කරන්න ඕනෑ. අද රේල්ලුවේ වැඩ වර්ජනයක්. කාටද ප්‍රශ්න තිබෙන්නේ? උඹලා ඕනෑ එකක් කර ගනිල්ලා කියලා ආණ්ඩුව බුදිය ගෙන ඉන්නවා. අපට වාහන තිබෙනවා. අපට පහසුකම් තිබෙනවා. අපට හොඳ සපත්තු තිබෙනවා. ඒක තමුන්නාන්සේලාගේ මතය. නමුත් රටේ ජනතාවට? හිටපු ගරු අගමැතිතුමනි, දැන් දුම්රිය strike එක යනවා. කාටද පාඩුව? Highways තිබෙන නිසා සල්ලි තිබෙන මිනිසුන්ට කාර් එකේ ගිය හැකියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
අද කාල වෙලාව ඉතුරු වුණු නිසා මට තව විනාඩි කීපයක් දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
විපක්ෂයේ සංවිධායකතුමා මොකද කියන්නේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
We will give him another five minutes. I will adjust it from the time allotted to others.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වැඩිපුර කාලය ගන්නේ නැහැ.

මේ පාර්ලිමේන්තුවේ තිබෙන අයිතිය නැති කරනවාය කියලා කියන්නේ, අර එළියේ වැඩ කරන ජනතාවගේ අයිතිය නැති කරන එකයි. රේල්ලුවට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ මුදල් ප්‍රමාණවත්ද, ඒකේ යකඩ හොරකම් කළේ කවුද, ඇමතිවරුද හොරකම් කළේ කියන කරුණු සම්බන්ධයෙන් කථා කරන්න තිබෙන අයිතිය කෙටි කිරීමක් තමයි කරන්නේ. මේක තමයි ප්‍රධාන කාරණය. හරියටම මේ වාගේයි. ජනතාවගේ පැත්තෙන් ජනතාව පළාත් පාලන ආයතනයට දෙන තීන්දුව පිළිගන්නේ නැහැ. Budget එක පරාජය වුණොත් පිළිගන්නේ නැහැ. "අපේ මිනිහා කර ගෙන පලයන්. ජනාධිවරණයට වැඩ කරපන්" කියන එක තමයි තීන්දුව වන්නේ. ඒ වාගේම තමයි මේ අය වැය ඉදිරිපත් කරමින් තමුන්නාන්සේලා කරන්නේ.

රටේ තිබෙන දැවෙන ප්‍රශ්නවලින් දුක් විඳින්නේ මේ රටේ මහ ජනතාවයි, තමුන්නාන්සේලාත් එක්ක; වෙනත් කවුරුවත් නොවෙයි. බැණුම් අහන්නේත් තමුන්නාන්සේලායි. අපට කථා කරන්න නොදුන්නාම අපිත් බැණුම් අහනවා. එවැනි භයානක තත්ත්වයන් කොපමණ ඇති වුණාද? විශ්වවිද්‍යාලවල කොපමණ ප්‍රශ්න ඇති වුණාද? ඒවා ඇති නොවිය යුතු දේවල්. ඒවා විසඳන්න පුළුවන්කම තිබුණු දේවල්. රජය ඒවා ගණන් ගත්තේ නැහැ. රජය "ඕන එකක්, ඔහේ තිබුණාවේ" කියා ඉන්නවා. මේක තමයි රජය ගිය ගමන් මාර්ගය.

දුම්රිය වැඩ වර්ජනය බලන්න. ඒ අය කොපමණ කාලයක් අයිතිවාසිකම් ඉල්ලුවා ද; කථා කළා ද; සාකච්ඡා කළා ද? ඒ අයට ඉඩක් දුන්නේ නැහැ. ඒ නිසා ඔවුන් වැඩ වර්ජනයකට ගියා. වැඩ වර්ජනය කරනකොට තැළෙන්නේ කවුද? තමුන්නාන්සේලා නොවෙයි. හිතන්න එපා, මේ විධියට ආණ්ඩුවක් ඉදිරියට ගෙන යන්න පුළුවන්ය කියා.

මේ සම්බන්ධයෙන් කථා කරන්න අපේ තවත් ගරු මන්ත්‍රීතුමන්ලා සිටින නිසා මං මීට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ. තමුන්නාන්සේලා 2012 වර්ෂයේ සංශෝධනයක් ගෙනාවා. ඒක නැවත වෙනස් කළා. ඊට පස්සේ නැවතත් වෙනස් කරනවා. පාර්ලිමේන්තුවේදී මේ හැම බහුබූතයකටම ඡන්දය දෙන්න එක්සත් ජාතික පක්ෂය නිවට වන්නේ නැහැයි කියා මා ප්‍රකාශ කරන්න කැමැතියි.

[අ.භා. 1.54]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු කථානායකතුමාගේ කථාවෙන් පසු වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මා ස්තුතිවන්ත වනවා.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is your point of Order?

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය පක්ෂ නායකතුමන්ලාගේ සාකච්ඡාවේදී එකඟ වුණේ, දැනට න්‍යාය පත්‍රයට අනුව ඇතුළත් කර තිබෙන **පළාත් පාලන ආයතන පිළිබඳ සංශෝධන පනත් කෙටුම්පත** පිළිබඳව අද විවාදයක් කරන්නයි. දැන් ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා විවාදය ආරම්භ කළා. විවාදය ආරම්භ කළාට පස්සේ, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණු සංශෝධනයට අමතරව තවත් සංශෝධන හතරක් දැන් ගෙනැවිත් භාර දුන්නා. දැන් ඉදිරිපත් කරපු සංශෝධන ගැන විවාද කරන්න, පාර්ලිමේන්තුවේ සලකා බලන්න අපි එකඟ වෙලා නැහැ. ඒ නිසා කලින් සඳහන් කරපු පනතේ තිබෙන ආකාරයට විවාදයක් කරලා ඡන්දයකට යන්න පුළුවන්. නමුත් අද මේ මොහොතේ ඉදිරිපත් කරපු සංශෝධන 4 සම්බන්ධව විවාදයක් පවත්වන්නවත්, ඒ පිළිබඳව ඡන්දයක් පවත්වන්නවත් මේ ගරු සභාවට අයිතියක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, රජයට Committee Stage Amendments ගෙන ඒමේ අයිතියක් තිබෙනවා. ඉදිරිපත් කර තිබෙන්නේ Committee Stage Amendments නම්, ඒවා ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංශෝධන ගෙන ඒමට තිබෙන අයිතිය මම පිළිගන්නවා. නමුත් ඉදිරිපත් කරපු සංශෝධනයට වඩා ගැඹුරට යන බරපතළ සංශෝධනයක් තමයි මේ මොහොතේ ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා පනතේ මූලික හරයටම කිඳා බහින නීතිමය ප්‍රශ්නයක් මෙතැන තිබෙනවා. ඒ නිසා මා කියන්නේ, ඉදිරිපත් කර තිබුණු සංශෝධනයට වඩා බරපතළ කාරණයක් මෙයින් මතු වන නිසා කරුණාකර මේ පිළිබඳ විවාදය වෙනත් දිනයකට කල් දමලා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, if those come within the Committee Stage Amendments, the Chair will have to allow them. If not, we can take it up at the Party Leaders' Meeting.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ඒ සංශෝධනය තුළට එන එකක් නොවෙයි. ඒකෙන් පරිබාහිරවයි මෙය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා (පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா - உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர்)
(The Hon. A.L.M. Athaullah - Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Party Leaders' Meeting එක කැඳවලා එහිදී එකඟ වූ කාරණය අනුව තමයි මේ සංශෝධනය එවා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නැහැ, නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ඔව්, ඔව්.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ කාරණය අනුව තමයි ගරු ඇමතිතුමා. එතැන මමත් සිටියා. නමුත්- [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට කථා කරන්න ඉඩ දෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමා යම්කිසි කාරණාවක් කිව්වා. ඒ පිළිබඳව ඔබතුමා අදහස් දක්වා තිබෙනවා. ගරු විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාට ඕනෑ නම් කාරක සභා අවස්ථාවේදී යළිත් ඒ කාරණය නගන්න පුළුවන්. මම පළමුවෙන්ම කියනවා, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය ගරු අතාවුල්ලා අමාත්‍යතුමාත් අපත් විරුද්ධ පක්ෂයේ ඉල්ලීම පරිදි පෙරේදා සාකච්ඡාවක් පැවැත්වූ බව. සියලු පක්ෂ නායකයෝ ඒ සාකච්ඡාවේ සිටියා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා, අපේ හිටපු කථානායක ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා ඇතුළු අපි සියලු දෙනා එයට සහභාගි වුණා. එතැනදී අපි සාකච්ඡා කරලා එකඟතාවකට ආවා. මේ පනත පැරණි සභාවට පත් වූ මන්ත්‍රීවරුන් සිටින සභාවලට පමණක් බලපාන ලෙස සංශෝධනය කළ යුතුය කියලා. ඒ අනුව-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Sir, I rise to a point of Order.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කථා කරලා ඉවරයි නේ. දැන් මට කථා කරන්න ඉඩ දෙන්න කෝ. I am on my feet. You uttered so many words which we did not challenge.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Joseph Michael Perera, what is the point of Order?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I am on my feet; allow me to speak.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
එවැනි එකඟතාවකට -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I am sorry, Hon Member, that is not a point of Order.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
Why not? He said that we agreed.- [*Interruption.*]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Yes, we agreed. Why do you not listen to what I am trying to say, without jumping in? Sir, I very clearly stated that we agreed. What did we agree to? We agreed to communicate. - [*Interruption.*] Please listen; I am on my feet. අර්ථයක් ඇතිව ඕනෑ, කථා කරන්න. තමුන්නාන්සේලාට වැරදුණාම - [බාධා කිරීමක්] තමුන්නාන්සේ වරද්දාගෙනයි දැන් කථා කරන්නේ. [බාධා කිරීමක්] රටේ ලෝකයේ දේවල් කථා කළා. මේ කාරණය කථා කළේ නැහැ. [බාධා කිරීමක්] මමයි කථා කරන්නේ හිටපු ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉඳගන්න. ඔබතුමා හිටපු කථානායකතුමෙක්. සභාවේ ගෞරවය - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
If there is any issue, you can take it up at the Party Leaders' Meeting.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව අපි රැස් වුණා. රැස් වෙලා අපි සාකච්ඡා කළා. එහිදී විරුද්ධ පක්ෂය යම් යම් අදහස් ප්‍රකාශ කළා. ඒ අනුව අපි එකඟතාවකට පැමිණියා. ඒ එකඟතාවේදී ගරු ඇමතිතුමාගෙන්ඉල්ලුවා, මේ සංශෝධනයට තව සංශෝධනයක් ඉදිරිපත් කරන පනත් කෙටුම්පත අද දින විරුද්ධ පක්ෂයට බාර දෙන්නය කියා. ඒක අද විරුද්ධ පක්ෂයට බාර දුන්නා. "නැහැ" කියන්න එපා. ඒක ඔබතුමන්ලා පිළිගන්නවාද නැද්ද කියන එක ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක්. අප එකඟ වුණු පරිදි ඇටෝර්නි ජනරාල්වරයා, නීති කෙටුම්පත් නිලධාරිතුමියගේ සාකච්ඡාවෙන් පසුව ගරු ඇමතිතුමා ඒක ඔබතුමන්ලාට එවා තිබෙනවා. [බාධා කිරීමක්] ඉන්න කෝ. පාර්ලිමේන්තුවට අපි ඒක ඉදිරිපත් කර තිබෙනවා. ඒක ඔබතුමන්ලා පිළිගන්නවාද නැද්ද කියන එක ඔබතුමන්ලාගේ කාරණාවක්. නමුත් අපි එකඟතාවකට පැමිණි බව ඔබලාට කිසි ලෙසකින් නැහැ කියන්න බැහැ. මේක විරුද්ධ පක්ෂයේ හැටි. එක මතයක් නැහැ, මත 5ක් රණ්ඩු වෙනවා. මත 5ක් රණ්ඩු වන නිසා තමයි මේ සම්බන්ධයෙන් එක තීරණයක් ලබා දෙන්න බැරි. මා කනගාටු වෙනවා විරුද්ධ පක්ෂය පිළිබඳව. මා කනගාටු වෙනවා හිටපු ගරු කථානායකතුමා ගැන. ඇයි මම කනගාටු වෙන්නේ?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නැහැ. මට හැමදාම කියනවා, මම බොරු කියනවා කියලා. ඔබ කිව්වේ බොරුවක්ද ඇත්තක්ද කියලා දැන් අහගන්න. මේක අහගන්න. [බාධා කිරීමක්] ඔබතුමා කියන්නේ බොරුද ඇත්තද කියලා අහගන්න. පළාත් පාලන පනත සංශෝධනය කරන ලද්දේ අපේ,-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. John Amaratunga, what is your point of Order?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

අපි සාකච්ඡාවක් පවත්වපු එක ඇත්ත. එතැනදී අපි කිව්වේ මේ සංශෝධන අපේ කණ්ඩායම් රැස්වීමට ඉදිරිපත් කරලා අනුමත කරන්න ඕනෑ කියන එකයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

That is not a point of Order. You can take it up at the Party Leaders' Meeting.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Yes, I said we will have to take this up at our Group Meeting and get the approval.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

You can take it up at the Party Leaders' Meeting.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මේවා ආවේ දැනුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Wijeyadasa Rajapakshe, I know you are a very senior counsel, but please listen to me also. You are not correct. You cannot say එකඟතාවක් වුණේ නැහැ. I repeat the word "එකඟතාව". එකඟතාවකට පැමිණියා. ඒ එකඟතාව අනුව තමයි ගරු ඇමතිතුමා මේ draft එක හදලා අද උදේ ඔබතුමන්ලාට එව්වේ. ඔබතුමන්ලාට එව්වේ නැහැ කියලා කියන්න පුළුවන්ද? ඒක ඔබතුමන්ලාට එව්වා. පෙරේදා ඇති වුණු එකඟතාව අනුව තමයි ඒක එව්වේ. බොරු කියන්න එපා. ඔබතුමන්ලා ඒක පිළිගන්නවාද නැද්ද කියන එක ඔබතුමන්ලාගේ ප්‍රශ්නයක්. [බාධා කිරීම්] මට කථා කරන්න දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

බොරු කාරයෝ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

බොරු කියන්න පුරුදු වෙලා හැම තිස්සේම බොරු කියනවා. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Azwer, please do not disturb.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

සත්‍යයක් කථා කරන කොට විරුද්ධ පක්ෂය එය වසන් කිරීමට උත්සාහ කිරීම ගැන මම පුදුම වෙන්නේ නැහැ. මේ පනත මුලින් ගෙනාපු අවස්ථාව මට මතකයි. මම සභා ගර්භයේ එහා පැත්තේ සිටියේ. අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ආදරණීය පියා පළාත් පාලන ඇමතිවරයා හැටියට මේ පළාත් පාලන පනත් සියල්ල සංශෝධනය කළා. ඒ අනුව ප්‍රාදේශීය සභා පනතක් ඇති කළා. ඒ ප්‍රාදේශීය සභා පනතේ 169වැනි වගන්තිය කියවන්න. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබයි අපයි එදා ඒ පැත්තේ සිටියේ. මේ පනතේ 169වැනි වගන්තිය යළිත් ක්‍රියාත්මක කිරීමට තමයි අපි මේ සංශෝධනය ගෙනෙන්නේ. [බාධා කිරීමක්] ඔහොම ඉන්න කෝ. පොඩ්ඩක් අහගන්න. ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමනි, එදා ඔබත් අත උස්සලා ඡන්දය දුන්නා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත්, ඔබතුමාත් දෙදෙනාම එදා අත උස්සලා ඡන්දය දුන්නා මට මතකයි. මම විරුද්ධව ඡන්දය දුන්නා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඔහොම ඉන්න කෝ. කියන දේ අහගන්න. මේ පනතේ 169වැනි වගන්තියෙන් කියන්නේ මොකක්ද? "වරක් අය වැයක් පැරදුණොත්, එය සති දෙකක් තුළ දෙවැනි වරට ඉදිරිපත් කිරීමට හැකියි. දෙවැනි වරට පරාජය වුණොත් ඒ අය වැය ලේඛනය සම්මත වූවා සේ සලකනවා." මෙන්න ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා ලංකාවේ පළාත් පාලන නීතියට එකතු කරපු වගන්තිය. දැන් තිබෙන ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, මේ නීතිය යටතේ අපි ඡන්දය පවත්වලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ අපි ඔක්කෝම එකතු වෙලා අලුතින් පනතක් හැදුවා. ඒ පනත යටතේ තවම ඡන්දයක් තියලා නැහැ. මේ පනතේ අඩු පාඩු තිබෙන බව මැතිවරණ කොමසාරිස්තුමාත් කිව්වා. ගරු රනිල් වික්‍රමසිංහ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මැතිතුමා මේ කාරණය පිළිබඳව මීට මාස හතකට ඉස්සෙල්ලා පාර්ලිමේන්තුවේදී ඇහුවා. ඒ අනුව අපි සංශෝධනයක් ගෙනාවා. මොකද, යූඑන්පී එකට බැහැ පුරප්පාඩු පුරවා ගන්න; අපට බැහැ පුරප්පාඩු පුරවා ගන්න. ඒ නිසා මැතිවරණ කොමසාරිස්තුමා අර්ථ නිරූපණයක් දීලා කිව්වා, පරණ පනත යටතේ පත් වූ සභාවල පුරප්පාඩු අලුත් පනත යටතේ පුරවන්න බැහැ කියලා. මොකක්ද අපි කළේ? අපි දෙගොල්ලන් හදිසියේ සංශෝධනයක් සකස් කර ඒ සංශෝධනය සම්මත කර ගත්තා. හදිසියේ යමක් කරන්නේ යම් කිසි අඩු පාඩුවක් නිවැරදි කිරීම සඳහා පමණයි කියන කාරණය ගරු ඇමතිතුමා එදාත් මේ සාකච්ඡාවේදී කිව්වා. ඉදිරියේදී කොට්ඨාස ක්‍රමය යටතේ පත් වන පළාත් පාලන ආයතනයන් සඳහා මේ වගන්තිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියන සංශෝධනයයි අද අපි ඉදිරිපත් කරන්නේ. ඉතින් මේකේ වැරැද්ද මොකක්ද? ඔබලා හදපු පනතේ තිබෙන්නේ ඒක නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ඒක නේ වෙනස් කළේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක වෙනස් කළාට, මීට විනාඩි 10කට කලින් ඔබතුමා කිව්වා, ඒක අනාගතයේ කොට්ඨාස ක්‍රමයට- [බාධා කිරීමක්] කොට්ඨාස ක්‍රමය යටතේ තවම ඡන්දයක් පැවැත්වුවේ නැහැ නේ? ඒ ඡන්දයට අපි ලැහැස්ති වෙනවා. එදාට ඔබතුමන්ලාට පරාජය අත් වෙනවා. ඒ ගැන සැකයක් නැහැ. නමුත් ප්‍රශ්නය මේකයි. දැන් කොට්ඨාස ක්‍රමය යටතේ ඡන්දය පවත්වන්න, ඇමතිතුමාට ලැබුණු බලතල අනුව ඇමතිතුමා කොමිෂන් එක පත් කරලා කොට්ඨාස වෙන් කිරීමේ කටයුතු කරගෙන යනවා. ඒ නිසා 1987 දී ඇති කරන ලද සංශෝධනය ප්‍රකාරව තමයි මේ පනතට සංශෝධනයන් ඉදිරිපත් වෙන්නේ.

ලංකාවේ පළාත් පාලන ක්‍රමයේ ස්ථාවරභාවයක් අවශ්‍යයි. ලංකාවේ පළාත් පාලන ක්‍රමයට විවෘතභාවයකුත් අවශ්‍යයි. ලංකාවේ පළාත් පාලන ඡන්ද ක්‍රමය ජනතාවට වඩාත් කිට්ටු කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා අලුත් පනතක් පාර්ලිමේන්තුවේදී සම්මත කරන්න ආශිර්වාදය දුන්නා. ඒ අනුව අපි කොට්ඨාස ක්‍රමය යටතේ මේ රටේ පළාත් පාලන ක්‍රමය වෙනස් කළා. කවුද මේක කළේ? අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව. යූඑන්පී ආණ්ඩුව මොකද කළේ? කොට්ඨාස ක්‍රමය නැති කරලා අනුපාත නාඩගම ඇති කළා. ඔව්, අනුපාත, මනාප නාඩගම ඇති කළේ එක්සත් ජාතික පක්ෂයේ මැතිවරණ නීතියෙන්. අපි නොවෙයි ඇති කළේ. අපි කවදාවත් එහෙම නීතියක් ගෙනාවේ නැහැ. වැඩේ වරද්දාගෙන, දැන් තේරිලා තිබෙනවා වැඩේ වැරදුණා කියලා. කවුද කොට්ඨාස ක්‍රමය නැති කළේ? කොට්ඨාස ක්‍රමය නැති කළේ එක්සත් ජාතික පක්ෂයේ මෝඩ ආණ්ඩුව. මොකද, මෝඩකම කියලා කියන්නේ? අනුපාත ක්‍රමය යටතේ හැම දාම බලයේ ඉන්න පුළුවන් කියලා ඔවුන් හිතුවා. වැඩේ වැරදුණා, 1994 දී. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජීවතුන් අතර ඉන්නවා නම් මට කියපු කථාවක් ඇත්ත කියලා කියාවි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කිව්වා, "I never thought the PR system can defeat the UNP" කියලා. That is why the UNP passed the PR system.

ඩිව් ගුණසේකර මැතිතුමා ඉන්නවා. අපි පැරැණි අය. අප දේශපාලන ලෝකයේ ජීවතුන් අතර ඉන්න නිසා ඔබතුමන්ලාගේ බොරුව එළිදරව් කිරීමට පුළුවන්. අපේ හිටපු අග්‍රාමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමාට මතකයි, ඒ කාලයේ මේ පනත් කෙටුම්පත් සම්මත වනවා. හොර ඡන්ද නැවැත්වීම සඳහා ජාතික හැඳුනුම් පත අනිවාර්ය කරන පනතක් අප ගෙනාවා. ඒක ඉස්සෙල්ලා නීතියෙන් අයින් කළේ කවුද? එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව. කලින් මැතිවරණ නීතිය යටතේත් තිබුණා, මේ හැඳුනුම් පත අනිවාර්ය කටයුත්තක් කියලා. කවුද ඒක අහෝසි කළේ? තමුන්නාන්සේලා. ඒක අහෝසි කළේ හොර ඡන්ද දාන්න. තමුන්නාන්සේලා හොර ඡන්ද දාන්න පුළුවන් කියලා ඒක අයින් කළා. අප ඒ නීතිය ආපසු ගෙනාවා. අවුරුදු ගණනාවක් රණ්ඩු කරලායි ගෙනාවේ. දැන් identity card එක යටතේ ලංකාවේ ඡන්ද දායකයින්ගේ නම් ගම් ඇතුළත් දත්ත පරිගණකයේ එකම ලේඛනයක ඇතුළත් කරනවා. අප එකතු වෙලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමු, මගේ මිත්‍ර ගරු ජෝන් අමරතුංග විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

මම තව එක කාරණයක් පමණක් සිහිපත් කරලා මගේ කථාව අවසන් කරන්නම්. මේ පළාත් සභා ක්‍රමයටත් පැටවූ ගහන්නා සේ මන්ත්‍රීවරු ඇති කිරීමට පුළුවන්කම තිබුණා. මගේ සභාපතිත්වයෙන් තිබුණු කොමිටිය එදා මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනාවා. ඔබතුමාගේ අග්‍රාමාත්‍යතුමා ඒක පිළිගත්තා. එදා විපක්ෂ නායකතුමා හැටියට හිටියේ මහින්ද රාජපක්ෂ මැතිතුමායි. අප ඒකාබද්ධව ඒ යෝජනාව සම්මත කළා. ඒ යෝජනාව සම්මත නොකරන්න පළාත් සභා මන්ත්‍රීවරු ප්‍රමාණය සියයක්, එකසිය පනහක් දක්වා මේ වන කොට වැඩි වෙනවා. අප ඒක තිබුණු තැන නැවැත්වූවා. ඒක ගෙනෙන්න සිද්ධ වුණේත් -

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඇමතිවරු නම් පැටවූ ගහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා අපත් එක්ක හිටපු කෙනෙක් නේ. මම ඒ ගැන මොනවත් විජයදාස රාජපක්ෂ මන්ත්‍රීතුමාට කියන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි,- [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ඔහොම ඉන්න කෝ. [බාධා කිරීමක්] ඔබතුමාගේ ආදරණීය පියාත් සිහිපත් කළේ ඒකයි.

**ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
සංසුන් වෙලා කථා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, කිසිම නොසංසුන් භාවයක් නැහැ. නොසංසුන් වූ අය සභා ගර්භයෙන් පිටව ගොස් ඇත. මා නොසංසුන් වූයේ නැහැ.

අපි යම් යම් නීති-රීති වෙනසකට ලක් කර තිබෙනවා. ඒ යෝජනාව යටතේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුයි කියලා ඒ විශේෂ කාරක සභාව නිර්දේශ කළා. ඒ විතරක් නොවෙයි. මැතිවරණ ක්‍රියාදාමයට ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීම අවශ්‍ය බව අපි නිර්දේශ කළා. ඒ වාගේම දේශපාලන පක්ෂ පිළිගැනීම හා අවලංගු කිරීම ගැන නව නීතියක් අවශ්‍යයි කියන එකත් අපි

පාර්ලිමේන්තුවේ සම්මත කළා. ඒ වාගේම විද්‍යුත් ඡන්ද ගණක යන්ත්‍රය හඳුන්වා දීම අපි යෝජනා කර තිබෙනවා. ඒක මැතිවරණ කොමසාරිස්ට තිබෙන වග කීමක්. අද මේ electronic voting ඉන්දියාව පුරා සිද්ධ වෙනවා; බංග්ලාදේශයේත් සිද්ධ වෙනවා; හැම රටකම සිද්ධ වෙනවා. අපි එකහයි, මැතිවරණ කොමසාරිස්තුමාට යම් කිසි කාලයක් ලබා දීලා ඡන්ද දායකයන්ට මේක හඳුන්වා දීලා, වියදම අඩු කර ගෙන මේ කටයුත්ත කරන්න. ඒ වාගේම ඡන්ද බලය හා මැතිවරණ පිළිබඳ ස්ථාවර කාරක සභාවක් පාර්ලිමේන්තුවේ ඇති කළ යුතුයි කියලාත්, තැපැල් ඡන්ද ක්‍රමයේ යම් යම් වෙනස්කම් ඇති කළ යුතුයි කියලාත් අපි යෝජනා කළා. මා මේ අවස්ථාවේ විශේෂයෙන් ගරු ඇමතිතුමාටත් සඳහන් කරන්න කැමැතියි, ආබාධිතවූවන්ගේ ජාතික සම්මේලනය, ඉදිරියේ පැවැත්වෙන මැතිවරණවලදී ආබාධිතවූවන්ටත් තැපැල් ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ඉල්ලා තිබෙන බව. ආබාධිතවූවන්ගේ ජාතික සම්මේලනය ඉල්ලා තිබෙනවා postal voting rights for disabled persons. This is something that we must consider even for Local Government and all other elections. මා මේ කාරණා විශේෂයෙන් සඳහන් කරමින් අපේ රටේ-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Why did you not go for an independent Election Commission? That is the most important thing. Why are you not doing it? That is more important than all what you have said.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මට නම් පුදුම මේවා ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කියන එක ගැනයි. ඒකයි පුදුමය. අලුතින් ආපු යූඑන්පී මන්ත්‍රීවරයකු කිව්වා නම් අපට යම් කිසි සවන් දීමක් කළ හැකියි. නමුත් ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා නැඟිට මේ වාගේ දේවල් ප්‍රකාශ කිරීම ගැන පුදුමයි. අපි සියලු දෙනාම එකතු වෙලා ඡන්ද ක්‍රමය දියුණු කරලා, නියෝජිතයන් ඡන්ද දායකයන් ළඟට ගෙනෙල්ලා, අලුත් ඡන්ද ක්‍රමයක් ඇති කරගෙන කටයුතු කරන්න පුළුවන් පිළිවෙළකට ගමන් කරමු. ලෝකය පුරා ධනවාදය උත්සන්නව පැතිරී යාම නිසා මුල්‍ය බලය ඡන්දවලට පාවිච්චි වෙන කනගාටුදායක තත්ත්වයකට පරිවර්තනය වෙමින් තිබෙනවා. මේවා පාලනය කර ගැනීම සියලු දේශපාලන පක්ෂවල මැදිහත් වීමෙන්, ඡන්ද නීති-රීති වඩාත් ශක්තිමත් කිරීමෙන් කළ යුතු දෙයක් හැටියට මා අදහස් කරනවා. මම මේ කාරණා කිහිපය පමණක් සඳහන් කරමින් අපි පැමිණි එකඟතාව අනුව කටයුතු කිරීමට ඔබ සැමගේ සහයෝගය ඉල්ලමින් නවතිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

The next speaker is the Hon. P. Ariyanethran. Order, please! Before he starts, the Hon. Deputy Chairman of Committees will take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார் ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[பி.ப. 2.14]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று இச்சபையில் கொண்டுவரப்பட்டிருக்கின்ற, உள்ளூராட்சிச் சபைகள் சம்பந்தமான திருத்தச் சட்டமூலங்கள் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு மகிழ்ச் சியடைகின்றேன். மட்டக்களப்பு மாவட்டத்தில் கடந்த ஒன்றரை வருடங்களாக மாநகர சபை மற்றும் ஏழு பிரதேச சபைகளுக்கான தேர்தல்கள் நடத்தப்படாமல் பிற்போடப் பட்டிருக்கின்றன. இவ்வாறான ஒரு செயல் வட மாகாணத்திலும் நடைபெற்றது. அதாவது, புதுக்குடியிருப்பு, கரைதுறைப்பற்று பிரதேச சபைகளுக்கான தேர்தலுக்கு 2011ஆம் ஆண்டு நியமனப்பத்திரங்கள் தாக்கல் செய்யப்பட்ட போதிலும், அத்தேர்தலும் தொடர்ச்சியாகப் பிற்போடப்பட்டு வந்தது. ஆனால், அதற்குப் பிற்பாடு அங்கு மாகாண சபைத் தேர்தல் இடம்பெற்றது. இதிலிருந்து நாங்கள் ஒன்றை விளங்கிக்கொள்ள முடிகின்றது. அதாவது, வடக்கு, கிழக்கிலுள்ள தமிழ் பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள உள்ளூராட்சிச் சபைகள் மற்றும் மாநகர சபைத் தேர்தல்கள் என்பன திட்டமிட்டுத் தொடர்ச்சியாகப் பிற்போடப் படுவதற்கான காரணம், அங்கு தமிழ்த் தேசியக் கூட்டமைப் பினரின் ஆதிக்கம் இருப்பதனால் அத்தேர்தல்களில் அவர்கள் இலகுவாக வெற்றி பெற்றுவிடுவார்கள் என்ற அரசின் மனோநிலையே ஆகும்.

இன்று மட்டக்களப்பிலே இருக்கின்ற நீண்ட வாவியில் காத்தான்குடி நகர சபைத் தவிசாளரின் அனுமதியுடன் குப்பைகள் கொட்டப்படுவதனால் அது அசுத்தமாகி வருகின்றது. கடந்த மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தின்போது, நாங்கள் - தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற, மாகாண சபை உறுப்பினர்கள் - இதனைச் சுட்டிக்காட்டியபோது, குறித்த நகர சபையின் தவிசாளர், தானே அந்த வாவியில் குப்பைகளைப் போடுவதாக ஒத்துக்கொண்டார். இன்று நாங்கள் சூழல் மாசடைவதைத் தடுக்கவேண்டும் என்றும் நகரங்களைச் சுத்தமாக வைத்திருக்கவேண்டும் என்றும் வலியுறுத்தி வருகின்றோம். இந்த நிலையில் "மீன்பாடும் தேன் நாடு" என்று பெருமையாகப் பேசப்படுகின்ற மட்டக்களப்பில் அமைந்துள்ள வாவியில் காத்தான்குடி நகர சபையின் தவிசாளர் ஏன் திட்டமிட்டு குப்பைகளைக் கொட்டுகின்றார் என்பதற்கு இங்கிருக்கின்ற உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர் அவர்கள் பதிலளிக்கவேண்டும். குறித்த நகர சபைத் தவிசாளர், குப்பை களைப் போடுவதற்காக அவ்வாவியைத் தன்னகப்படுத்தி இருக்கின்றார். மட்டக்களப்பு மாவட்டத்திலுள்ள அந்த வாவி மக்களால் பல்வேறு தேவைகளுக்காகவும் நீண்டகாலமாகப் பாவிக்கப்பட்டு வருவது உங்களுக்குத் தெரியும். அதனை நகர சபைத் தவிசாளர் ஒருவர் நகர சபை நடவடிக்கைகளினூடாக மாசடையச் செய்வதை வன்மையாகக் கண்டிப்பதோடு, அந்தச் செயற்பாட்டை உடனடியாகத் தடுத்து நிறுத்தி, வாவியைப் பாதுகாப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்கவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, கல்முனை வடக்கில் ஒரு தனியான பிரதேச சபையொன்று உருவாக்கப்படவேண்டும். ஏனென்றால், அங்கி ருக்கின்ற தமிழ் பிரிவுக்கான பிரதேச சபை அலுவலகம் தரமுயர்த்தப்படாமலும் தனியாகச் செயற்பட முடியாமலும் இருக்கின்றது. கௌரவ அமைச்சரவர்களே, இச்சட்டமூலத்தின் வாயிலாக அதனைத் தரமுயர்த்துவதற்கு அல்லது தனியாக இயங்கச்செய்வதற்கு நீங்கள் உரிய நடவடிக்கைகளை எடுக்க

[ගරු පී. අරියනේත්‍රන් මහතා]

வேண்டும் என்று நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இன்று பிரதேச சபை, நகர சபை, மாநகர சபை போன்ற உள்ளூராட்சிச் சபைகளின் ஆதிக்கத்தின் கீழுள்ள எல்லைக் கிராமங்களில் அவற்றின் எல்லைகளை ஊடறுத்து, அவற்றை இல்லாமல் செய்வதற்காகத் திட்டமிட்ட சிங்களக் குடியேற் றங்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. குறிப்பாக, வெல்லாவெளி பிரதேச சபைக்குட்பட்ட வெல்லாவெளி, மண்டூர், நவகிரி போன்ற பிரதேசங்களின் எல்லைப்புறங்களில் சிங்களக் குடியேற்றங்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. அதேபோன்று, பட்டிப்பளை பிரதேச சபைக்குட்பட்ட கெவுளியாமடுவை ஊடறுத்து பல்வேறு குடியேற்றத் திட்டங்கள் திட்டமிட்டு மேற்கொள்ளப்பட்டு வருகின்றன. எல்லை தொடர்பாக ஒரு வரையறை இருந்தாலும்கூட, அதனைக் கவனிக்காது வெளிமாவட்டங்களைச் சேர்ந்தவர்கள் இந்தப் பிரதேசங்களில் அத்துமீறிக் குடியேறும் நடவடிக்கை யானது, எதிர்காலத்தில் வடக்கு,கிழக்குத் தாயகத்தின் ஓர் எல்லையாக இருக்கின்ற தமிழ் பேசும் மக்களின் நிலப்பரப்பு பேரினவாதத்தின் மூலமாகத் துண்டாடப்படுவதற்கு வாய்ப் பாக அமையும். ஆகவே, இதுபற்றிய திட்டங்கள் பிரதேச சபைகளூடாக ஒழுங்காக வரையறுக்கப்பட வேண்டும். அவ்வாறு வரையறுக்கப்பட்ட அந்தத் திட்டங்களைச் செயற் படுத்துவதற்கான நடவடிக் கைகள் மேற்கொள்ளப்பட வேண்டுமென்றும் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order?

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
அரியநேத்திரன் அவர்கள் கூறுகின்றார் -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please give the mike to the Hon. Piyasena.

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)
அங்கு சிங்களக் குடியேற்றத்தை ஏற்படுத்தியதாக அவர் கூறுகின்றார். இது தவிர்க்கப்படவேண்டிய ஒரு வசனமாக இருக்கின்றது. இலங்கைத் திருநாட்டிலே எல்லோரும் எங்கும் வாழலாம்!

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Ariyanethran, please continue with your speech.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
எங்களுடைய கட்சியின் வாக்குகளைப் பெற்று வந்து, இன்று அரசாங்கத்துக்கு வக்காலத்து வாங்குகின்ற, நீலச்சால் வையைப் போட்டுக்கொண்டு எங்களையும் அம்பாறை மாவட்டத்தையும் அவமானப்படுத்துகின்ற

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

அவர்கள்தான் ஒழுங்குப் பிரச்சினை எழுப்புகிறார். அவரே 50:50 அரைச் சிங்களவர்! உள்ளூராட்சிச் சபைகள் தொடர் பான இத்தகைய சட்டமூலங்கள் வாயிலாக எல்லைகளை வரையறுக்கின்ற நேரத்திலே எல்லைகளைக் கபளீகரம் செய்யாமல் - சிங்களக் குடியேற்றம் செய்யாமல்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

போன்ற அரசாங்கத்துக்கு வக்காலத்து வாங்குபவர்களை அங்கு குடியேற்றாமல், திட்டமிட்டுச் செயற்றிட்டங்களை முன்னெடுக்க வேண்டுமென்று நான் கேட்டுகொள்ள விரும்புகின்றேன்.

ஜனாதிபதித் தேர்தல் மற்றும் பொதுத்தேர்தல் என்று இப்பொழுது தேர்தல்களைப் பற்றியே கதைத் துக்கொண்டிருக் கின்றார்கள். - [*Interruption*.]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Piyasena, please sit down.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
ஆனால் வடக்கு, கிழக்கிலே குறிப்பாக தமிழ் மக்களை இலக்குவைத்து உள்ளூராட்சிச் சபைத் தேர்தல்கள் திட்டமிட்டுப் புறக்கணிக்கப்படுகின்றன. வடக்கு, கிழக்கில் இருக்கின்ற தமிழ் மக்கள் தொடர்ந்தும் தமிழ்த் தேசியக் கூட்ட மைப்பைப் பலப்படுத்துவார்கள் என்ற பயம் காரணமாகவே அரசாங்கம் அங்கு உள்ளூராட்சிச் சபைத் தேர்தல்களை நடத்தவில்லை என்பதை நான் பகிரங்கமாகத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன். எதிர்வரும் ஜனாதிபதித் தேர்தல் அல்லது பாராளுமன்றத் தேர்தலுக்கு முன்பு மட்டக்களப்பு மாவட்டத்தின் புதுக்குடியிருப்பு பிரதேச செயலாளர் பிரிவிலே உள்ள உள்ளூராட்சிச் சபைகளுக்கு தேர்தல்களை நடாத்துவதற்கு உங்களால் முடியுமா? அல்லது அவற்றை மேலும் பிற்போடுவீர்களா? இதற்கான பதிலையும் நாங்கள் எதிர்பார்க்கின்றோம்.

நான் ஏற்கெனவே கூறியதுபோன்று இந்த பிரதேச செயலாளர் பிரிவிலே திட்டமிட்ட குடியேற்றங்கள் நடைபெறு கின்றன. அதேவேளையிலே, மட்டக்களப்பு மாவட்ட பிரதேச சபைகளின் எல்லைகளில் இருக்கின்ற மேய்ச்சல் தரைகள் கபளீகரம் செய்யப்படுகின்றன. குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்திலே ஏறக்குறைய 1,48,000 பசுக்கள் மற்றும் எருமை மாடுகள் இருக்கின்றன. அவற்றுக்காக ஒதுக்கப்பட்ட மேய்ச்சல் தரைகள் - நிலங்கள்கூட கபளீகரம் செய்யப்பட்டு

அங்கு பேரினவாதிகளால் சிங்களக் குடியேற்றம் செய்யப் பட்டிருக்கின்றது. அவர்களுக்கு அத்துமீறிப் பயிர்செய்வதற் கான இடங்களும் வழங்கப்பட்டிருக்கின்றன. அதன் காரண மாக மட்டக்களப்பு மாவட்டத்திலிருக்கின்ற கால்நடை வளர்ப்போர் தங்களுடைய கால்நடைகளை மேய்ச்சல் தரைகளிலே மேய்க்க முடியாமல் இருக்கின்றார்கள். இப்போது மானாவாரி நெற்செய்கையும் ஆரம்பித் திருக்கின்றது. அங்கு அத்துமீறிக் குடியேறியவர்களுக்குப் பாதுகாப்பாகத் துப்பாக்கியும் வழங்கியிருக்கிறார்கள். தமிழ் மக்களின் கால்நடை களுக்கு எதிராகவும் அவற்றை மேய்ச்சல் தரைக்குக் கொண்டுசெல்கின்ற தமிழர்களுக்கு எதிராகவும் அந்தத் துப்பாக்கிகள் நீட்டப்படுகின்றன. கடந்த வருடத்திலே ஏறக்குறைய 47 மாடுகள் இவ்வாறு சுடப்பட்டிருக்கின்றன. இதுபோன்ற ஒரு நிலைவரம் இந்த வருடமும் ஏற்படக்கூடாது என்பதற்காக கடந்த மட்டக்களப்பு மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலே அதுபற்றி நாங்கள் எடுத்துக்கூறியும்கூட அதற்கான ஒரு தீர்வு இதுவரையும் முன்வைக்கப்படாமல் இருக்கின்றது.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
What is your point of Order, Hon. Azwer?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, அரியநேத்திரன் அவர்கள் பேசும்பொழுது கௌரவ உறுப்பினர்

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

அவர்களைப் பார்த்து

என்று சொன்னார். இப்படியாக தரங்கெட்ட முறையிலே இந்தச் சபையிலே பேசுபவர்கள் இவர்கள்தான்! தமிழ் மக்களை அங்கே

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

மதிக்கின்றவர்கள் இவர்கள்!

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order.

கௌரவ அரியநேத்திரன் அவர்களே, தயவுசெய்து பாராளு மன்றத்தில் கண்ணியமாகப் பேசப் பழகிக்கொள்ளுங்கள்!

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
இது கண்ணியமான பாராளுமன்றமாக இருந்தால், அவரும் கண்ணியமாக நடந்துகொண்டால் கண்ணியமாகப் பேசலாம்! கண்ணியம் கெட்டவர்கள் இங்கிருக்கின்றபோது கண்ணிய மில்லாமல்தான் நான் பேச வேண்டியிருக்கின்றது.

இவ்வாறான நடவடிக்கைகள் தொடர்ச்சியாக எமது பிரதேசங்களில் இடம்பெறுகின்றன. இந்த நிலையிலே உள்ளூ ராட்சித் சபைகள் தொடர்பாக அல்லது அதன் எல்லைகள் தொடர்பாக நாங்கள் பேசுகின்றபோது பியசேன போன்றவர் களால் அதைப் பொறுத்துக்கொள்ள முடியாமல் இருக்கிறது. எங்கள் மக்களால் அளிக்கப்பட்ட வாக்குகளைப் பெற்றுக் கொண்டு தமிழ்த் தேசியக் கூட்டமைப்பினூடாக பாராளு மன்றத்துக்கு வந்த அவர், முதலில் அரசாங்கத்துக்கு வக்காலத்து வாங்குவதை விடுத்து வாயைப் பொத்திக் கொண்டிருக்க வேண்டும். ஆகவே, மாநகர சபைகள் (திருத்தம்), சட்டமூலம், நகர சபைகள் (திருத்தம்) சட்டமூலம், பிரதேச சபை (திருத்தம்) சட்டமூலம் போன்ற உள்ளூராட்சிச் சபைகளின் சட்டமூலங்களைக் கையாளுகின்றபோது எங்களுடைய பிரதேச எல்லைகள் - நிலங்கள் பாதுகாக்கப்பட வேண்டும் என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
நன்றி, உங்களது நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
ஒரு நிமிடம்!

மட்டக்களப்பு மாவட்டத்திலே இருக்கின்ற வன இலாகா வுக்குச் சொந்தமான காணிகள் பெரும்பான்மை மக்களுக்கு மூன்று வருடக் குத்தகைக்கு கொடுக்கப் பட்டிருந்தன. அந்தக் குத்தகை இந்த வருடம் நிறுத்தப் பட்டிருந்தது. ஆனால், சட்டத்துக்கு முரணாக அவர்களுக்கு அவற்றை மீண்டும் கொடுக்குமாறு பாதுகாப்பு அமைச்சின் செயலாளர் அவர்கள் கூறியதாக அங்கே சம்பந்தப்பட்டவர்கள் தெரிவிக்கின்றார்கள். ஆகவே, மட்டக்களப்பிலே இருக்கின்ற இலாகா கொழும்பிலே இருக்கின்ற நிர்வாகத்தின்கீழ் இயங்குகின்றதா என்பதையும் உள்ளூராட்சிச் சபைகளுக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் கூற வேண்டும் என்று கேட்டு, எனது பேச்சை முடிக்கின்றேன்.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
கௌரவ உறுப்பினர் அவர்களே! நீங்கள் இப்பொழுது உள்ளூராட்சி சம்பந்தமான இரண்டு -மூன்று விஷயங்களைப் பற்றிக் கதைத்தீர்கள்.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
ஆம்!

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
அதற்கு மேலதிகமாக மேய்ச்சல் தரை போன்ற விஷ யங்களை எல்லாம் கதைத்தீர்கள். இப்பொழுது Delimitation வேலைகள் முடிவடையாத காரணத்தினால்தான் உள்ளூ ராட்சித் தேர்தல் பின்போடப்பட்டிருக்கிறது. உண்மையிலே அதற்கு நாம் வேறு காரணம் கற்பிக்கத் தேவையில்லை. அந்த

[ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]

வேலைகள் முடிந்து புதிய வட்டாரங்கள் சம்பந்தமான gazette வெளியிடப்பட்டதும் குறித்த election நடக்கும். அதற்காக நாங்கள் Delimitation Committee க்கு டிசம்பர் வரை அவகாசம் கொடுத்திருக்கின்றோம். ஆகவே, அவர்கள் அந்த வேலையை முடித்தவுடன் election நடத்தக்கூடியதாக இருக்கும். இரண்டாவதாக, கல்முனையிலே ஒரு பிரதேச சபையை அமைப்பது பற்றிச் சொன்னீர்கள். அது பற்றி விளக்கமாகச் சொல்லுங்கள்!

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கல்முனை வடக்கை மையப்படுத்தித் தனியான ஒரு பிரதேச சபையை அமைக்க வேண்டும் என்று நான் கேட்கின்றேன்.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

உதாரணமாக கல்முனை வடக்கு, மேற்கு, கரைவாகுப்பற்று தெற்கு என்று எல்லாம் அங்கு பிரதேச சபைகள் இருக்கின்றன. இப்பொழுது நீங்கள் கரைவாகுப்பற்று வடக்கு என்ற ஒரு பிரதேச சபையை அமைக்க வேண்டும் என்று சொல்கின் றீர்கள்!

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

ஆம். அதைப் பற்றியும் சிந்தித்துப் பாருங்கள்!

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

சரி.

[අ.භා. 2.26]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත ඇතුළු පනත් කීපයකටම සංශෝධන ගෙනෙන මෙම අවස්ථාවේදී අදහස් කීපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙනවා.

අද ගෙනෙන මෙම සංශෝධන තුළින් ප්‍රජාතන්ත්‍රවාදයට, ඒ වාගේම යුක්තියට, සාධාරණයට මොනම ආකාරයකින්වත් හානියක් නොවන බව මුලින්ම සඳහන් කරන්න ඕනෑ.

මේ වන විට අපේ රටේ මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සියල්ලක්ම පාලනය වන්නේත්, ඒ මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සඳහා මන්ත්‍රීවරුන්, සභිකයන් තේරී පත් වී තිබෙන්නේත් ඒ අදාළ පනත් මඟින් පැවැරී තිබෙන බලතල අනුවයි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ප්‍රාදේශීය සභාවල පරිපාලනය සහ අනෙකුත් කටයුතු පාලනය වනවා. ඒ වාගේම, 1987 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත යටතේ සමානුපාතික ක්‍රමය හඳුන්වා දීලා, ඒ නීතිය තුළින් තමයි අද අපේ රටේ සියලුම පළාත් පාලන ආයතන පාලනය වන්නේ; ඒ මන්ත්‍රීවරුන් තේරී පත් වන්නේ; ඒ මන්ත්‍රීවරුන් ඉවත් කරන්නේ; ඉවත් වන මන්ත්‍රීවරුන් වෙනුවට අලුත් මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගන්නේ.

ඒ අතරතුර, අපේ රටේ සමාජය තුළ විවිධ ආකාරයෙන් මත වාදයක් ගොඩ නැඟුණා, අවශ්‍යතාවක් ඇති වුණා, අපේ රටේ තිබෙන සමානුපාතික ඡන්ද ක්‍රමය වෙනස් විය යුතුයි කියලා. ඒ අනුව, 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගෙනැල්ලා මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා, පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරමින් විශේෂ කාරක සභාවක් පත් කරලා, ඒ විශේෂ කාරක සභාව අවස්ථා ගණනාවක් රැස් වෙලා, ඒ නියෝජිතයන්ගේ අදහස් යෝජනා විමසලා, අපේ රටේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ මූලික අවස්ථාවක් විධියට.

විශේෂයෙන්ම මේ වන විට තිබෙන පළාත් පාලන ආයතන තිබෙන්නේ මා මුලින් සඳහන් කළ ආකාරයට පැරණි නීතිය යටතේයි. නමුත් 2012 දී නව පනත පාර්ලිමේන්තුට ගෙන ඒම නිසා, විශේෂයෙන්ම අපේ රටේ පළාත් පාලන ආයතනවල අය වැය සම්මත කර ගැනීම යනාදී පරිපාලන කටයුතුවලට ඒ නව පනතේ නීති-රීති බලපාන තත්ත්වයක් ඇති වුණා. මේ නිසා පළාත් පාලන ආයතනවල පක්ෂ විපක්ෂ සියලුම මහජන නියෝජිතයන් අදහස් ඉදිරිපත් කළා, "අපි තේරී පත් වුණේ පැරණි නීතිය යටතේ, අපි මේ පළාත් පාලන ආයතන පාලනය කළේ පැරණි නීතිය යටතේ, එම නිසා අපට පැරණි නීතිය යටතේම ඒවා පාලනය සඳහා අවස්ථාව ලබා දීම සාධාරණයි, එය ඉටු කර දෙන්න" කියලා. එම නිසා අද ගෙනෙන මේ සංශෝධන මඟින් සිද්ධ වෙන්නේ පැරණි නීතිය යටතේ තේරී පත් වුණු ප්‍රාදේශීය සභාවලට තිබුණු පැරණි නීති රීති යටතේම ක්‍රියාත්මක වෙන්න, පරිපාලන කටයුතු කරන්න අවස්ථාව ලබා දීමයි.

විශේෂයෙන්ම කේවල ඡන්ද ක්‍රමයත්, සමානුපාතික ඡන්ද ක්‍රමයත් ඒකාබද්ධ වෙලා ඉදිරියේදී නව නීතිය යටතේ පළාත් පාලන ආයතනවල මැතිවරණ පැවැත්වූවාට පස්සේ, ඒ පළාත් පාලන ආයතනවල අය වැය සම්මත කර ගැනීම සහ පරිපාලනය ඒ නව නීතිය යටතේ සිද්ධ වීම අනිවාර්යයෙන්ම සිද්ධ වෙනවා. මේක සාධාරණයි.

මේ ක්‍රියාවලිය තුළින් මොනම ආකාරයකටවත් අසාධාරණයක්, අයුක්තියක්, ප්‍රජාතන්ත්‍රවාදී විරෝධයක් කොහෙත්ම සිද්ධ වන්නේ නැහැ. පැරණි නීතිය යටතේ මන්ත්‍රීවරු තේරී පත් වුණා. පැරණි නීතිය යටතේ ඒ සභාව අවසාන වන තෙක්ම ඒ නීතියේ වලංගුතාවක් තිබුණා. එම නිසා නව නීතියක් සම්මත කර ගත්තාට පස්සේ -විශේෂයෙන්ම අලුත් මැතිවරණ ක්‍රමයක් යටතේ- තේරී පත් වන මන්ත්‍රීවරුන්ට මුහුණ පාන්න සිද්ධ වන පරිපාලනමය තත්ත්වයන් නොවෙයි, පැරණි සමානුපාතික ක්‍රමය යටතේ තේරී පත් වූ මන්ත්‍රීවරුන්ට සභාවක් තුළ පරිපාලනමය වශයෙන් මුහුණ පාන්න සිද්ධ වන්නේ. විශේෂයෙන්ම සමානුපාතික ක්‍රමය තුළදී ඒ පළාත් පාලන ආයතනවල ඕනෑම ඡන්ද දායකයෙකුට -ඒ අදාළ සභිකයෙකුට- ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව තිබෙනවා. එතකොට ඒ ඡන්ද දායකයාගේ වගකීම් වෙනස්. ඒ තේරී පත් වන සභාපතිවරයාගේ වගකීම් වෙනස්. ඒ තේරී පත් වන විපක්ෂ නායකවරයාගේ වගකීම් වෙනස්. එම නිසා ඒ වග කීමට අනුව අනෙක් පැත්තේ මහජන නියෝජිතයින්ගේ යුතුකම් හා වගකීම් ඉටු කිරීමත් ඒ අයුරින්ම පැවරෙනවා. නමුත්, කේවල ක්‍රමයක් යටතේ තේරී පත් වන මන්ත්‍රීවරයකුට ඉටු කරන්න තිබෙන වගකීම් වෙනස්. ග්‍රාම නිලධාරි වසම් කීපයක ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කිරීම තමයි අනිවාර්යයෙන්ම ඒ නව ක්‍රමය යටතේ මහජන නියෝජිතයෙකුට

පැවරෙන වගකීම වන්නේ. ඊට පස්සේ ඒ මන්ත්‍රීවරුන්ගෙන් ඒක රාශි වෙලා තමයි සභාපතිවරයා, උපසභාපතිවරයා තෝරා පත් කර ගැනීම අනිවාර්යයෙන්ම සිද්ධ කරනු ලබන්නේ. එවිට නව ක්‍රමය යටතේ පත් වන මහජන නියෝජිතයින්ට -මන්ත්‍රීවරුන්ට- ඉටු කරන්න තිබෙන වගකීම අඩුයි. ඔවුන්ට ආසනයකට වැඩ කරන්න සිද්ධ වන්නේ නැහැ. ඒ වාගේම ඒ අයට සිය සේවාව ඉටු කරන්න සිද්ධ වන්නේ අනිවාර්යයෙන්ම ඒ කොට්ඨාස ක්‍රමයේ ඡන්ද දායකයින්ට පමණයි. එම නිසා අද ගෙන එන සංශෝධනය තුළින් සිද්ධ වන්නේ නව මැතිවරණ ක්‍රමයට අනුව මන්ත්‍රීවරු තේරී පත් වෙලා නව ප්‍රාදේශීය සභාවක් පිහිටුවා ගැනීමෙන් පස්සේ නව නීතිවලට අනුව ඒ පරිපාලනය සහ ඒ සභාවන්වල අය වැය සම්මත කර ගැනීම් යනාදී ක්‍රියාවලි සිද්ධ වන අතරතුර පැරණි ක්‍රමය යටතේ ඒ අදාළ මන්ත්‍රීවරුන්ට පැරණි නීතිය යටතේම ඒ සභාවල පරිපාලනය ගෙන යෑම සඳහා අවශ්‍ය කරන අවස්ථාව ලබා දීමයි.

මැතිවරණ පිළිබඳව අපේ දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාත් සඳහන් කළා. විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම වෙනුවෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි මැතිවරණයකදී හැඳුනුම්පත භාවිත කිරීම අනිවාර්ය කරමින් ඡන්ද දායකයින්ගේ නැති වුණු අයිතිය නැවත ඔවුන්ට ලබා දුන්නේ. කලින් මැතිවරණ දූෂණ සිද්ධ වුණා. සියලුම දේශපාලන පක්ෂ මැතිවරණ දූෂණ කළා. එය අපි පිළිගන්න ඕනෑ. නමුත්, අද අපේ රටේ අගමැතිවරයාටවත් ඡන්ද මධ්‍යස්ථානයට ගිහිල්ලා හැඳුනුම්පත නොමැතිව ඡන්දය දමන්න පුළුවන්කමක් නැහැ. මෙවර අපේ ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමාටත් ඡන්ද මධ්‍යස්ථානයෙන් ආපහු එන්න සිද්ධ වුණා. ඒකට හේතුව මොකක්ද? එතුමාගේ හැඳුනුම්පත තිබුණේ නැහැ. මේ ආකාරයෙන් මැතිවරණ පිළිබඳව තිබෙන විශ්වාසය අනිවාර්යයෙන්ම ශක්තිමත් කළේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද විපක්ෂය විවිධ ආකාරයෙන් වැරදි මත ඉදිරිපත් කරනවා. මේ අය තුළ සැබෑ සැකයක් තිබෙනවා. ඒ අය තුළ සැකයක් තිබීම සාධාරණයි. 1977 දී කේවල මැතිවරණ ක්‍රමය තුළින් අපේ රටේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වූවා. එහිදී එක්සත් ජාතික පක්ෂය හයෙන් පහක බලයක් ලබා ගත්තා. ඒ පැරණි මැතිවරණ ක්‍රමය යටතේ හයෙන් පහක බලයකින් පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු තේරී පත් වෙලා ඒ අය මැතිවරණ නීති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා මැතිවරණ කල් දැමීම සඳහා ජනමත විචාරණ පැවැත්වූවා. එවැනි ඉතිහාසයක් තිබෙන එක්සත් ජාතික පක්ෂයට මේ ආකාරයෙන් සද්භාවයෙන් යුතුව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා සාධාරණ යුක්තිය වෙනුවෙන් මෙවැනි සංශෝධනයක් හෝ ගෙන ඒම පිළිබඳව වැරදි ආකාරයෙන් දැකීම පිළිබඳව අප පුදුම විය යුතු නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම විජයදාස රාජපක්ෂ අපේ උගත් නීතිඥතුමා සඳහන් කළා, අද සංශෝධන හතරක් ඉදිරිපත් කළා කියලා. අද අපේ මේසය මත සංශෝධන හතරක් තබා නැහැ. අද අපට ලබා දුන්නේ එක සංශෝධනයයි. ඒ එක සංශෝධනය සඳහා පනත් හතරක් සංශෝධනය විය යුතුයි. ජනාධිපති නීතිඥයෙක් වෙන එතුමාට අපි බොහොම ගරු කරනවා. නමුත් එතුමා වැනි ජනාධිපති නීතිඥයෙකුටත් මේ ආකාරයේ කරුණක්වත් අවබෝධ නොවීම පිළිබඳව අපි පුදුම වෙන්නේ නැහැ. අපේ මේසය මතට අද සංශෝධන හතරක් ආවේ නැහැ. එක සංශෝධනයක් කිරීම සඳහා පනත් හතරක් සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කරන සංශෝධනයයි අද අපට අවේ. විපක්ෂයේ සියලුම අය අද ඉදිරිපත් කරපු මතයන් පිළිබඳව අපි එකඟ වෙන්නේ නැහැ; අපි අනුමත කරන්නේ නැහැ.

විශේෂයෙන්ම අද අපේ රටේ පළාත් පාලන ආයතන ගමේ සංවර්ධනය සඳහා විශාල සේවාවක් සිදු කරනු ලබනවා. අද අපට විශාල ශක්තියක්, අපේ ප්‍රාදේශීය සභා සහ නගර සභා. ඒ නගර සභා, ප්‍රාදේශීය සභා පිළිබඳව අපේ විශ්වාසය අපි තව තවත් තබලා තිබෙනවා. අපි ඒ ආයතන ශක්තිමත් කරනවා. අපි දන්නවා, ඉදිරියේදී අපේ රටේ සංවර්ධන ක්‍රියාවලියට මේ පළාත් පාලන ආයතන දැනට වඩා යෝධ ශක්තියක් ලබා දෙනවා කියලා. ඒ පළාත් පාලන ආයතනවල ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන් අනිවාර්යයෙන්ම ඒ ශක්තිය ලබා දෙනවා කියන එක අපි දන්නවා. එම පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ අපේ රජය කටයුතු කරනවා වාගේම මැතිවරණ ක්‍රමයත්, ප්‍රජාතන්ත්‍රවාදයත්, නිදහසත්, සාධාරණත්වයත් ශක්තිමත් කිරීම සඳහා පනත් ගෙනෙනවා, සංශෝධන ගෙනෙනවා ඇරෙන්න වෙනත් පටු අරමුණු වෙනුවෙන් අපේ රටේ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ගෙන එන්නේ නැහැ කියන පණිවුඩයත් ලබා දෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 2.38]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතා පැහැදිලිව පනත් හතරක් සංශෝධනය කරන්න සංශෝධන හතරක් තිබෙනවා. පනත් හතරක් එක සංශෝධනයෙන් වෙනස් කරන්න බැහැ. මේ සරල දේ තේරෙන්නේ නැත්නම්-

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

අරමුණ එකයි.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

අරමුණ එක වෙන්න පුළුවන්. සංශෝධන හතරක් තිබෙන්න ඕනෑ. පනත් හතරක් සංශෝධනය කරන්න බැහැ, එක අරමුණක් තිබුණාට. අරමුණුවලින් පනත් සංශෝධනය වෙන්නේ නැහැ නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

පනතක් සංශෝධනය වෙන්න අනිවාර්යයෙන්ම සංශෝධන හතරක් තිබිය යුතුයි. අරමුණක් හිතේ තිබුණාය කියා නිකම් අහසේ පාවෙන අරමුණක් තියා ගත හැකියි. එක අරමුණක් තිබුණාට පනත් හතරම සංශෝධනය වෙනවා නම් මෙතැන කථා කරන්න දෙයකුත් නැහැ. එහෙම නම් අරමුණක් හිතේ තියාගෙන ඔබතුමන්ලාගේ ආණ්ඩුවට පුළුවන් නේ මේක ක්‍රියාත්මක කරන්න. එහෙම බැහැ. පනත් හතරක් තිබෙනවා නම් පනත් හතර සංශෝධනය කරන්න අනිවාර්යයෙන්ම සංශෝධන හතරක් දැමිය යුතුයි. ඒක හරි සරල දෙයක්. මම හිතන හැටියට, ඒක මුලින්ම තේරුම් ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාගේ කලබලයට, හදිසියට මේවා කරන්නට ගිහින් හැම දාම ආණ්ඩුව කර ගත්තේ වැඩ අවුල් කර ගැනීමයි. මේ අද කර ගන්නට යන්නේත් ඒ අවුලම තමයි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත විශේෂ කාරක සභාව තුළ සාකච්ඡා කරද්දී ජනතා විමුක්ති පෙරමුණ විධියට ඉතා පැහැදිලිව අප දිගින් දිගටම කිව්වා, කලබලයට හදිසියට කරන්න යන්න එපා; මේක වැරදියි කියා. මැතිවරණ පනතක් වෙනස් කරනවා නම් වෙනස් කළ යුතු වන්නේ රටේ භූගෝලීය සහ ජනගහනයේ සංයුතිය, ව්‍යාප්තිය මත පළමුවෙන්ම සීමා නිර්ණය කිරීමෙනුයි. විද්‍යාත්මක පදනමක් මත රටේ භූගෝලීය ස්වභාවය පදනම් කර ගෙන, ඒ වාගේම ඒ භූගෝලීය ස්වභාවය තුළ ව්‍යාප්ත වෙලා තිබෙන ජන සංයුතියේ ව්‍යාප්තිය පදනම් කර ගෙන විද්‍යානුකූල පදනමක් මත කොට්ඨාස

[ගරු විජිත හේරත් මහතා]

නිර්ණය කළ යුතුයි. ඒ කොට්ඨාස නිර්ණය කළාට පස්සෙයි ඒ කොට්ඨාස නියෝජනය කරන්න මහජන නියෝජිතයින් පත් කිරීම සිදු කරන්නේ. ඒකට ගැලපෙන මැතිවරණ ක්‍රමයක් තමයි අප සකස් කළ යුතු වන්නේ. නමුත් ආණ්ඩුව මොකක්ද කළේ? ඒ විශේෂ කාරක සභාවේදී අප ඉතා පැහැදිලිව දැක්කා, අන්තිම මොහොතේ ෆැක්ස් පණිවුඩ එනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලයෙන් මැතිවරණ ක්‍රම ගැන ෆැක්ස් පණිවුඩ එනවා. මැතිවරණ ක්‍රම ගැන හදිසියේ ෆැක්ස් පණිවුඩ එනකොට ඒවා තමයි සාකච්ඡාවට ගන්නේ. අන්තිම මොහොතේ ඒවා ක්‍රියාත්මක කරන්නේ. මේ විධියට තකහනියේ, කලබලයේ කරන්නට ගිහින් ඒ වෙච්ච අලකලංචිය තමයි පසු ගිය දවස්වල ප්‍රාදේශීය සභාවල අප දැක්කේ. තමන්ටම ඒකේ ආනිශංසය විඳින්නට සිදු වුණා. තමන්ගේ ම ආණ්ඩු පක්ෂයේ සභාපතිවරුන්ට විරුද්ධව ඒ සභාවල මන්ත්‍රීවරු නැඟිට්ටා. අය වැය පරාද වෙනකොට සභාපතිවරුන් එලවා දැම්මා. ඊළඟට උප සභාපති පත් කරනවා. ඊළඟ වතාවේ ඔහුව එලවනවා. ඔහු ඒ පුටුවේ වාඩි වුණාට පස්සේ කලින් සභාපතිවරයා වාගේම තමන්ගේ අතට බලතල ගන්නවා. ඒ බලතල අරගෙන අර විධියටම සොරකම් කරන්න- ටෙන්ඩර් නැතිව මගඩි කරන්න-පටන් ගන්නවා. අනෙක් අයට පංගුව බෙදා දෙන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ අයට පංගුව දෙන්නේ නැහැ. පංගුව දුන්නේ නැති වුණාම, ඒ එන සභාපතිවරයා ඊළඟ අවුරුද්දේ ආයෙත් එලවනවා.

මේක තමයි සිද්ධ කර ගත්ත දෙය. ඒ වෙලාවේ අප පැහැදිලිව කිව්වා, කලබල වෙන්න එපා; හදිසි වෙන්නට එපා; මොකක් ද තදියම කියා. ඇයි මේ තදියමේ මේ පනත් කෙටුම්පත ගේන්න යන්නේ, තව ගොඩක් දේවල් සාකච්ඡා කරන්නට තිබෙනවාය කියා. ඒ වෙලාවේ ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ. ඒ නිසා තමයි මේ සංශෝධනය එදා විශේෂ කාරක සභාවට ගෙනා වෙලාවේ අප අත්සන් කළේ නැත්තේ. අප ඉතා පැහැදිලිව කිව්වා, මේක වැරදියි; මේක කලබලයට, හදිසියට වරද්දා ගැනීමක් මේ කරන්නේ; එම නිසා අප අත්සන් කරන්නේ නැහැ කියා. අප එදා ගත් තීන්දුව හරියට ම හරිය කියා අද පෙනෙනවා. තමන්ට වුණු වැරැද්ද නිවැරදි කර ගන්න ආපසු වරක් මේ පාර්ලිමේන්තුවට සංශෝධන ගේන්න ආණ්ඩුවට ම සිද්ධ වුණා. ඒ විශේෂ කාරක සභාවට ගෙනා සමහර මැතිවරණ ක්‍රම හඳුන්වා දුන් නියෝජිතයෝ කවුද? ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ ආචාර්ය සුදන්ත ලියනගේ. එතුමා ඒවා ගෙනාවේ ස්වාධීන ආචාර්යවරයෙක් විධියට. මේ මහා හසළ දැනුමක් තිබෙන, මැතිවරණ ක්‍රමය පිළිබඳව උපරිමයට ගිහින් තිබෙන, එවැනි ගණිත සූත්‍ර ක්‍රම දන්නා, ස්වාධීන කෙනෙක් හැටියට තමයි සුදන්ත ලියනගේ ඇවිත් පෙනී සිටියේ. ඌව ඡන්ද වෙලාවේ අප දැක්කා, උවේ මහ ඇමති ශෂීන්ද්‍ර රාජපක්ෂගේ ජයග්‍රහණය වෙනුවෙන් කිසි හිරිකිතයක් නැතිව ගිහින් වාඩිවෙලා මාධ්‍ය සාකච්ඡා තිබ්බා, ස්වාධීනයයි කියපු සුදන්ත ලියනගේ කියන විශ්වවිද්‍යාල ආචාර්යවරයා. ඒ මාධ්‍ය සාකච්ඡාව තිබ්බේ තනිවම නොවෙයි. ඌව විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයාත් එක්ක. උප කුලපතිවරයෙකුට එහෙම අයිතියකුත් නැහැ. ආචාර්යවරයෙකුට එහෙම අයිතියක් තිබෙන්නට පුළුවන්. හැබැයි උප කුලපතිවරයෙක් කියන්නේ ස්වාධීන පුද්ගලයෙක්. දේශපාලන පක්ෂ වෙනුවෙන් ඔහුට පෙනී ඉන්න බැහැ. නමුත් ඒ නීතියත් උල්ලංඝනය කරලා මාධ්‍ය සාකච්ඡා තිබ්බා. එම නිසා තමන්ගේ පටු බල වුවමනාව වෙනුවෙනුයි මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කළේ. එසේ නැතිව රටේ ජනතාවගේ පැත්තෙන් හිතලා විද්‍යාත්මක පදනමක් මත හදපු මැතිවරණ ක්‍රමයක් නොවෙයි. එම නිසායි ගෙනාපු ගමන්ම අද මේක අවුලෙන් අවුලට පත් වෙලා තිබෙන්නේ. දැන් මොකක්ද කරන්න යන්නේ? අපි ඉතා පැහැදිලිව කිව්වා, මේකට අදාළව තවදුරටත් සාකච්ඡා කළ යුතු සංශෝධන ගණනාවක් තිබෙනවාය කියා. එදා අතාවුල්ලා ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ගෙනෙන්න තිබුණ හදිසිය - තකහනිය- නිසා මේ පාර්ලිමේන්තුවටම වාචිකව පොරොන්දු වුණා වැඩි කාලයක් යන්න කලින් ඔය කියන සංශෝධන නැවත සාකච්ඡා කර, ඒ සංශෝධන සහිතව සම්පූර්ණ පනත් කෙටුම්පත නැවත ගෙනෙනවාය කියා. නමුත් අද වන තෙක් නැහැ. ඒ ගැන කථාවකුත් නැහැ. ඒ ගැන සාකච්ඡාවකුත් නැහැ. හදිසියේ මේ සභාපතිවරයා පිළිබඳව තමන්ගේ ආණ්ඩුව මුහුණ දුන් ප්‍රශ්නයට උත්තර සොයන එක වෙනුවට සමස්ත සංශෝධන සහිතව පූර්ණ පළාත් පාලන මැතිවරණ පනත් කෙටුම්පත මෙතැනට ගෙනෙන්න ඕනෑ. ඒක ගෙනාවේ නැහැ. සීමා නිර්ණය කිරීමේ කොමිසමක් පත් කළා. අපි එදා ඉතා පැහැදිලිව කිව්වා, මේ සීමා නිර්ණය කිරීමේ කොමිසමට නියෝජිතයන් පත් කරන්න ඇමතිවරයාට තිබෙන බලය වැරදියි කියා. ඇමතිවරයා ඒ කොමිසමට නියෝජිතයන් පත් කළ ගමන් එතැන ස්වාධීනත්වය මුළුමනින්ම නැති වෙනවා. නමුත් දිගින් දිගටම අපි කියන දේ පිළිගන්නේ නැතිව, ඒ කොමිසමට තමන්ගේ හෙංචයියලා පත් කර ගන්න තිබුණ වුවමනාව නිසා එදා සීමා නිර්ණය කිරීමේ කොමිසම පිහිටුවීම සඳහා ඇමතිවරයාට නිෂේධ බලයක් තියා ගත්තා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද රට පුරාම කොට්ඨාස නිර්ණය කිරීම් සිද්ධ වෙමින් යනවා. හැබැයි, හැම තැනම තිබෙන ප්‍රශ්නය මොකක්ද? අදාළ දේශපාලන බලවතා තමන්ගේ ඡන්ද ගැන හිතලා, තමන්ට වැඩිපුර ඡන්ද ගන්න පුළුවන් භූමි ප්‍රදේශය ගැන හිතලා කොට්ඨාස නිර්ණය කරනවා. විවිධ ජාතිකත්වයන් නියෝජනය කරන කොටස්; දේශපාලනඥයෝ තමන්ගේ වුවමනාව, තමන්ගේ ජාතිකත්වයේ ඡන්ද ටික අර ගෙන ජාතිවාදය තුළින් මන්ත්‍රීවරයෙක් වෙන්නේ කොහොමද කියන එක මත කොට්ඨාස තීරණය කරනවා.

අද ප්‍රාදේශීය දේශපාලනඥයන්ට ඒ බලය ගිහිල්ලයි තිබෙන්නේ. ඒ නිසා නැති අවුල් හැදිලායි තිබෙන්නේ. කොට්ඨාස ක්‍රමය ක්‍රියාත්මක කරන්න ගිය වෙලාවට මේ නැති අවුල් තවත් ඇති වෙනවා. තවම ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. තවම බිම් මට්ටමේ තිබෙන්නේ. බිම් මට්ටමේ තිබෙද්දීත් දැනට ඒ ප්‍රශ්නය ඇවිස්සිලායි තිබෙන්නේ. කොට්ඨාස නිර්ණය කිරීම කියන එක දැන් කිසිදු විද්‍යාත්මක පදනමක් මත සිද්ධ වන්නේ නැහැ. ඒක මුළුමනින්ම දේශපාලන බලපෑම් මතයි සිද්ධ වන්නේ. දේශපාලන බලාධිකාරය මතයි සිද්ධ වන්නේ. එහෙම වුණාම සාධාරණයක් සිද්ධ වන්නේ නැහැ. ඒ නිසා මේක තවත් කැඳ හැළියක් බවට පත් වන එක අනිවාර්යයයි. පරණ ක්‍රමයට පත් වුණු මේ සභාපතිවරයා ඉවත් කරන්න අලුත් ක්‍රමයෙන් නීති හැදුවා. මේක හරි අපභ්‍රංසයක්. ඔවුන් තේරී පත් වුණේ පරණ ක්‍රමයට. පරණ පළාත් පාලන නීතියට අනුව තමයි පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් පත් වුණේ. එහෙම පත් වෙන කොට මේ පනත් කෙටුම්පත සම්මත වෙලා තිබුණේ නැහැ. හැබැයි ඔවුන් ඉවත් කරන්න අලුත් පනත පාවිච්චි කරනවා. හැබැයි එතැන විකෘතියක් වෙනවා. මේ විකෘතිය තේරුම් ගන්න එදා මේ ආණ්ඩුවට බැරි වුණා. "අලුත් මැතිවරණ ක්‍රමයක් මම ගෙනාවා, ඒක ගෙනෙන්න මූලික වුණේ ඇමතිවරයා විධියට දිනේෂ් ගුණවර්ධන කියන මම, ඒක තුළ රටේ ඉතිහාසයේ නමක් ඇති වෙනවා, අලුත් මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීමේ නිර්මාතෘවරයා විධියට ඒක ලියා ගන්න පුළුවන්" කියන එක තමයි එදා තිබුණ හදිසි වුවමනාව. ඉතින්, අද මොකක්ද වෙලා තිබෙන්නේ. වැරදි මැතිවරණ ක්‍රමයක, අවුල් සහගත මැතිවරණ ක්‍රමයක පීතෘවරයා වෙන්න ගිහිල්ලා අන්තිමට නැති අවුල් ඇති කරලා, නැති ප්‍රශ්න ඇති කරලා බිම් මට්ටමේ තමන්ගේම පක්ෂයේ මන්ත්‍රීවරු ගහ මරා ගන්නා තත්ත්වයට පත් වුණා. මෙසේ හුදු ජනප්‍රියවාදී විධියට නම ඉතිහාසගත කර ගන්න ගිය එකේ වැරැද්ද අද තමන්ගේ පක්ෂයටම අත්විඳින්න සිද්ධ වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි නැවත අවධාරණය කර කියනවා, මේ විධියට හදිසියේ -තකහනියේ- තමන්ගේ බලය පිළිබඳ ප්‍රශ්න මතු වුණාම පමණක් මේ පාර්ලිමේන්තුවට සංශෝධන ගෙනෙන්න එපා. ඒක මේ රටේ ජනතාවට කරන

අසාධාරණයක්. මේ රටේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ට කරන අසාධාරණයක්. ඡන්දයෙන් තේරී පත් වුණු බිම් මට්ටමේ මහජන නියෝජිතයන්ට කරන බරපතළ අසාධාරණයක්. ඒ අසාධාරණය කරන්න එපා. අදත් අපි ඒක කියනවා.

එදා අපි පැහැදිලිවම මේ තිබෙන පනත් කෙටුම්පතට සංශෝධන තුනක් ඉදිරිපත් කළා. අද මේ වන තෙක් ඒ සංශෝධන පිළිබඳව කිසිදු සාකච්ඡාවක් නැහැ. ඒ පනත් කෙටුම්පතේ තිබෙන ගණිතමය සූත්‍රය ඒ විධියටම සියයට 33ක් සමානුපාතික ක්‍රමයටයි, ඉතිරි සියයට 67 කේවල ක්‍රමටයි - කොට්ඨාස ක්‍රමයටයි- පත්වීමක් සිද්ධ වන්නේ නැහැ. එහෙම නැත්නම් සියයට 30ක් සමානුපාතික ක්‍රමයට, සියයට 70ක් කොට්ඨාස ක්‍රමයට ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ ගණිත සූත්‍රයම වැරදියි. ඒ ගණිත සූත්‍රයේ වැරැද්ද අපි එදා ඉතා පැහැදිලිව, තර්කානුකූලව, ගණිතමය වශයෙන් ඔප්පු කර පෙන්නුවා. හැබැයි, එදා තිබුණු කලබලයට ආණ්ඩුව ඒක පිළිගත්තේ නැහැ. ඒ නිසා සමානුපාතික ක්‍රමයට සියයට 70යි, කොට්ඨාස ක්‍රමයට සියයට 30යි කියන එක මේ පනතේ කොහේවත් හරියට සඳහන් වන්නේ නැහැ. ඒ ආයතනයක එක අවුරුද්දක නියෝජිතයෝ 25ක් හිටියොත්, සමහර වෙලාවට ලබන අවුරුද්දේ නියෝජිතයෝ 27ක් වෙනවා. ඒක වෙනස් වෙනවා. එවැනි අවිනිශ්චිත තත්ත්වයක් මේ පනතේ තිබෙනවා. එහෙම අවුල් ගොඩක් තිබෙනවා. මේ අවුල් ලිහන්න කාලය පැමිණ තිබෙනවා. තකහනියේ - හදිස්සියේ - මේ සංශෝධන ගෙනැල්ලා නැවත පටලවා ගන්නේ නැතුව, සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කරලා, භූ ගෝලීය ස්වභාවය සහ ජන සංයුතියේ ව්‍යාප්තිය වැනි සාධාරණ, විද්‍යායානුකූල පදනමක් මත කොට්ඨාස නිර්ණය කරන්න. එහෙම කොට්ඨාස නිර්ණය කරලා මේ මැතිවරණ ක්‍රමය වඩාත් නිවැරදි ආකාරයට ගෙනෙන්න. අන්න ඒ සාකච්ඡාවට අපි සූදානම්. සුජාතභාවයක් නැති තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා, බලහත්කාරී විධියට පනත් කෙටුම්පත් සම්මත කරන්න ලැහැස්ති වෙන්න එපා. සුජාතභාවයක් නැති තුනෙන් දෙකේ බලය පාවිච්චි කරලා පසු ගිය දවස්වල දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. එදත් හදිස්සිය තිබුණේ. එදත් හදිස්සිය තිබුණේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කණ්ඩායම ඉක්මනට ගන්න. වරදාන, වරප්‍රසාද දීලා ඒ කණ්ඩායම ගත්තා. තකහනියේ -හදිස්සියේ- දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. අද ඒක මහ අවුලක් වෙලා තිබෙනවා. තුන් වන වතාවටත් එන්න පුළුවන් වෙයි කියා හදපු සංශෝධනය අන්තිම අවුල් ජාලයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් මේ විධියටම තමයි වරද්දා ගත්තේ. පටු වුවමනා මත, බලය පිළිබඳ තිබුණු කෑදරකමත් එක්ක තකහනියේ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළා. හිතුවා, "දැන් හරි, තුන් වන වතාව නොවෙයි, හතර වන වතාව, පස් වන වතාවත් පුළුවන්# කියා. හැබැයි, අන්තිමට ඒ නීතිය බරපතළ වරද්දා ගැනීමකට ලක් වෙලා තිබෙනවා.

අන්න ඒ විධියටම තමයි මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතටත් වුණේ. ඒ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණේ 2010 සැප්තැම්බර් මස 09 වන දා. නමුත් වර්තමාන ජනාධිපතිවරයා පත් වුණේ 2010 ජනවාරි මාසයේ 27 වන දා. ඔහු තේරී පත් වුණේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතා පැහැදිලිව තිබෙන්නේ, "යම් කිසි පුද්ගලයෙක් ජනාධිපතිවරයා ලෙස ජනතාව විසින් තෝරා පත් කරනු ලබන්නේ නම්, දෙවන වතාවට තෝරා පත් කරනු ලබන්නේ නම්, තුන් වන වතාව සඳහා ඉල්ලීමට නුසුදුස්සෙක් වන්නේය" කියා. ඒක ඉතා පැහැදිලිව තිබෙනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව තමයි වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති පුටුවේ වාඩි වුණේ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණේ 2010 සැප්තැම්බර් 09 වන දා. ඒ ව්‍යවස්ථාව අතීතයට බලපාන්නේ නැහැ. ඒ ව්‍යවස්ථාව බලපාන්නේ එතැන් සිට ඉදිරියට. එය අතීතයට බලපාන්නේ නැහැ. ඒ පනත අර්ථ දැක්වීම අනුව ඒක අතීතයට බලපාන්නේ නැහැ කියා ඉතා පැහැදිලිව තිබෙනවා. මේ පිළිබඳව, ආණ්ඩුවට හිතවත්ව කඩේ යන ව්‍යවස්ථා ඔස්තාර්ලා කිසි කෙනෙක් එදා පෙන්වා දුන්නේ නැහැ. ඒ වරද්දා ගැනීම තමයි මේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ අද සිදු වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ප්‍රාදේශීය සභාවල මාධ්‍යවලට ඉඩක් නැහැ. ජාඇල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සභාවේ සල්ලිවලින් මැලේසියාවේ ගිය එක පිළිබඳව මාධ්‍යවේදියෙක් පත්තරයට ලිව්වා කියලා, එදා සිට ඒ මාධ්‍යවේදියාට ආවරණ කටයුතු කරන්න ඉඩ දෙන්නේ නැහැ. මේ තත්ත්වය හැම පළාත් පාලන ආයතනයකම තිබෙනවා. සභාපතිවරයා අත්තනෝමතික ලෙස බලය පාවිච්චි කරනවා. සභාවේ තිබෙන දේවල් ජනතාවට දැනුම් දෙන්න මාධ්‍යයට ඉඩක් දෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අද පළාත් පාලන ආයතනවල සංවර්ධන කටයුතු සඳහා ලෝක බැංකු ආධාර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. ඒ ටෙන්ඩරය අඩු මිලට ගත්තාට පස්සේ ලෝක බැංකු ආධාර යටතේ ලැබෙන සල්ලිවලින් ඉතුරු වෙන මුදලක් තිබෙනවා. ඒ මුදල අයිති වෙන්න ඕනෑ ඒ අදාළ දිස්ත්‍රික්කයට. හැබැයි, අද මොකද වෙන්නේ? ඒ දිස්ත්‍රික්කවල ඉතුරු වෙන සියලුම සල්ලි යන්නේ අම්පාර, අක්කරපත්තුවට විතරයි. නැගෙනහිර පළාතේ මඩකලපුව-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Vijitha Herath, please wind up now.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තත්පර කිහිපයකින් අවසන් කරනවා.

ලෝක බැංකු ආධාර යටතේ ලැබුණු, නැගෙනහිර පළාතේ ව්‍යාපෘතිවලින් ඉතුරු වෙන සියලුම සල්ලි යන්නේ අක්කරපත්තුවට විතරයි. මහනුවර, බදුල්ල සල්ලි යන්නේ අක්කරපත්තුවට විතරයි. මේක වැරදියි. මේ සල්ලි දිස්ත්‍රික්ක සංවර්ධනයට ඉතුරු විය යුතුයි. ඒ නිසා ලෝක බැංකුවත් දැන දැන මේ වැරැද්දට ඉඩ දීලා තිබෙනවා. අද පළාත් පාලන ආයතන තුළ මේ අක්‍රමිකතාව සිදු වෙනවා. එයත් වහාම නතර කළ යුතුයි කියමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. V.S. Radhakrishnan, please.

இன்று பிரதி அமைச்சராகப் பதவிப்பிரமாணம் செய்து கொண்ட உங்களை நான் வாழ்த்துகின்றேன்.

[பி.ப. 2.53]

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා (උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
*மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன் - தாவரவியல் பூங்காக்கள், பொதுப் பொழுதுபோக்கு அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. V.S. Radhakrishnan - Deputy Minister of Botanical Gardens and Public Recreation)
Thank you, Sir. இன்று காலை நான் பிரதி அமைச்சராகச் சத்தியப்பிரமாணம் செய்துகொண்டேன். அதற்காக, மேதகு

[ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා]

ஜனாதிபதி அவர்களுக்கும் அதற்கு உதவிய கௌரவ பெஸில் ராஜபக்ஷ அவர்களுக்கும் எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මා උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු නියෝජ්‍ය ඇමතිවරයා හැටියට දිවුරුම් දුන්නා. ඒ වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු බැසිල් රෝහණ රාජපක්ෂ ඇමතිතුමා ඇතුළු වත්මන් ආණ්ඩුවටත් මාගේ අවංක ස්තුතිය මා මේ වෙලාවේදී පුද කරනවා.

இன்று இந்தப் பாராளுமன்றத்திலே சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற உள்ளூராட்சிச் சபைகளின் விசேட பிரிவுக்குட்பட்ட கட்டளைச் சட்டத்தின்கீழ் இப்பொழுது இருக்கின்ற பிரதேச சபைகள் தொடர்ந்து இயங்குவதற்கு அந்தச் சட்டத்திலே இடம் இருக்கின்றது என்று கூறுகின்ற இந்தச் சட்டமூலம் சம்பந்தமாகவும் எங்களது பகுதியிலே இருக்கின்ற சில பிரச்சினைகள் சம்பந்தமாகவும் நான் இந்தச் சபையில் சில விடயங்களைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

நுவரெலியா மாவட்டம் கிட்டத்தட்ட 6 - 7 இலட்சம் மக்கள் வசிக்கின்ற ஒரு பகுதியாகும். இங்கே 5 பிரதேச சபைகளும் 5 பிரதேச செயலகங்களும்தான் இருக்கின்றன. இதனால் அங்குள்ள மக்கள் தமது தேவைகளை - பிரதேச செயலகத்திற்கு செல்லவேண்டிய தேவைகள், பிரதேச சபைக்குச் செல்ல வேண்டிய தேவைகள், மாநகர சபைக்குச் செல்லவேண்டிய தேவைகளை - பூர்த்தி செய்ய முடியாமல் மிகவும் கஷ்டமான சூழ்நிலையில் உள்ளனர். நுவரெலியா பிரதேச மக்கள் அங்குள்ள பிரதேச செயலகத்திற்கோ அல்லது பிரதேச சபைக்கோ போகவேண்டுமானால் கிட்டத்தட்ட 50 கிலோமீற்றர் தூரம் செல்லவேண்டிய சூழ்நிலை இருக்கின்றது. ஆகவே, அவர்கள் போய்த் திரும்பி வருவதற்கு கிட்டத்தட்ட 100 கிலோமீற்றர் தூரம் போகவேண்டும். இதேநிலையில்தான் அம்பகமுவ, கொத்மலை, வலப்பனை, ஹங்குரான்கெத்த ஆகிய பிரதேச செயலகங்களும் இருக்கின்றன. காரணம், இந்தப் பகுதிகளில் மக்கள் தொகை அதிகமானாலும் பிரதேச செயலகப் பிரிவுகள் அல்லது பிரதேச சபைகள் குறைவாகவே இருப்பதுதான். இதனால் நுவரெலியா மாவட்டத்தில் இருக்கின்ற எல்லாக் கட்சியினரும் சேர்ந்து கிட்டத்தட்ட 12 பிரதேச சபைகளை அந்தப் பகுதியிலே உருவாக்க வேண்டுமென்று ஏற்கெனவே அரசாங்கத்திடம் கேட்டிருக்கின்றோம்.

அதேபோன்று, அங்கே கிராமசேவகர் பிரிவுகளும் மிகவும் குறைவாகவே இருக்கின்றன. கிட்டத்தட்ட 3,000 - 4,000 மக்களுக்கு ஒரு கிராமசேவகர்தான் அங்கு கடமையாற்றுகின்றார். அரசாங்கத்தினுடைய நியதியின்படி கிட்டத்தட்ட 1,000 க்கு உட்பட்ட மக்களுக்கு ஒரு கிராம சேவகர் என்ற வகையில் கிராமசேவகர் பிரிவுகள் உருவாக்கப்பட வேண்டும். உதாரணமாக, கிழக்கு மாகாணத்திலே மட்டக்களப்பு மாவட்டத்தில் 12 கிராமசேவகர் பிரிவுகளுக்கு ஒரு பிரதேச செயலகம் இருக்கின்றது; பல பிரதேச சபைகள் உள்ள அப்பகுதிகளில் இப்படித்தான் நிலைமை இருக்கின்றது. ஆனால், நுவரெலியா மாவட்டத்திலே இருக்கின்ற நிலைமையானது மிகவும் வருந்தத்தக்க விடயமாகும். கடந்தவாரம் நடைபெற்ற ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலே நுவரெலியா பிரதேசத்தை 12ஆகப் பிரிப்பதன் மூலமாகப் பிரதேச சபைகளை அதிகரித்து, எதிர்காலத்திலே அந்த மக்களுக்கு நல்லதொரு சேவையைச் செய்வதற்கான வாய்ப்பை ஏற்படுத்தித்தரும்படி மாண்புமிகு அமைச்சர் அவர்களிடம் நாங்கள் கேட்டிருந்தோம். அத்துடன், பணம் ஒதுக்கீடு செய்யும்போது ஒரு பிரதேச சபைக்கு இவ்வளவு என்றுதான் பணம் ஒதுக்கப்படுகின்றது. இதனால் அங்குள்ள மக்களுக்கு அந்தப் பணம் போய்ச் சேர்வதிலே மிகவும் பிரச்சினையாக இருக்கின்றது. அதன்படி தோட்ட மக்களுக்குச் சேவையைச் செய்வதற்கு பிரதேச சபையாலும் முடியாது; பிரதேச செயலகத்தினாலும் முடியாது. இவ்வாறான ஒரு நிலைமைதான் அங்கு இருக்கின்றது என்பதை இச்சந்தர்ப்பத்தில் கூறிக்கொள்வதோடு, எதிர்காலத்திலே இவற்றை நிறைவுசெய்து தரவேண்டுமென்றும் மாண்புமிகு அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

அதேநேரத்திலே அங்கு இன்னுமொரு பிரச்சினையும் இருக்கின்றது. பிரதேச சபைகளின் பணத்திலே தோட்டப்புற மக்களுக்கு எந்தச் சேவையையும் செய்ய முடியாது என்று ஒரு சட்டம் இருக்கின்றது. அந்தச் சட்டத்தை அன்று நாங்கள் மாற்றித் தரச்சொன்னோம். புதிதாகச் சேர்க்கப்படுகின்ற பிரதேச சபைகள் சட்டத்திலே நாங்கள் அதை மாற்றுவதற்கான வழிமுறைகளை மாண்புமிகு அமைச்சர் அவர்களுக்குத் தெரிவித்திருக்கின்றோம். கௌரவ அமைச்சர்களான பெஸில் ராஜபக்ஷ அவர்களும் தினேஷ் குணவர்தன அவர்களும் விசேட குழுக் கூட்டத்திலே இதனை ஆராய்ந்து நடவடிக்கை எடுப்பதாக எங்களிடம் கூறியிருக்கின்றார்கள். උඩ පළාත என்ற பிரதேசத்தில் தோட்டப் பகுதியிலே வேலை செய்ததற்காக அந்தப் பிரதேச சபை கலைக்கப்பட்டது. இவ்வாறான ஒரு சூழ்நிலைதான் அந்தப் பகுதியிலே இருந்தது என்பதை நான் இந்தச் சபைக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஆகவே, எதிர்காலத்திலே இவ்வாறான ஒரு சூழ்நிலை ஏற்படாமல் இருப்பதற்கு இந்தச் சபையில் கொண்டுவருகின்ற புதிய சட்டங்களின்மூலம் நடவடிக்கை எடுக்க வேண்டும். அதேநேரம் பிரதேச சபைகள் தோட்டப்புற மக்களுக்குக் கட்டாயம் சேவை செய்யக்கூடிய வகையில் வாய்ப்புக்கள் ஏற்படுத்தப்பட வேண்டும் என்றும் நான் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று பதுளைப் பகுதியை எடுத்துக்கொண்டால், அங்கு அதிகமான மக்களைக் கொண்டுள்ள பசறை, அப்புத்தளை, ஹாலிஎல, பண்டாரவளை, நமுனுகொல போன்ற பகுதிகளிலும் பிரதேச சபைகள் பிரிக்கப்பட வேண்டும் என்பதையும் நான் இந்தச் சபைக்கு வலியுறுத்த விரும்புகின்றேன். அதுபோல், ஹற்றன் இப்பொழுது வளர்ந்து வருகின்ற ஒரு நகரமாகும். ஆகவே, ஹற்றனை ஒரு நகர சபையாகவும் அதேநேரம் பூண்டுலோயா, கொட்டகல, மஸ்கெலியா, ராகல, றிக்கலகஸ்கட போன்ற பகுதிகளையும் நகர சபை அந்தஸ்துக்குத் தரமுயர்த்த வேண்டுமென்றும் கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஏனென்றால், சிறுசிறு நகரங்களாக இருந்தாலும்கூட இன்று அவை வளர்ச்சியடைந்து வருகின்றன. அதேநேரம் இன்று நகர அபிவிருத்தி அதிகாரசபை இவ்வாறு வளர்ச்சியடைந்து வருகின்ற நகரங்களில் அதன் சேவையை விஸ்தரித்து வருகின்றது. இவ்வாறு நகர சபைகளை உருவாக்குவதன்மூலம் அங்குள்ள நகரப்புறங்களை வளர்ச்சியடையச் செய்ய முடியும். மக்களுக்குச் சேவை செய்வதுதான் உள்ளூராட்சிச் சபைகளின் கடமையாகும். உள்ளூராட்சிச் சபைகள் நல்ல முறையிலே சேவை செய்தால் மட்டுமே மக்கள் நன்மையடைவார்கள். கிராமப் பகுதியிலே கிராமசேவகர் மூலமும் மற்றும் பிரதேச மட்டத்தில் பிரதேச சபைகளின் மூலமும் மாகாண சபைகளின்மூலம் மாகாண மட்டத்திலும் இவ்வாறான சேவைகளை மேற்கொள்ள முடியும். ஆகவே, மக்களுக்குக் கூடிய விரைவில் சேவை செய்யக்கூடிய வகையில் சட்டங்களைத் திருத்துவதுடன் அந்தச் சபைகள் நல்ல முறையிலே இயங்கும் வகையில் புனரமைப்புச் செய்யப்படவும் வேண்டும்.

உள்ளூராட்சி மன்றத் தேர்தல்களில் புதிதாக கොට්ඨාස முறை அறிமுகப்படுத்தப்படவிருக்கின்றது. எங்களைப் பொறுத்தளவிலே பழைய முறை அதாவது இப்பொழுது இருக்கின்ற system தான் - preferential முறைதான் - சிறுபான்மையினருக்கு நன்மைபயப்பதாக இருக்கும். ஆனால், அமைச்சர் அவர்கள் எல்லாக் கட்சிகளுடனும் பேசி இந்தத் திருத்தத்தைச் செய்திருக்கின்றார் என்று நான் நினைக் கின்றேன். ஆகவே, நாங்கள் இதை எதிர்க்கவில்லை. ஆனால், எங்களுடைய அபிப்பிராயத்தைச் சொல்கின்றோம். நான் இங்கு பற்பல விடயங்களையும் கூறியுள்ளேன். அந்த விடயங் களில் விசேடமாகத் தோட்டப் பகுதிகளுக்குச் சேவை செய்கின்ற விடயத்தில் அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டும். எதிர்காலத்திலே நீங்கள் இதனை மேற் கொள்வீர்கள் என்ற எதிர்பார்ப்பு எங்களுக்கு இருக்கின்றது.

இறுதியாக, இன்று என்னை ஒரு பிரதி அமைச்சராக நியமித்த மேதகு ஜனாதிபதி அவர்களுக்கும் அதேநேரம் என்னை அரசியலுக்குக் கொண்டுவந்த மறைந்த தலைவர் கௌரவ சௌமியமூர்த்தி தொண்டமான் அவர்களுக்கும் எனது கட்சியான மலையக மக்கள் முன்னணியின் மறைந்த தலைவர் கௌரவ சந்திரசேகரன் அவர்களுக்கும் மற்றும் நுவரெலியா மக்களுக்கும் நான் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். அத்துடன் நான் இந்தப் பதவிக்கு வருவதற்கு எனது கட்சியைச் சேர்ந்தவர்கள் எல்லோரும் எல்லா வகையிலும் உதவி செய்திருக்கின்றார்கள். ஆகவே, அவர்களுக்கும் நான் இந்தத் தருணத்தில் எனது நன்றியையும் வாழ்த்துக்களையும் தெரிவித்து, எதிர்காலத்திலே மக்களுக்குச் சேவை செய்கின்ற ஒரு பிரதி அமைச்சராகச் செயற்படுவேன் என்று கூறி, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 3.02]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත සාකච්ඡාවට භාජනය වන මේ මොහොතේ මගේත් අදහස් කීපයක් එකතු කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේ මොකක්ද රාජ්‍ය පාර්ශ්වය කිව්වේ? පළාත් පාලන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් කරනවාය කිව්වා. ඓතිහාසික දිනයක් හැටියට මේ දිනය ඉතිහාසයට එකතු වන බව ප්‍රකාශ කළා. අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාය කිව්වා. ගරු වග කිව යුතු ඇමතිතුමා ප්‍රමුඛ මැති ඇමතිවරු ගණනාවක් රටටත්, ලොවටත්, පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කළ පුරසාරම් ඔක්කෝම ඇතුළත් 2012.10.10 හැන්සාඩ් වාර්තාව මා සතුව තිබෙනවා. එම හැන්සාඩ් වාර්තාවේ අදාළ කොටස් මම **සභාගත*** කරනවා.

2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතෙන් මොකක්ද පෙන්වා දුන්නු චිත්‍රය? පළාත් පාලන ක්ෂේත්‍රයේ කිසිදාක සිදු නොවුණු ඓතිහාසික, ධනාත්මක, ගුණාත්මක, හරයාත්මක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වනවාය කියන එක එදා අපට පෙන්වලා දුන්නා. අපේ පැත්තෙන් අපි ඒ සංශෝධනයේ තිබුණු අඩු පාඩු පෙන්වා දුන්නා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති අපි ඉදිරිපත් කළ විවේචන බොහෝ දෙනෙකු සමච්චලයට ලක් කළ බව; හිනා වුණ බව; විහිළුවක් හැටියට භාර ගත්ත බව. බොහෝ වෙලාවට කිව්වේ, අපි ඒ විවේචන කරන්නේ දේශපාලන වශයෙන් ලකුණු දමා ගන්න කියලායි; ජනප්‍රිය වෙන්න කියලායි; අපි මාධ්‍යවලට කථා කරනවා කිව්වා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? පළාත් පාලන ක්ෂේත්‍රයේ විස්මයජනක විපර්යාසයක් ක්‍රියාත්මක කරන්නට ඉදිරිපත් කළාය කිව්ව ඒ සංශෝධනය අද නැවතත් වරක් සංශෝධනය කරලා ආපහු හැරවීමක් දැන් තමුන්නාන්සේලා ක්‍රියාත්මක කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන දිනයකට -අද දවසට- යන වියදම? රුපියල් ලක්ෂ 150යි. වසරකට රුපියල් මිලියන 1,500ක් වෙන් කරනවා. දළ වශයෙන් වසරකට දින 100ක් පාර්ලිමේන්තුව රැස් වනවා. එක රැස්වීම් දවසකට රුපියල් ලක්ෂ 150යි -රුපියල් මිලියන 15යි-. දැන් රුපියල් මිලියන 15ක් වැය කරලා, අපේ කාලයත් නාස්ති කරලා, රටේ ධනයත් සූරාකාලා අද මේ පාර්ලිමේන්තු රැස්වීම් දිනය පවත්වන්නේ මොනවාටද? මේ සංශෝධනය ගෙනාවේ ජනතාව ගැන හිතලාද, මාතෘ භූමිය ගැන හිතලාද, එහෙම නැත්නම් තමුන්නාන්සේලාගේ දූෂිත සභාපතිවරු සුරකින්නද? රුපියල් ලක්ෂ 150ක් රටේ ධනය තමුන්නාන්සේලා කාබාසිනියා කරන්නේ තමන්ව රැක ගන්න; තමන්ගේ අඳබලයන් රැක ගන්න; තමන්ගේ අතකොළුවන් රැක ගන්න; තමන්ගේ හෙංචයියලා සුරක්ෂා කරන්න. බොහොම කනගාටුයි.

ගරු ඇමතිතුමනි, පසු ගිය කාලයේ රජය සතුව තිබුණු පළාත් පාලන ආයතනවල අය වැය ගණනාවක් පිට පිට පැරදුණා. පැවතුණ නීති-රීති, රෙගුලාසිවලට අනුකූලව නගරාධිපතිවරුන්ට, සභාපතිවරුන්ට තමන්ගේ පුටු අහිමි වුණා. ඒ බහුතරයක් දිහා බැලුවාම බොහෝ සභාපතිවරු අත්තනෝමතිකව කටයුතු කළ අයයි; දූෂිත ක්‍රියාදාමවලට සම්බන්ධ වුණු අයයි; පගා දේශපාලනයට, අල්ලස් දේශපාලනයට, කුඩු දේශපාලනයට, වංචාකාර දේශපාලනයට ලක් වුණු අයයි; ඒකාධිපති වියරුවෙන් තමන්ගේ හයිය උපයෝගි කර ගෙන තමන්ගේ මතය පමණක් ජයග්‍රහණය කරවන්නට කටයුතු කළ අයයි. දැන් පිට පිට අය වැය පැරදිලා, පුටු අහිමි වුණාම දූෂිත සභාපතිවරුන්ට යන එන මං නැති වුණා. කරකියා ගන්න දෙයක් නොමැතිව අසරණ වුණා. ඒ අයගේ උද්ධච්චකමත් ඉවත් වුණා. නැවතත් වරක් ඒ අයට අර නිහතමානි ආවේග ටික ආවා. කැටි වලාකුළුවල වැජඹුණු, කෙඳි වලාකුළුවල සැතපුණු මේ නගරාධිපතිවරුන්ට, සභාපතිවරුන්ට ඉහළ මාලයෙන් පහළට බැහැලා මහ පොළොවට පය ගසා පොදු මනුෂ්‍යයන් සමඟ නැවතත් වරක් අත්වැල් බැඳ ගන්න සිද්ධ වුණා.

ගරු ඇමතිතුමනි, මොකක්ද මේ සංශෝධනයෙන් සිද්ධ වෙන්නේ? නැවතත් වරක් තමුන්නාන්සේලා ඒකාධිපතිත්වයට තැන දෙනවා; ආඥාදායකත්වයට තැන දෙනවා. අල්ලස්කාරයින්ට, පගාකාරයින්ට, හොරුන්ට, දූෂිතයින්ට, ළමා අපචාරකරුවන්ට තැන ලැබෙනවා. ඒක තමයි තමුන්නාසේලාගේ රාජ්‍ය ප්‍රතිපත්තිය.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ අය මත පදනම් වුණු ඡන්ද බලයක් තමයි තමුන්නාන්සේලාට තිබෙන්නේ. තමුන්නාන්සේගේ කාල වේලාව

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තුළ තමුන්නාන්සේ උත්තර දෙන්න. තමුන්නාන්සේ මේ විවාදයට පැමිණියේත් ප්‍රමාද වෙලායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රජය රුපියල් ලක්ෂ 150ක් අද දවස වෙනුවෙන් වියදම් කර -රටේ ජනතාවගේ සල්ලි, බදු ගෙවන්නන්ගේ සල්ලි, මහජන මුදල් වියහියදම් කර- කවුරුන්ද මේ ආරක්ෂා කරන්න හදන්නේ? තමන්ගේ අතකොළුවන්ව, තමන්ගේ අඳබලයින්ව තමයි මේ ආරක්ෂා කරන්න හදන්නේ. අල්ලස, දූෂණය, ස්ත්‍රී අපචාර, ළමා අපචාර, දූෂිත ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කරන පුද්ගලයන් සුරැකීමට ඔබතුමන්ලාට පුළුවන්, රුපියල් ලක්ෂ 150ක් වියහියදම් කරන්න; වෙනමම පාර්ලිමේන්තුවේ කාලය කා දමන්න. බොහොම යසයි.

ගරු ඇමතිතුමනි, මේ වටිනා කාලය පළාත් පාලන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම සඳහා යෙදවීමට තමුන්නාන්සේලාට බැරිද? ඔබතුමා නොදන්නවා නම් මම ඔබතුමාගේ දැන ගැනීමට සහ රටේ දැන ගැනීමට මේ අපචාරවලට සම්බන්ධ, දූෂණවලට සම්බන්ධ, අල්ලස් ගත්ත, කොමිස් ගහපු සභාපතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා. ඔබතුමා මේවා මොනවාවත් දන්නේ නැහැ නේ. ඔබතුමා ඇමති තොත්ත බබා. මොනවාවත් දන්නේ නැහැ.

ගරු ඇමතිතුමනි, ඇයි ඔබතුමාට බැරි මේ පළාත් පාලන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න? ඔබතුමාට පුළුවන් ආයතන ශක්තිමත් කරන්න. ඔබතුමාට පුළුවන් බිම් මට්ටමත් සමඟ ලොකුම සම්බන්ධතාවක් තිබෙන අපගේ ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරුන් දිරි ගන්වන්න. ඔබතුමාට පුළුවන් ජනතා සේවය උදෙසා ඇප කැප වෙලා සිටින මේ මන්ත්‍රීවරුන්ට පහසුකම් සපයන්න. ඔබතුමාට පුළුවන්කම තිබුණා, අන්න ඒ සංශෝධන ටික ගෙන එන්න. ඔබතුමා ඒවා ගෙනාවේ නැහැ. කොටින්ම කිව්වොත් ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති 2012 වර්ෂයේදී මම ඉදිරිපත් කළ යෝජනා. මම ඇසුවා, පළාත් සභා මන්ත්‍රීවරයාට "මන්ත්‍රී" කියා කියනවා නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට "මන්ත්‍රී" කියා කියනවා නම් නගර සභාවේ, ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයින්ට "සභිකයින්" කියන්නේ ඇයි කියලා. ඇයි ඔවුන්ට "මන්ත්‍රීවරුන්" කියන්න බැරි? ඇයි අද තමුන්නාන්සේලාට මෙන්න මේ කාරණාව මෙම සංශෝධනයට ඇතුළත් කරන්න බැරි වුණේ? මොකද, ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීවරුන්ට, සභාපතිවරුන්ට "මන්ත්‍රී" කියා කිව්වාම ඔබතුමාට මදිකමක්ද? ඇයි ඔබතුමාට ඒ වාගේ හොඳ, දිගු කාලීන, ප්‍රගතිශීලී පියවරක් ගන්න බැරි වුණේ? ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ. 2012 වර්ෂයේ සංශෝධන පනත ගෙන එන කොට මේ රටේ තරුණයින්ට වෙන් කර තිබුණු සියයට 40 අපේක්ෂකත්වය ඔබතුමා අහෝසි කළා. කැලි, කැලිවලට ඉරලා දැම්මා. අපි යෝජනා කළා, කරුණාකර තරුණයින්ට සියයට 25කුත්, කාන්තාවන්ට සියයට 25කුත් අපේක්ෂකත්වය අනිවාර්යය කරන්නය කියලා. ඒවා වෙනුවෙන් තමුන්නාන්සේලාට සංශෝධන ගෙනෙන්න බැහැ. ඒවාට කාලය නැහැ. ඒවාට සල්ලි නැහැ. ඒවා හොඳ නැහැ. නමුත් දූෂිත සභාපතිවරුන් රැක ගැනීමට, අල්ලස්කාරයින් රැක ගැනීමට, පගාකාරයින් රැක ගැනීමට, කුඩුකාරයින් රැක ගැනීමට සහ හොරු තක්කඩි ටික රැක ගැනීම සඳහා සංශෝධන ගෙන ඒමට තමුන්නාන්සේලාට පුළුවන්. රටේ ජනතාවගේ සල්ලිවලින් මේ අද දවසේ වියදම විධියට රුපියල් මිලියන 15ක් -රුපියල් ලක්ෂ 150ක් - වැය කරන්නට ඔබතුමන්ලාට හැකියාව තිබෙනවා. නමුත් තරුණ අපේක්ෂකවරුන්ට සියයට 25ක නියෝජනයක් දෙන්න බැහැ; ඒවා හොඳ නැහැ. කාන්තාවන්ට සියයට 25ක නියෝජනයක් දෙන්න බැහැ. අපි ඉදිරිපත් කරන මේ අදහස් ජාති විරෝධීද, මව් බිමට විරෝධිව කරන කුමන්ත්‍රණයක්ද?

ගරු ඇමතිතුමනි, ඔබතුමා තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව කියවා නැත්නම් පොඩ්ඩක් කියවා බලන්න. මා මේ වාර්තාව හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා. මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ සාමාජිකයෙක් තමයි ජී.එල්. පීරිස් ඇමතිතුමාත්. එදා ඒ වාර්තාවෙන් ප්‍රකාශ කළා, 1971 කැරැල්ලටත්, 1988 - 1989 කැරැල්ලටත් ප්‍රධාන හේතුව ජන සමාජයෙන් තරුණයන් කොන් කිරීමයි කියලා. එම නිසා තමයි, සියයට 40ක නියෝජනයක් තරුණ පරපුරට වෙන් කළේ. ඔබතුමන්ලා 2012 දී මේ යෝජනා සියල්ලක්ම කැලි-කැලිවලට ඉරා දැම්මා. ඔබතුමන්ලා මහ ලොකුවට කථා කරනවා, "තාරුණ්‍යයට ශක්තිය" කියලා. තාරුණ්‍යය රැක ගන්නවා ලු. තාරුණ්‍යය බලා ගන්නවා ලු. හැබැයි තරුණ පරපුර වෙනුවෙන් වෙන් කරපු සියයට 40 අපේක්ෂකත්වය තමුන්නාන්සේලා එදා 2012 දී සහමුලින්ම අහෝසි කළා. අපි පුන-පුනා කිව්වා, එහෙම කරන්න එපා කියලා. අපි කිව්වා, සියයට 40ක් දෙන්න බැරි නම් සියයට 25ක් දෙන්න කියලා. අපි කිව්වා, කාන්තාවන්ට සියයට 25ක නියෝජනයකුත්, තරුණයන්ට සියයට 25ක නියෝජනයකුත් දෙන්න කියලා. ඔබතුමන්ලා එයට සවන් දුන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලාගේ ඇඟ පුරාම මොළය තිබෙනවා; සියල්ලක්ම දත්. ඔබතුමන්ලා හැම දෙයම දන්නවා. ඔබතුමන්ලාට සුපිරි දැනුමක් තිබෙනවා. හැම දෙයම දන්නා නිසා තමයි එදා කරපු දේ වසර දෙකකට පස්සේ අද ආපසු හරවා ගන්න සිද්ධ වුණේ. ඉදිරි කාලයේදී තමුන්නාන්සේලාට තව දේවල් හරවා ගන්න සිද්ධ වෙයි.

ගරු ඇමතිතුමනි, මා තමුන්නාන්සේට විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ සංශෝධන ගෙන ඒම අපේ කාලය කා දැමීමක් කියලා. ඇයි අපි සියලු දෙනාගේම කාලය කැවේ? ඇයි මේ මුදල් නාස්තිය කළේ?

මේ රටේ පළාත් පාලන ආයතන 335ක මහජන නියෝජිතයෝ 4,486 දෙනෙක් ඉන්නවා. අඩුම ගණනේ මේ අයගේ දීමනා පොඩ්ඩක් වැඩි කරන්න ඔබතුමාට සංශෝධනයක් ගෙනෙන්න තිබුණා නේද? දැන් බලන්න, ගරු ඇමතිතුමනි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ලැබෙන වැටුපෙන් හරි අඩක් ලැබෙනවා, පළාත් සභා මන්ත්‍රීවරයකුට. හැබැයි, පළාත් සභා මන්ත්‍රීවරයකුගේ වැටුපෙන් හරි අඩක් ලැබෙන්නේ නැහැ, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුට. නගරාධිපතිවරයාට රුපියල් 15,000ක් ලැබෙනවා, උපනගරාධිපතිවරයාට රුපියල් 10,000ක් ලැබෙනවා. නාගරික මන්ත්‍රීවරයාට රුපියල් 7,000ක් ලැබෙනවා. සුළු නගර සභා සහ ප්‍රාදේශීය සභාවල සභාපතිට රුපියල් 10,000ක් ලැබෙනවා, උපසභාපතිට රුපියල් 6,500ක් ලැබෙනවා, සභිකයකුට රුපියල් 5,000ත් ලැබෙනවා. තමුන්නාන්සේ කරුණාකරලා මට කියන්න, මේ රටේ බිම් මට්ටමත් සමඟ ඍජු සම්බන්ධතාවක් තිබෙන, මහ පොළවේ පය ගහලා වීදියක්-වීදියක්, මාවතක්-මාවතක්, නිවසක්-නිවසක්, ගෘහ මූලික පවුල් ඒකකයක්-පවුල් ඒකකයක් පාසා ඉතා ශක්තිමත් ජනතා සේවාවක් කරන අපේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට මේ වාගේ සොච්චම් දීමනාවකින් ඒ මහජන සේවය කරන්න පුළුවන්ද කියලා. එක පැත්තකින් මා පිළිගන්නවා, පළාත් පාලන

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ආයතනවල ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ සාක්කු පිරිලා තිබෙන බව. ඒක මා පිළිගන්නවා. දිවි නැඟුම කියයි, රට නැඟුම කියයි, උතුරු වසන්තය කියයි, නැඟෙනහිර නවෝදය කියයි, මහ නැඟුම, මහ ලැගුම, අර ලැගුම, මේ ලැගුම, අරයට කිරුළ, මෙයාට කිරුළ කියයි. ඔය හැම එකකින්ම ගසා කාලා, රාජ්‍ය පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කොටසකට හොඳ සන්තෝෂමක්, අල්ලසක් ලැබෙනවාය කියන එක මා පිළිගන්නවා. ඒවා ගැන නොවෙයි මා කථා කරන්නේ. මේ රටේ පළාත් පාලන ක්ෂේත්‍රයේ මන්ත්‍රීවරුන් හැටියට, මහජන නියෝජිතයන් හැටියට අද්විතීය ජනතා සේවාවක් කරන අපේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ගේ වේතනය අද වාගේ දවසක වැඩි කළා නම් නරකද? මේ කාලය මීඩංගු කරලා ඒ අයගේ දීමනා වැඩි කරන්න කථා කළා නම් නරකද? දූෂිතයන්, අල්ලස්කාරයන්, හොරුන්, වංචාකාරයන්, තමන්ගේ ගෝල බාලයන් ටික රැක ගන්නට සංශෝධන ගෙන එන මේ මොහොතේ අඩුම ගණනේ ප්‍රාදේශීය සභා, නගර සභා මන්ත්‍රීතුමන්ලාගේ සහ නියෝජිතයන්ගේ පඩිය පොඩ්ඩක් වැඩි කළා නම් නරකද? ඇයි, එහෙම කරන්න බැරිද? එහෙම කරන්න හයියක් ඔබතුමන්ලාට නැද්ද කියලා මා ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

බලන්න ගරු ඇමතිතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දුරකථන පහසුකම් තිබෙනවා; කාර්යාල පහසුකම් තිබෙනවා; ප්‍රවාහන පහසුකම් තිබෙනවා; fax පහසුකම් තිබෙනවා; photocopy පහසුකම් තිබෙනවා; පරිගණක පහසුකම් තිබෙනවා; ලිපි ද්‍රව්‍ය පහසුකම් තිබෙනවා. ඒ වාගේම, රුපියල් ලක්ෂ 300ක් වටිනා තීරු බදු රහිත වාහනයකුත් ලැබෙනවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට. එහෙවු සහන අප ලබා ගන්නා මෙවන් මොහොතක ඇයි ඔබතුමන්ලාගේ රජයට බැරි, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, නගර සභා මන්ත්‍රීවරුන්ට -රටට ඉමහත් සේවාවක් කරන, රටේ පොඩි මිනිහාගේ හදවත් හඳුනාගත්, රටේ ජන විඥානය අවබෝධ කරගත් ඒ බිම් මට්ටමේ නායකයන්ට- අඩුම ගණනේ තීරු බදු රහිත ත්‍රිරෝද රථයක්වත් ලබා දෙන්න? ඔබතුමන්ලාට ඒ වාගේ හැකියාවක් නැද්ද? ඒ වාගේ අදහසක් ඔබතුමන්ලාගේ හදවත්වල ඇති වන්නේ නැද්ද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙච්චර සහන රැසක් ලබා දෙන යුගයක ඇයි ඔබතුමන්ලාට බැරි, ප්‍රාදේශීය සභා ක්ෂේත්‍රයේ සිටින අපේ ආදරණීය මහ ජන නියෝජිතවරුන්ට, නගර සභා ක්ෂේත්‍රයේ සිටින මහ ජන නියෝජිතවරුන්ට ඒ සහන ටිකක් ලබා දෙන්න? අද ඒ අයට කාර්යාලයක් නැහැ; ලිපි ද්‍රව්‍ය නැහැ; උපකරණ නැහැ; කිසිම සහනයක් නැහැ. බොහොම අමාරුවෙන් තමයි තමන්ගේ යුතුකම ඉටු කරන්නේ. ඔවුන්ට ගහපු කතිරය, මනාපය වෙනුවෙන් ජනතාවට ඔවුන්ගේ සේවාව ඉටු කරන්නේ ඉමහත් බාධක මැද්දේ; ප්‍රශ්න රැසක් මැද්දේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් කාරුණිකව මේ ඉල්ලීම කරනවා. අපි අපේ හක්ක ගෙවෙන කල් මේ උත්තරීතර සභාවට මේ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. මේ රටේ පළාත් පාලන ආයතන ක්ෂේත්‍රයේ සිටින මන්ත්‍රීවරුන්ගෙන් විධිමත් ජනතා සේවාවක් ඉටු කර ගන්න-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Perumal Rajathurai to take the Chair?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I propose that the Hon. Perumal Rajathurai do now take the Chair.

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. PERUMAL RAJATHURAI *took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

විධිමත් ජනතා සේවාවක් කරන්න, ශක්තිමත් ජනතා සේවාවක් කරන්න පුළුවන් වන විධියට එතුමන්ලාටත් පහසුකම් සපයන්නට ඔබතුමන්ලාගේ හදවත්වල චින්තනයක් නිර්මාණය වන්නේ නැද්ද? ඔබතුමන්ලාගේ හදවත්වල ජනතාවාදී සංකල්ප බිහි වන්නේ නැද්ද?

ගරු ඇමතිතුමනි, අපි කථා කරනවා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ, පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්ගේ දීමනා ගැන. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ වසර පහක් සිටියොත් විශ්‍රාම වැටුපක් හිමි වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ දැන ගැනීමට මම කියන්න කැමැතියි, පළාත් පාලන ආයතනවල නොකඩවා වසර 10ක් සේවය කරපු හැම මන්ත්‍රීවරයකුටම විශ්‍රාම වැටුපක් ලබා දෙන්න වර්තමාන ජනාධිපතිතුමා අද ඊයේ නොවෙයි 2007 වසරේදී යෝජනා කළ බව. ඒ, ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා පළාත් පාලන පළාත් සභා අමාත්‍ය ධුරය දරපු සමයේ. මා ළඟ තිබෙනවා, ඒ කරුණු සියල්ල. එක දිගට වසර 10ක් පළාත් පාලන ආයතනවල සේවය කළා නම්, විශ්‍රාම වැටුපක් ලබා දෙනවා කියලා එදා පොරොන්දු වුණා. කවදාද? 2007 දී. අද වන කොට ඒ යෝජනාව ඉදිරිපත් කරලා වසර 7ක් ගිහිල්ලා ඉවරයි. මොකක්ද ඇමතිතුමෝ, මේකට කරන්නේ? මේ යෝජනාව ක්‍රියාත්මක කරනවාද? ජනාධිපතිතුමාම ලබා දුන්නු පොරොන්දුවක් මේක. ඇයි මේ යෝජනාව ක්‍රියාත්මක නොකරන්නේ? කරුණු නොදන්නා ඔබතුමාගේ දැන ගැනීමට මම ඒ තොරතුරු ඇතුළත් ලිපිය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා ගරු ඇමතිතුමනි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙය කියවා බලන්න. එතුමාම කරපු මේ යෝජනා ඇයි ක්‍රියාත්මක නොකරන්නේ? ඇයි මේවා වෙනුවෙන් ඔබතුමා සටන් වදින්නේ නැත්තේ ගරු ඇමතිතුමනි? මේවා ජනතාවාදී යෝජනා. ජනතාවගේ මහ ජන නියෝජිතයන් අතර ලොකුම මිත්‍රයා වන පළාත් පාලන ආයතන නියෝජිතවරුන්ගේ විශ්‍රාම වැටුප වෙනුවෙන් ඇයි ඔබතුමා සටන් නොකරන්නේ ගරු ඇමතිතුමනි? ඔබතුමාට කැපිල්ලක් තිබෙනවාද? ඔබතුමාට හයියක් නැද්ද මේ යෝජනා ඉදිරිපත් කරන්න? එහෙම නැත්නම් ඔබතුමා නාම මාත්‍රික ඇමතිවරයෙක්ද?

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

නිකම් ඉන්නන්වාලේ ඉන්නවාද? ඔහේ පුටුව රත් කර කර ඉන්නවා. ඒකද ඔබතුමාගේ වගකීම? මම දන්නවා, තමුන්නාන්සේ හොඳ දක්ෂ පුද්ගලයකු බව. ඔබතුමා නිර්වින්දනය කරපු පුද්ගලයකු වාගේ හැසිරෙන්න එපා. ගරු ඇමතිතුමා, බොහොම කාරුණිකව ඔතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. මේවා ප්‍රගතිශීලී විවේචන හැටියට බාර ගෙන, තමන්ගේ රාජ්‍ය නායකයා වසර හතකට පෙර පොරොන්දුවක් වුණා නම් -වසර දහයක් නොකඩවා සේවය කරපු පළාත් පාලන මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් වරම ලබා දෙනවාය කියන පොරොන්දුව දුන්නා නම්- වසර හතකට පස්සේ 2014 වසරේදීවත් ඒ පොරොන්දුව ක්‍රියාත්මක කරන්න ඔබතුමාට කොන්දක් තිබෙන්නට ඕනෑ. කරුණාකර රටේ නායකතුමාට මේක ක්‍රියාත්මක කරන්නට ඔබතුමා යෝජනා කරන්න. පැත්තකට වෙලා නිරුපද්‍රිතව බලාගෙන ඉන්නේ නැතුව ඔබතුමා යෝජනා කරන්න. මොකද, මම දන්නවා ගරු ඇමතිතුමනි, 2012 පනත ඉදිරිපත් කිරීමේදී ඔබතුමා එච්චර සතුටකින් නෙවෙයි ඒක ඉදිරිපත් කළේ කියලා. ඔබතුමා දැන ගත්තා මේවායේ අඩු පාඩුකම් තිබෙනවා කියලා. දේහ භාෂාව - body language - කියලා එකක් තියෙනවා නේ. ඔබතුමා ඒ සංශෝධන පනත් කෙටුම්පත එදා ඉදිරිපත් කරන වෙලාවේ හැකිළිලා එහාට මෙහාට පැද්දෙන කොට මම දැන ගත්තා ඔබතුමාට අපේ විවේචන තේරෙනවා කියලා. හැබැයි ඔබතුමාට ඇමතිකම රැක ගන්නට රජය වෙනුවෙන් කඩේ යන්නට වුණා. ඒක සිද්ධ වුණා. ඒ නිසා ගරු ඇමතිතුමනි, කරුණාකර මේක කියවන්න. 2007 නිර්දේශය මොකක්ද? පළාත් පාලන මන්ත්‍රීවරු වසර 10 ක් සම්පූර්ණ කළා නම් විශ්‍රාම වැටුප් වරම ලබා දෙනවා කිව්වා නම්, කරුණාකර බොරු කරන්නේ නැතිව, ප්‍රෝඩා කරන්නේ නැතිව, වංචා කරන්නේ නැතිව, මේ රටේ පළාත් පාලන මහජන නියෝජිතයින් මුළා කරන්නේ නැතුව මේ යෝජනා ටික ක්‍රියාත්මක කරන්න. ඔබතුමා ඒ කටයුතු කරයි කියලා මම හදපත්ලෙන් විශ්වාස කරනවා.

ඒ කරුණත් සමඟම ගරු ඇමතිතුමාගේ අවධානය මම යොමු කරන්නට කැමැතියි, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ අරමුණින් අද ගෙන ආ සංශෝධනය ගැන. මේකෙන් ඇතිවන ශක්තියක් නැහැ, ගරු ඇමතිතුමනි. මේ ගෙනැල්ලා තියෙන්නේ අල්ලස්කාරයො, මංකොල්ලකාරයො, දූෂිතයො, කුඩු ජාවාරම්කාරයො, ළමා අපචාරකාරයො, ස්ත්‍රී දූෂකයෝ රැක ගැනීමේ සංශෝධනයක්.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අරමුදලක් වෙන් වෙනවා. අද යුද්ධයක් නැහැ. යුද්ධයක් නැති නිසා සාමයේ ප්‍රතිලාභ ලබා දිය යුතු යුගයක්. කෝ අද peace dividend; කෝ අද සාමයේ ප්‍රතිලාභ? කෝ අර යුද්ධයෙන් ඉතුරු වුණු සල්ලි ටික? අද MiG යානාවලට, Kfir යානාවලට, multi-barrel rocket launchers, Bell හෙලිකොප්ටර්වලට, Hind හෙලිකොප්ටර්වලට, Dora බෝට්ටුවලට ඒ වැය කරපු සල්ලි ටික අද ඔක්කොම ඉතුරුයි. ඇයි ඒ ඉතුරු වුණ සල්ලිවලින් අඩුම ගාණේ අපේ රටේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අය වැයක් දෙන්නට බැරි? ලොකු ප්‍රමාණයක් ගැන මම කතා කරන්නේ නැහැ. ස්ථාවර විමධ්‍යගත අය වැයක්. ඇයි ඒ වාගේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න බැරි?

ඒ විතරක් නෙවෙයි, ඔබතුමා දන්නවා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 දෙනෙකුට අද සුපිරි නිල නිවාස හදාගෙන යන බව. පිහිනුම් තටාක පහසුකම්, ඒ වාගේම කාය වර්ධන මධ්‍යස්ථාන, cafeterias , තරු පහේ නිල නිවාස හදාගෙන යනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඔබතුමාට ඒවා එපා නම් ඒවා නොගෙන ඉන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට ඒවා අවශ්‍ය නැහැ. තමුන්නාන්සේ ඒවා ටික ලබා ගන්න කුලියට කඩින පුද්ගලයෙක්. මට ඒවා අවශ්‍ය නැහැ. [බාධා කිරීමක්] මම පැහැදිලිවම කියනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
There is no point of Order. මෙතුමා මේ නිකන් කුලියට කඩින්නෙ. කුලියට කඩේ යන්නෙ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරුන්ට සැපපහසුකම් තිබෙන නිල නිවාස හදාගෙන යනවා. අපේ සෞඛ්‍ය රක්ෂණය ලක්ෂ දෙකේ ඉඳන් වැඩි කරන්න හදනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I want to know from the Hon. Member whether that is the policy of -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, that is not a point of Order. Hon. Sajith Premadasa, you may proceed.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩකට නැති අදහස් වලට මේ ගරු සභාවේ වැදගත් කාලය මිඩංගු කරන්න ඉඩ දෙන්න එපා කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සෞඛ්‍ය රක්ෂණය ලක්ෂ දෙකේ ඉඳලා ලක්ෂ තුනහමාර, හතර දක්වා වැඩි කරන්න අපි අපිටම අත්සන් කර ගන්නවා; අපි අපිටම නිර්දේශ කර ගන්නවා. සුපිරි තරු පහේ නිල නිවාස හදා ගන්නවා. හැබැයි අපේ රටේ 4,500 ක් පමණ වූ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන්ට සෞඛ්‍ය රක්ෂණයක් තියෙනවාද ගරු ඇමතිතුමනි? ඇයි ඒ අයට නැත්තේ? ඇයි ඒ අයට දෙන්න බැරි? ඇයි පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් වෙනුවෙන් සටන් වදින්නේ නැත්තේ? ඒ අයගේ අයිතිය ආරක්ෂා කරන්නේ නැත්තේ?

මේ වැරදි පෙන්වා දෙනකොට, මේ අඩු පාඩු පෙන්වා දෙනකොට එදාත් මේ වාගේ කෑ ගැහුවා. හැබැයි එදා 'හූ' කියපු අයට වසර දෙකකින් ආපසු එන්න සිද්ධ වුණා, කරපු දෙය ආපහු හකුළා ගන්න. මේක හකුළා ගැනීමේ පනත් කෙටුම්පතක්; දූෂිතයෝ ආරක්ෂා කරන සංශෝධනයක්. "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සෞඛ්‍ය රක්ෂණයට මහා මුදල් සම්භාරයක් වෙන් කරන්න පුළුවන් නම් පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් වෙනුවෙන් පොඩි රක්ෂණාවරණයක් දෙන්න බැරි ඇයි, පොඩි සහනයක් දෙන්න බැරි ඇයි?" කියා මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. ඒ අයත් මහජන නියෝජිතයෝ නේද? ඒ අයත් මහජන මන්ත්‍රීවරු නේද? ඒ අයත් කතිරයෙන්, මනාපයෙන් ප්‍රාදේශීය සභාවලට, සුළු නගර සභාවලට, මහ නගර සභාවලට පත් වුණු පුද්ගලයෝ නේද? කවුරුවත් ඔබතුමාට මේවා යෝජනා කරන්නේ නැද්ද? එහෙම යෝජනා කරනවාට අකැමැතිද?

මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි, අද ඓතිහාසික දවසක් බව. ඇයි අද ඓතිහාසික දවසක් වෙලා තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදත් ඇමතිවරයෙක් පැටව් ගැහුවා. අදත් ඇමති කෙනෙක් පැටව් ගැහුවා. ඇමතිවරු පැටව් ගහන්න, ඇමතිවරුන්ට සල්ලි වෙන් කරන්න, ඇමතිවරුන්ගේ කාර්ය මණ්ඩලවලට සල්ලි වෙන් කරන්න පුළුවන්. හැබැයි පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට ජනතා සේවාවක් ඉෂ්ට කරන්නට සල්ලි වෙන් කරන්න බැහැ. ඒ නිසා මම විශේෂයෙන් ඇමතිතුමාට කියන්න කැමැතියි, ඔබතුමා වාගේ උගත්, බුද්ධිමත්, ප්‍රගතිශීලී ඇමතිවරයෙක් දූෂිතයෝ සුරැකීමේ සංශෝධනයක් මේ පාර්ලිමේන්තුවට ගෙනැවිත් තමුන්නාන්සේලාගේ අඳබාලයො ටික, අතකොළුවෝ ටික රැක ගන්නට මේ දරන නින්දිත උත්සාහය මම තරයේ හෙළා දකිනවාය කියන එක. එසේ හෙළා දකිමින් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අප ඉදිරිපත් කළේ බොහොම ප්‍රගතිශීලී අදහස්. අද මේ පළාත් පාලන ආයතනවලට වැඩ කරන්න සල්ලි නැහැ. අපේ ගරු නිරූපමා රාජපක්ෂ මැතිනිය මේ ගරු සභාවේ ඉන්න මොහොතේ මම කියනවා, මොනවාද හම්බන්තොට නගරාධිපති එරාජ් ප්‍රනාන්දු මැතිතුමා කියා තිබෙන්නේ කියන එක. 2014 අගෝස්තු 8 වැනි සිකුරාදා"ලක්බිම" පුවත්පතටඑතුමා කියා තිබෙනවා, "හම්බන්තොට මහ නගර සභාවට සල්ලි නෑ." කියා. ආශ්චර්යයේ පුරවරය! හම්බන්තොට මහ නගර සභාවට සල්ලි නැහැ කියා කවුද කියන්නේ? මම නොවෙයි කියන්නේ. එරාජ් ප්‍රනාන්දු කියන නගරාධිපතිතුමායි එහෙම කියන්නේ. මොකක්ද එතුමා කියා තිබෙන්නේ? එතුමා කියනවා, හම්බන්තොට මහ නගර සභාවට අපේක්ෂිත ආදායම නොලැබීම නිසාත්, දකුණු පළාත් සභාවෙන් අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසාත් නගර සභාව පවත්වාගෙන යාමට තමන්ට නොහැකි තත්ත්වයක් උදා වෙලා තිබෙනවාය කියා. කවුද එහෙම කියා තිබෙන්නේ? මම නොවෙයි. එරාජ් ප්‍රනාන්දු කියන නගරාධිපතිතුමායි එහෙම කියන්නේ. මොකක්ද එතුමා කියන්නේ? එතුමා මේ විධියට කියා තිබෙනවා:

> "හම්බන්තොට නගර සභාව මහ නගර සභාවක් බවට පත් කිරීමෙන් පසු ඉටු විය යුතුව තිබූ කිසිවක් මෙතෙක් ඉටු වී නොමැති බව පැවසූ නගරාධිපතිවරයා හම්බන්තොට නගර සභාවේ ජනතාවට වගකිවයුතු මහජන නියෝජිතයෙකු වශයෙන් තමන් කලකිරීමට පත්ව සිටින බවද පැවසීය."

මේ වන තුරු හම්බන්තොට මහ නගර සභාවට ලේකම්වරයකු නැහැ, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකු නැහැ, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු නැහැ, කළමනාකාර සහකාරවරයකු නැහැ කියා එතුමා කියනවා. කවුද එහෙම කියා තිබෙන්නේ? ජනාධිපතිතුමාගේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නගර සභාවේ නගරාධිපතිතුමායි.

එතකොට ගරු ඇමතිතුමනි, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පළාත් පාලන ක්ෂේත්‍රය සක්‍රිය කරන්න, ශක්තිමත් කරන්න, මුදල් වෙන් කරන්න තමුන්නාන්සේට බැහැ. පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනැල්ලා, මුදල් නැති පළාත් පාලන ආයතනවලට මුදල් වෙන් කරන්න, අද දවස උපයෝගී කරගන්න තිබුණා නේ. නමුත් මොකක්ද ඔබතුමා කළේ? අද රටේ ජනතාවගේ බදු මුදල්වලින් රුපියල් ලක්ෂ 150ක් විනාශ කරලා සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. මොකක්ද ඒ සංශෝධනය? දූෂිතයො රැක ගන්න, තනතුරු අහිමි වූ සභාපතිවරු රැක ගන්න ගෙනාපු සංශෝධනයක්. වාසනාවට ඒ සභාවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් සත්‍යය අවබෝධ වෙලා, යථාර්ථය වැටහිලා ඒ දූෂිතයො පරාජය කළා; ළමා අපචාරකරුවන් පරාජය කළා. ඒ අල්ලස්කාරයො, දූෂිතයො විනාශ කරන්න ඒ අය දේශපාලනික වශයෙන් කටයුතු කළා. හැබැයි, ගරු ඇමතිතුමනි, ඒ විනාශයට ලක් වුණු හොරු ටික රැක ගන්න ඔබතුමා සංශෝධනයක් ගෙනෙනවා. මොන විහිළුවක්ද?

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මම ඉදිරිපත් කළ අදහස් උදහස් සියල්ල හොඳින් අවබෝධ කර ගෙන කල් මරමින් ඉන්නේ නැතුව -මේ විවේචන 2012 දීත් අපි ඔබතුමාට ඉදිරිපත් කළා නේ- මේ අදහස්වලට සවන් දීලා මේවායින් පාඩමක් ඉගෙන ගෙන මේවා ක්‍රියාවට නඟන්න කියා. කල් මරමින් ඉන්න එපා, මේවා ගැන හිතලා බලන්න. අපි ඔබතුමාගෙන් බොහොම කරුණාවෙන් ඉල්ලනවා, මේවා ක්‍රියාවට නඟන්න කියලා. මේ යෝජනා ක්‍රියාවට නඟන්න ඔබතුමාට ශක්තිය, ධෛර්ය, වාසනාව, බුද්ධිය, දැනුම පැදේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.33]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - தொழில், தொழில் உறவுகள் அமைச்சர்)
(The Hon. Gamini Lokuge - Minister of Labour and Labour Relations)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හිත මිත්‍ර සජිත් ප්‍රේමදාස මහත්මයා කථා කළාට පස්සේ මට කථා කරන්නට ලැබීම භාග්‍යක් කියා මා හිතනවා. එතුමාගේ කථාව අහගෙන ඉන්නකොට මම බොහොම කනගාටු වුණා.

1948 ඉඳලා මේ රටේ ගම් සභා ක්‍රමය තිබුණා. එදා එක් එක් ප්‍රදේශ කොට්ඨාසවලට කඩලා මහ ජනයාගේ ඡන්දයෙන් මන්ත්‍රීවරු පත් වුණා. සුළු නගර සභාවලට ඒ විධියට මන්ත්‍රීවරු පත් වුණා. ඒ කාලයේ පළාත් සභා තිබුණේ නැහැ, මහ නගර සභාවටත්, පාර්ලිමේන්තුවටත් මන්ත්‍රීවරු පත් වුණා. ඒ ක්‍රමය වෙනස් කළේ කවුද කියලා සජිත් ප්‍රේමදාස මහත්මයාට මතක නැහැ නේ. මේ ක්‍රමය හඳුන්වලා දුන්නේ කවුද? එදා ආණ්ඩුවේ අතිගරු ජනාධිපතිතුමා ඒක හඳුන්වලා දුන්නා. පළාත් පාලන ඇමතිවරයා හැටියට එදා තමුන්නාන්සේගේ පියා තමයි ප්‍රාදේශීය සභා ක්‍රමය හඳුන්වලා දුන්නේ. ඒකේ තිබෙන එක වගන්තියක් තමයි අද සංශෝධනය කරන්නේ. තමුන්නාන්සේගේ පියා, ඇයි පනතක් සම්මත කර ගන්න ඡන්දයක් පවත්වලා දිනුවත්, පැරදුණත් ඒක දෙවැනි වතාවටත් ඉදිරිපත් කරන්න පුළුවන් කියා සම්මත කළේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇමතිතුමා, ඒක 2012 දී වෙනස් කළේ ඇයි?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒක නොවෙයි ප්‍රශ්නය. තමුන්නාන්සේ දැන් කිව්වා, හොරු තක්කඩි ආරක්ෂා කරන්න මේක සංශෝධනය කරනවා කියා. එහෙම කියනකොට අපි තමුන්නාන්සේට බාධා කරමින් උත්තර දෙන්න ගියේ නැහැ. තමුන්නාන්සේ ලංකාවේ තිබෙන වචන ඔක්කෝම පාවිච්චි කළා. හොරු, තක්කඩි, කුපාඩි ආරක්ෂා කරන්න හදනවා කියා කිව්වා. හොරු, තක්කඩි, කුඩුකාරයෝ ආරක්ෂා කරන්න හදනවා කියා මේ රටේ තිබෙන ඔක්කෝම වචන තමුන්නාන්සේ පාවිච්චි කළා. එහෙම නම් එදා තමුන්නාන්සේගේ පියාත් ඒ අය ආරක්ෂා කරන්නනේ මේක කරන්න ඇත්තේ. ඇයි එදා ඒක ගෙනාවේ? එදා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට වාහන දෙන්න තිබුණා. ඒ අයට වාහන දුන්නේ නැහැ නේ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
මන්ත්‍රීවරුන්ට වාහන දෙන්න තිබුණා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගාමිණී ලොකුගේ ඇමතිතුමනි, ඔබතුමාත් ඒවාට සහයෝගය දුන්නා නේ.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒක තමයි මම කියන්නේ. මම සම්පූර්ණ සහයෝගය දුන්නා. එදා ඒකට නායකත්වය දුන් කෙනාගේ පුතා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒකට විරුද්ධව කථා කරනකොටයි මම කල්පනා කළේ, ඇයි මේ අලුත් වෙනස කියා. [බාධා කිරීමක්] ක්‍රමය ගැන නේ කථා කරන්න ඕනෑ. අපි තමුන්නාන්සේට ගරු කරනවා. [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අහගන්නත් පුළුවන්, උගන්වන්නත් පුළුවන්.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඒ දෙකම අපි දන්නවා. තමුන්නාන්සේ ඒ දෙකෙන් ඕනෑ එකක් කරන්න. එහෙම නම් තමුන්නාන්සේ ප්‍රසිද්ධියේ කියන්න "එදා අපේ තාත්තා කරපු එක වැරැදියි" කියලා. තමුන්නාන්සේ ඒක කියන්නේ නැහැ නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එදා ඔය විධියට අය වැය පැරදුණාද?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
අය වැය පරදින්න විධියක් නැහැ නේ. නමුත් අය වැය කීයක් නම් පැරදුණාද? පැරදුණාට ඒ පනත නිසා මොකවත් වුණේ නැහැ.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
ආරක්ෂාව දුන්නේ තාත්තා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි එහෙම නම් ඒක 2012 දී වෙනස් කළේ?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
පොඩ්ඩක් ඉන්න. තමුන්නාන්සේගේ කථාවට අපි වචනයකින්වත් බාධා කළේ නැහැ. තමුන්නාන්සේ මහත්මයෙක් කියලා අපි පිළිගන්නවා. ඒ නිසා අපටත් කථා කරන්න ඉඩ දෙන්න. හැබැයි, තමුන්නාන්සේ කියන්නේ නැහැ "අපේ තාත්තා වැරැද්දක් කළා" කියා. තමන්ගේ තාත්තා ගෙනාපු පනතට සංශෝධනයක් ඉදිරිපත් කරනකොට තමුන්නාන්සේ කියනවා, "හොරු, තක්කඩියෝ ආරක්ෂා කරන්න හදනවා" කියා. ඒ කාලයේ තමුන්නාන්සේ ගෙදර හිටපු නිසා දන්නවා ඇති, ඒ උදවිය ආරක්ෂා කර ගන්නයි ඒ පනත ගෙනාවේ කියා. නැත්නම් ඒක එහෙම වෙන්න බැහැ නේ. නමුත් අද මේ සංශෝධනය ගෙනෙන්නේ ඒකට නොවෙයි. ඒ අය ඡන්දය ඉල්ලන අවස්ථාවේ මේ නීතිය තිබුණේ නැහැ. පාර්ලිමේන්තුවේ ඔක්කෝම එකතු වෙලා අනාගතය වෙනුවෙන්, ඉදිරි මැතිවරණය වෙනුවෙන් මේ පනත සංශෝධනය කළා. එතකොට මේ අය පත් වෙලායි සිටියේ. එසේ පත් වෙලා හිටපු අයට වුණ වැරැද්ද අනාගතයේදී එන අය වෙනුවෙන් නිවැරදි කරන්නයි මේක කරන්නේ.

ඊළඟ ප්‍රාදේශීය සභා මැතිවරණය කොට්ඨාස මට්ටමින් පැවැත් වුවාම ඒ පත් වන අයට නොවෙයි මෙන්න මේ සංශෝධනය කරන්න ඕනෑ. තමුන්නාන්සේගේ පියාට මම ගරු කරනවා. එතුමා දුර දිග බලා තමයි එදා ඒ කටයුත්ත කළේ. එතුමා ඒ කටයුත්ත කරන්න හේතුවක් තිබුණා. කෙනෙකු සභාපති වුණාම, නගරාධිපතිවරයෙකු වුණාම තමතමන්ගේම අය විරුද්ධ වෙලා, ඒ මනුස්සයාට හොඳ වැඩ පිළිවෙළවල් ගෙන යන්න ඉඩ දෙන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ජනාධිපතිතුමාට වාගේ.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
හොඳ වැඩ පිළිවෙළවල් ගෙන යන්න ඉඩ දෙන්නේ නැහැ. එහෙනම් තමුන්නාන්සේගේ තාත්තාටත් ඒක වෙලා ඇති. ඒ නිසා වෙන්න ඇති ඒ ගැන කථා කරන්නේ. එදා අප තමයි තමුන්නාන්සේගේ තාත්තා ආරක්ෂා කළේ. හරිද? නමුත් අප අවංකව කථා කරන්න ඕනෑ. ඒ අයව ආරක්ෂා කරන්න තමයි මේ පනත් කෙටුම්පත ගෙනාවේ.

මම ඇත්ත වශයෙන්ම සංශෝධනයක් ගෙනෙනවා, ඡන්දයෙන් පරාජය වුණු සභාපතිවරු සියලු දෙනා නැවත පත් කරන්න කියා. මොකද, ඒ අය මහජන ඡන්දයෙන් පත් වුණු අය. තමුන්නාන්සේයි, මමයි දෙදෙනාම දන්නවා, ආයතනයකට සභාපතිවරයෙකු පත් වුණාම හිටපු මිනිසුන් තරහ වෙනවා, කැපිලි කෙටිලි ඇති වෙනවා, නොයෙක් ප්‍රශ්න ඇති වෙනවාය කියා. ඒ හේතු නිසා තමයි මේ අය පරාජය වුණේ. එහෙම නැතිව මහජන ඡන්දයෙන් ඒ අය පරාජය වුණේ නැහැ. මහජන ඡන්දයෙන් පළාතේ වැඩිම ඡන්ද අරගෙන තමයි මේ හැම සභාපතිවරයෙකුම පත් වුණේ; හැම උපසභාපතිවරයෙකුම පත් වුණේ. ඒ ප්‍රතිපත්තිය තමයි තමුන්නාන්සේලා අනුගමනය කළේත්; ආණ්ඩුව අනුගමනය කළේත්. සභාපතිවරු පත් කරනකොට, උපසභාපතිවරු පත් කරනකොට ඒ කොට්ඨාසයේ වැඩිම මනාප ගත් අය තමයි පත් කළේ. ඒ මනාප ක්‍රමය ඇති කළේ තමුන්නාන්සේලා සහ අප සියලු

දෙනා එකතු වෙලායි. අද අප මනාප ක්‍රමය කොපමණ විවේචනය කළත් තමුන්නාන්සේලා සියලු දෙනා එකතු වෙලා තමයි ඒ කටයුත්ත කළේ. මේ පනත් කෙටුම්පත ගෙනාවේත් ආණ්ඩුව පමණක් මැදිහත් වෙලා නොවෙයි. දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මැතිවරණ ක්‍රමයේ වෙනසක් වෙන්න ඕනෑ කියා මේ පනත් කෙටුම්පත ගෙනාවා. ඒකට අප සියලු දෙනා එකතු වුණා. ඒ පනත් කෙටුම්පත ගෙනාවාට පස්සේ ඒ පනත් කෙටුම්පතේ යම් යම් අඩු පාඩුවලට තමුන්නාන්සේලාගේ නායකතුමා සංශෝධනයක් ගෙනාවා.

කෙනකුට ආසනයක් අහෝසි වුණොත් ආපසු ඔහු ඇතුළු කරන්නේ කොහොමද කියන කාරණයට මේ පනතින් ඉඩකඩ තිබුණේ නැහැ. අප දෙගොල්ලන්ම එකතු වෙලා ඒ සංශෝධනය පිළිගත්තා. ඇබෑර්තුවක් ඇති වුණාම කොහොමද ඔහුව ඇතුළු කරන්නේ කියන කාරණය සම්බන්ධව මුල් පනතේ තිබුණේ නැහැ. ඒ කාරණය අප මේ පනත් කෙටුම්පතට ඇතුළු කළා. විපක්ෂ නායකතුමා තමයි ඒ යෝජනාව ගෙනාවේ. අප කාටත් ඒ අඩු පාඩුව පෙනුණා. පනත් කෙටුම්පතක් ගෙනාවාම, ඒ පනත් කෙටුම්පතට අඩු පාඩු තිබෙනවා නම් අපට ඒවා සංශෝධනය කරන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ එවැනි සංශෝධනයන් ඕනෑ තරම් අප කර තිබෙනවා. ඒවා ඕනෑ තරම් අප නිවැරැදි කර තිබෙනවා. ඒවාට ඕනෑ තරම් අඩු පාඩු එකතු කර තිබෙනවා. ඒ කාරණා වෙනුවෙන් පාර්ලිමේන්තුව රැස් වනකොට ඒ සඳහා රුපියල් මිලියන 15ක් වියදම් කරනවා කියා චෝදනා කරනවා.

ඉතිහාසය ගත්තොත් ඕනෑ තරම් ඒ වාගේ සිද්ධීන් තිබෙනවා. මේවා මාධ්‍යයට පෙනෙන්න කථා කරන්න හොඳයි. මේවා හොඳයි, මාධ්‍යයට කථා කරන්න. තමන්ගේ පෙන්ෂන් එක දෙන්න කියලා කථා කරන්න හොඳයි. තමුන්නාන්සේට මම දැන් අභියෝගයක් කරනවා. ලබන වතාවේ තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයේ දමන්න, මේ හැම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුටම "පෙන්ෂන් එකක් දෙනවා, වාහනයක් දෙනවා, විමධ්‍යගත මුදල් දෙනවා" කියා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මේ පාර්ලිමේන්තුවේ කථා කර වැඩක් නැහැ නේ. ජනාධිපතිවරණය එනවා. එතකොට තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනය හදනවා. [බාධා කිරීමක්] දැන් තමුන්නාන්සේ එක්සත් ජාතික පක්ෂයේ උපනායකතුමා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. මේ ඔක්කොම මැතිවරණ ප්‍රකාශනයට දමන්න බැහැ කියා මම අභියෝග කරනවා. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවේ කථා කිරීම විතරක් නොවෙයි කරන්න ඕනෑ. ඒවා ක්‍රියාවටත් නඟන්න ඕනෑ. ක්‍රියාවට නඟන්න මේ පාර්ලිමේන්තුවේ කථා කර, පත්තරවලට කථා කර වැඩක් වන්නේ නැහැ. ජනාධිපතිවරණයේ දී තමුන්නාන්සේලා මැතිවරණ ප්‍රකාශනයක් ගහනවා. ඒ මැතිවරණ ප්‍රකාශනයට ඇතුළු කරන්න, තමුන්නාන්සේ අද කථා කරපු ඔක්කොම. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු රැස් වන්නේ නැත්නම් රුපියල් මිලියන 15ක් වියදම් වන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ට අප පඩි ගෙවනවා. මන්ත්‍රීවරුන්ට වාහන දෙනවා. මන්ත්‍රීවරුන්ට මුදල් දෙනවා. මේ පාර්ලිමේන්තුවේ අද කථා කරපු සියල්ලම තමුන්නාන්සේලාගේ මැතිවරණ ප්‍රකාශනයට ඇතුළත් කරන්න. මැතිවරණ ප්‍රකාශනයට දමා ජනතාවට කියන්න, "මෙන්න මේවා අප කරනවා" කියා. තමුන්නාන්සේලා මැතිවරණ ප්‍රකාශනයට දමන්නේ නැහැ. නමුත් මේ ගරු සභාවට ඇවිල්ලා කථා කරනවා.

අප දෙගොල්ලන්ම ආණ්ඩු කර තිබෙනවා. ඒ කාලයේ තිබුණු ආර්ථික තත්ත්වයන් අනුව, රටේ තිබෙන ආදායම් මාර්ග අනුව තමයි මේ හැම කටයුත්තක්ම කරන්නේ. විපක්ෂයට ගියාට පස්සේ ඒවා විවේචනය කර හරි යන්නේ නැහැ. රටක් කරනකොට, ඒ රටේ ආර්ථිකයත් එක්ක ඒ කටයුතු කරන්න ඕනෑ. මම බොහොම සතුටු වනවා, අද මේ පනත් කෙටුම්පත් සංශෝධනය කිරීම ගැන. ඒ එක්කම මම ඇමතිතුමාගෙන් ඉල්ලනවා, මේ සංශෝධනයත් එක්ක තවත් සංශෝධනයක් කරන්න කියා. ඒ අය ඡන්දය ඉල්ලන අවස්ථාවේ දී මේ පනත් කෙටුම්පත නොතිබුණු නිසා, ඒ තනතුර අහෝසි වුණ හැම සභාපතිවරයෙකුටම නැවතත් සභාපති හැටියට පත් වෙන්න අවස්ථාව දෙන්න වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා මම ඉල්ලනවා. මොකද, මහජන ඡන්දයෙන් තමයි ඒ අය පත් වෙලා ආවේ. මන්ත්‍රීවරු කණ්ඩායමකට පුළුවන්කමක් නැහැ, සභාපතිතුමාව අයින් කරන්න. ඒ අය අයින් කළේ වෙනත් කටයුත්තක් වෙනුවෙන් හරිගස්සපු පනතක් පාවිච්චි කරලායි. පළාත් සභා මැතිවරණය වෙනුවෙන් අපි අලුත් වැඩ පිළිවෙළක් ඇති කළා. [බාධා කිරීමක්] ඒක තිබුණා. ඒක ක්‍රියාත්මක කළේ ඒක නැතිව පත්වුණ අයට. [බාධා කිරීමක්] තමුන්නාන්සේගේ වෙලාවේදී කථා කරන්න. ඇත්ත වශයෙන්ම මේ සංශෝධන අද ඉදිරිපත් කළේ ඒක නිවැරදි කරන්නයි.

සජිත් ප්‍රේමදාස මහත්මයා කිව්වා, සංශෝධනයන් ගෙන ඒම ගැන. මේ රටේ ඉතිහාසය බැලුවොත් 1948 සිට ගෙනාපු හැම පනතකටම එක් එක් අවස්ථාවල සංශෝධන ගෙනැල්ලා තිබෙනවා; සැලසුම් ගෙනැල්ලා තිබෙනවා; ඒවාට අලුත් ඡේද එකතු කරලා තිබෙනවා. ඒක තමයි මේ පාර්ලිමේන්තු ක්‍රමයේ වැඩ පිළිවෙළ.

අද ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් ගෙනැවිත් තිබෙන්නේ වැරැද්දක් නිවැරදි කරන්නයි. සජිත් ප්‍රේමදාස මහත්මයාගේ පියාත් ඒ ක්‍රමය පිළිගත්තා. එතුමා තමයි මේ ක්‍රමය හඳුන්වලා දුන්නේ. මීට ඉස්සර තිබුණේ නැහැ මෙහෙම ක්‍රමයක්. පළාත් පාලන ආයතනයක අය වැය ඡන්දයෙන් පැරදුණොත් ඊළඟ වතාවේදී ඡන්දයෙන් එය සම්මත කර ගන්න පුළුවන්. එම ක්‍රමය හඳුන්වලා දුන්නේ සජිත් ප්‍රේමදාස මහතාගේ පියා. අපි ඒ කාලෙත් එතුමාට සහාය දුන්නා, ඒක හරියි කියලා. ඡන්දයෙන් පත් වුණ මන්ත්‍රීවරයෙක්, පක්ෂයක් අනුමත කරපු සභාපතිවරයෙක් මන්ත්‍රීවරු කණ්ඩායමකට එකතු වෙලා අයින් කරන්න බැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ තුළින් දැනට ඉන්න සභාපතිවරුන්ට ආරක්ෂාවක් ඇතිව තමන්ගේ කටයුතු කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. පුළුවන්නම් අර තනතුරු අහිමි වුණ සභාපතිවරුන්ට ඔවුන්ගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කර ගෙන නැවතත් ඒ තනතුරේ කටයුතු කරන්න වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට, ගරු රෝහණ දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.45]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon.# Rohana Dissanayake - Deputy Minister of Transport)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 252 වෙනි අධිකාරය වූ මහනගර සභා ආඥාපනත සංශෝධනය කිරීම, 255 වෙනි

[ගරු රෝහණ දිසානායක මහතා]

අධිකාරය වූ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම, 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ විශේෂ විධිවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත් අද දින ඉදිරිපත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතලේ මහ නගර සභාවේ හිටපු නගරාධිපතිවරයෙක් වශයෙන්; ඒ වාගේම අවස්ථා ගණනාවකදීම පළාත් පාලනයේ විශේෂ ජයග්‍රහණ ලබා ගත්ත කෙනෙක් වශයෙන්; ඒ වගේම ලංකාවේ හොඳම මහ නගර සභාව හැටියට ස්වර්ණපුරවරය සම්මානය ලබා ගත්ත කෙනෙක් වශයෙන් තමයි මම පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධයෙන් කතා කරන්නේ. විශේෂයෙන්ම අපේ රටේ මේ වෙන කොට මහ නගර සභා 23ක් තිබෙනවා, නගර සභා 41ක් තිබෙනවා, ප්‍රාදේශීය සභා 271ක් තිබෙනවා. එකතුව සමස්ත පළාත් පාලන ආයතන 335ක් මේ රටේ අද තිබෙනවා. මේ පළාත් පාලන ආයතන දිහා බලපුවාම විශේෂයෙන් අපි දකින දෙයක් තමයි සමස්ත ජන ජීවිතයේ උපතේ සිට මිනී වළ දක්වා - womb to tomb කියලා අපි කිව්වොත් එය ඉතාම නිවැරදියි- දෛනිකව කළ යුතු කාර්ය භාරය මහ නගර සභාවකින් එහෙම නැත්නම් පළාත් සභා ආයතනයකින් තමයි සිද්ධ කරන්නේ. අප රටේ පළාත් පාලන ඉතිහාසයට අපි ගියොත් පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ඉඳලා මෙය පැවතුණා. ඊට පස්සේ 1947දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේ එතුමා පළාත් පාලන ඇමතිතුමා වශයෙන් පළාත් පාලනයේ අලුත් යුගයක් නිර්මාණය කළා කිව්වොත් ඒක ඉතාම නිවැරදියි. පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ග්‍රාම රාජ්‍ය සංකල්පය ආරම්භ වුණා. එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ යුගයේදීත් මේ ක්‍රමය පැවතුණා. අද වන විට පවතින්නේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයයි. අපේ ගරු අතාවුල්ලා ඇමතිතුමා පළාත් පාලනයේ විශිෂ්ට වගකීමක් ඉෂ්ට කරන අමාත්‍යවරයෙක්.

පළාත් පාලනයේ මන්ත්‍රීතුමා කියන්නේ ප්‍රාදේශීය සභාවේ ඉන්න, ග්‍රාමීය මට්ටමේ, බිම් මට්ටමේ ඉන්න මහජන නියෝජිතයායි. විධායක ජනාධිපති, ඊළඟට පාර්ලිමේන්තුව; ඊළඟට පළාත් සභාව, ඊළඟට ප්‍රාදේශීය සභාව. ඒ විධියටයි යන්නේ. ග්‍රාමීය මට්ටමේ ගමේ ජනතාවත් එක්ක ජීවත් වෙන ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයා තමයි අපි දැක්ක විධියට ගමේ මාර්ගවලට විදුලිය ලබා දෙන්න, ගමට ජලය ලබා දෙන්න, පෙර පාසලට පහසුකම් සලසන්න, ගමේ ජනතාවට සෞඛ්‍ය පහසුකම් සලසන්න, ගමේ පාර හදන්න සහභාගි වුණේ. නමුත් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයට පෙර පළාත් පාලන ආයතන මන්ත්‍රීවරයකුට ගමේ කොන්ද කෙළින් තියාගෙන, සෘජුව නැඟී සිටින්න ශක්තියක් තිබුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා අද ඒ යුගය නිර්මාණය කර තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. අද ග්‍රාමීය සංවර්ධනය සිදු වෙලා තිබෙනවා.

ඈත දුෂ්කර ගම්මාන දිහා බලපුවාම මේ රටේ පළාත් පාලන ආයතන 335ක් හරහා ඉතාම සුවිශේෂී වූ සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා. ග්‍රාමීය සංවර්ධනය සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම පසු ගිය කාලයේදී දිවි නැඟුම ව්‍යාපෘතිය හරහා ගමේ ඩිස්පැන්සරිය හැදෙන විධිය අපි දැක්කා. ඒ වාගේම ගමේ අනෙකුත් සංවර්ධන කටයුතු සිද්ධ වන විධිය අපි දැක්කා. මෙකට විශාල ශක්තියක් ලබා දෙන්නේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුනුයි. 2005න් පස්සේ යුගය පළාත් පාලනයේ විශිෂ්ටතම යුගය වශයෙනුයි අපි දකින්නේ. ඒකට හේතුව, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් පළාත් පාලන මන්ත්‍රීවරයාට සුවිශේෂී කාර්ය භාරයක් ඉෂ්ට කිරීමේ වගකීම පැවරීමයි. විශාල මුදලක් වියදම් කරලා ගමේ මාර්ග නිර්මාණය කිරීම, ප්‍රජා සංවිධාන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම, ඉංජිනේරු සේවාවන් ක්‍රියාත්මක කිරීම, පරිසර හිතකාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළු සංස්කෘතික, ආගමික, සමාජයීය වැඩසටහන් ක්‍රියාත්මක කරන්න, ග්‍රාමීය සංවර්ධන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන්ට අද අවස්ථාව ලැබිලා තිබෙනවා. මහ නගර සභාවක නගරාධිපතිවරයාට, නගර සභාවක සභාපතිවරයාට, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ඔහුගේ වගකීම් ඉෂ්ට කරන්න යම් කිසි කාල සීමාවකට බලතල තිබිය යුතුයි. පෘථග්ජන මිනිස්සු වශයෙන් සමහර අවස්ථාවලදී සභාපතිවරයා වුණාට පස්සේ පක්ෂය අමතක කරලා, ප්‍රතිපත්ති අමතක කරලා, ඒ වාගේම ජනතාව අමතක කරලා වැඩ කටයුතු කරන්න ගිය අවස්ථාවලදී උප සභාපතිගේ ඉඳලා අනෙකුත් මන්ත්‍රීවරු නිරන්තරයෙන් ඔහු සමඟ විරුද්ධව තමයි කටයුතු කරන්නේ.

පසු ගිය කාලයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සම්බන්ධයෙන් කළ සංශෝධන තුළ එවැනි අවස්ථාවක් අපිට දකින්න ලැබුණා. මා නම් කවදාවත් ඒ මතයේ හිටියේ නැහැ. ඒ සංශෝධන තුළ සභාපතිවරයා අවුරුදු හතරකට පත් වුණා නම් සමහර වෙලාවට අවුරුද්දක් යන විට අනෙක් අයගේ විරුද්ධතා නිසා එහෙම නැත්නම් විරුද්ධවාදී බලපෑම් නිසා ඔහුට සභාපතිකමින්, නගරාධිපතිකමින් ඉල්ලා අස් වෙන්න, එහෙම නැත්නම් අයින් කරන්න, අයින් වෙන්න සිදු වුණු අවස්ථා තිබුණා.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් 1988 දී පළාත් පාලනය සඳහා ගෙනාපු වැඩ පිළිවෙළ තුළ නිරන්තරයෙන් නගරාධිපතිවරයාට, සභාපතිවරයාට යම් යම් බලතල තිබුණා. පළාත් පාලන ආයතනයක් නොවැම්බර් මාසයේදී හෝ දෙසැම්බර් මාසයේදී ඉදිරි අවුරුද්දේ අය වැය ලේඛනය ඉදිරිපත් කළාට පස්සේ සමහර විට පරදින්න පුළුවන්. එහෙම පැරදුණාම දෙවැනි වර අය වැය ඉදිරිපත් කිරීමේ අයිතිය සභාපතිවරයාට, නගරාධිපතිවරයාට, නැත්නම් පළාත් පාලන ආයතන ප්‍රධානියාට තිබෙනවා. දෙවැනි වරත් අය වැය පරාජයට පත් වුණා නම් තුන්වැනි වර ඉදිරිපත් කරලා එය සභා සම්මත වූ අය වැයක් වශයෙන් තමයි සලකන්නේ. ඒ තුළ යම් කිසි දැක්මක් අපි දකිනවා. මොකද, අවුරුදු හතරකට පත් වුණු සභාපතිවරයකුට, නගරාධිපතිවරයකුට තමන්ගේ ධුර කාලය තුළ යම් කිසි කාර්ය භාරයක් ඉෂ්ට කිරීමේ වගකීම තිබෙන බව අපි දැක්කා. මා හිතන හැටියට අය වැය ඡන්දය නිසා එහෙම නැත්නම් විරුද්ධවාදී බලවේග නිසා ඔහු එතැනින් ඉවත් කරලා වෙනත් කෙනකු පත් කරන්න ගියොත් අනෙක් ආයතනවලටත් ඒක බලපානවා. ඒ ක්‍රමය ආවොත් අවුරුදු හතරට නගරාධිපතිවරු හතර දෙනකු පත් වෙන්නත් පුළුවන්. අවුරුදු හතරට ප්‍රාදේශීය සභා සභාපතිවරු හතර දෙනකු පත් වන අවස්ථා ඇති වන්නත් පුළුවන්.

ඉන්දියාවේ පංචායට් ක්‍රමය අනුව සමහර පළාත් පාලන ආයතනවලට වසර පහකට වතාවක් පත්වන නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා අනිවාර්යයෙන්ම කාන්තාවක් වනවා. එහෙම නැත්නම් තරුණයෙක් වනවා. එවැනි ක්‍රමවේද තිබෙනවා. ඉන්දියාවේ පළාත් පාලන ආයතනවල සියයට 33ක බලයක් කාන්තාවන්ට ලබා දීම සිදු වනවා. මම හිතන්නේ ලංකාවේත් ඒ ක්‍රමය ඇති කරන්න ඕනෑ කියලායි. අනාගතයේදී ඒ ආකාරයට මේ නීති-රීති සංශෝධනය විය යුතුයි කියලා අපි කල්පනා කරනවා. විශේෂයෙන් කාන්තාවන්ට මේ සඳහා බලය ලබා දීම සිදු විය යුතුයි. පළාත් පාලනයේ විශිෂ්ටතම යුගය හැටියට තමයි මම මේ යුගය දකින්නේ.

මේ යුගයේ ග්‍රාමීය සංවර්ධනය ඇතුළුව අපේ රට සංවර්ධනය කිරීමේදී අපේ ඒකපුද්ගල ආදායම ගැන කල්පනා කරන්න වෙනවා. අපේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා, ජීවන මට්ටම උසස් කිරීම සඳහා අවශ්‍ය වන ඒ කටයුතු කාරණා දිහා බැලුවාම පළාත් පාලනයෙන් විශිෂ්ට කාර්ය භාරයක් ඉෂ්ට වන බව අපට පෙනෙනවා. නියමාකාරයෙන් තමන්ගේ වගකීම් කොටස ඉෂ්ට කරන පළාත් පාලන ආයතන මේ රටේ අපට ඇති කරන්න පුළුවන්

නම්, රජයකට තිබෙන, එහෙම නැත්නම් පළාත් සභාවකට තිබෙන ඒ වගකීම්වලින් විශාල ප්‍රමාණයක් බිම් මට්ටමේ ඉඳගෙන පළාත් පාලන ආයතනයකට ඉෂ්ට කරන්න පුළුවන් කියලා මම හිතනවා. ඒකට මුදල්ම අවශ්‍ය වෙනවා කියලා අපි කල්පනා කරන්නේ නැහැ. සමහර විට හිතා බලා මේ දේවල් කරන්න පුළුවන්.

යම් කිසි භූමි ප්‍රදේශයක් ගත්තාම නගර සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී, ඒ වාගේම පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී, ඒ වාගේම අධ්‍යාත්මික ගුණවගාවන් දියුණු කිරීමට සම්බන්ධ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කිරීමේදී, සමාජයීය තත්ත්වයන් ගොඩනැඟීමේ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේදී කියන මේ සෑම කාර්ය භාරයක් ඉටු කිරීමට පළාත් පාලන ආයතනයේ මූලිකයා වශයෙන්, පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා වශයෙන් සභාපතිවරයාට හෝ නගරාධිපතිවරයාට ඒ සඳහා විශේෂ වූ බලතල තිබෙනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අද මම නියෝජ්‍ය ඇමතිවරයෙකු වශයෙන් කටයුතු කරන කොට සමහර විට අපට බලතල නැහැ. හැබැයි, නගර සභාවක, ප්‍රාදේශීය සභාවක ප්‍රධාන මූල්‍ය නිලධාරියා බවට පත් වෙන්නේ නගරාධිපතිවරයා, ප්‍රාදේශීය සභා සභාපතිවරයා. ඒ නිසා වගකීම් ක්‍රියාත්මක කිරීමේදී තමන්ගේ තීන්දුවලට අනුව, ජනතා හිතවාදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව යම් කිසි ආකාරයකට ඔහුට ලැබෙනවා. ඒ නිසා මේ සංශෝධනය තුළ අපි කල්පනා කරනවා, කාලීනව මෙවැනි වෙනස්කම් සිද්ධ විය යුතුයි කියලා. පසු ගිය අවුරුද්දේ පළාත් පාලනයේ ඇති වූ යම් යම් සංශෝධනයන් නිසා යම් ආකාරයක කඩා වැටීම් පළාත් පාලන ආයතනවල අපි දැක්කා. ඒ නිසා ඒ කඩා වැටීම් නතර කර ගන්න දැන් අවස්ථාව එළඹිලා තිබෙනවා. ඒ තුළින් නැවත නැවත අපි ඒවා ඉගෙන ගෙන, අපි ඒවා අත් දැකීම්වලට අරගෙන පළාත් පාලනයේ ඇති වන ඒ කඩා වැටීම්වලදී ඒ හිස්තැන් පිරවීමේ වැඩසටහන් අද අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ නිසා මෙය සංශෝධනය කිරීම අද දවසේ ඉතාම වැදගත් කාර්යයක් වෙනවා. හැබැයි, සමහර සභාපතිවරු, නගරාධිපතිවරු බලයට පත් වුණාට පස්සේ තමන්ගේ දේශපාලන පක්ෂයේ තිබෙන ප්‍රතිපත්ති අමතක කරනවා. ඒ වාගේම නගර සභාව වෙනුවෙන්, ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ඉදිරිපත් කරපු තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අමතක කරනවා. ඒ වාගේම තමන්ගේ වගකීම් කොටස, ජනතාව වෙනුවෙන් කළ යුතු වගකීම් කොටස අමතක කරනවා. හැබැයි, එහෙම අමතක කරපු කෙනෙක් එළියට ගියාට කමක් නැහැ. නමුත්, මේ ක්‍රමය තුළ නොවෙයි. ඔහුට නිරන්තරයෙන් අවුරුදු 4 කට වතාවක් ඡන්දයකට ඉදිරිපත් වෙන්න සිද්ධ වෙනවා. ඒ අවස්ථාවේදී ජනතාව එය තීන්දු කරාවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධනය ක්‍රියාත්මක කිරීම ඉතාම කාලෝචිතයි. විශේෂයෙන් මම කියන්න කැමැතියි, නගරාධිපතිවරයෙක් වශයෙන් මම අවුරුදු පහක් මාතලේ මහ නගර සභාවේ කටයුතු කළ බව. අපි විශේෂ ජයග්‍රහණ ලැබුවා. අපි එක කණ්ඩායමක් විධියටත්, තනි තනිවත්, සාමූහිකවත්, අපේ වගකීම් කොටස ඉෂ්ට කළා. අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි මෑත ඉතිහාසයේ, මෑත යුගයේ මේ රටේ පළාත් පාලන ඉතිහාසයේ විශිෂ්ටතම ජනාධිපතිවරයා වශයෙන් අපි දකින්නේ. අපට කොන්ද කෙළින් තියාගෙන පළාත් පාලන ආයතනවලට ගිහිල්ලා, මන්ත්‍රීවරුන්ට තමන්ගේ ගමට ගිහිල්ලා, ජනතාව ඉස්සරහ, තමන්ගේ ඡන්ද දායකයන් ඉස්සරහ වැඩ කටයුතු කරන්න අවස්ථාව ලබා දුන් නායකයෙක් වශයෙන් තමයි අපි එතුමාව දකින්නේ. මේ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලන ආයතන සඳහා ආසන මට්ටමින් මැතිවරණ පවත්වන ඒ කේවල ක්‍රමය අපි දකිනවා. කේවල ක්‍රමය යටතේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරයාට මනාප ක්‍රමය යටතේ තමන්ගේ ජයග්‍රහණය සඳහා විශාල ප්‍රදේශයක් ආවරණය කිරීමට විශාල මුදලක් යොදවන්න වෙනවා. හැබැයි, කේවල ක්‍රමය යටතේ යම් කිසි කොට්ඨාසයකට සීමා වෙලා, කොට්ඨාසයකට වග කියන ජනතා නියෝජිතයෙක් බවට පත් කිරීමයි සිද්ධ වෙන්නේ. ඒ ක්‍රමය තුළින් පළාත් පාලනයේ නියම ප්‍රතිඵල ලබන්න අපට පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතනවල සිටින මන්ත්‍රීවරුන්ට ලැබෙන දීමනාව අලුත් අය වැයෙන් හරි යම් ආකාරයකින් මීට වඩා වැඩි වෙනවා නම් ඉතාම වැදගත් වෙනවා. ඔහුට මීට වඩා වැඩි දීමනාවක් ලැබිය යුතු වෙනවා. මොකද, පළාත් පාලන නියෝජිතයින් වශයෙන් පත් වුණු සියලු දෙනාම ගම්වල ඉඳගෙන ගමේ ජනතාව වෙනුවෙන් බොහොම වුවමනාවෙන් කටයුතු කරනවා. කොයි දේශපාලන පක්ෂය නියෝජනය කළත් ඔහුට ඒ අවස්ථාව ලබා දීම අපේ වග කීමක් බවට අපි කල්පනා කරනවා. ඒ නිසා මේ සංශෝධනයට ඔබ සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.58]

**ගරු කරු ජයසූරිය මහතා**
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත ගැන කථා කරන කොට මට එහි ඉතිහාසය ගැන මතක් වෙනවා. මනාප ක්‍රමය ඇතුළු මුළු මැතිවරණ ක්‍රමයේම වෙනසක් ඇති විය යුතු බවට විශාල මහජන මතයක් අවුරුදු ගණනාවක් තිස්සේ මේ රටේ තිබුණා. අන්න ඒ අවස්ථාවේදී -2001 දී- බලයට පත් වූ රනිල් වික්‍රමසිංහ රජය ප්‍රජාතන්ත්‍රවාදී පියවර කිහිපයක් අර ගත්තා. එම අවස්ථාවේදී අපි මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා අධ්‍යයනය කිරීමට තේරීම් කාරක සභාවක් පත් කළා. අපි හිතුවා, ප්‍රජාතන්ත්‍රවාදීව එහි සභාපතිත්වය විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට පැවරිය යුතුයි කියලා. ඒ අනුව තමයි අපි යෝජනා කළේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා එහි සභාපතිත්වය දැරිය යුතුයි කියලා.

එම කාරක සභාවේ අවසාන නිර්දේශ හා නිගමන ඉදිරිපත් කිරීමට දශකයකට වඩා කල් ගියත් අපි එයින් බලාපොරොත්තු වුණේ මේ මනාප ක්‍රමය නිසා ඇතිවන ගැටුම්, මිනිස් ඝාතන වැනි විනාශයන් නතර කිරීමයි. ඒ නිසා කවදා හෝ ආපහු හැරිලා බලන කොට අපට සන්තෝෂ වෙන්න පුළුවන්, මේ කාලය තුළ නව මැතිවරණ ක්‍රමයක් යෝජනා කරලා අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරන්න අපට පුළුවන් වුණා කියලා. ඒ වාගේම අපි බලාපොරොත්තු වුණේ, මේ තුළින් අලුත් දේශපාලන සංස්කෘතියක් වාගේම මැතිවරණ ක්‍රමයේ වෙනසක් ඇති කර නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම හා ගැටුම්වලින් තොර "ගරු මන්ත්‍රීතුමා" කියලා කටපුරා ආමන්ත්‍රණය කළ හැකි හොඳ මහජන නියෝජිතයන් තෝරා ගැනීමටයි. අපි දැක්කා, අතීතයේදී පළාත් පාලන නියෝජිතයින් වශයෙන් හුඟක්ම පත් කර ගත්තේ ඒ ප්‍රදේශයේ -තම ප්‍රදේශයේ- ජනතාවගේ ඕනෑ එපාකම්වලට කන් දෙන ඒ වාගේම වග කියන, ලෙඩට, දුකට, මඟුලට, මරණයට තමන් සමඟ එක්වන අය බව. එවැනි අය තමයි මහජන නියෝජිතයින් වශයෙන් එදා පළාත් පාලන ආයතන තුළට පැමිණියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මනාප ක්‍රමය ආවාට පස්සේ මේ දම්වැලේ පුරුක් කැඩුණා. ඒ වාගේම ඉදිරිපත් වෙන අපේක්ෂකයන්ගේ තරා තිරම දේශපාලන හේතූන් නිසා වෙනස් වුණා. අපි දැක්කා, සමහර අවස්ථාවලදී මිනී මරුවන්, ස්ත්‍රී දූෂකයන්, බෙබද්දන්, කුඩු ව්‍යාපාරිකයන් වාගේ අයත් මෑත යුගයේදී මේ පළාත් පාලන ආයතන තුළින් දේශපාලනයට ආපු ආකාරය; ඒ අය ක්‍රියා කළ ආකාරය. මේ නිසා හොඳ, අවංක මහජන නියෝජිතයින් වර්තමාන ක්‍රමය තුළ හුඟක් අසරණභාවයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අද මේ රටේ මුළු

[ගරු කරු ජයසූරිය මහතා]

මැතිවරණ ක්‍රමයම දූෂිත වෙලා තිබෙනවා කියලා කියන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම අපි අද දකිනවා, මැතිවරණ නීති-රීති අමු අමුවේ උල්ලංඝනය වන ආකාරය. පළාත් පාලන මන්ත්‍රීවරයකු වෙන්න සමහරු කෝටි ගණන් වියදම් කරන ආකාරය අපි දකිනවා. ඒ වාගේම බලය ලබා ගත් සමහර අයගේ හැසිරීම ගැන අපි අමුතුවෙන් සඳහන් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපි පෙරේදාත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ඒ සාකච්ඡා කරලා එකඟ වූ කරුණු වෙනස් කරන්න උත්සාහ කරන්න එපාය කියලායි මේ අවස්ථාවේදී අපි ගරු අමාත්‍යතුමාට කියන්නේ. මොකද අපට අවශ්‍ය වුණේ මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම තුළින් මේ රටේ සම්පූර්ණයෙන්ම අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරන්නයි.

හැම දාම ගහ ගන්නවාට, බැණ ගන්නවාට, මරා ගන්නවාට වැඩිය කාටත් සහයෝගයෙන් වැඩ කරන්න පුළුවන් අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීම තමයි අපි බලාපොරොත්තු වුණේ. ඒ වාගේම පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා වශයෙන් පත් වෙන තැනැත්තාට කා සමඟත් සහයෝගයෙන් වැඩ කරන්න වෙනවා. නමුත් සමහර පළාත් පාලන අයතනවල අද ඒකාධිපති ස්වරූපයෙන් හැසිරෙන ප්‍රධානීන් ඉන්නවා. ගැටුම් ඇති වෙන්නේ මෙන්න මේ වාගේ පුද්ගලයන් ප්‍රධාන මේසේ ඉන්න කොටයි. මේ යෝජනා ඉදිරිපත් කිරීමේදී අපි සැලකිල්ලට ගත්තේ මෙන්න මේ කරුණුයි. පසු ගිය අඟහරුවාදා ගරු පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා සහ රාජ්‍ය නිලධාරින් සමඟ අපි සාකච්ඡා කරන විටත් මේ කාරණය සඳහන් කළා. මුල් අවස්ථාවේ යම් යම් ගැටලු විසඳීමට සංශෝධන ගෙන ඒමට අපට අදහස් හුවමාරු කර ගන්න පුළුවන්. නමුත් අපි සම්පූර්ණයෙන් විරුද්ධයි, මේ පනත් කෙටුම්පත සම්පූර්ණයෙන් සංශෝධනය කරනවා නම්. මොකද, එහෙම සංශෝධනය කරලා මේ ක්‍රමය වෙනස් වුණොත්, දශකයකට වඩා කල් ගත කරමින් කටයුතු කරමින් නව දේශපාලන සංස්කෘතියක් මේ රටේ ඇති කිරීමට අපි ගන්නා උත්සාහයේ ප්‍රතිඵල ලැබෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පළාත් පාලන ක්‍රමය හරහා දේශපාලනයට පැමිණි අය වශයෙන් වර්තමාන ක්‍රමයේ ඇති අඩු පාඩු, අඩු ලුහුඬු තැන් අප තේරුම් අරගෙන තිබෙනවා. බොහෝ අවස්ථාවලදී ගැටුම් ඇති වෙන්නේ ප්‍රධානීන් හිතුවක්කාරී ලෙස හැසිරීම නිසායි. සමහර විට පක්ෂයේ නියෝගවලටත් පිටුපාන, පක්ෂයේ ඉහළ තැන්වලින් දෙන නියෝගවලටත් පිටුපාන පළාත් පාලන ආයතන ප්‍රධානීන් ඉන්නවා. මීට ඉහතදී එක්සත් ජාතික පක්ෂය කළ අත්හදා බැලීම් තුළින්, අපි ලබා ගත් අත්දැකීම් තුළින් අපි දන්නවා පළාත් පාලන ආයතන තුළ බලය බෙදා හැරීම ඉතාම යෝග්‍ය බව. එක්සත් ජාතික පක්ෂය සැම විටම විශ්වාස කරන්නේ කමිටු ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් බවයි. එක්සත් ජාතික පක්ෂයට බලය තිබෙන පළාත් පාලන ආයතනවල අපි මේ ක්‍රමය බොහොම සාර්ථකව අත්හදා බැලුවා. මට මතක් වෙනවා, 1997 දී එක්සත් ජාතික පක්ෂය කොළඹ මහා නගර සභාවේ බලය ලබා ගත් අවස්ථාවේදී, එදා දේශපාලන දැවැන්තයන් වශයෙන් හිටපු විමල් වීරවංශ මැතිතුමා, ගීතාංජන ගුණවර්ධන මැතිතුමා, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා, ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න මැතිතුමා වැනි දේශපාලනඥයන් මේ කමිටු ක්‍රමය තුළ බොහොම සාර්ථකව නගරවාසීන්ට විශාල සේවාවක් කළ බව. ඒ අයගේ සහයෝගය තුළ කොළඹ මහා නගර සභාව තුළ සම්පූර්ණ වෙනසක් ඇති කරන්න පුළුවන් වුණා. ඒ නිසා මේ කමිටු ක්‍රමය කෙරෙහි මම රජයේ අවධානය යොමු කරනවා වාගේම, ගරු ඇමතිතුමාගේත් අවධානය යොමු කරනවා. හුඟක් පළාත් පාලන ආයතනවල කමිටු නම් කරලා තිබුණත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ කමිටුවලට අවශ්‍ය කරන බලතල දීලා ක්‍රියාත්මක කිරීමට පුළුවන් නම් අපට සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් කියලා මම හිතනවා. ඒ වාගේම දේශපාලන පක්ෂවලට පුළුවන් මේ කමිටුවල සාර්ථකත්වය පිළිබඳව අධීක්ෂණය කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මා දකින ආකාරයට බිම් මට්ටමේ ජනතාවට සමීපතම පළාත් පාලන ආයතනය තමයි ප්‍රාදේශීය සභාව, එහෙම නැත්නම් නගර සභාව. ඒවා තුළින් කාර්යක්ෂම සේවාවක් මහ ජනතාවට ලබා දෙන්නට පුළුවන්. ඒ නිසා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ ක්‍රමය ගැන අධ්‍යයනය කරන්න කියලා. ඒ සම්බන්ධව කළ විවිධ researches, ඒ අධ්‍යයනය කළ විස්තර අප සතුව තිබෙනවා. දේශීයව මෙන්ම විදේශීයව කළ අධ්‍යයන පිළිබඳ විස්තර අප සතුව තිබෙනවා. අමාත්‍යතුමාට ඕනෑ නම් අපට ඒ විස්තර ලබා දෙන්න පුළුවන්.

අපි තවත් කරුණක් ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. පසු ගිය අඟහරුවාදා අපි අමාත්‍යතුමා හමු වූ අවස්ථාවේදී අපි බොහොම ගෞරවනීය ඉල්ලීමක් කළා, දැනට අවසන් කර ඇති කොට්ඨාස නිර්ණය කිරීමේ විස්තර දේශපාලන පක්ෂ වශයෙන් අපට ලබා දෙන්න කියලා. ඒ ඉල්ලීම අපි කළේ කරුණු කිහිපයක් නිසායි. රජයේ මන්ත්‍රීවරුන්ට, රජයේ ඇමතිවරුන්ට දිසාපති කාර්යාල හරහා ඒවා ලබා ගන්න පුළුවන්. මම දන්නවා හුඟක් තැන්වල ඒවා ලබා ගෙන තිබෙන බව. නමුත් විපක්ෂයේ අපට ඒවා ලබා ගන්න බැහැ. මෙහිදී සමහර විට අඩු පාඩු වෙන්න පුළුවන්. ඒ වාගේම අපි දන්නා විධියට සමහර අවස්ථාවලදී යම් යම් දේශපාලන බලපෑම් තුළ මේ කොට්ඨාස බෙදීම සාධාරණව වෙලා නැහැ. ඒ නිසා මම මේ පිළිබඳව එදා ගරු අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශ ලේකම්තුමාටත් කිව්වා. අපි විශ්වාස කරනවා අවසාන පනත් කෙටුම්පත අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීමට පෙර අපට ලුහුඬු පිටපතක් ලබා දෙයි කියා. ඉන් පසුව ඒ පිළිබඳව සාකච්ඡා කරලා අවසාන පිටපත ජනාධිපතිතුමාට දෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි පසු ගිය දා දැක්කා කොට්ඨාස සීමා නිර්ණය කොමිසමේ සභාපතිවරයා ඇතුළු රාජ්‍ය නිලධාරින් 6 දෙනෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපති මෙහෙයුම් කාර්යාලය විවෘත කිරීමේ උත්සවයට සහභාගි වුණු බව. රාජ්‍ය නිලධාරින් මෙසේ එළිපිටම දේශපාලනයට සහභාගි වෙනවා නම්, එහෙමපිටින්ම දේශපාලන ලේබල් ගහ ගන්නවා නම් යුක්තිගරුක, නීතිගරුක, සාධාරණ මැතිවරණයක් බලාපොරොත්තු වන්නට බැහැ. ඒ වාගේම මේ සීමා නිර්ණය කරන කමිටුවේ සභාපතිවරයා මේ වාගේ උත්සවයකට සහභාගි වීමෙන් අපට විශාල සැකයක් ඇති වෙනවා. ඒ නිසා අපි අවසාන වශයෙන් කියන්නේ මේ මැතිවරණය නිදහස් සහ සාධාරණ විය යුතු බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, හෘදය සාක්ෂිය අනුව තමන් කැමැති දේශපාලන නායකත්වයක්, දේශපාලන දර්ශනයක්, දේශපාලන නියෝජිතයෙක් තෝරා ගැනීමට ඇති අයිතිය, නිදහස් හා සාධරණ මැතිවරණයක් තුළින් ලබා දෙන ලෙස අපි රජයෙන් ඉල්ලනවා. මෑත යුගයේදී එසේ වන්නේ නැති බව අපි කියනවා. ඒ නිසායි අපි මේ කරුණු සඳහන් කරන්නේ. එක්සත් ජාතික පක්ෂය හැම විටම මහජන මතයට හිස නමන පක්ෂයක්.

බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ප.ව. 4.08]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

தமிழ் பேசுகின்ற ஒரு பெருமகன் அக்கிராசனத்தில் அமர்ந்திருக்கின்ற இவ்வேளையிலே, உங்களுக்கும் கௌரவ பாராளுமன்ற உறுப்பினர்களுக்கும் பாராளுமன்றச் செயலாளர்கள் மற்றும் அனைத்து ஊழியர்களுக்கும் என்னுடைய ஹஜ்ஜுப் பெருநாள் வாழ்த்துக்களைத் தெரிவித்துக் கொள்வதில் மிக்க மகிழ்ச்சியடைகின்றேன். ஈத் - முபாரக்!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ උණු උණුවේ ලැබුණු ප්‍රවෘත්තියක්, දැන් ලැබුණු ඡන්ද ප්‍රතිඵලයක් මම මේ ගරු සභාව ඉදිරියේ ප්‍රකාශයට පත් කරනවා.

The website, "www.adaderana.lk" states, "12.5 kg gas cylinder reduced by Rs. 250"

මේ දැන් ලැබුණු ඡන්ද ප්‍රතිඵලයක්. තවත් ඡන්ද ප්‍රතිඵල එනවා. [බාධා කිරීම්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අඩු වෙන්න පටන් ගත්තා විතරයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඉවසන්න. Electricity වලින් රුපියල් 250යි. මේකෙන් රුපියල් 250යි. සාමාන්‍ය පවුලකට රුපියල් 500ක සහනාධාරයක් මේ රජය විසින් දැනටමත් දී තිබෙන බව මා ඉතා සන්තෝෂයෙන් ප්‍රකාශ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණ මේ උත්තරීතර සභාව තුළ ප්‍රකාශයට පත් කරන්න මට ලැබුණු සුබ මොහොතක් මේක. [බාධා කිරීම්] එහෙම නම්, තමුන්නාන්සේලා අය වැය ගැනත් බලාපොරොත්තුවෙන් ඉන්න. තමුන්නාන්සේලා මොන උප්පරවැට්ටි දැම්මත්, ඌව ගැන කථා කළත්, ඌව ගැන නම් කියන්න වුවමනා කරන්නේ නැහැ. ඒක තමුන්නාන්සේලාගේ ජයග්‍රහණයක් කියලා එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලා හිතනවා නම්, එසේ සිතීම අපට බොහොම සතුටුදායක දෙයක් බව අපි ප්‍රකාශ කරන්න කැමැතියි. අපි දිනලා ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා මහ ඇමති වශයෙන් දිවුරුම් දුන්නාට පස්සේ, මේ පාර්ලිමේන්තුවේ ඉඳලා ගිය අපේ මිත්‍ර හරින් ප්‍රනාන්දු මැතිතුමාට විරුද්ධ පක්ෂයේ නායක ධුරයවත් ලැබෙයි දෝ කියා අපි හිතුවා. ඒක නම් ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපේ පරණ මිත්‍රයා, රවීන්ද්‍ර සමරවීර මැතිතුමා ඒ පළාතේ, වැලිමඩ ප්‍රදේශයේ, ජ්‍යෙෂ්ඨ එක්සත් ජාතික පාක්ෂිකයෙක්. එතුමාට ඒ තනතුර ලැබෙන්න තිබුණා. නමුත් මෙතැනින් ගිය එක්කෙනා ඒක ඩැහැගත්තා.

Sir, while I was listening to the Hon. Sajith Premadasa I was reminded of the axiom, "Empty vessels make the most sound". එතුමා කිසිම හරයක් නැති කථාවක් කළා. එතුමා තම පියාටත් නිගරු කළා. එතුමා කියනවා, මේ ප්‍රාදේශීය සභාවල තිබෙන system එක අනුව දූෂිතයෝ ඉන්නවාලු; කුඩුකාරයෝ ඉන්නවාලු; ස්ත්‍රී දූෂකයෝ ඉන්නවාලු; වංචාකාරයෝ ඉන්නවාලු. එහෙම මිනිසුන්ට තැන දුන්නේ ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමාද කියන එක මම එතුමාගෙන් අහනවා. මා නම් එහෙම කියන්නේ නැහැ. එතුමාගේ පුතා තමයි අද මේ ගරු සභාවේදී අලුත් වෙස් මුහුණක් බැඳගෙන ඇවිත් - Deputy Leader ද, මොන leader ද, මම දන්නේ නැහැ. - තමන්ගේ තාත්තාටම අපහාස කළාය කියන එක මම තමුන්නාන්සේලා ඉදිරියේදී, රටට ප්‍රකාශ කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இன்று உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சராக இருக்கின்ற மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா அவர்கள் அருமையான, பெறுமதிமிக்க ஓர் அமைச்சர். கிழக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள சிறந்ததொரு தலைவரென நாங்கள் அவரை நாகூசாமல் அழைக்கலாம். அதனை, அவர் இச்சபையில் கொண்டுவந்திருக்கின்ற திருத்தச் சட்டமூலங்களினூடாக - மசோதாக்களினூடாக நிரூபித்து விட்டார். இலங்கை என்பது ஒரு தனி நாடு; ஐக்கியப்பட்ட ஒரு நாடு. அந்தந்த மாகாணங்களிலுள்ள உள்ளூராட்சி சபைகள் தனித்தனியாக இயங்க வேண்டும். வடக்கும் கிழக்கும் இணைய இடமளிக்க முடியாது. அப்படி இணைவதற்கு மட்டக்களப்பிலுள்ள தமிழர்களுக்குக்கூட விருப்பமில்லை. அவர்கள் யாழ்ப்பாணத்துத் தமிழர்களை விரும்புகிறார்களில்லை. அதற்கு நல்லதோர் உதாரணத்தை நான் இங்கு கூற விரும்புகின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்திலிருந்து தெரிவாகி இப்பாராளுமன்றத்துக்கு வந்த மாண்புமிகு அரியநேத்திரன் அவர்கள் இச்சபையிலே பேசும்பொழுது, மாண்புமிகு உறுப்பினர் பியசேன அவர்களை மிகவும் மோசமான வார்த்தையால் பேசினார். அதற்காக நான் அவரை மட்டரகமான அரியநேத்திரன் என்று சொல்லமாட்டேன். ஏனெனில், மட்டக்களப்பு என்பது மீன் பாடும் தேன் நாடு; இங்கிருக்கின்ற எங்களுடைய பிரதி அமைச்சரான ஹிஸ்புல்லாஹ் அவர்களும் மட்டக்களப்பைச் சேர்ந்தவர். மக்களால் தெரிவுசெய்யப்பட்டு இம்மன்றத்துக்கு வந்த பியசேன அவர்களைப் பார்த்து அரியநேத்திரன் அவர்கள்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

என்று அகௌரவமான முறையில் பேசினார். இது தமிழர் ஒருவர் செய்யக்கூடியதா? தமிழ்ப் பண்பா? தமிழர் பண்பாடா? அவர்களுடைய மார்க்கமா? என்று கேட்க விரும்புகின்றேன். ஐயா! தலைவர் அவர்களே, ஔவையாருடைய பாடல்களைப் பற்றி நீங்கள் கேள்விப்பட்டிருப்பீர்கள். அவர் சாதியைப் பற்றிக் கூறியிருக்கின்றார். நான் இச்சந்தர்ப்பத்தில் உங்களுக்கு ஔவையார் கூறியதை நினைவுபடுத்த விரும்புகின்றேன்.

"சாதி இரண்டொழிய வேறில்லை சாற்றுங்கால்
நீதி வழுவா நெறிமுறையின் - மேதினியில்
இட்டார் பெரியோர் இடாதார் இழிகுலத்தோர்
பட்டாங்கில் உள்ள படி"

அரியநேத்திரன் அவர்களுக்கு இது தெரியுமா? தெரியாவிட்டால், பண்டிதர் கா.பொ. இரத்தினம் இருந்த அந்தக் கட்சிக்குள்ளே இருக்கின்றவர்கள் அவருக்கு ஔவையாருடைய அறிவுரைகளைப் படித்துக் கொடுக்கவேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன். ஔவையார் சாதி என்று குறிப்பிடும்பொழுது, மனிதர்கள் பிறப்பால் உருவாக்கிக் கொள்ளும் சாதியையோ அல்லது பாலின - ஆண், பெண்- அடிப்படையில் உருவாகும் சாதியையோ குறிப்பிடவில்லை.

அது மாத்திரமல்ல அவர் சொன்னார், வடக்கிலே புதுக் குடியிருப்புப் பிரதேச சபைக்கான தேர்தலை நடத்துவதற்கு அரசாங்கம் அஞ்சுகின்றதாம் என்று. அதாவது அங்கு தேர்தல் நடத்தினால் அவர்களுடைய கூட்டமைப்பு வெற்றி பெறும் என்று அரசாங்கம் அஞ்சுகின்றதாம். கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே! இவ்வளவு மோசமான முறையிலே, புத்தி பேதலித்த முறையிலே இவர்கள் பேச முடியுமா? அப்படியென்றால் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் வட மாகாண சபைத் தேர்தலை நடத்தியிருக்க மாட்டாரே! அண்மையில் மேதகு ஜனாதிபதி அவர்களோடு

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

ஐக்கிய நாடுகள் சபை - United Nations க்குச் சென்று வரக்கூடிய பாக்கியம் எனக்குக் கிடைத்தது. மாண்புமிகு பிரதி அமைச்சர் நிரூபமா ராஜபக்ஷ அவர்களும் மாண்புமிகு உறுப்பினர் சூரியப்பெரும அவர்களும் எம்முடன் வந்தார்கள். அங்கு போகுமிடம் எல்லாம் "உங்கள் நாட்டிலே நீங்கள் ஜன நாயகத்தை ஸ்திரப்படுத்திவிட்டீர்கள்!" என்று சொல்கின் றார்கள்.

"You have a consolidated democracy in your country. You are a great leader. Take up the leadership of Asia". Who says this? Ban Ki-moon said this when we met him, because considering the leadership in Asia, he found no other leaders. "The most senior, the most able, and the most talented leader is found in Sri Lanka, and that is His Excellency Mahinda Rajapaksa". என்று கூறியவர் ஐக்கிய நாடுகள் சபையின் செயலாளர் நாயகம் பான் கீ மூன் அவர்கள் என்பதை நான் உங்களுக்கு இந்தக் கட்டத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அப்படி மதிப்பு!

இந்தியாவிலே பஞ்சாயத்து முறை இருப்பது உங்களுக்குத் தெரியும். அந்த பஞ்சாயத்து மூலமாகத்தான் மகாத்மா காந்தி அவர்கள் அங்கு ஒவ்வோர் ஊரையும் - ஒவ்வொரு கிராமத்தையும் அபிவிருத்தி செய்தார். அதேபோன்றுதான் இந்த நாட்டிலே ஆரம்பத்தில் எஸ்.டபிள்யு.ஆர்.டி. பண்டார நாயக்க அவர்கள் - உள்ளூராட்சி மன்றங்களின் தந்தை என வர்ணிக்கப்படுகின்றவர் இவ்வாறான திட்டங்களைக் கொண்டு வந்தார். அதன் பிறகு 21ஆம் நூற்றாண்டிலே எல்லாப் பிரதேச சபைகளுக்கும் நகர சபைகளுக்கும் மாநகர சபைகளுக்கும் மற்றும் எல்லா மாகாண சபைகளுக்கும் தேர்தலை நடத்தி, அனைத்து இடங்களிலும் வெற்றியீட்டி மாபெரும் சாதனையை நிலைநாட்டியவர் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் என்பதை நாங்கள் இங்கே சொல்லிக் கொள்வதில் பெருமைப்படுகின்றோம்.

வடக்கிலே புதுக்குடியிருப்பில் தேர்தலை நடத்துவது சம்பந்தமாக நீதிமன்றத்தில் ஒரு case இருக்கின்றது. There is a court case. How can you hold the election? அது தெரியாதா? இவர்கள் ஏன் இந்த மக்களைக் குழப்புகின்றார்கள்? அது தெரியாமல் பாராளுமன்றத்திலே வந்து பேச முடியுமா? நீங்கள் கண்ணியமாகப் பேசுங்கள் என்று சம்பந்தப்பட்ட உறுப்பின ரிடம் சொன்னதற்கு இது கண்ணியமான சபை என்று நான் கருதவில்லை என்று அவர் சொன்னார். ஐயா! இதைவிடக் கேவலமான பேச்சு இருக்கின்றதா? இந்தச் சபையிலே வந்து உட்கார்ந்துகொண்டு, இந்த மன்றுக்கு வந்து வயிறுமுட்டச் சாப்பிட்டுக்கொண்டு, சம்பளம் மற்றும் வாகனம் என்று எல்லா அனுகூலங்களையும் பெற்றுக்கொண்டு, இந்தச் சபை கண்ணி யமானதல்ல என்று சொல்லக்கூடியவர்களின் மதிப்பு எப்படி யானது என்பதை நீங்களாகவே நிர்ணயித்துக் கொள்ளலாம்! இப்படியாக முட்டாள்தனமாகப் பேசுகின்ற வர்கள்தாம் அங்கே இருக்கின்றார்கள்.

வட மாகாண சபைத் தேர்தலை நடத்தியதையிட்டு ஐக்கிய நாடுகள் சபையின் 194 உறுப்பு நாடுகளின் தலைவர்கள் மட்டுமல்ல, கண்டவர்கள் எல்லாம் பாராட்டுகின்றார்கள். அந்தத் தேர்தலில் TULF இனர்தான் வெற்றி பெறுவார்கள் என்பது ஜனாதிபதி அவர்களுக்குத் தெரியும். தமிழ் மக்களே நீங்கள் உங்களுக்கு வேண்டியவர்களைத் தேர்ந்தெடுங்கள் என்று சொல்லித்தான் ஜனாதிபதி அவர்கள் அங்கு அந்தத் தேர்தலை நடத்தினார். இதுதான் ஜனநாயகம். ஆனால், வடக்கிலுள்ள உள்ளூராட்சிச் சபைகள் எல்லாம் அவர்களுடை யனவா? இல்லை. அங்கு வேலணை, ஊர்காவற்றுறை போன்ற பிரதேச சபைகளை EPDP கைப்பற்றியுள்ளது. அங்கு பூநகரியை TNA வெற்றிகொண்டது 100 வாக்குகளால் மாத்திரம்தான். பளை பிரதேச சபையை வெற்றிகொண்டது 400 வாக்குகள் வித்தியாசத்தில்தான்! முசலி பிரதேச சபையை எங்களுடைய மாண்புமிகு றிஸாத் பதியுதீன் அவர்களுடைய தலைமையிலான அகில இலங்கை மக்கள் காங்கிரஸ்தான் வெற்றி பெற்றது. இப்போது சபாமண்டபத்தினுள் பிரவேசிக் கின்ற ஈ.பீ.டி.பீ. கட்சியின் செயலாளர் நாயகமான மாண்புமிகு டக்ளஸ் தேவானந்தா அவர்களிடம் கேட்டுப் பாருங்கள்! இந்த நாட்டின் வடபுலத்திலே வாழ்கின்ற தமிழர்களுக்காக அங்குள்ள ஒவ்வொரு உள்ளூராட்சி மன்றங்க ளுக்கும் அரசாங்கத்தின் மூலமாக அதனுடைய செல்வத்தை வாரி வழங்குகின்ற ஒரு தமிழ்த் தலைவர் இருப்பாரேயானால் அது மாண்புமிகு டக்ளஸ் தேவானந்தா அவர்கள்தான் என்பதை எங்களால் வாய்கூசாமல் சொல்ல முடியும். கிழக்கிலே ஒரு ஹிஸ்புல்லாஹ்! வடக்கிலே டக்ளஸ் தேவானந்தா!

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised by the Hon. J. Sri Ranga. What is your point of Order, Hon. Member?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ஸ்ரீ றங்கா அவர்களே, உங்களுக்கும் எனக்குமிடையே சண்டையா?

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
உங்களுக்கும் எனக்குமிடையில் சண்டையில்லை. 194 நாடுகள் வடக்கு மாகாண சபையை வரவேற்றிருப்பதாக நீங்கள் சொன்னீர்கள்! TULF வெல்லுமென்று தெரிந்து கொண்டே வட மாகாண சபைத் தேர்தலை அரசு நடத்திய தாகவும் கூறினீர்கள்!

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
வடக்கிலே முசலி பிரதேச சபையில் All-Ceylon Muslim Congress வெற்றி பெற்றிருக்கிறது. எனவே,வடக்கிலே 100 சதவீதமான வெற்றியை அவர்கள் பெறவில்லை. அது மாத்திரமா?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ அஸ்வர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

'யாழ்தேவி' புதுமணப்பெண்ணாக யாழ்நோக்கிப் புறப் பட்டுச் செல்லவிருக்கிறாள். அந்த பெண்ணை முன்னர் குதறிக் கொலை செய்தவர்கள் யார்? யாழ்தேவியை அன்று கொலை செய்தவர்கள் புலிகள்! அவர்களுடைய proxy ஆகத்தான் தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் இப்பொழுது பிரதிநிதித்துவம் வகிக்கின்றார்கள். எதிர்வரும் 13ஆம் திகதி மேதகு ஜனாதிபதி அவர்கள் மீண்டும் அந்த யாழ். மணமகளை அழைத்துக் கொண்டு யாழ்ப்பாணத்துக்குச் செல்லும் அருமையான காட்சியை நீங்களும் நானும் கண்டு இறும்பூதெய்தவிருக் கிறோம்.

"The Hindu" newspaper of 7th October, 2014, under the caption "India puts Jaffna train back on rails" states, I quote:

> "JAFFNA: The iconic Yal Devi Express from Colombo to Jaffna will resume its run on October 13, some 25 years after the link was suspended during the height of the Sri Lankan civil war."

This is what Meera Srinivasan wrote to "The Hindu" newspaper. Those days, they were not able to do that. It further states, I quote:

> "After the war ended in 2009, the line was gradually restored section by section, first to Omanthai, then further North to Kilinochchi, and ……"

"A track through a former war zone" இதைப் பாருங்கள்! இது அபிவிருத்தி இல்லையா?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, please wind up, now.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

2 - 3 பேச்சாளர்கள் சமூகம் தரவில்லை. எனவே, மேலதிக மாக 5 நிமிடம் தாருங்கள்!

இது வடக்கிலே உள்ள தமிழ் மக்களுக்கு மாத்திரம் உரிய அபிவிருத்தியல்ல! தெற்கில் உள்ளவர்களுக்கும்தான்! அவர்கள் வடக்கிற்குச் செல்ல 8 - 10 மணித்தியாலங்கள் எடுத்தன. இப்பொழுது 5 மணித்தியாலங்களில் வடக்கிற்கு செல்லக்கூடிய அந்த அருமையான சந்தர்ப்பத்தை எங்களுடைய அரசாங்கம் - உலகப் புகழ்பெற்ற எங்களுடைய அருமையான தலைவர் மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஏற்படுத்தித் தந்திருக்கிறார். அவருக்கு இந்த சபையில் வடக்கு தமிழ் மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். வட மாகாண முதலமைச்சருக்கு அரசாங்கத்தினுடைய பணத்தின்மூலம் வாகனம் வாங்கலாம்! டக்ளஸ் தேவானந்தா அவர்கள் அப்படியா செய்கின்றார்? அவர்கள் அங்கே மக்களுக்காகச் செலவழிக்கின்றார். அங்கே யாரும் வந்தாலென்ன? போனால் என்ன? நாங்கள் வடபுலத்தை அபிவிருத்தி செய்வோம். அந்த உத்வேகம், அந்த நல்லெண்ணம், அந்த ஜனநாயக மரபுரிமையெல்லாம் எங்களுடைய மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களிடம் யாழ்தேவி ஓடுவது போன்று தெளிவாக இருக்கின்றது. யாழ்தேவி சம்பந்தமான பாடலொன்று காலையிலே SLBC இலே ஒலிபரப்பானது. ஆகவே, யாழ்தேவி எல்லோருக்கும் நன்மை பயக்கக்கூடிய ஒரு வாகனமாக அமையுமென்று சொல்லிக்கொள்ள விரும்பு கின்றேன்.

அது மாத்திரமல்ல, the Hon. Dinesh Gunawardena is going to give water from Iranamadu Tank to the North.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Please wind up.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I **table*** all these articles, Sir. The "Daily News" of 9th October, 2014, states, I quote:

> "Jaffna - Kilinochchi water supply scheme will enhance well-being of Jaffna people"

ஐயா விக்னேஸ்வரன் அவர்களே, நீங்கள் செய்ய மாட்டீர்கள்! நாங்கள் செய்வோம். தினேஷ் குணவர்தன அவர்கள் செய்வார்; டக்ளஸ் தேவானந்தா அவர்கள் செய்வார்; ஹிஸ்புல்லாஹ் அவர்கள் செய்வார். எல்லாவற்றுக்கும் மேலாக மஹிந்த ராஜபக்ஷ அவர்கள் செய்வார்! மிகவும் நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Palitha Range Bandara. You have 15 minutes.

[අ.භා. 4.23]

**ගරු පාලිත රංගේ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් පනත් කෙටුම්පත් විවාදයේදී මගේ දිස්ත්‍රික්කයේ හිටපු සභාපතිවරයකු වන ගරු ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාට පසුව මට කථා කරන්නට අවස්ථාව ලැබී තිබෙනවා. ගරු අස්වර් මන්ත්‍රීතුමා කිව්වේ, "දැන් ලැබුණු ඡන්ද ප්‍රතිඵලයක්" කියා ගෑස් මිල අඩු කළාය කියායි. [බාධා කිරීම්] හොඳයි. මොනවා ද නරක? හැබැයි මේ රටේ මිනිස්සු පාරට බැහැලා ගෑස් මිල අඩු කරන්න කියා කිව්වේ නැහැ. අද fight කළේ නැහැ. අද මේ රටේ මිනිසුන්ගේ සටන තිබෙන්නේ දුම්රිය දෙපාර්තමේන්තුව සම්බන්ධවයි. අද දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෝ එළියට බැහැලා මහජනතාව අපහසුතාවට පත් වෙන ආකාරයට වැඩ වර්ජනයක් ආරම්භ කර තිබෙනවා. ඔවුන් ඉල්ලන්නේ රුපියල් දහසකින් තමන්ගේ වැටුප වැඩි කරන්න කියා. ඒ බොහොම සොච්චම් මුදලකින්.

පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩු පාර්ශ්වයේ නායකයා වන අපේ මිල්රෝයි මැතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. මීට අවුරුදු

---

*** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

දෙකකට ඉස්සෙල්ලා හලාවත ධීවර ජනතාව, වෙන්නප්පුවේ ධීවර ජනතාව ඇතුළුව වෙන්නප්පුවේ ඉඳලා සේරක්කුලියට යන තෙක් සියලු ධීවර ජනතාව සහ මීගමුවේ ධීවර ජනතාව එළියට බැහැලා මේ ආණ්ඩුවට කිව්වේ භූමිතෙල් ටික සාධාරණ මිලට දෙන්න කියා.

**ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා (සමාජ සුබසාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து - சமூக நலன்புரி அமைச்சர்)
(The Hon. Milroy Fernando - Minister of Social Welfare)
භූමිතෙල් මිල අඩු කර තිබෙනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ඔව්. දැන් තමුන්නාන්සේත් අඩු කර තිබෙනවා නේ. ඒවා මම කියන්නේ නැහැ. [බාධා කිරීමක්] අස්වර් ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න කෝ. අස්වර් මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඇමතිතුමා කියලා මම කථා කරන්නම්. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. මහත්තයෙක් වාගේ අහගෙන ඉන්න කෝ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ධීවර ජනතාව පාරට බැහැලා භූමිතෙල් සාධාරණ මිලට දෙන්න කිව්වා. එහෙම භූමිතෙල් ටික සාධාරණ මිලට දෙන්න කියා සටන් කරනකොට ආණ්ඩුව කළේ මොකක්ද? පොලිස් විශේෂ කාර්ය බල කාය යොදවා ඒ නිරායුධ, අහිංසක ධීවර ජනතාවට වෙඩි තබා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙකු වන ඇන්ටනි ප්‍රනාන්දු ඝාතනය කළා. ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුත්තලම දිස්ත්‍රික්කයේ නායකයා වශයෙන් ඔබතුමාත් දන්නවා, එය ඇත්තද නැත්තද කියලා. එම සිද්ධියේදී වෙඩි තබා රිගන් ඇතුළු තව තුන් දෙනෙක් සදාකාලික ආබාධිතයන් බවට පත් කළා. මෙන්න ආණ්ඩුව ලබා දුන් පිළිතුර. EPF එක ආරක්ෂා කර ගන්න කටුනායක සේවකයෝ එළියට බැහැලා සටන් කරපු වෙලාවේ ආණ්ඩුව මොකක්ද කළේ? වෙඩි තබා රොෂේන් චානකව මරා දැම්මා.

රතුපස්වල මිනිස්සු බොන වතුර ටික පිරිසිදුවට බොන්න ඕනෑ, රසායනික ද්‍රව්‍ය පොළොවට මිශ්‍ර වෙලා තිබේද්දී වතුර බොනකොට විනාශයක් වන්නේ, ඒ නිසා මේ කර්මාන්තශාලාව වෙනත් සුදුසු ස්ථානයකට ගෙන යන්න කියා සටන් කරනකොට රතුපස්වල මිනිසුන්ට වෙඩි තබා තරුණයෝ දෙදෙනෙකු ඝාතනය කර වළලා දැම්මා. ඒ දේවල් කළේ හමුදා ආරක්ෂාව යටතේ. ඔන්න මේ ආණ්ඩුව කරපු දේ.

හැබැයි, ආණ්ඩුව ඌව පළාත් සභා මැතිවරණයට ගියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පිළිබඳව අස්වර් මන්ත්‍රීතුමා කථා කළ නිසායි මම මේ ගැන කථා කරන්නේ. මම මේ පනත් කෙටුම්පත ගැන කථා කරන්නයි හිටියේ. ආණ්ඩුව ඌව පළාත් සභා මැතිවරණය පවත්වන්න ගිහින් බැලුවාම මේක ගල උඩ සටනක්, වැඩේ අමාරුයි කියා තේරුණා. [බාධා කිරීමක්] ඉන්න කෝ, පැහෙන්නේ නැතිව. තමන්ගේ බලය පාවිච්චි කරලා මේක කරන්න බැහැ කියා ආණ්ඩුව තේරුම් ගත්තා. දෙන්න පුළුවන් භාණ්ඩ වර්ග 28ක් -items 28ක්- ආණ්ඩුවේ නියෝජිතයෝ ගිහින් නිකම් බෙදුවා. මේ සභාවේ නායකතුමාත් ඒ ප්‍රදේශවලට ගිහිල්ලා මැතිවරණ ව්‍යාපාරයේ යෙදී සිටියා. ආණ්ඩුව එහෙමයි ඒ මැතිවරණ ව්‍යාපාරය කළේ. එහෙම කළත් ඔවුන්ගේ ඡන්ද ප්‍රතිශතය සියයට 52 දක්වා බැස්සා. සිංහල, බෞද්ධ පදනම කියන, චීන ප්‍රාකාරය වාගේ ජනාධිපතිතුමාගේ ආරක්ෂාව තිබෙන්නේ සිංහල ජනතාවට. 1818 දී ඉංග්‍රීසින් ඌව වෙල්ලස්සට පහර දෙනකොට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ හමුදාවට විරුද්ධව නැඟී සිටි සිංහල ජනතාවක් ඒ ප්‍රදේශවල හිටියේ. ඒ සිංහල ජනතාව තමන්ගේ උරුමය වෙනුවෙන් එදා සටන් කළා. එදා ඌව වෙල්ලස්ස මිනිසුන්ට ගහලා ඔවුන්ව මට්ටම් කරන්න බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ ඉංග්‍රීසි හමුදාවට පුළුවන් වුණේ නැහැ. එහෙම සිංහල ජනතාවක් ඉන්න ඌව වෙල්ලස්සෙන් සියයට 82ක ජන වරමක් 2009 අවුරුද්දේ ලබා දුන්නා. එදා 2009 දී ඒ ජන වරම ලබා ගත්තේ මෙ ලෝ දෙයක් බෙදා නොවෙයි. අඩුම තරමින් ඇල්පෙනෙත්තක්වත් බෙදා නොවෙයි. හැබැයි, මෙදා ජන වරම දුන්නේ මුදල් ඒ වාගේම භාණ්ඩ ඇතුළු මේ සියල්ලම බෙදා. එහෙම කළත් ලැබුණේ සියයට 52යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඌව පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කිරීම අමාරු බව දැන ගෙන එදා ආණ්ඩුව මොකක්ද කළේ? ඌවේ මිනිස්සු ඉල්ලපු නැති දේවල් දුන්නා. ඒ මොනවාද? විදුලිය බිල මම සියයට 25කින් අඩු කරනවා කිව්වා. දැන් කියනවා, ඉන්ධන ගැළපුම් ගාස්තුවෙන් සියයට 25යි කියා. ඌවේ පළාත් සභා මැතිවරණයට කලින් කිව්වා, සම්පූර්ණ විදුලි බිල සියයට 25කින් අඩු කරනවා කියා. දැන් ඉන්ධන ගැළපුම් ගාස්තු පමණයි කියනවා. ඊට පස්සේ ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල් මිල අඩු කළා. ඌව පළාත් සභා මැතිවරණයේදී දැන ගත්තා, වැඩේ වැරදෙන්න එනවා; වතුවල මිනිස්සු ඡන්දය දෙන්නේ නැති වෙයි කියා. ඒ නිසා භූමිතෙල් මිල අඩු කළා. එදා ධීවරයින් පාරට බැහැලා භූමිතෙල් ටික සාධාරණ මිලට දෙන්න කියා උද්ඝෝෂණය කරනකොට දුන්නේ මොකක්ද? වෙඩි උණ්ඩය. රොෂේන් චානකලා තමන්ගේ EPF එක ආරක්ෂා කර ගන්න එළියට බැහැලා සටන් වදිනකොට සාමකාමී අරගළයක යෙදෙන කොට දුන්නේ මොකක්ද? වෙඩි උණ්ඩය. රතුපස්වල මිනිස්සු තිබහට බොන්න වතුර ටිකක් ඉල්ලපුවාම ආණ්ඩුව දුන්නේ මොකක්ද? වෙඩි උණ්ඩය.

අවුරුදු දෙක හමාරකට පස්සේ අද හදිසියේම ගෑස් මිල අඩු කර තිබෙනවා.ඇයි? දැන් දන්නවා, ජනවාරි මාසයට ජනාධිපතිවරණය එනවා නම් වැඩේ අමාරුයි; දැන් ජනතාව ගොනාට අන්දවන්න බැහැ; ජනතාව මේක අවබෝධ කර ගෙන ඉවරයි කියා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
තව අඩු කරනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හරි, හරි. දැන් අඩු කරයි. තව අඩු කරයි. අපි දන්නවා, මේ මාසයේ 24 වන දා ගෙනෙන අය වැයෙන් - [බාධා කිරීම්] හරි, ඉන්න පොඩ්ඩක්. අහගන්න. තමුන්නාන්සේලාගේ වේලාවේදී කථා කරන්න. මේ මස 24වන දා අය වැය ගෙනෙන්න හදන්නේ විවිධ සහන සමඟ. වැටුප රුපියල් 10,000කින් වැඩි කරනවා, සමෘද්ධි දීමනාව රුපියල් 5,000කින් වැඩි කරනවා. ඇයි? මෙතෙක් කාලයක් සහන දෙන්න බැරි වුණා. චීන ජාතිකයන්ට මේ රට විකුණලා ඉවරයි. [බාධා කිරීම්]

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
මන්ත්‍රීතුමා,-[බාධා කිරීමක්]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අයියෝ! මාර කරදරයක් නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Deputy Minister, please do not disturb the Hon. Member.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මේ ගොල්ලොත් සමඟ වසන්ත අලුවිහාරේ මන්ත්‍රීතුමන්ලා මාතලේ කොහොම වැඩ කරනවාද දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර Budget එකත් ගෙනෙන්න හදන්නේ එහෙමයි. ඇයි, ජනවාරි මාසයේ 08වන දාට ජනාධිපතිවරණය තියන්න හදන්නේ? මේ Budget එකෙන් මිනිස්සු ගොනාට අන්දවන්න හදනවා. ලබන අවුරුද්දටයි, Budget එක ක්‍රියාත්මක වෙන්නේ, අය වැයෙන් පස්සේ ක්‍රියාත්මක කරන්න නොවෙයි. මෙය ඡන්දය ගැනීම සඳහා යොදා ගන්නා වූ උපක්‍රමයක්. ඊළඟ ජනාධිපතිවරණය සඳහා මෙරට ජනතාව ගොනාට ඇන්දවීම සඳහා ගන්නා වූ ප්‍රයත්නයක් පමණයි මෙය. එහෙම නැතුව ජනතාවට ආදරය නිසා නොවෙයි. එදා හලාවත ධීවරයන් භූමිතෙල් ටික නිකම් ඉල්ලුවේ නැහැ, මිල්රෝයි ඇමතිතුමනි, ඔබතුමා දන්නවා. ඔබතුමා කථා කර කියන්න, නිකම් ඉල්ලුවාද කියා. එදා ඇන්ටනී ප්‍රනාන්දු මරන්න, වෙඩි තියන්න නියෝග දුන්නේ ජනතාවට ආදරය නිසාද? එදා රීගන් ඇතුළු තුන් දෙනෙක් සදාකාලික ආබාධිත කරන්න වෙඩි තියන්න නියෝග දුන්නේ ජනතාවට ආදරයටද? රොෂේන් චානකලාට වෙඩි තියලා මරන්න, හමුදා ආරක්ෂාව යටතේ වළ දමන්න නියෝග දුන්නේ ජනතාවට ආදරය නිසාද? රතුපස්වල මිනිසුන්ට බොන්න පිරිසිදු වතුර ටික දෙන්න කියා ඉල්ලනකොට, පිරිසිදු වතුර ටිකට තිබෙන බාධාව ඉවත් කරන්න කියා ඉල්ලනකොට වෙඩි තිබ්බේ ජනතාවට තියෙන ආදරයටද? ජනතාවට ආදරයට නොවෙයි, තමන්ගේ පරපුරට තිබෙන ආදරය නිසා. වෙන මොකක්වත් නිසා නොවෙයි, තමන් බලයේ ඉන්න තිබෙන කෑදරකම නිසා. තවදුරටත් දිගටම බලයේ ඉන්න ජනතාව ගොනාට ඇන්දවීමේ ව්‍යාපාරයක් විධියට තමයි මේ ගැස් මිල හදිසියේම අඩු කළේ. එහෙම නැතුව වෙන මොකක්වත් නිසා නොවෙයි. අස්වර් මන්ත්‍රීතුමාගේ ඡන්ද ප්‍රතිඵලය බලා ගන්න පුළුවන් වෙයි, මැතිවරණයකට යනකොට. ජනතාව එදා වාගේ ගොන් වැඩ කරන්නේ නැහැ. අද ජනතාව අවදියෙන් ඉන්නවා කියන එකත් අස්වර් මන්ත්‍රීතුමා මතක තියා ගත්තොත් වඩාත් හොඳයි කියා මම කියන්න කැමැතියි.

මේ, 2012 අවුරුද්දේ ගෙනා පනත. [බාධා කිරීමක්] පනත එපාද? එහෙම නම් ඊට වඩා දේ කියන්නම්. අපේ නිරූපමා රාජපක්ෂ නියෝජ්‍ය අමාත්‍යතුමිය කියනවා, "පනත එපා. අනෙක් ඒවා කියන්න" කියා. එතුමිය කැමැතියි, මම අනෙක් කරුණු කියනවාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඌව පළාත් සභා මැතිවරණය වෙලාවේදී තවත් වැඩ වුණා. මොකක්ද වුණේ? දැන් මිල්රෝයි ඇමතිතුමා මෙම ගරු සභාවේ ඉන්නවා. 1977 එක්සත් ජාතික පක්ෂය 5/6ක බලයක් අරගෙන මේ රටේ මැතිවරණ කොට්ඨාස වැඩි ගණනක් දිනන කොට මැතිවරණ කොට්ඨාස අටයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කළේ. ඒ මැතිවරණ කොට්ඨාස අටෙන් එකක් තමයි, ආනමඩුව මැතිවරණ කොට්ඨාසය. සද්ධාතිස්ස වඩිගමංගාව මැතිතුමායි එදා සිටියේ, ඒ මැතිවරණ කොට්ඨාසයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා විධියට. එතුමා යහපත් මහත්මයෙක්.

එදා දැඩි නියඟයක් තිබුණා. ඒ දැඩි නියඟය වෙලාවේ ග්‍රාම සේවක මහත්වරුන් හරහා ජනතාවට නියං සහනාධාර කියා තිරිඟු පිටි බෙදලා දුන්නා. ඒක ආනමඩුවේ විතරයි කළේ. මැතිවරණයේදී, ආනමඩුව මැතිවරණ කොට්ඨාසය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කළාම හිටපු සැම්සන් රණසිංහ පළාත් සභා මන්ත්‍රීතුමාත්, හිටපු ගුණවර්ධන පළාත් සභා මන්ත්‍රීතුමාත් ගිහිල්ලා හලාවත දිසා අධිකරණයේ නඩුවක් දැම්මා. හරි නේද, මිල්රෝයි ඇමතිතුමනි? ඒ නඩුවේ පැමිණිල්ල වුණේ, "රජයේ ග්‍රාම සේවක මහත්වරුන් හරහා තිරිඟු පිටි බෙදා දීම නිසා මැතිවරණයේ ප්‍රතිඵලයට බලපෑමක් වුණා, ඒ නිසා මේ මැතිවරණය අවලංගු කරන්න" කියා. දිසා අධිකරණය පැමිණිල්ලේ ඉල්ලීම පිළි අරගෙන පූර්ණ විනිශ්චයකින් පස්සේ තීන්දුවක් දුන්නා, "මේ මැතිවරණ ප්‍රතිඵලය අහෝසි කරන්න, අහෝසි කර නැවත මැතිවරණයක් පවත්වන්න" කියා.

එදා තිබුණු ඉහළම අධිකරණය, අද වාගේ ශ්‍රේෂ්ඨාධිකරණය නොවෙයි, අභියාචනාධිකරණයයි. ඒ අය අභියාචනාධිකරණයට ගිහිල්ලා ඇපෑලක් ඉදිරිපත් කළා. අග්‍ර විනිශ්චයකාරතුමා සමඟ තවත් විනිශ්චයකාරවරුන් දෙදෙනෙකුගෙන් යුක්ත විනිසුරු මණ්ඩලයක් මෙම නඩුව විමසුවා. නඩුව විමසා, "හලාවත දිසා අධිකරණය විසින් දෙන ලද තීන්දුව එලෙසමයි" කියා තීන්දුව තහවුරු කළා. අවසානයේ 1980 දී අතුරු මැතිවරණයක් පැවැත් වුවා. ඒ මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරාජයට පත් වුණා. එදා එක්සත් ජාතික පක්ෂයේ අශෝක වඩිගමංගාව මහත්තයා පාර්ලිමේන්තුවට ආවා. මිල්රෝයි ඇමතිතුමන්ලා ගිහින් ලොකු සටනක් දුන්නා, මාත් පොඩි කාලයේ. එදා 1970 දශකයේ ලංකාවේ අධිකරණය එහෙමයි යුක්තිය පසිඳිලුයේ, එදා යුක්තිය පසිඳිලන අධිකරණයක් තිබුණ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, 2014 ඌව පළාත් සභා මැතිවරණය පවත්වන කොට ඒකේ අනෙක් පැත්තයි සිද්ධ වුණේ. ඌව පළාත් සභා මැතිවරණය කාලයේ ඌව පළාතට පමණක් නියං සහනාධාර බෙදන්න හදන කොට ඒකට විරුද්ධව අපි මැතිවරණ කොමසාරිස්වරයාට සහ මානව හිමිකම් කොමිසමට පැමිණිලි කළා. මැතිවරණ ප්‍රතිඵලයට මේකෙන් බලපෑමක් වෙනවා, ඒ නිසා ඒක කරන්න එපා කියලා මානව හිමිකම් කොමිෂන් සභාවත්, මැතිවරණ කොමසාරිස්වරයාත් නියෝගයක් දුන්නා. එහෙම නියෝගයක් දුන්නාම මොකක්ද කළේ? මේ රටේ නීතිපති දෙපාර්තමේන්තුව තිබෙන්නේ යුක්ති සහගත කාරණාවලට මැදිහත් වීම සඳහා පමණයි. එහෙම නැතිව පාර්ශ්ව ආරක්ෂා කිරීම සඳහා තිබෙන එකක් නොවෙයි නීතිපති දෙපාර්තමේන්තුව. නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෝ ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඉල්ලීමක් කරනවා, ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කය සඳහා නියං සහනාධාර දෙන්න කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය මේ application එක බැලුවේ කොහොමද? නියම විධියට නම් මේ නියං සහනාධාර ලබා දෙන්න එපා කියලා නියෝග දුන්නු නියෝජිතයෝ දෙදෙනා ඒ නඩුවේ පාර්ශ්වකරුවන් - වගඋත්තරකරුවන්- කරන්න ඕනෑ. මැතිවරණ කොමසාරිස්වරයා පාර්ශ්වකරුවකු කළේත් නැහැ, මානව හිමිකම් කොමිසම පාර්ශ්වකරුවකු කළේත් නැහැ. එහෙම නැතිව මේ යෝජනාව *ex parte* අර ගෙන රජයේ නිලධාරින් හරහා නියං සහනාධාර බෙදන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දුන්නා. එදා 1977 කාලයේ ග්‍රාම නිලධාරි මහත්වරු බොහොම ගෞරවාන්විතව රාජකාරි කළා. දේශපාලන ගොට්ටන්, ගැත්තන් වෙලා සිටියේ නැහැ. ගරු මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමා ඒකට සාක්ෂි දරනවා. එතුමා මාත් එක්ක එකඟයි, ඒක මම දන්නවා. එතුමා හෘදය සාක්ෂියට එකඟව ඒක අනුමත කරනවාය කියලාත් මම දන්නවා. [බාධා කිරීමක්] එදා ග්‍රාම නිලධාරි මහත්මයා රාජකාරි කළේ

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

එහෙමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද ග්‍රාම නිලධාරි මහත්මයාත් දේශපාලන ගොට්ටා වෙලා. කෘෂිකර්ම මහත්මයාත් එහෙම වෙලා. සමෘද්ධි සංවර්ධන නිලධාරි මහත්මයාත් එහෙම වෙලා. ආර්ථික සංවර්ධන නිලධාරියාටත් එහෙම වෙන්න වෙලා. ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දෙනවා, රජයේ නිලධාරින් හරහා මේ නියං සහනාධාර බෙදන්න කියලා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? එදා ගැත්තන්, ගොට්ටන් නොවුණු ග්‍රාම නිලධාරින් හරහා බෙදන එක වැරදියි කියලා යුක්තිය පසිඳලන අධිකරණය කිව්වා. අද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විසින් නියෝගයක් දෙනවා "මගේ ගැත්තන්, ගොට්ටන් වෙලා ඉන්න රජයේ නිලධාරින් හරහා නියං සහනාධාර බෙදපන්" කියලා. ඔන්න දුන්නු නියෝගය. ඒ නියෝගයෙන් පස්සේ නියං සහනාධාර බෙදුවේ කොහොමද? 2012 වසරේ ඡන්ද නාම ලේඛනයට අනුව බෙදුවා. කැබිනට් ඇමතිතුමාටත්, ඇමතිතුමියටත් නියං සහනාධාරය හම්බ වෙනවා. ග්‍රාම නිලධාරිටත් හම්බ වෙනවා. දිසාපතිටත් හම්බ වෙනවා. ප්‍රාදේශීය ලේකම්ටත් හම්බ වෙනවා. ව්‍යාපාරිකයාටත් හම්බ වෙනවා. මොකක්වත් නැති මිනිහාටත් හම්බ වෙනවා. මෙන්න, 2014 ඌව පළාත් සභා මැතිවරණය වෙලාවේ රටේ නීතියක් තිබුණේ නැහැ. නීතිය කණපිට හැරිලා. පනත ගැන කථා නොකර මේවා කියන්න කියලා මගේ හිතවත් ගරු නිරූපමා රාජපක්ෂ නියෝජ්‍ය ඇමතිතුමිය මට කියපු නිසායි මම මේවා කිව්වේ. නැත්නම් ගරු ඇමතිතුමනි, මම මේවා ගැන කථා කරන්නේ නැහැ. මේවා ගැන කියන්න කියලා මට නිරූපමා රාජපක්ෂ නියෝජ්‍ය ඇමතිතුමිය කියනවා ඔබතුමාත් අහගෙන හිටියා. එතුමියට මේක කියන්න බැහැ. මේ රටේ නීතියට කරන විනාශයට එතුමිය එකඟ නැහැ. ඒ නිසා තමයි එතුමිය ඒක කියන්න කිව්වේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)
ඔබතුමාට ළිඳේ පනින්න කියලා එතුමිය කිව්වොත් පනිනවාද?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳ ළිඳක් නම් පැනලා බලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 දී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවා. පාර්ලිමේන්තුවට මේ පනත් කෙටුම්පත ගෙනා වෙලාවේ අපි විපක්ෂයෙන් යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා. එක යෝජනාවක් තමයි තරුණ අපේක්ෂකයන්ගේ දායකත්වය මේකට ඇතුළත් කරන්නය කියන එක. අපේ අනෙක් යෝජනාව තමයි කාන්තා නියෝජනයක් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්නය කියන එක. හැබැයි, ආණ්ඩුව ඒවා ශත පහකටවත්, තුට්ටුවකටවත් මායිම් කළේ නැහැ. ඒවා ඔක්කොම අතහැර දමලා ආණ්ඩුවට ඕනෑ විධියට පනත ගෙනාවා. අවුරුදු දෙකක් ගිය පසු වැඩි ඡන්ද ප්‍රමාණයකින් අය වැය සම්මත කර නොගත්තොත්; බහුතර ඡන්දයෙන් අය වැය පරාජයට පත් වුණොත් සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කිරීම සඳහා ඒ පනත් කෙටුම්පත ගෙනාවා. එහෙම හදිසියේ කඩිමුඩියේ ඒ පනත් කෙටුම්පත ගෙනාවාට අතාවුල්ලා ඇමතිතුමාට ඒක හරියට ගේන්න බැරි වුණා. මේ පනත් කෙටුම්පත ගැසට් කිරීම සඳහා වැඩ කටයුතු කළේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍ය අතාවුල්ලා මැතිතුමා. නැවත අවුරුදු දෙකකින් අද මේ පනතට සංශෝධන ගේන්න කටයුතු කරනවා. නමුත් මේ පනත යටතේ එක ඡන්දයක්වත් පවත්වන්න බැරි වුණා. එක ඡන්දයක්වත් පවත්වන්නේ නැතිව අතාවුල්ලා ඇමතිතුමාට සිද්ධ වුණා මේ පනත නැවත සංශෝධනය කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතාවුල්ලා ඇමතිතුමා කළ යුත්තේ මේ සංශෝධන ගෙන ඒම නොවෙයි, නිසියාකාරව පනත් කෙටුම්පත ගේන්න බැරි වීම ගැන සමාව ඉල්ලලා ඇමති ධුරයෙන් ඉල්ලා අස් වෙලා නම්බු පිටින් ඉවත් වීමයි කියන එක අපි බොහොම පැහැදිලිව කියනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසන්.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
විපක්ෂයේ කාලයෙන් තව විනාඩි දෙකක් තුනක් ගන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ පනතට "අන්තර් කාලීන විධිවිධාන" ගේනවා. මේ අනුව අද නැවතත් මේ සභාපතිවරු ටික, නගරාධිපතිවරු ටික ආරක්ෂා කර ගන්න ඕනෑ වෙලා තිබෙනවා. ඇයි? මේ පත් කර ඉන්න සභාපතිවරුන් ගත්තාම මේකෙන් සියයට 75කට වඩා ඉන්නේ දූෂිතයෝ, මංකොල්ලකාරයෝ,කප්පම්කාරයෝ, කොමිස්කාරයෝ,මැරයෝ. තංගල්ල නගරාධිපතිවරයා ගන්න; මැරකමේ පියා. හම්බන්තොට ගන්න.

**ගරු#ශාන්ත බණ්ඩාර මහතා**
*மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
කොහේද ඉන්නේ?

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)#
ඉන්න තැන දන්නවා නේ ඉතින්. මම කියන්න ඕනෑ නැහැ නේ. රිමාන්ඩ් බන්ධනාගාරයේ නේ වැඩි කාලයක් ජීවත් වෙන්නේ.

**ගරු#ශාන්ත බණ්ඩාර මහතා**
*மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
එතුමා හිරේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)#
අන්න ඒක තමයි කියන්නේ. එහෙම උදවිය තමයි රැක ගන්න හදන්නේ. ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාම කියනවා එතුමා හිරේ කියලා. එතුමා, ජනාධිපතිතුමාගේ මැතිවරණ කොට්ඨාසයේ, ජනාධිපතිතුමාගේ "කාල්ටන් හවුස්" එක තිබෙන බල ප්‍රදේශයේ නගරාධිපතිවරයා. එහෙව් නගරාධිපතිවරයායි හිරේ ඉන්නේ. වැඩි කාලයක් හිරේ. ඉතින් හත්දෙයියනේ රටේ ඉන්න අනෙක් සභාපතිවරු ගැන අහන්න දෙයක් තිබෙනවාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංහල කියමනක් තිබෙනවා, "යකඩ මල්ලට ගුල්ලෝ ගැහුවා නම් හාල් මල්ල නොබලාම විසි කරන්න" කියලා. ජනාධිපතිවරයාගේ ගෙදර අයිති වෙන නගර සභාවේ නගරාධිපතිවරයා හිරේ නම්, අනෙක් සභාපතිවරු ගැන කථා කර වැඩක් තිබෙනවාද? ඒ ගැන කුමන කථාද, මූලාසනාරූඪ

ගරු මන්ත්‍රීතුමනි? ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ මේ අය ආරක්ෂා කරන්න තව දුරටත් කැප වෙලා කටයුතු කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ජනාධිපතිවරණයක් තිබෙනවා කියලා පෙනි පෙනී අපි එක එක කථා කියනවා. ඒකේදී මැරකම, චන්ඩිකම, වලත්තකම කර ගන්න මිනිස්සු ඕනෑ වෙනවා. අන්න ඒ සඳහා මේ සභාපතිවරු ටික ආරක්ෂා කර ගැනීම සඳහා තමයි මෙවැනි සංශෝධනයක් කඩිමුඩියේ ගෙනෙන්නේ. එකක් මතක තියා ගන්න ඕනෑ. හැබැයි ආරක්ෂා කරන්න යන්නේ නරක එකා. නරක එකා ආරක්ෂා කරන කොට ඊට පල්ලෙහා ඉන්නේ හොඳ මිනිස්සු ටික. හොඳ මිනිස්සු ටික මෙතැන රැඳෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී ඇති වෙන හෝදා පාළුව අපට බලා ගන්න පුළුවන් වෙයි.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හීන දකිනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)#
ඔව්, අපි දකින්නේ හීන. තමුන්නාන්සේලා විතරයි හැබෑ වන ඒවා දකින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් වෙලා තිබෙන්නේ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා, ඒකාධිපතිත්වය ඉදිරියට ගෙන යාම සඳහා. දීර්ඝ කාලීනව තමන්ම බලයේ සිටීම සඳහා ගෙනාවා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මේ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට මෙන්න මේ පළාත් පාලන පනත ගෙනාවා වාගේම තමයි වෙලා තිබෙන්නේ. පළාත් පාලන පනතෙත් අන්තර්කාලීන විධිවිධාන ගෙනැල්ලා නැහැ. ඇයි? ඒ අන්තර්කාලීන විධිවිධාන ගෙනාවා නම් මේක වෙන්නේ නැහැ. ඒ නිසා තමයි ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පතට අන්තර්කාලීන විධිවිධාන සංශෝධන වශයෙන් ඇතුළත් කරන්න අද හිස්බුල්ලා ඇමතිතුමාට සිදු වෙලා තිබෙන්නේ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට ඒකට අන්තර්කාලීන විධිවිධාන ඇතුළත් කළේ නැහැ. ඒ අන්තර්කාලීන විධිවිධාන ගෙනාවා නම් වර්තමාන ජනාධිපතිවරයා -[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. - [*Interruption.*E

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වේ හිස්බුල්ලා ඇමතිතුමා කියලායි. නමුත් ගරු අතාවුල්ලා ඇමතිතුමා යනුවෙන් වෙන්න ඕනෑ. ඒකයි ගරු අස්වර් මන්ත්‍රීතුමා කියන්නේ.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)#
මොකක්ද? [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Azwer, I have corrected that. Hon. Palitha Range Bandara, you may continue.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)#
අතාවුල්ලා ඇමතිතුමා වශයෙන් එය නිවැරැදි කළාට බොහොම ස්තුතියි, අස්වර් මන්ත්‍රීතුමාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා 1978 මේ ව්‍යවස්ථාව ගෙනෙන කොට බුද්ධිමත් නායකයෝ, බුද්ධිමත් මිනිස්සු එකතු කරගෙන තමයි ව්‍යවස්ථාව හැදුවේ. ඒ ව්‍යවස්ථාවේ 160 වන ව්‍යවස්ථාවේ සඳහන් කළා, "අන්තර් කාලීන විධිවිධාන" ගැන. එහි මෙසේ සඳහන් වෙනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් යම් තැනැත්තෙක් ජනාධිපති ධුරය දැරුවේද ඒ තැනැත්තා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රථම ජනාධිපතිවරයා වන්නේය. ඒ ජනාධිපතිවරයා ජනරජයේ ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ ලෙස සියලු කාර්යය සඳහා සලකනු ලැබිය යුත්තේය. ඒ ජනාධිපතිවරයා 1978 පෙබරවාරි මස 4 වන දින සිට *[31 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව] සාවුරුද්දක් ධුරය දරන්නේය."

මෙන්න මෙහෙමයි එදා අන්තර්කාලීන විධිවිධාන ගෙනාවේ, 1978 ව්‍යවස්ථාව ගෙනෙන කොට, ජේ. ආර්. ජයවර්ධන මහතා වාගේ බුද්ධිමත් නායකයෝ. අද බුද්ධිමත් නායකයෝ නොවෙයි, අබුද්ධිමත් උදවිය දමා ගෙන, ගසා කන උදවිය දමා ගෙන, කොමිස් ගහන උදවිය දමා ගෙන පැවැත්ම සඳහා වරින් වර එක එක ගෙනෙනවා. මෙන්න මේ නිසා තමයි 2012 මේ පනත ගෙනාවාම, මේ පනත 2014 වෙනකොට සංශෝධනය කරන්න වුණේ. ඒක නිසා තමයි අද අන්තර්කාලීන විධිවිධාන නැවත ගෙනෙන්න වුණේ. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මේ කාරණය බොහොම පැහැදිලිව කියනවා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන කොට අන්තර්කාලීන විධිවිධානවල කොතැනකවත් සඳහන් කරලා නැහැ, දෙවරක් දිවුරුම් දීලා ඉන්න තැනැත්තෙකුට - වර්තමාන ජනාධිපතිවරයාටද - නැවත වරක් මේ ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් විය හැක්කේය කියන එක. එහෙම නම් අන්න ඒක තමයි කියන්නේ - [බාධා කිරීමක්] ඔබතුමා නීතිඥයෙක් තමයි. ඔබතුමාගේ කාලය ආවාම කථා කරලා කියන්න, ඔබතුමා නිකම් බොරුවට තටමන්නේ නැතුව. මම දන්නවා, ඔබතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බොහොම දක්ෂයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අතාවුල්ලා ඇමතිතුමා අවුරුදු දෙකකට ඉස්සරවෙලා මේ පනතට ගෙනාපු සංශෝධනය නැවතත් සංශෝධනය කරන්නට සිදු වුණා වාගේ, වර්තමාන ජනාධිපතිතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් යටතේ නැවත ජනාධිපතිවරණයකට ඉදිරිපත් වෙනවා නම්, එදාට වන්නේත් කකුල කැඩුණු අශ්වයෙක් වාගේ නොන්ඩි ගගහා යන්නට තමයි. ඒක නීතියට කරන නින්දාවක්, අගෞරවයක් කියන එක අපි මතක තබා ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල රන් මීහිතැන්නේ චිත්‍රපටයක් හදන්න පටන්ගෙන තිබෙනවා. මොකක්ද? "බිඳුණු දේශයේ සිට ආසියාවේ ආශ්චර්ය කරා" නමැති චිත්‍රපටය. ආසියාවේ ආශ්චර්ය කොහොමද? නාඩු හාල් කිලෝ එක රුපියල් 95යි. බොන්න වතුර වීදුරුවක් නැහැ. ඔන්න ලංකාවේ තිබෙන ආසියාවේ ආශ්චර්ය. [බාධා කිරීමක්] වතුර තිබෙනවා, කාලගුණයට පිහිට වෙන්න යන්තම් ඊයේ පෙරේදා වහින්න පටන්ගත්තාට පස්සේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "බිඳුණු දේශයේ සිට ආසියාවේ ආශ්චර්ය කරා" නමැති මේ චිත්‍රපටය

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

අධ්‍යක්ෂණය කරන්නේ කවුද? නාවික හමුදාවේ ලුතිනන් වරයෙක්. ලුතිනන්වරයාගේ නමත් ඕනෑ නම් කියන්න පුළුවන්. කවුද නිෂ්පාදනය කරන්නේ? මහජන මුදලින් රුපියල් ලක්ෂ 250ක් අරගෙන ජැක්සන් ඇන්තනි කියන කලාකරුවා තමයි නිෂ්පාදනය කරන්නේ. එතැනදී එක එක ආකෘති හදනවා. මොනවාද? එකක් තමයි බටලන්ද වධාපෘතිය හදන්න කියා -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, what is the point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
*மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ජැක්සන් ඇන්තනි කියන්නේ ශ්‍රේෂ්ඨ කලාකරුවෙක්. එතුමාට මේ අපහාසය කරන්න එපා කියලා කලාකරුවන් වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. Hon. Member, you may continue.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)#
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියලුම විස්තර මා සභාගත කරන්නම්. මා කරන ඉල්ලීමත් ඉෂ්ට කර දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසු ගිය කාල වකවානුව තුළ 2005.12.25වැනි දා ජෝසප් පරරාජසිංහම් මන්ත්‍රීවරයා ඝාතනය කළා. නඩරාජා රවිරාජ් මන්ත්‍රීතුමා 2006.10.31වැනි දා ඝාතනය කළා. ටී. මහේෂ්වරන් මන්ත්‍රීතුමා 2008.01.01වැනි දා ඝාතනය කළා. කේ. ශිවනේෂන් මන්ත්‍රීතුමා 2008.03.06වැනි දා ඝාතනය කළා. මේජර් ජනරාල් ජානක පෙරේරා මහත්මයා 2008.10.06වැනි දා ඝාතනය කළා. මේ සියලු ඝාතනයන් සිද්ධ වුණේ වර්තමාන පාලනය යටතේයි කියන එක මා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. එහෙම නම් අර ජැක්සන් ඇන්තනි මහත්මයා නිෂ්පාදනය කරන, නාවික හමුදාවේ ලුතිනන්වරයෙක් අධ්‍යක්ෂණය කරන අන්න ඒ චිත්‍රපටයට මෙන්න මේවාත් ඇතුළත් විය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම යාපනයේ තිනකුරල් කාර්යාලයට පහර දී එහි කේ. නවරත්නම් යන අය ඝාතනය කළා. "තිනකුරල්" පත්‍රයේ මාධ්‍යවේදියාට පහර දුන්නා. "සුඩර්ඔළි" පත්‍රයේ මාධ්‍යවේදී සුගීර්ධරන් ඝාතනය කළා. නඩරාජා ගුරපරන් පැහැරගෙන ගියා. "මව්බිම" පුවත් පතේ පරමේෂ්වරී අත් අඩංගුවට ගත්තා. "සන්ඩේ ලීඩර්" පුවත් පතේ කැමරා ශිල්පී අශෝක ප්‍රනාන්දු අත් අඩංගුවට ගත්තා. ලසන්ත වික්‍රමතුංග කියන්නේ බොහොම කලාත්මක පුද්ගලයෙක්. ඔහුවත් ඝාතනය කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම "තිනකුරල්" පත්‍රයේ මාධ්‍යවේදී සුබ්‍රමනියම් රාමචන්ද්‍රන් ඝාතනය කළා. ඒ වාගේම ටිරාන් අලස්ව අත් අඩංගුවට ගත්තා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
There is a point of Order being raised by the Hon. W.D.J. Senewiratne.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයට ගැනෙන්නේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පතයි. නමුත් මේ මන්ත්‍රීතුමා දිගින් දිගටම, දිගින් දිගටම මේ විවාදයට අදාළ නැති, සම්පූර්ණයෙන්ම බාහිර කරුණු පිළිබඳව සඳහන් කරමින් මේ ගරු සභාවේ කාලය නාස්ති කරනවා. මේ එක කරුණක්වත් අද ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පතට කොයිම විධියකින්වත් අදාළ වන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Palitha Range Bandara, please confine yourself to the subject under discussion.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)#
பாராளுமன்ற உறுப்பினர் ராதாகிருஷ்ணன் அவர்கள் இன்று பிரதி அமைச்சராக பதவியேற்றிருக்கிறார். அது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். நுவரெலியா மாவட் டத்துக்கு இன்னுமொரு பிரதி அமைச்சர் கிடைத்திருக்கிறார். கடந்த பாராளுமன்ற அமர்வின்போது அவர் உரையாற்றுகின்ற போது, அவர் ஆளுங்கட்சியில் இருக்கின்றாரா? எதிர்க் கட்சியில் இருக்கின்றாராவென்று என்னால்கூட புரிந்து கொள்ள முடியவில்லை. அந்தளவுக்கு அரசாங்கத்தை தாறுமாறாக கண்டித்துப் பேசினார். மக்கள் பாரிய இன்ன லுக்கும் துன்பத்துக்கும் மத்தியில் நுவரெலியாவில் வாழ்ந்து கொண்டிருக்கின்றார்களென்று கூறினார். அவருக்கு நுவரெலியா மாவட்ட மக்கள் எதிர்நோக்கும் பிரச்சினைகள் பற்றி நன்கு தெரியும். எனவே, அந்தப் பிரச்சினைகளை பிரதி அமைச்சராக இருந்து அவர் தீர்த்துவைக்க வேண்டுமென்று கேட்டுக்கொள்வதுடன், இந்தச் சபையில் அவருக்கு வாழ்த்துக்களையும் தெரிவித்துக்கொள்கின்றேன். மக்களின் பிரச்சினைகள் பற்றித் தெரிந்த ராதாகிருஷ்ணன் அவர்கள் இந்தப் பிரதி அமைச்சர் பதவியைப் பயன்படுத்தி மிகவும் அழகாக அந்தப் பிரதேசத்தை முன்னேற்ற வேண்டுமென்றும் நான் கேட்டுக்கொள்கின்றேன்.

இங்கு இன்னொரு விடயம் பற்றியும் நான் பேச வேண்டும். எமது தமிழ் மக்கள் தொடர்பாக அஸ்வர் அவர்கள் கூறுகையில், TNA வெற்றிபெறுமென்று தெரிந்துகொண்டே ஜனாதிபதி அவர்கள் வட மாகாண சபைத் தேர்தலை நடத்தினாரென்று குறிப்பிட்டார். ஏனென்றால், அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் தோற்பாரென்று தெரிந்து கொண்டே அரசு அத்தேர்தலை நடத்தியிருக்கின்றது என்ற வரவேற்கத்தக்க கருத்தொன்றினை அஸ்வர் அவர்கள் முன்வைத்திருந்தார். உண்மையில் அது ஒரு துணிச்சலான கருத்தென்றுதான் கூறவேண்டும். 1977ஆம் ஆண்டு தனிநாடு வேண்டுமென்று கேட்ட தமிழரசுக் கட்சியின் அன்றைய பாராளுமன்ற உறுப்பினர்கள் பலரின் பிள்ளைகள் இந்தியாவில்தான் படித்தனர். தற்போதைய தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்களின் சில பிள்ளைகள் கனடாவில் படித்துக்கொண்டிருக்கின்றார்கள். அங்கு medicine கிடைக்காவிட்டால் இந்தியாவிற்குச் சென்று medicine படிப்பதுதான் வழக்கம். தமிழ்த் தேசியக் கூட்ட மைப்பின் சில பாராளுமன்ற உறுப்பினர்கள் தமிழ்நாட்டி லிருந்து நேரடியாக இங்கு வந்து உரையாற்றி விட்டு மீண்டும் தமிழ்நாட்டுக்குச் செல்கின்ற ஒரு நிலைமையை நாங்கள் காண்கின்றோம். ஏனென்றால், அவர்களுடைய பிள்ளைகள், மனைவிமார், குடும்பத்தவர் எல்லாம் இன்றும் தமிழ் நாட்டில்தான் வாழ்ந்து கொண்டிருக் கின்றார்கள். இன்று அவர்கள் இந்தப் பாராளுமன்றத்திலே ஜெயலலிதா அம்மையாரின் கைது பற்றிப் பேசுவார்கள் என்று நான் எதிர்பார்த்தேன். ஆனால், துரதிருஷ்டம்! அவர்கள் அது பற்றிப் பேசவில்லை.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, please wind up now.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

அன்று ஜெயலலிதா அம்மையார் தமிழ்நாட்டு அரசாங் கத்திலே இருந்தபோது இவர்களுக்காக பல வழிமுறைகளை ஏற்படுத்திக் கொடுத்தார். ஜெயலலிதா அம்மையார் இலங்கை வாழ் தமிழர்களுக்காக இவ்வளவுதூரம் பேசியும்கூட, அவருடைய கைதுபற்றித் தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் இங்கு பேசவில்லை. அவருடைய கைதானது உரியமுறையில் மேற்கொள்ளப்பட்டதா? இந்தியாவின் முன்னாள் மத்திய உட்துறை அமைச்சர் சிதம்பரம் அவர்கள்மீது 25 பில்லியன் டொலர் corruption இருக்கின்றது; அதைவிட, சோனியா காந்தியின் மருமகனுடைய சொத்து 25 பில்லியன் டொலரைத் தாண்டியிருக்கின்றது; இதைவிட, கருணாநிதி அவர்களுடைய சொத்து 500 கோடியாக மாறியிருக்கின்றது என்றெல்லாம் சொல்லப்படுகின்றது. இவ்வாறிருக் கின்றபொழுது, 63 கோடி சொத்துக்களை வைத்துள்ள ஜெயலலிதா அம்மையாரைக் கைதுசெய்வது சரியா? என ஒரு கேள்வி எழுகின்றது. ஏனென்றால், இன்று மத்திய அரசாங்கத்துக்கு அடுத்ததாக இருக்கின்ற ஒரேயொரு எதிர்க்கட்சியாக வரக்கூடிய தகுதியுள்ள -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, please wind up now.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

அந்த வகையில், ஜெயலலிதா அம்மையார் அவர்களின் கைதானது ஓர் அரசியல் பழிவாங்கலாக இருக்குமா என்று தான் நாங்கள் சிந்திக்கின்றோம். தமிழர்களின் பல பிரச்சினைக ளுக்குக் குரல் கொடுத்த ஜெயலலிதா அம்மையாருடைய கட்சியானது, மத்திய அரசாங்கத்துக்கு நெருக்குதல் கொடுக்கும் வகையில் 38 ஆசனங்களை வைத்துக்கொண்டிருக் கின்றது. இன்று ஜெயலலிதா அம்மையாரை "ஜாமீன்" இல்கூட எடுக்க முடியாத நிலை ஏற்பட்டிருக்கின்றது. *[இடையீடு]* அவர் என்னுடைய நேரத்தை எடுத்துக் கொண்டிருக்கின்றார். உண்மையில், அவர்கள் இந்தச் சபையிலே அது பற்றிப் பேசவில்லை என்றால், -

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! There is a point of Order being raised by the Hon. P. Piyasena.

**ගරු පී. පියසේන මහතා**
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

TNA தமிழ் மக்களுக்காகப் பேசுவதற்கு இங்கு வரவில்லை. மாறாக, அவர்கள் தங்களுடைய இருப்புக்காகத்தான் இங்கு இருக்கின்றார்கள். அதனால்தான், அவர்கள் ஜெயலலிதாவைப் பற்றி இங்கு கதைக்கவில்லை.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Sri Ranga, your time is over. Please wind up now.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

Please give me one more minute, Sir.

மேலும், ஜெயலலிதா அவர்கள் கைது செய்யப்பட்ட அடுத்த நாளே இந்தியப் பிரதமர் மோடி அவர்கள், பிரபல நடிகர் ரஜனிகாந்த் அவர்களை அரசியலுக்கு வரும்படி கேட்டிருக் கின்றார் என்றும், அவ்வாறே நடிகர் கமலஹாசனையும் கேட்டிருப்பதாகவும் செய்திகள் தெரிவிக்கின்றன. எனவே, மத்திய அரசாங்கம் தமிழகத்தில் செய்கின்ற ஒரு சதித்திட்டம் தான் இது.

[අ.භා. 5.45]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொது நிருவாக, உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - Minister of Public Administration and Home Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදයට ගන්නා සංශෝධන පනත් කෙටුම්පත් ඉතාම වැදගත් කියා මා හිතනවා. මම එහෙම කියන්නේ හේතු සහිතවයි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා දීර්ඝ කාලයක් සාකච්ඡා කරලා, මේ ගරු සභාවට පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සම්මත කළා. එසේ සම්මත කළ ඒ පනත ක්‍රියාත්මක කිරීමේදී ඇත්ත වශයෙන්ම දේශපාලන වශයෙන් රට තුළ බොහොම අවුල් වියවුල් ඇති වන තත්ත්වයක් අපි දැක්කා. මේ පනතේ තිබෙන යම් යම් විධිවිධාන උපයෝගි කර ගෙන පළාත් පාලන ආයතනවල ශුභ සිද්ධිය වෙනුවෙන්, එහෙම නැත්නම් ඒ පළාත් පාලන ආයතන යටතේ සිටින ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් කටයුතු කරනවා වෙනුවට, දේශපාලන වශයෙන් කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා, ජනතාවට ඉතාම අවාසිදායක, ජනතාවට අහිතකර වැඩ පිළිවෙළක් සමහර තැන්වල ක්‍රියාත්මක වුණා. පනතට අනුව, යම් කිසි පළාත් පාලන ආයතනයක අය වැයක් ඉදිරිපත් කරලා, ඒක සම්මත කරන්න බැරි වුණොත් එය දෙවැනි වර ඉදිරිපත් කරන්න අයිතිය තිබෙනවා. එසේ දෙවැනි වර ඉදිරිපත් කරන අය වැයක් නැවත වරක් ප්‍රතික්ෂේප වුණොත් ඒ සභාපතිවරයා, නැත්නම් ඒ නගරාධිපතිවරයා ඉවත් විය යුතුයි. ඒක තමයි පළමුවන සංශෝධනයේ සඳහන් වුණේ. නමුත්, මේ පනතේ විධිවිධාන උපයෝගි කර ගෙන බලයේ ඉන්න පක්ෂයේම උදවිය කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක් ප්‍රාදේශීය සභාවක යම් සිද්ධියක් ඇති වුණා. ඒ ප්‍රාදේශීය සභාව තිබෙන ආසනයේ සංවිධායකවරයා ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට කැමති වුණේ නැහැ. එසේ කැමති නොවෙන්න හේතුව තමයි, ඒ සභාපතිවරයා මැතිවරණයේදී ඒ සංවිධායකවරයාගේ මනාපයට වැඩ කළේ නැති එක. ඒ දෙදෙනාම එකම පක්ෂයේ. ඒ සභාපතිවරයා ඒ පක්ෂයේම වෙනත් අපේක්ෂකයෙකුට තමයි වැඩ කළේ. මේ නිසා ඒ සභාපතිවරයා ඉවත් කරන්නට ආසනයේ සංවිධායකවරයා විසින් මේ පනතේ විධිවිධාන උපයෝගි කර ගත්තා. ඔහුට පක්ෂ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් අල්ලා ගෙන පළමුවර ඉදිරිපත් කළ අය වැය පරාජය කළා. එසේ පරාජය කළාට පස්සේ, ඒ සභාපතිතුමා සියලුම මන්ත්‍රීවරු කැඳවලා ඇහුවා, "තමුන්නාන්සේලා මේ අය වැය පරාජය කළේ ඇයි, මේ අය වැයේ අගති සහිත, අසාධාරණ විධිවිධාන තිබෙනවාද, එසේ තිබෙනවා නම් කියන්න, මම ඒවා ඉවත් කරන්නම්. එහෙම නැත්නම් මේ අය වැයට ඇතුළු කිරීමට තමුන්නාන්සේලා යම් කිසි විධිවිධාන යෝජනා කරනවාද, එහෙම නම් මම ඒවා ඇතුළු කරන්නම්. එහෙම ඇතුළු කරලා මේ අය වැය සම්මත කරන්න ඉඩ දෙන්න" කිව්වා. නමුත්, ඒ කිසිම මන්ත්‍රීවරයෙක් කිසිදු සංශෝධනයක් ගෙනාවේ නැහැ. ඒ විධියට ඉඩකඩ සලසා තිබියදීත්, පළමුවැනි වතාවේ අය වැය පරාජය කරන්න කටයුතු කළා වාගේම, කිසිම පිළිගත හැකි හේතුවක් නැතුව දෙවැනි වතාවේත් එම අය වැය පරාජය කළා. ඒකෙන් පෙනෙනවා, එතැනදී අවශ්‍ය කරන්නේ මේ පළාත් පාලන ආයතන හරහා ප්‍රදේශයේ ජනතාවට, නැත්නම් ප්‍රදේශයට සේවය කරන්න නොවෙයි කියන එක. මේ පනතේ විධිවිධාන උපයෝගි කර ගෙන පළාත් පාලන ආයතනවල බලය උඩු යටිකුරු කරලා බලය ඩැහැ ගැනීමේ චේතනාවෙන් තමයි බොහෝ වෙලාවට කටයුතු කරන්නේ. ඒක අපට පැහැදිලිව පෙනුණා. එහෙම වුණොත් මේ පළාත් පාලන ආයතනවලින් ජනතාවට, ඒ වාගේම සමාජයට කරන්නට බලාපොරොත්තු වන කිසිම සේවාවක් කරන්න පුළුවන් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි එක කාලයක් තිබුණා, සභාපතිවරයා තෝරන දවසට ඉස්සෙල්ලා දවසේ රාත්‍රියේ මන්ත්‍රීවරු උස්සා ගෙන ගිහිල්ලා ඒ අය හංගනවා. හංගලා ඒගොල්ලන්ට ඡන්දයට එන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ විධියට බලපුළුවන්කාරකම් කරලා තමයි එදා සභාපතිවරයා පත් කළේ. පසුව ඒ ක්‍රමය නැති කළා. ඊට පසුව මේ අනුපාත ක්‍රමය යටතේ වැඩිම මනාප ගන්න පුද්ගලයා සභාපති කිරීමේ ප්‍රතිපත්තියක් අද හැම පක්ෂයකින්ම ගෙන යනවා. මේක එච්චර සාධාරණ යුක්තිගරුක වැඩ පිළිවෙළක් නොවෙයි. නමුත්, වෙනත් පදනමක් නැති නිසා ඒ පදනම තෝරා ගැනීමේ වරදක් නැහැ. නමුත් ඒ විධියට වැඩි මනාප සංඛ්‍යාවක් අරගෙන, වැඩි දෙනාගේ මනාපයෙන් පත්වෙන සභාපතිවරයාට විරුද්ධව කිසිම පිළිගත හැකි හේතුවක් නොමැතිව, මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුව අල්ලස් දීලා අරගෙන, එහෙම නැත්නම් යම් යම් පොරොන්දු දීලා අරගෙන හෝ එහෙම නැත්නම් ඒ අයට වෙනයම් ආකාරයකට බලපෑම් කරලා වැඩි ඡන්දය පාවිච්චි කරලා අය වැය ප්‍රතික්ෂේප කරලා, එතුමාට සභාව ගෙන යන්නට බැරි තත්ත්වයක් ඇති කිරීමේ හැකියාවක් අද ඇති වෙලා තිබෙනවා. ඒ තත්ත්වය නැති කරන්නට තමයි මේ සංශෝධනය ගේන්නේ. මම දන්නා විධියට මේ සම්බන්ධයෙන් ගරු පළාත් පාලන හා පලාත් සභා ඇමතිතුමා හුඟාක් මහන්සි වුණා. ඒ විධියට හුඟක් මහන්සි වෙලා තමයි මේ සංශෝධනය ගෙනාවේ. එම නිසා මේ සංශෝධනයට සියලු දෙනාම සහයෝගය දෙයි කියා මා විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට පිළිතුරු කථාව කිරීම, ගරු ඒ.එල්.එම්.අතාවුල්ලා අමාත්‍යතුමා.

[අ.භා. 5.50]

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා (පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா - உள்ளூராட்சி, மாகாண சபைகள் அமைச்சர்)
(The Hon. A.L.M. Athaullah - Minister of Local Government and Provincial Councils)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම අගය කරනවා අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාව. දහවල් 1.00 සිට මේ වෙනකම්, - දැන් වේලාව පස් වරු 6.00යි - එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කෑ ගැහුවා. එතුමන්ලා ඒ විධියට කෑ ගහන විට අපි බාධා කළේ නැහැ. උත්තරය දෙන වෙලාව, පිළිතුර දෙන වෙලාව වනතෙක් කරුණාකර මේ ගරු සභාවේ වාඩිවෙලා ඉන්න කියලා අපි එතුමන්ලාට කිව්වා. දැන් මේ ගරු සභාවේ කවුරුත් නැහැ. නමුත් ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ සිටිනවා. අපිට එතුමා ගැන ලොකු ගෞරවයක් තිබෙනවා. එම නිසා  මේ අවස්ථාවේ මේ ගරු සභාවේ රැඳී සිටීම වෙනුවෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා.

මේ අවස්ථාවේදී මම පළමුවෙන්ම ප්‍රකාශ කළ යුතු කාරණය මෙයයි. මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේදී මේ ආකාරයට කථා කළාට, විපක්ෂයේ පාලනය යටතේ පවතින, ආණ්ඩුවේ පාලනය යටතේ පවතින පළාත් පාලන ආයතනවල සභාපතිවරු, ඒ වාගේම TNA එකේ පාලනය යටතේ පවතින පළාත් පාලන ආයතනවල සභාපතිවරු සියලු දෙනාම මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා කථා බහ කරලා, ගොඩක් ප්‍රශ්න විසඳාගෙන තිබෙනවා. ඒ අවස්ථාවලදී කිහිප වතාවක්ම ඒ අය අපට ප්‍රකාශ කළා, මේ කාලය පළාත් පාලන ආයතනවලට වසන්ත කාලයක්ය කියලා. දෙමළ පක්ෂවල පාලනය යටතේ පවතින පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්, එක්සත් ජාතික පක්ෂ පාලනය යටතේ පවතින පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් වාගේම ආණ්ඩු පක්ෂ පාලනය යටතේ පවතින පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් සියලු දෙනාම ඒ බව ප්‍රකාශ කරලා තිබෙනවා. හේතුව, අපේ අතිගරු ජනාධිපතිතුමාගේ මේ යුගය තමයි අපේ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළට හුඟක්ම මුදල් වෙන් කළේ. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා මේ සභාවේදී හුඟාක් කෑ ගැහුවා, අපේ ආණ්ඩුවෙන් පළාත් පාලන ආයතනවලට කිසි දෙයක් කරලා නැහැයි කියලා. එතුමා ඇත්ත, සත්‍යය දන්නේ නැහැ. මේ වසරේ, 2014 අය වැය කථාවේදීම අපේ අතිගරු ජනාධිපතිතුමා පළාත් පාලන ආයතනවලට මාසයකට රුපියල් මිලියනයක් දෙනවා කියලා පොරොන්දු වෙලා, දැන් ඒක දීගෙන යනවා. එතකොට අවුරුද්දකට රුපියල් මිලියන 12ක් මේ පළාත් පාලන ආයතනවලට දීගෙන යනවා. ප්‍රාදේශීය සභාවලට පාරවල් හදන්න අවශ්‍ය වාහන ලබා ගැනීමට රුපියල් මිලියන 10,000කට වැඩි මුදලක් යොදා තිබෙනවා.

"පුර නැඟුම" ව්‍යාපෘතිය හරහා පළාත් පාලන ආයතන 108ක් තෝරාගෙන, ඒ පළාත් පාලන ආයතනවලට අපි රුපියල් මිලියන 50ක් දීගෙන යනවා. ඒ වාගේම පළාත් සභාවල මාර්ග හදන්නට සල්ලි දෙනවා. ඒ වාගේම "ගම නැඟුම" ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට සල්ලි ලැබිලා තිබෙනවා. ආර්ථිකය දියුණු කිරීමට අපි වෙනම ව්‍යාපෘතියක් හඳුන්වලා දීලා තිබෙනවා. එපමණක් නොවෙයි, දැන් තමයි පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් ජනතාවට සමීප වෙලා වැඩ කරන්නේ. එක්සත් ජාතික පක්ෂය  ප්‍රාදේශීය සභා පනත ගෙනාවා. ඊට කලින් තිබුණ පනත යටතේ කොට්ඨාස ක්‍රමය තමයි තිබුණේ. ඒ කොට්ඨාස ක්‍රමය යටතේ මන්ත්‍රීවරුන් තේරී පත් වෙනවා. ඒ මන්ත්‍රීවරුන් එකතු වෙලා ඒ පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා කවුද කියලා තෝරනවා.  ඒ වාගේම අය වැය ප්‍රශ්න ආවාම එතුමාව පරාජයට පත් කිරීමටත් ඒ පනත යටතේ ඉඩ කඩ තිබුණා. දැන් ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා කථා කළා. එතුමාගේ තාත්තා, ප්‍රේමදාස මහත්මයා තමයි හොරුන්ට හොරකම් කරන්නට අවස්ථාව ලබා දුන්නේ. ඒ වාගේම, දූෂණ කරන්න ඉඩ කඩ ලබා දුන්නේ.

අය වැය පරාද වුණත්, ඒ සභාපතිතුමාට කැමැති නම් දිගටම සභාව ගෙන යන්න පුළුවන් විධියට ඒ පනත හදලා දුන්නේ එක්සත් ජාතික පක්ෂයෙන්. මේ ගරු සභාවේ ඉන්න කාටවත් ඒක එහෙම නොවෙයි කියන්න බැහැ. එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙකුට එහෙම කියන්න බැහැ. ඒ ක්‍රමය යටතේ ඡන්දයක් දිනලා එනකොට තමන්ගේ කොට්ඨාසයට කවුද වග කිව යුතු මන්ත්‍රීවරයා කියලාවත් සමහර අය දන්නේ නැහැ. ඒ ක්‍රමය වෙනස් කරන්නට එක්සත් ජාතික පක්ෂය බලයේ සිටි කාලයේම කොමිටියක් පත් කළා.  අපි ඒක ඇත්තටම අගය කරනවා. විශේෂ කාරක සභාවේදී අපි ඒ කරුණු ගැන අවුරුදු කීපයක් සාකච්ඡා කරලා අන්තිමට පක්ෂ නායකයින් සියලු දෙනාම ඒක රාශි වෙලා කතා කරලා එකඟතාවකට ඇවිල්ලා එකමුතුවෙන් තමයි අපි එය සම්මත කරලා තිබෙන්නේ. ඒ වුණාට එතැන අඩු පාඩු සිදු වෙලා තිබෙනවා.

දැන් පවතින ක්‍රමය බලන්න. දැන් තිබෙන ක්‍රමය අනුව ඡන්දය තියලා ඉන්නේ අවුරුදු තුන හමාරයි නම් මේ තුළින් ඒ අයට තවත් කල් තිබෙනවා. ඒ සභාවට මන්ත්‍රීවරුන්ගේ පුරප්පාඩුවක් ආවාම පුරවන්නට එම පනත අනුව හැකියාවක් තිබුණේ නැහැ. ඒ නිසා ඒක අපි වෙනස් කළා. ඒ වාගේම පළාත් පාලන ආයතනවල පසු ගිය අය වැය ඉදිරිපත් කරන කොට අපි මේ වෙනසත් හඳුනා ගත්තා. දැන් අපි අලුතින් ගෙනාපු පනතේ මනාප ක්‍රමය නැහැ. එය අපි පිළිගන්න ඕනෑ. කොට්ඨාස ක්‍රමය විතරයි තිබෙන්නේ. කොට්ඨාසයකට මන්ත්‍රීවරයෙක් ඉන්නවා. එතකොට මනාප ප්‍රශ්නයක් නැහැ. පක්ෂය ඇතුළෙත් ප්‍රශ්නයක් නැහැ. දැන් තේරී පත් වී පැමිණි මන්ත්‍රීවරු සභාපති වෙන්න පුළුවන්, උප සභාපති වෙන්න පුළුවන්, මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, පක්ෂය ඇතුළේම තිබෙනවා මනාප ප්‍රශ්නය.  ඒ නිසා එකිනෙකා අතර වෛරයක් ඇති වෙලා තිබෙනවා. ඒ වෛරය පාවිච්චි කරලා, අපේ පනතත් පාවිච්චි කරලා තමයි මේ අය වැය පරද්දලා ඒ සභාපතිවරයාව එළියට යවන්නට මේ ගොල්ලන් සූදානම් වුණේ. අපි ඒක දැක්කා. සමහර සභාවල  පක්ෂ විපක්ෂ සියලු දෙනාම එකතු වෙලා මේ කුමන්ත්‍රණය සැලසුම් කර  තිබෙනවා. ඉතින් ඒක නැති කරන්න තමයි අපි මේ සංශෝධනය මෙතැනට ගෙන ආවේ. ඒ කියන්නේ විශේෂ කාරක සභාවේදී ගත්ත තීන්දුව අපි වෙනස් කරලා නැහැ. ඒ අලුත් පනත අනුව, අලුත් සභාවක් පත් වන විට,  ඡන්දය තියලා අලුතින් මන්ත්‍රීවරු එනකොට ඒ ප්‍රශ්නය මතු වන්නේ නැහැ.  අපි ඒ තීන්දු ගත්ත විධියටම ඒක ක්‍රියාත්මක වෙනවා.  නමුත් දැන් අපි ඒක වෙනස් කරන්න යන්නේ. මොකද, මේ සභාවේ ස්ථිරභාවය නැති කරන්න හදන කුමන්ත්‍රණයට විසඳුමක් හොයන්න තමයි අපි දැන් එළැඹිලා සිටින්නේ.

මිනිසුන්ගේ කාලීන අවශ්‍යතාවලට අවශ්‍ය වන නීති-රීති හදන්න තමයි මේ සභාව තිබෙන්නේ. ඒකට තමයි සල්ලි වෙන් කරලා තිබෙන්නේ. නමුත් සජිත් ප්‍රේමදාස මහත්මයා කියනවා, "සල්ලි විනාශයි ලු. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාලය විනාශයි ලු" කියලා. එතුමාට මම මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. එතුමා ජනාධිපති වෙන්න සූදානම් වනවා වාගේ මට පෙනෙනවා. ජනාධිපති අපේක්ෂකවරයා වශයෙන් කටයුතු කරන්න සූදානම් වනවා වාගේ තමයි එතුමා කථා කරන්නේ. නමුත් ඒ සම්බන්ධයෙන් මාධ්‍යවලට කථා කරන්නේ නැහැ. ඇත්ත -සත්‍යය - ගැන කථා කරන්න ඕනෑ. මන්ත්‍රීතුමන්ලාගේ පඩිය සහ allowances ගැන කථා කරනවා. නිතරම කථා කරන්නේ කරුණු තුනයි. Youth representatives, women representatives, allowances කියන මේ කරුණු තුන ගැන විතරයි එතුමා කථා කරන්නේ. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම ගැන, ඒ පළාත් පාලන ආයතන දියුණු කිරීම ගැන, පාරවල් ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, අපේ අතිගරු ජනාධිපතිතුමා

බලාපොරොත්තු වන්නේ ජනතාවට සමීපව කටයුතු කරන ආයතනය බවට මේ පළාත් පාලන ආයතන පත් කරන්නයි. ඒ පළාත් පාලන ආයතන හරහා මහ ජනතාවට වැඩ කරන්න අපට පුළුවන්. ඔබතුමන්ලා රට පුරාම ගිහිල්ලා බලන්න. හෙටත් අපේ අතිගරු ජනාධිපතිතුමා පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ අලුත් ගොඩනැගිල්ල විවෘත කිරීමට යනවා. අනිද්දා බිංගිරියට යනවා. ඔබතුමන්ලා රට පුරාම ගිහිල්ලා බලන්න. 1957 හදපු ගොඩනැඟිල්ල තමයි තමුන්නාන්සේලා මෙච්චර කාලයක් තියාගෙන හිටියේ. අප එය වෙනස් කළා. අප Pradeshiya Sabha Act එක විතරක් වෙනස් කරලා නැහැ. අප සම්පූර්ණයෙන්ම සියල්ල වෙනස් කළා. එක්සත් ජාතික පක්ෂය කරපු ඔක්කොම වැරදි අප නිවැරදි කරගෙන යනවා. ඒ කාරණය තමුන්නාන්සේලා දන්නවා. අපේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඒ ගැන දන්නවා. ඇත්තටම අපත් ඒ ගැන දන්නවා. අපත් ඒවායේ ඉඳලා තිබෙනවා. අපත් දැකලා තිබෙනවා. ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදී ප්‍රශ්නය ඇතුළු සෑම ප්‍රශ්නයකදීම තමුන්නාන්සේලා තීන්දු ගත්තේ දේශපාලන විධියටයි. එදා Pradeshiya Sabha Act එක ප්‍රේමදාස මැතිතුමා ගෙනාවේ තමන්ගේ ගෝලයින් ටික ආරක්ෂා කරන්නයි. එතුමාගේ පුතා ඇවිල්ලා කියනවා, "අපි ආරක්ෂා කරන්න යනවා ලු". අපි ආරක්ෂා කරන්න ගියේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව* ජානක බණ්ඩාර මහතා *මූලාසනයෙන් ඉවත් වූයෙන්,* නියෝජ්‍ය කථානායකතුමා *මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* மாண்புமிகு ஜானக பண்டார அவர்கள் *அக்கிராசனத் தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. JANAKA BANDARA *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප දැන් බලාපොරොත්තු වන්නේ වැරැද්දක් තිබෙනවා නම් ඒක නිවැරදි කර ගන්නයි. අප මෙය ගැසට් කළ නිසා අපට අඩු පාඩු කීපයක් හඳුනා ගන්න පුළුවන්කම ලැබුණා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව එහෙම නොවෙයි කටයුතු කළේ. පනත් කෙටුම්පත හදන කොට මොනවා හෝ වැරැද්දක් වුණා නම් ඒ වැරැද්ද දිගටම එහි තිබෙනවා. අප test කරලා බැලුවා. Test කරලා බලලා අඩු පාඩු ටික අප නිවැරදි කරගෙන යනවා. Delimitation process එක ඉවර වුණාම අප අනිවාර්යයෙන්ම අලුත් ඡන්ද පවත්වනවා. ඒ අවස්ථාවේ දී අපට කියන ඔක්කොම කරන්න පුළුවන්. මොකද, දැන් මනාප ප්‍රශ්නයක් නැහැ, වෛරයක් නැහැ. මන්ත්‍රීවරුත් එක්ක සභාපතිතුමාගේ තිබෙන සම්බන්ධතාව වැඩි කරන්න ඕනෑ. ඒ වාගේ allocation සම්බන්ධයෙනුත් බලලා තමයි මේ පනත් කෙටුම්පත හදලා තිබෙන්නේ. ඇත්තටම මේ පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරන්න කලින් අප කාරක සභාවට දැම්මා. තමුන්නාන්සේලා ඒ කාරක සභාවට ආවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. නමුත් Party Leaders' Meeting එකේ දී කියලා තිබුණා, ඇමතිතුමාත්, පක්ෂ නායකවරුත් මේ සම්බන්ධයෙන් කථා කරන්න ඕනෑ කියලා. ඒකට අවස්ථාව ලබා දුන්නා. ඒ අනුව අප එතැනදී ඒ ගැන සාකච්ඡා කළා. සාකච්ඡා කරලා ඔබතුමන්ලා එකඟ වුණ කාරණය අනුව තමයි අප මේ පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරන්නේ. නමුත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ඇවිල්ලා මෙතැන කියනවා, "නැහැ, නැහැ, එහෙම කිව්වේ නැහැ" කියලා. එහෙම අසත්‍යක් කියන්න බැහැ නේ. අමාත්‍යාංශයේ ලේකම්වරු බලාගෙන ඉන්නවා. Legal Draftsman බලාගෙන ඉන්නවා. අනික් officersලා බලාගෙන ඉන්නවා. Additional Secretary බලාගෙන ඉන්නවා. UNP එක මෙහෙම අසත්‍ය කියන්නේ ඇයි කියලා ඒ නිලධාරීන් අහවි නේ. ඒක මේ සභාවට හොඳ නැහැ. Legal Draftsmanට පෙරේදා තමයි මේ පනත් කෙටුම්පත ලබා දුන්නේ. දවසක් ඇතුළත මේ සංශෝධන හදලා අපට ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්තටම මේ අවස්ථාවේ දී මම ඒ නිලධාරීන්ට ස්තුතිවන්ත වන්න ඕනෑ. පෙරේදා හවස අප ඒ නිලධාරීන් කැඳවුවා. ඊයේ නිවාඩු දවසක්. අද පෙ.ව. 10.00ට මේ පාර්ලිමේන්තුවට සංශෝධන ඉදිරිපත් කළා. ඒ වෙනුවෙන් ඒ නිලධාරීන් කොපමණ වැඩ කරන්න ඕනෑද? ඒගොල්ලන් හදලා ඉදිරිපත් කරපු සංශෝධන බොරු කියලා කියන්න බැහැ නේ. නමුත් ඒ ස්ථාවරයේ තමයි අපේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කට්ටිය ඉන්නේ.

අපි සියලු දෙනාම ඒක රාශි වෙලා, එකඟතාවකට ඇවිල්ලා, මොනවා හරි කරනකොට ඒකට සහයෝගය දෙන්න ඕනෑ, "මෙන්න මේක හොඳයි" කියලා. ඒ කියන්නේ මේක සන්ධානයට පමණක් නොවෙයි UNP එකටත් බලපානවා. UNP එකේ බලය තිබෙන සභා කිහිපයක් තිබුණා, මේ වාගේ ප්‍රශ්නයකට මුහුණ දුන්. TNA එකට වව්නියාවේ මේ ප්‍රශ්නය තිබුණා. මුස්ලිම් කොංග්‍රසයේ සියලු දෙනාටම මේ ප්‍රශ්නය තිබුණා. මේ ප්‍රශ්නය විසඳීමට තමයි අපි මේ ගරු සභාවට භාර දීලා තියෙන්නේ.

සමහර මන්ත්‍රීවරු කරුණු කිහිපයක් සම්බන්ධව කථා කළා. කරු ජයසූරිය මන්ත්‍රීතුමා කථා කළා. ඒවා අපි පිළිගන්නවා. ජ්‍යෙෂ්ඨ නායකවරු, ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මොනවා හරි අදහසක් කියනවා නම් ඒක අපි පිළිගන්නවා. ඒක පිළි අරගෙන අපි අනිවාර්යයෙන්ම කරනවා. අන්න ඒක තමයි අපේ අතිගරු ජනාධිපතිතුමාත් බලාපොරොත්තු වෙන අදහස. හැබැයි, හැම වෙලාවේම මඩ ගහන්නට තමයි එන්නේ. අපේ කාලය විනාශ කරන්න නොවෙයි නේ අපි ඇවිල්ලා ඉන්නේ.

Budget එක ඉදිරිපත් කරන දවසේදී, Budget එක ඉදිරිපත් කරලා, හැම පළාත් පාලන ආයතනයම ආරවුලකට පත් වෙලා දැන් මේ මිනිස්සු ඡන්දය දීලා එවපු මන්ත්‍රීවරු ගෙදර යවලා අපි මොකක්ද කරන්න හදන්නේ? මේක ඇත්ත නම් අපි ඒකට සහයෝගය දෙන්න ඕනෑ. මේ පළාත් පාලන ආයතන ගැන තමුන්නාන්සේලා දන්නවා; අපේ මන්ත්‍රීතුමාලාත් දන්නවා. දැන් රට පුරා ගිහිල්ලා අහන්න, මොකක්ද කරලා තියෙන්නේ මොකක්ද වෙලා තියෙන්නේ, සල්ලි කොහොමද වෙන් කරලා තියෙන්නේ කියලා. පළාත් පාලන ආයතනවලට Budget එකෙන් කොච්චර මුදල් වෙන් කරලා තියෙනවාද කියලා බලන්න. එහෙම සල්ලි වෙන් කරලා තියෙද්දි නිකම්ම බොරු කියන්න බැහැ නේ. ඒක දන්නේ නැහැ. සභාවට යන්නේ නැහැ. සභාවේ ඉන්න අයගේ ප්‍රශ්නයකට ඇහුම්කන් දෙන්නේ නැහැ. නිකම් දේශපාලනය ගැන පමණක් කථා කරලා මාධ්‍ය ඉස්සරහා නටන්න තමයි තමුන්නාන්සේලා මේ ගරු සභාවට ඇවිල්ලා කථා කරන්නේ; කෑ ගහන්නේ. ඒවාට ඉඩදෙන එක නරකයි.

මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මේ අවස්ථාවේ දී කරුණු කිව්ව සියලු මන්ත්‍රීවරුන්ට මම ස්තුති වන්ත වෙනවා. දැන් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු තමන්ගේ කථාව කරලා වාඩි වෙලා ඇහුම්කන් දෙමින් ඉන්නවා. කනිෂ්ඨ මන්ත්‍රීවරු නිකම් බොරුවට දඟලනවා. ඒ ගොල්ලොන්ට ඉදිරියේදී ඉගෙන ගන්න තව ගොඩක් දේවල් තියෙනවා. ඒවා ඉගෙන ගන්න ඕනෑ. කථා කරන විධිය ඉගෙන ගන්න ඕනෑ. බලන්න, තමන්ගේ ප්‍රශ්නවලට තමන්ගේ අන්තේම උත්තර තියෙනවා. සජිත් මන්ත්‍රීතුමා කථා කළ ප්‍රශ්න සියල්ල එතුමාගේ තාත්තා කරපු වැඩ. තමා කථා කරපු සියල්ලම

[ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]

තමන්ගේ තාත්තා කරපු ඒවා කියලා මෙතැන පෙන්වලා දුන්නා. අපි අගය කරන ප්‍රේමදාස මැතිතුමා වැරදියි කියලා තමයි එතුමා කථා කළේ. එතකොට UNP අය අහගෙන හිටියා; අත්පුඩි ගැහුවා. එහෙම තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, අපි හොඳ දෙයක් කරනකොට සහයෝගය දෙන්න කියලා. පළාත් පාලන අමාත්‍යාංශය හරහා අපි ගොඩක් වැඩ කරගෙන යනවා. ඒක මුළු රටම දන්නවා; සභාපතිවරු දන්නවා; සියලු දෙනාම දන්නවා. Delimitation Commission එක ඒ වැඩ කටයුතු කර ගෙන යනවා. Delimitation Commission එකේ සභාපතිතුමා කොහේ හෝ ගියා නම් අපට කියන්න බැහැ, එතුමා දේශපාලනය වෙනුවෙන් ගියා කියලා. එහෙම නෙවෙයි. ජනාධිපතිවරයාව හමු වෙනවා නම් එතුමාගේ නිවසේදී හම්බ වෙන්න පුළුවන්. එතුමාගේ කාර්යාලයේදී හම්බ වෙන්න පුළුවන්. නැත්නම් බදුල්ලේ ගිහිල්ලා හම්බ වෙන්න පුළුවන්. එහෙම හම්බවෙනකොට අපට කියන්න බැහැ, Delimitation Commission එකේ Chairman ගිහිල්ලා දේශපාලන වැඩ කරනවා කියලා. ඒක වැරදියි. [බාධා කිරීමක්] අන්න ඒක තමයි මම කිව්වේ. Office එකේ මන්ත්‍රීවරයෙක් ඉඳලා තියෙනවා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, කවුරු හෝ මගෙන් වෙලාවක් ඉල්ලනකොට මටත් පුළුවන් මම අහවල් වෙලාවට මෙතන ඉන්නවා හම්බ වෙන්න කියලා කියන්න. [බාධා කිරීමක්]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
He has no political rights.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
නැහැ. නැහැ. එයාට political rights නැහැයි කියලා කියන්න බැහැ.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
He cannot go.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
No, he has the right. You cannot say so.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
That is the law.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
What is the law? - [*Interruption]* එහෙම law එකක් නැහැ. [බාධා කිරීමක්] කවුරු හරි කිව්වොත් ඔහුට political rights නැහැයි කියලා එහෙමනම් ඔහු කොහේද ගියේ? ඇමතිවරයෙක්ව හමු වෙන්න ගියාම මොකක්ද වෙන්නේ?

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
As the Chairman of the Commission, he has no political rights. He cannot attend a political function.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
එතුමා ගිහිල්ලා කොහේ හරි වේදිකාවක කථා කළාද? මොනවා හෝ පණිවුඩයකට ඇමතිතුමා හම්බ වෙන්න ගියා.

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)
එහෙම නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලයට ගියා.

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
කාර්යාලයේ ඇමතිවරයෙක් ඉඳලා තිබෙනවා. ඇමතිවරයෙක් හම්බ වෙන්න ගියා. මෙතුමා -ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා- ඒ කාලයේ UNP regime එකේ ඇමතිවරයෙක්. එතුමාට එක්සත් ජාතික පක්ෂ කාර්යාලයක ඉඳගෙන කවුරු හෝ officer කෙනකු ගෙන්වා ගෙන වැඩ කරන්න බැරිද? එහෙම බැහැ කියලා අපට කියන්න බැහැ. යූඑන්පී ආණ්ඩු කාලයේත් එහෙම කළා. මෙතැනදී වුණෙත් එතුමාගේ වුවමනාවකට නැත්නම් ඇමතිතුමාගේ වුවමනාවකට ඇමතිතුමාව හමු වෙන්න ගිය එකයි. එච්චරයි. ඇමතිතුමා ඒ office එකේ ඉන්නවා. තවම දේශපාලන වැඩ කටයුතු පටන් ගත්තෙත් නැහැනේ. ඡන්ද වැඩ පටන් ගත්තෙත් නැහැ නේ. නමුත් මෙතැනදී ඔබතුමන්ලා පෙන්වන්න යන්නේ මොකක්ද? ඔබතුමන්ලා මෙතැන දේශපාලන බලපෑමක් තිබෙනවා කියලා පෙන්වන්න යනවා. එහෙම එකක් නැහැ. ඒ Delimitation Commission එක තමන්ගේ රාජකාරිය හරියට ඉටු කරගෙන යනවා. ඒ ගොල්ලන් හොඳට වැඩ කර ගෙන යනවා. මම නියම වෙලාවට ඒ Report එක අතිගරු ජනාධිපතිතුමාට භාර දෙනවා.

එක්සත් ජාතික පක්ෂයේ තමුන්නාන්සේලා නිතරම ඉල්ලනවා, copy එකක් දෙන්න කියලා. එහෙම දෙන්න නීතියක් නැහැ. අපි තමයි නීතිය හැදුවේ. එතැන කියලා තිබෙන්නේ ඇමතිවරයාට භාර දුන්නාම ඇමතිවරයා අතිගරු ජනාධිපතිතුමාට භාර දෙන්න ඕනෑය කියලායි. ඒකේ copy එකක් අසවල් පක්ෂයට දෙන්නය, අසවල් කණ්ඩායමට දෙන්නය කියලා එහෙම එකක් නැහැ. එහෙම ඉල්ලන එකත් හොඳ නැහැ. නමුත් අපි හැම දෙනාටම chance එක දුන්නා, ඒ ගොල්ලන්ගේ අදහස ප්‍රකාශ කරන්න; ලිඛිතව දෙන්න; ගිහිල්ලා හම්බ වෙලා කථා කරන්න. සියලු දෙනාටම ඒ අවස්ථාව දීලා තිබෙනවා. ඒ නිසා එතැන අසාධාරණකම් මොනවත් සිදු වෙලා නැහැ. අපි හැකි ඉක්මනින් ඒ වැඩ කටයුතු ඉවර කරලා මේ රටේ අලුත් ක්‍රමයට ඡන්ද තියන්නට සූදානම් වන බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විරුද්ධයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."-[ ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [ மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. A.L.M. Athaullah]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (252 වන අධිකාරය වූ මහනගර සභා ආඥාපනතේ 215අ වගන්තිය සංශෝධනය කිරීම.)

වாசகம் 2.- ((252ஆம் அத்தியாயமான) மாநகர சபைகள் கட்டளைச் சட்டத்தின் 215அ என்னும் பிரிவினைத் திருத்துதல்.)

CLAUSE 2.- *(Amendment of section 215A of the Municipal Councils Ordinance (Chapter 252).)*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"In page 1, leave out all words in lines 7 to 10 and insert:

| | | |
|---|---|---|
| 'Insertion of new section 215B in the Municipal Councils Ordinance (chapter 252) | The following new section is hereby inserted immediately after section 215A of the Municipal Councils Ordinance (Chapter 252) and shall have effect as section 215B of that Ordinance | |
| Transitional Provision | 215 B | The provisions of the proviso to section 215A of the Municipal Councils Ordinance as amended by the Local Authoritie(Special Provisions)Act, No. 21 of 2012 shall not be applicable to any budget or supplementary budget to be submitted to a Municipal Council constituted in terms of the results of elections held prior to the date of coming into operations of Local Authorities (Special Provisions) Act No. 21 of 2012 and Local Authorities Elections (Amendment) Act, No. 22 of 2012 respectively.' " |

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු සභාපතිතුමනි, අපි විරුද්ධයි.

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தத்துடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත

## நகர சபைகள் (திருத்தம்) சட்டமூலம்

## URBAN COUNCILS (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"That the Bill be now read a Second Time."

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විරුද්ධයි.

[ගරු ජෝන් අමරතුංග මහතා]

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."-[ ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [ மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. A.L.M. Athaullah]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[ பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- ((255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 178අ වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 2.- [(255ஆம் அத்தியாயமான) நகர சபைகள் கட்டளைச் சட்டத்தின் 178அ என்னும் பிரிவைத் திருத்துதல்.]

CLAUSE 2. - *(Amendment of section 178A of the Urban Councils Ordinance (Chapter 255)*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"In page 1, leave out all words in lines 7 to 10 and insert:

| | | |
|---|---|---|
| 'Insertion of new section 178B in the Urban Councils Ordinance (Chapter 255) | | 2. The following new section is hereby inserted immediately after section 178A of the Urban Councils Ordinance (Chapter 255) and shall have effect as section 178B of that Ordinance . |
| Transitional Provision | 178B. | The provisions of the proviso to section 178A of the Urban Councils Ordinance as amended by Local Authorities (Special Provisions) Act, No. 21 of 2012 shall not be applicable to any budget or supplementary budget to be submitted to an Urban Council constituted in terms of elections held prior to the date of coming into operation of Local Authorities (Special Provisions) Act, No. 21 of 2012 and Local Authorities Elections (Amendment) Act, No. 22 of 2012 respectively." |

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු සභාපතිතුමනි, අපි විරුද්ධයි.

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தத்துடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත

### பிரதேச சபைகள் (திருத்தம்) சட்டமூலம்

### PRADESHIYA SABHA (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"That the Bill be now read a Second time."

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි විරුද්ධයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය."-[ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [ மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. A.L.M. Athaullah]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 2. - (1987ஆம் ஆண்டின் 15ஆம் இலக்க, பிரதேச சபைச் சட்டத்தின் 169ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 2.- (*Amendment of section 169 of the Pradeshiya Sabha Act No. 15 of 1987.*)

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"In page 1, leave out all words in lines 7 to 10 and insert:

| | |
|---|---|
| 'Insertion of new section 169A in the Pradeshiya Sabha Act, No. 15 of 1987. | 2. The following new section is hereby inserted immediately after section 169 of the Pradeshiya Sabha Act and shall have effect as section 169A of that Act - |
| Transitional Provision | 169A. The provisions of the proviso to section 169 of the Pradeshiya Sabha Act as amended by the Local Authorities (Special Provisions) Act, 21 of 2012 shall not be applicable to any budget or supplementary budget to be submitted to a Pradeshiya Sabha constituted in terms of the results of the elections held prior to the date of coming into operation of Local Authorities (Special Provisions) Act, No. 21 of 2012 and Local Authorities Elections (Amendment) Act No. 22 of 2012 resepctively." |

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු සභාපතිතුමනි, අපි විරුද්ධයි.

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2 , as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தத்துடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)
I move,

"That the Bill, as amended, be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත
## உள்ளூர் அதிகாரசபைகள் தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம்
## LOCAL AUTHORITIES ELECTIONS (AMENDMENT) BILL

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Local Authorities Elections (Amendment) Bill එක මම withdraw කර ගන්නවා. හේතුව, අනෙක් පනත්වලට amendments කරලා තිබීම මත මේ සංශෝධන පනත් කෙටුම්පත අවශ්‍ය නැති නිසා. එහෙයින් සභාවේ අවසරය ඇතිව මම මේ සංශෝධන පනත් කෙටුම්පත withdraw කර ගන්නවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

***අවසර දෙන ලදුව පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී.***
*சட்டமூலம், அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.*
*Bill, by leave, withdrawn.*

## පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත් කෙටුම්පත
## உள்ளூர் அதிகாரசபைகள் வெற்றிடங்களை நிரப்புதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்
## LOCAL AUTHORITIES FILLING OF VACANCIES (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

I move,

"That the Bill be now read a Second time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [ மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. A.L.M. Athaullah.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[ பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY SPEAKER in the Chair.]*

***1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendments.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

I move,

"That the Bill be now read the Third time."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

**ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා**
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂ නායකයන් සියලු දෙනාම පෙරේදා රැස් වෙලා දවසක් ඇතුළත තමයි Legal Draftsman මේ සියලු amendments කරලා තිබෙන්නේ. සමහර වෙලාට මේවායේ මොනවා හරි අඩු පාඩු, clerical mistakes තිබෙන්න පුළුවන්. එසේ තිබෙනවා නම් Legal Draftsman's Department එකට ඒවා හදා ගන්නටත් මෙම ගරු සභාවේ අවසරය ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනා අංක 19.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් අද දින න්‍යාය පත්‍රයේ අංක 19 යටතේ සඳහන් ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝගවලට අදාළ යෝජනාව ඉල්ලා අස් කර ගන්නවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සභාවේ එකඟත්වය?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***අවසර දෙන ලදුව යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.***
*பிரேரணை, அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.*
*Regulation, by leave, withdrawn.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.20ට, 2014 ඔක්තෝබර් 10 වන සිකුරාදා අ. භා. 1.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 6.20 மணிக்கு பாராளுமன்றம், 2014 ஒக்ரோபர் 10, வெள்ளிக்கிழமை பி.ப. 1.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.20 p.m. until 1.30 p.m. on Friday, 10th October, 2014.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.